210 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 210 - இல. 11
**Volume 210 - No. 11**

**2012 සැප්තැම්බර් 19 වන බදාදා**
2012 செப்ரெம்பர் 19, புதன்கிழமை
**Wednesday, 19th September, 2012**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත - [ගරු එම්.එස්. තව්ෆීක් මහතා]- පළමුවන වර කියවන ලදී.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත:
නියමය

රේගු ආඥා පනත:
යෝජනාව

මෝටර් වාහන පනත:
නියෝග

කල් තැබීම:
අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග

---

# பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
பரீரா முஸ்லிம் மகளிர் அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம்.எஸ். தௌபீக்]-
முதன்முறை மதிப்பிடப்பட்டது

விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்:
கட்டளை

சுங்கக் கட்டளைச் சட்டம்:
தீர்மானம்

மோட்டார் வாகனச் சட்டம்:
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:
Bareerah Muslim Ladies Arabic College (Incorporation) – [The Hon. M.S. Thowfeek] – Read the First time

SPECIAL COMMODITY LEVY ACT:
Order

CUSTOMS ORDINANCE:
Resolution

MOTOR TRAFFIC ACT:
Regulations

ADJOURNMENT MOTION:
Unprotected Level Crossings

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 සැප්තැම්බර් 19 වන බදාදා***
*2012 செப்ரெம்பர் 19, புதன்கிழமை*
*Wednesday, 19th September, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.*, MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2012 සැප්තැම්බර් මස 19 වන බදාදා, එනම් අද දින පස් වරු 2.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රිවරුන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව; සහ

(iv) 2011 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2011 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 05 දිනැති අංක 1774/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය.- [උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(i) 2011 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් වාර්තාව;

(ii) 2011 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2011 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සුළු අපනයන භෝග ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.- [කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)
ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, 2009 වර්ෂය සඳහා සී/ස ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දහය පිළිගන්වමි.

(1) ගල්ගමුව, උස්ගල, සියඹලංගමුව, අංක 08, යාය 02 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මුණමල්දෙණිය, මල්වානේගෙදර පදිංචි ටී.එම්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කල්එළිය, තෙන්නකෝන් නිවස, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි යූ.පී.එස්.සී.එම්. උග්ගල්දෙණිය මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) දෙමෝදර, පහළ වැල්ගොල්ල, මුදුන්පිට පදිංචි ඒ.එම්. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(5) ඇහැලියගොඩ, බුළුගහපිටිය, මහින්ද මාවතේ, අංක 375/2 දරන ස්ථානයෙහි පදිංචි බී.එම්. සුමනසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) මහියංගණය, මාපාකඩ වැව, කෙසෙල්පොත, අංක 11-134 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. ජයරත්න මහතාගෙන් ලැබුණු පත්සම;

(7) තෙල්දෙණිය, රඹුක්වැල්ල, අංක 205/3 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්. බන්දුල වීරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) බලන්ගොඩ, පින්නවල, උඩගම, සිදුවිකි හි පදිංචි පී.ජී. සිරි ඉන්ද්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) මාවතගම, ගුවන් තොටු පොළ පාර, "උපේක්ෂා" නිවසෙහි පදිංචි එස්.ඒ.ඩී. සපුආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(10) බණ්ඩාරවෙල, ධර්මපාල මාවත, නගරසභා නිවාස, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.සී. අමරවංශ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, රද්දොළුගම, මුතුවාඩිය, අංක 140ඒ දරන ස්ථානයෙහි පදිංචි ජී.ඒ.සී. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)

Hon. Speaker, I present a petiton received from Mr. E.M. Mariyanesam of No. 129, St. Mary's Street, Trincomalee.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.

**ගරු වී.කේ. ඉන්දික මහතා**
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) හම්බන්තොට, ගොන්නොරුව, 6 කණුව දරන ස්ථානයෙහි පදිංචි කේ. පත්මකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාවරල, ගොමිල, අනගාරික ධර්මපාල පුරය, අංක 10 දරන ස්ථානයෙහි පදිංචි එස්. මාගින ආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

(1) වැලිගම, කොක්මාදුව, මහහේන්ගොඩ, අංක 165/2 දරන ස්ථානයෙහි පදිංචි සුමනා හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගාල්ල, කරාගොඩ, "ජයසෙත" නිවසෙහි පදිංචි කේ.ජී.එල්. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මාතර, නාවිමන-දකුණ, මිරිස්වත්තහේන, සෝමාරාම පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ජගත් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු කථානායකතුමනි, තැලිගම, කුමාරිගේ වත්ත, එෆ් 35/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.එල්. වාසනා හේමමාලි ලියනගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, නාත්තණ්ඩිය, කච්චිරාව, ඉහළ තබ්බෝව පදිංචි රුවන්ති උත්පලා ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2-1370/'11- (3), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-1868/'11-(3), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4-2057/'11-(4), ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානාකතුමනි, මම එම ප්‍රශ්නය හතර වන වරටත් අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලනවා. මේ පිළිබඳව දීර්ඝ ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හතරවන වරටයි මේ ප්‍රශ්නය අහන්නේ. හතරවන වරට ඇහුවාම තවත් මාස දෙකක් කල් ඉල්ලන එකේ තේරුමක් නැහැනේ ගරු කථානායකතුමනි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අහන ප්‍රශ්නයට අනුව දීර්ඝ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න ඕනෑ නිසායි කල් ඉල්ලන්නේ ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අවුරුද්දක් තිස්සේ ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන්නේ. හතර වන වරටයි අද මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, ඊයේත් හය වන වතාවට කල් අරගෙන දීර්ඝ ප්‍රශ්නයකට ව්‍යාපාර 30ක් පිළිබඳව සම්පූර්ණ උත්තරයක් දුන්නා. අද මේ ප්‍රශ්නයටත් නීති උපදෙස් පතා තිබෙනවා. නීති උපදෙස් අරගෙන තව මාස දෙකක් ඇතුළත මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අවුරුද්දක් තිස්සේ මොනවාද කළේ? ගරු කථානායකතුමනි, මෙහෙම කරන්න දෙන්න පුළුවන්ද? [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, අධිකරණයක් ගැන ප්‍රශ්නයක් අහලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වෙන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අධිකරණයට අදාළ නැහැ මේ ප්‍රශ්නය. මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ අර්ථ සාධක අරමුදලේ - [බාධා කිරීමක්] අධිකරණයේ ප්‍රශ්නයක් නැහැ මෙතැන. [බාධා කිරීම්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අධිකරණයට අදාළ නැහැ කියලා පිළිතුර ලැබුණාට පසුව -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙය අධිකරණයට අදාළ එකක් නොවෙයි ගරු කථානායකතුමනි. මෙය අධිකරණයට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, කමක් නැහැ. අපි බලමු ඒක අධිකරණයට අදාළද කියලා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-2106/'11- (2), ගරු රෝසි සේනානායක මහත්මිය. දෙවැනි වරටයි එම ප්‍රශ්නය අහන්නේ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
දෙවැනි වතාවටයි අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නැහැ. පළමුවැනි වතාවට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි වතාවට අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මාසයක් නොවෙයි, සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වසා දැමූ රජයේ පාසල් : විස්තර
## மூடப்பட்ட அரச பாடசாலைகள் : விபரம்
## CLOSED-DOWN GOVERNMENT SCHOOLS : DETAILS

2294/'12

7. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) 2000, 2001, 2002, 2003 සහ 2011 යන වර්ෂයන්හිදී වසා දමන ලද මධ්‍යම රජයේ සහ පළාත් සභා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යම් පාසලක් වසා දැමීමේදී,

(i) එම පාසලේ සිසුන් සහ ගුරුවරුන් සම්බන්ධයෙන් ගන්නා විකල්ප ක්‍රියා මාර්ගය කවරේද;

(ii) සැලකිල්ලට ගන්නා වූ නිර්ණායකයන් කවරේද;

(iii) එම සැලකිල්ලට ගන්නා වූ නිර්ණායකයන් මේ වන විට වසා දමා ඇති පාසල් සම්බන්ධයෙන් අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 වර්ෂය වන විට වසා දමා ඇති පාසල්වල ගොඩනැගිලි කිසියම් ඵලදායි කාර්යයක් සඳහා මේ වන විට යොදවා තිබේද;

(ii) එසේ නම්, යොදවා ඇති එම කාර්යයන්ගේ ස්වභාවයන් සහ එමඟින් උපයන වාර්ෂික ආදායම කවරේද;

(iii) ඵලදායී කාර්යයක යොදවා නොමැති පාසල් ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2000, 2001, 2002, 2003 மற்றும் 2011ஆம் ஆண்டுகளில் மாவட்ட அடிப்படையில் மூடப்பட்ட மத்திய அரசின் மற்றும் மாகாண சபை பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் அறிவிப்பாரா?

(ஆ) ஏதேனும் பாடசாலையொன்று மூடப்படும் போது,

(i) அந்த பாடசாலையின் ஆசிரியர்கள் மற்றும் மாணவர்கள் தொடர்பாக எடுக்கப்படும் மாற்று நடவடிக்கை என்ன என்பதையும்;

(ii) கவனத்திற் கொள்ளப்படும் அளவுகோல்கள் எவை என்பதையும்;

(iii) கவனத்திற் கொள்ளப்படும் அளவுகோல்கள் இதுவரை மூடப்பட்ட பாடசாலைகள் தொடர்பாக பின்பற்றப்பட்டதா என்பதையும்;

(iv) இன்றேல் அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2011ஆம் ஆண்டுவரை மூடப்பட்ட பாடசாலைகளின் கட்டிடங்கள் இதுவரை ஏதேனும் பயனுள்ள நடவடிக்கைகளுக்குப் பயன்படுத்தப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) அவ்வாறெனின் பயன்படுத்தப்பட்ட அத்தகைய நடவடிக்கைகளின் இயல்புகள் மற்றும் அதன் மூலம் சம்பாதிக்கப்பட்ட வருடாந்த வருமானம் யாது என்பதையும்;

(iii) பயனுள்ள நடவடிக்கைகளுக்கு பயன்படுத்தப் படாத பாடசாலைக் கட்டிடங்கள் தொடர்பாக எதிர்காலத்தில் எடுக்கப்படும் நடவடிக்கைகள் என்ன என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state separately the number of schools coming under the Central Government and the Provincial Councils that have been closed down in the years 2000, 2001, 2002, 2003 and 2011 at district level ?

(b) Will he also state -

(i) the alternative measures taken regarding the students and the teachers of a school when it is closed down;

(ii) the criteria used when a school is closed down;

(iii) whether the aforesaid criteria have been followed regarding the schools that have already been closed down; and

if not, the reasons for that ?

(c) Will he also state -

(i) whether the buildings of schools that have been closed down by the year 2011 have been used for any productive purposes by now;

(ii) if so, the purposes for which they have been used and the annual income earned through them; and

(iii) the action that will be taken in future regarding the school buildings that have not been used for any productive purpose ?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) පාසල් වසා දැමීමක් සිදු නොකෙරේ. නමුත්, ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම මත ඇතැම් පාසල් වැසී ගිය අවස්ථා ඇත. මධ්‍යම රජයට අයත් පාසල් කිසිවක් එසේ වැසී ගොස් නැත. පළාත් සභාවලට අයත් පාසල් සමහරක් වැසී ගොස් ඇත. ඒ පිළිබඳ සංඛ්‍යා ලේඛන ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

(ආ) (i) යම් පාසලක් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම මත වැසී යාමට ආසන්න වූ විට එම පාසල තව දුරටත් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය අවස්ථාවලදී, සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා සුළු වුවත් පවත්වා ගැනීමට කටයුතු කෙරේ. සිටින සිසුන් කිලෝමීටර් දෙකකට අඩු දුරක ඇති පාසල් වෙත යොමු කිරීමට හැකි විට එසේ යොමු කෙරේ. ගුරු භවතුන් සම්බන්ධව ද එපරිදිම ක්‍රියා කෙරේ. පළාත් පාසල් සම්බන්ධයෙන් මෙම ක්‍රියාමාර්ගය මෙම අමාත්‍යාංශය මඟින් නොව පළාත් බලධාරින් විසින් ඉටු කෙරේ.

(ii) සිසුන් සඳහා කිලෝමීටර් දෙකක් ඇතුළත වෙනත් පාසලක්/පාසල් තිබේද යන නිර්ණායකය.

(iii) ඔව්.

(iv) අදාළ නොවේ.

(ඇ) (i) වැසී ගිය පළාත් පාසල්වල ගොඩනැඟිලි හා ඉඩම් පළාත් බලධාරින් විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත පවරනු ලබන බැවින් ඉන් පසුව සිදු කෙරෙන කාර්යයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිතුරු දිය නොහැකි වේ.

(ii) ඉහත (i)ට දී ඇති පිළිතුර අදාළය.

(iii) ඉහත (i)ට දී ඇති පිළිතුර අදාළය.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
**Annexes tabled:*

2000, 2001, 2002, 2003 සහ 2011 යන වර්ෂයන්හිදී වැසී ගිය පළාත් සභා පාසල්

| **වැසී ගිය පළාත් සභා පාසල්** | | | | | |
|---|---|---|---|---|---|
| **දිස්ත්‍රික්කය** | 2000 | 2001 | 2002 | 2003 | 2011 |
| කොළඹ | 4 | 0 | 1 | 0 | 0 |
| ගම්පහ | 0 | 0 | 0 | 3 | 0 |
| කලුතර | 0 | 15 | 4 | 0 | 2 |
| මහනුවර | 3 | 2 | 3 | 0 | 0 |
| මාතලේ | 0 | 2 | 1 | 2 | 0 |
| නුවරඑළිය | 0 | 0 | 2 | 0 | 2 |
| ගාල්ල | 5 | 0 | 0 | 18 | 0 |
| මාතර | 0 | 0 | 0 | 1 | 1 |
| හම්බන්තොට | 0 | 3 | 0 | 2 | 0 |
| යාපනය | 8 | 0 | 15 | 4 | 0 |
| කිලිනොච්චිය | 0 | 0 | 2 | 1 | 0 |
| මන්නාරම | 0 | 0 | 1 | 0 | 0 |
| වවුනියාව | 0 | 0 | 1 | 0 | 1 |
| මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 |
| මඩකලපුව | 3 | 0 | 0 | 0 | 1 |
| අම්පාර | 0 | 0 | 0 | 4 | 0 |
| ත්‍රිකුණාමලය | 0 | 1 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 0 | 4 | 0 | 15 | 3 |
| පුත්තලම | 0 | 8 | 0 | 0 | 0 |
| අනුරාධපුරය | 5 | 0 | 6 | 0 | 6 |
| පොළොන්නරුව | 0 | 0 | 2 | 0 | 0 |
| බදුල්ල | 0 | 0 | 2 | 0 | 0 |
| මොණරාගල | 1 | 0 | 1 | 0 | 0 |
| රත්නපුර | 1 | 0 | 1 | 0 | 0 |
| කෑගල්ල | 17 | 7 | 0 | 0 | 0 |
| **එකතුව** | 47 | 42 | 42 | 50 | 16 |

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයෙන් පුළුල්ව අපේක්ෂා කළේ පාසල් වැසී යාමට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙන්නේ බොහෝ පාසල්වලට අවශ්‍ය සම්පත්, පහසුකම් ආදී දේවල්වල හිඟතාවක් තිබෙන නිසාය කියන කාරණය පෙන්වීමයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි මෙවර අය වැයෙන්වත් මේ පහසුකම් ලබා දීමට -අධ්‍යාපනය වෙනුවෙන්- තමුන්නාන්සේලා කොතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අය වැයෙන් මතු වන කාරණයක් පිළිබඳ ප්‍රශ්නයක් එතුමා අහන්නේ. කෙසේ නමුත් මම එතුමාට මතක් කර දෙනවා, මේ රටේ තිබෙන අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් තෝරා ගෙන ඒවා පාසල් දහසේ ව්‍යාපෘතියට බද්ධ කරලා පාසල් පහ බැගින් පාසල් පන්දහසක් සංවර්ධනය කරන බව. ඒ පාසල් පන්දහසටම වැසිකිළි, කැසිකිළි, විදුලිය ආදී සියලු පහසුකම් ලබා දීලා ළමා මිතුරු පාසලක් හැටියට ගොඩ නැඟීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත අප දැන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමා ඔය කියන පහසුකම් මේ ලංකාවේ නම් ඔය කියන විධියට දීලා නැහැ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමා පොළොන්නරුවට ගිහින් බලන්න. දිඹුලාගල කොට්ඨාසයට යන්න. ලංකාපුරට යන්න. ඒවා තමයි දුෂ්කර ප්‍රදේශ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මම තමුන්නාන්සේට එක උදාහරණයක් කියන්නම්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

තමුන්නාන්සේ ඒ ප්‍රදේශවලට යන්න. තමුන්නාන්සේ ඒ ප්‍රදේශවලට යන්නේ නැතිව ඔය කථාව කියන්න එපා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා මට අතුරු ප්‍රශ්න අහන්න ඉඩ දෙන්නේ නැහැ නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මේක මහා අපරාධයක් ගරු කථානායකතුමනි. අධ්‍යාපනය කඩා වැටුණා, කඩා වැටුණා කියනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මෙතුමා කියන විධියට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නය.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නේ නැහැ නේ. ගරු කථානායකතුමනි, මේ වෙන කොට අ.පො.ස. උසස් පෙළ කරන ශිෂ්‍යයන්ගේ Z-score ජාතික අගයට අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් 17,000ක ජනතාවගෙන් වෛද්‍ය පීඨයට එක් කෙනෙක් තේරෙද්දී, මොණරාගලින් තේරෙන්නේ ලක්ෂ 8කට එක්කෙනායි. එතකොට පේනවා නේ, මේ පරාසය. ගම්වල පාසල්වලට තමුන්නාන්සේ ඔය කියපු පහසුකම් ලබා දුන්නා නම්, වෛද්‍ය පීඨයට මොණරාගලින් ලක්ෂ අටකට එක්කෙනෙක් තේරෙන්නත්, කොළඹ දිස්ත්‍රික්කයෙන් 17,000කට එක් කෙනෙක් තේරෙන්නත් බැහැ නේ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ ප්‍රශ්නයට තමුන්නාන්සේගේ පිළිතුර මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අවුරුදු 30ක් තිස්සේ යුද්ධයක් තිබුණා. අපි අද අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉතා පැහැදිලි වෙනස්කම් කරන්න, ලක්ෂ්‍යක හැරවුමකට -අධ්‍යාපනයේ නව පෙරළියකට- පාත්‍ර කරලායි තිබෙන්නේ. ඒ එක්කම මතක් කරන්න ඕනෑ, ඔබතුමා ඉදිරිපත් කරන්නේ සාවද්‍ය සංඛ්‍යා ලේඛන බව. සාවද්‍ය සංඛ්‍යා ලේඛන. [බාධා කිරීමක්] ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් අහන්න. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නයට එතුමාට පිළිතුරු දෙන්න අමාරුයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නයක් අහන්න. මම පිළිතුරු දෙන්නම්. [බාධා කිරීම්] තමුන්නාන්සේ අධ්‍යාපන ඇමති කාලයේ මොනවාද කළේ? [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මට පිළිතුර ලැබුණේ නැහැ. එතුමා ප්‍රශ්නයට පිළිතුර වෙනුවට දුන්නේ වෙනත් උත්තරයක්. බලාපොරොත්තු වුණ උත්තරය නොවෙයි ලැබුණේ.

## කණ්ඩලම වී ගබඩා සංකීර්ණය : ප්‍රතිසංස්කරණය
கண்டலம நெற்களஞ்சிய கட்டிடத்தொகுதி : மறுசீரமைப்பு
PADDY STORAGE COMPLEX IN KANDALAMA: RESTORATION

1843/'11

9. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල, කණ්ඩලම ප්‍රදේශයේ වටිනා වී ගබඩා ගොඩනැගිලි සංකීර්ණයක් ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා ඇති බවත්;

(ii) රජයේ වී මිලදී ගැනීමේ ක්‍රියාදාමයට ගබඩා පහසුකම් නොමැතිකම බාධාවක් වන බැවින් ගොවීන්ගෙන් මිලදී ගනු ලබන වී තොග ගබඩා කිරීමට ඉහත ගබඩා සංකීර්ණය ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ගබඩා සංකීර්ණය ප්‍රතිසංස්කරණය කර, වී ගබඩා කිරීමට යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(ii) නොඑසේ නම්, එය වෙනත් ඵලදායි කටයුත්තකට යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

(iv) වී ගබඩා කිරීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා එම ගොඩනැගිලි භාවිතා කරන්නේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்ளக வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்தில் தம்புல்ல கண்டலம பிரதேசத்திலுள்ள பெறுமதிமிக்க நெற்களஞ்சிய கட்டிடத்தொகுதி பயன்படுத்தப்படாமல் கைவிடப்பட்டுள்ளதென்பதையும்;

(ii) அரசாங்கத்தின் நெற்கொள்வனவுச் செயற் பாட்டுக்கு களஞ்சிய வசதியின்மை தடையாக இருப்பதால், விவசாயிகளிடமிருந்து கொள்வனவு செய்யப்படும் நெல்லைக் களஞ்சியப்படுத்துவதற்காக இக்களஞ்சியக் கட்டிடத்தொகுதியை மறுசீரமைத்துப் பயன் படுத்தலாம் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ஆ) (i) அவ்வாறாயின் இக்களஞ்சியக் கட்டிடத் தொகுதியை மறுசீரமைத்து நெல் களஞ்சியப் படுத்தலுக்குப் பயன்படுத்துவதற்காக திட்டமிடப் பட்டுள்ளதா;

(ii) அவ்வாறின்றேல் இதை வேறேதேனும் பய னுள்ள நடவடிக்கைக்குப் பயன்படுத்தத் திட்ட மிடப்பட்டுள்ளதா;

(iii) அவ்வாறாயின் அந்நடவடிக்கை யாது;

(iv) நெல்லைக் களஞ்சியப்படுத்துவதற்காக அல்லது வேறேதேனும் நடவடிக்கைக்கு இக்கட்டிடங்கள் பயன்படுத்தப்படுமாயின் இந்நடவடிக்கை ஆரம்பிக்கப்படும் திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he admit that -

(i) a valuable paddy storage complex in Kandalama, Dambulla in Matale District has been abandoned without making use of it; and

(ii) the said storage complex can be restored for the use of stocking the paddy purchased from farmers as lack of storage space is a hindrance to the paddy purchasing process of the Government ?

(b) Will he inform this House -

(i) if so, whether it has been planned to restore the aforesaid storage complex and use it for the storage of paddy;

(ii) if not, whether there is a plan to use it for some other useful purpose;

(iii) if so, what that purpose is; and

(iv) if those buildings are to be used for the storage of paddy or some other purpose, the date on which such work will be started?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වී ගබඩා කිරීම සඳහා එම ගබඩා දැනටත් ප්‍රයෝජනයට ගෙන ඇත.

මේ වී ගබඩා සංකීර්ණය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ -2003- ආර්.එම්. මුර්සි මහතාට වර්ග අඩියට රුපියල් 2 ගණනේ බදු දීලා තිබුණා. බදු ගෙවලාත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඉස්සර වෙලා ප්‍රශ්නයට පිළිතුර දීලා ඒ කාරණා පසුව කියන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

හොඳයි ගරු කථානායකතුමනි. බදු ගෙවලාත් නැහැ. අප තමයි මේක භාර ගත්තේ. මේ වන විට එය පවත්වාගෙන යනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ කාලයේ ඔබතුමා කොහේද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මාත් ඒ පැත්තේ.

(ii) අදාළ නොවේ.

(ආ) (i) දැනටමත් ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගනු ලැබේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) 2009/10 මහ කන්නයේ සිට වී අළෙවි මණ්ඩලය විසින් වී මිල දී ගැනීම සඳහා මෙම ගබඩා සංකීර්ණය භාවිත කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල, කණ්ඩලම ප්‍රදේශයේ පිහිටා තිබෙන මේ වී ගබඩාව අවසන් වරට ප්‍රතිසංස්කරණය කළේ කුමන වර්ෂයේද කියලා සඳහන් කරන්න ගරු ඇමතිතුමාට පුළුවන්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

පුළුවන්. අපි මෙය භාර ගත්තේ 2010 පෙබරවාරි මාසයේ. ඇත්ත වශයෙන්ම මෙය අපට භාර දෙන්නේ නැතිව, බදු ගෙවන්නේත් නැතිව තිබුණා. ගත්තු දවසේ ඉඳලා ශත පහක්වත් බදු ගෙවලා නැහැ. රුපියල් මිලියන ගණනක් ආණ්ඩුවට වී අළෙවි මණ්ඩලයට ගෙවන්න තිබෙනවා. අපි නීතිපතිට දැන්නුවා. දඹුල්ල පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාලා වී ගබඩා කරන්නේ ගරු කථානායකතුමනි. 2010 පෙබරවාරි මාසය, මාර්තු මාසය වෙද්දී තමයි අප එය භාර ගත්තේ. භාර ගෙන රුපියල් 3,80,000ක් වියදම් කරලා සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරලා වී ගබඩා කරනවා. කණ්ඩලම වී ගබඩා දෙකක් තිබෙනවා, 1 සහ 2 කියලා. ඒ වී ගබඩා විතරක් නොවෙයි. ලංකාවේ හුඟක් තැන්වල තිබෙන වී ගබඩා තුට්ටු දෙකටයි දීලා තිබුණේ රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ ඉඳලා. අතිගරු මහින්ද රාජපක්ෂ

ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය තමයි වී අළෙවි මණ්ඩලය නැවත වාරයක් ස්ථාපිත කිරීම.

මේ වී ගබඩාව විතරක් නොවෙයි, තවත් ගබඩා ගණනාවක් දීලා තිබුණා. ඒ සියලුම ගබඩාවලින් සියයට 90ක් අපි මේ වෙන කොට ආපහු භාර ගෙන තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුර හම්බ වුණේ නැහැ. ඒ වී ගබඩාව අවසාන වරට ප්‍රතිසංස්කරණය කළේ කවදාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඇයි, මම කිව්වේ. 2010 මාර්තු මාසය වෙද්දී අපි ගබඩාව භාර ගත්තා. මාස තුනක් යන්න ඉස්සර වෙලා ප්‍රතිසංස්කරණය කරලා, අපි යල කන්නයේ සහ මහ කන්නයේ වී ගබඩා කරන්න පටන් ගත්තා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් ගරු ඇමතිතුමා සඳහන් කළා, ඒ වී ගබඩාව මීට කලින් වෙන අයට පවරලා තිබුණා කියලා. ඒ වාගේම ඒ පවරපු අයගේ නම් සඳහන් කළා. ඒ අයගෙන් මුදල් අය වුණේ නැහැ, විශාල මුදල් ප්‍රමාණයක් ලැබිය යුතුව තිබෙනවා කියලා කිව්වා. ගරු ඇමතිතුමාට සඳහන් කරන්න පුළුවන්ද ඒ මුදල් ප්‍රමාණය අය කර ගන්නවාද, අය කර ගන්න මොන ක්‍රමවේදයක් ද පාවිච්චි කරන්නේ කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඒ දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් අළුවිහාරේ මහතා තමයි ඒ වී ගබඩාව 2003.12.02වැනිදා ලබා දීලා තිබෙන්නේ. ඒ ලියුම මා ළඟ තිබෙනවා. මම ඒ ලියුම **සභාගත*** කරන්නම්.

ඒ වී ගබඩාව ලබා දීලා තිබෙන්නේ වැට් වංචාවට අසු වෙච්ච පුද්ගලයකුට. දුන්නු දා ඉඳලා බදු ගෙවලා නැහැ. අපි නීතිපතිතුමාට මේ ප්‍රශ්නය යොමු කරලා, නඩු පවරන්නත්, ඒ වාගේම මුදල් අය කර ගන්නත් කටයුතු කර තිබෙනවා. නමුත් ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ පදිංචි නැති නිසා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. නමුත් අපි නීත්‍යානුකූලව නීතිපතිතුමාට මේ කරුණු දන්වලා තිබෙනවා. ඒ ලියුම් මා ළඟ තිබෙනවා. මේ විධියට තමයි වී අළෙවි මණ්ඩලයට, ගොවීන්ට එක්සත් ජාතික පක්ෂය සැලකුවේ. ඒක තමයි කනගාටුවට කරුණ. මාත් ඒ ආණ්ඩුවේ හිටියා. ඒ කාලයේ ඒ විධියට තමයි වැඩ කටයුතු කළේ. සෙවනගල සීනි කර්මාන්තය දුන්නා; පැල්වත්ත සීනි කර්මාන්තය වික්කා. ගබඩා ටික පෞද්ගලික අයට දුන්නා අපි හිටපු ආණ්ඩුවෙන්. [බාධා කිරීමක්] ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි, මට හිතා ගන්න බැහැ ඔබතුමා මේ ප්‍රශ්නය ඇහුවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ගහන්නද කියලා. මේ ප්‍රශ්නය සජිත් ප්‍රේමදාස මහත්තයා ලියලා දුන්න ප්‍රශ්නයක් ද කියන එකත් අපිට තිබෙන ගැටලුවක්. මේක ඔය පක්ෂය ඇතුළේ තිබෙන ප්‍රශ්නයක්. පක්ෂයේ අය බෙදිලා, ඇතුළේ කොටා ගන්නවා. මේක ඇතුළේ ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, වැඩිය භාර හාරා අහන්න යන්න එපා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මේවා මේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තිබෙන අර්බුද. පාර්ලිමේන්තුවේ වෙලාව නිකම් නාස්ති කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඒ වැල්වටාරම් අවශ්‍ය නැහැ. තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. [බාධා කිරීම්] ප්‍රශ්නයක් ඇහුවාම ප්‍රශ්නයට උත්තරය දෙන්නයි තිබෙන්නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි ඊ ළඟ කන්නයේ වී අස්වැන්න විධිමත්ව ගබඩා කරන්න පුළුවන් මට්ටමට මේ වන විට මේ ගබඩා සියලු පහසුකම්වලින් සමන්විතද කියලා. එහෙම නැත්නම් ඒ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් තවත් මුදලක් වෙන් කළ යුතුද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතැනම ප්‍රශ්න දෙකයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේ ගබඩාවල මොන පහසුකම් ගැන දැන ගන්නද ඔබතුමා බලාපොරොත්තු වන්නේ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මට ලැබුණ වාර්තාවේ හැටියට වහලය දිරලා වතුර වැක්කෙරෙන තත්ත්වයක් තිබුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය පැහැදිලිව අහන්න. විස්තර කරන්න යන්න එපා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මේ ගබඩාව විතරක් නොවෙයි අලුතෙන් ගබඩා 30ක් අතිගරු ජනාධිපතිතුමා ලබා දුන්නා.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ගබඩාව සූදානම්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි හම්බන්තොට දිස්ත්‍රික්කයේත් අලුතෙන් ගබඩාවක් නිර්මාණය කළා. මොනරාගල දිස්ත්‍රික්කයේත් ඉදි කළා. ඒ වාගේ ගබඩා විශාල සංඛ්‍යාවක් ඉදි කළා. අපට pallets විතරයි ඕනෑ. අපි repairs හැම දෙයක්ම කරලා තිබෙනවා. [බාධා කිරීමක්] වහලය හැදුවා. වහලය හදන්නේ නැතිව පුළුවන්ද? එහෙම නැත්නම් වී ටික පැළවෙනවා නේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 2133/'11- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-2187/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මානව සහ භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘති : අධ්‍යාපන අමාත්‍යාංශය

மனித மற்றும் பௌதிக வள அபிவிருத்திக் கருத்திட்டங்கள் : கல்வி அமைச்சு

HUMAN AND PHYSICAL RESOURCES DEVELOPMENT PROJECTS: MINISTRY OF EDUCATION

2295/'12

12. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මානව සහ භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘති කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ව්‍යාපෘතියෙහි,

(i) මුඛ්‍ය අරමුණ;

(ii) ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය;

(iii) ඇස්තමේන්තුගත මුළු මුදල;

(iv) විදේශීය ආධාර ලැබෙන්නේ නම්, ඒවා ලබා දෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(v) රජය වෙන්කළ මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) தற்போது கல்வி அமைச்சின் கீழ் நடைமுறைப்படுத்தப் பட்டுள்ள மனித மற்றும் பௌதிக வள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தினதும்

(i) பிரதானமான நோக்கம்;

(ii) ஆரம்பித்த ஆண்டு மற்றும் நிறைவு செய்ய உத்தேசித்துள்ள ஆண்டு;

(iii) மதிப்பீடு செய்யப்பட்டுள்ள தொகை;

(iv) வெளி நாட்டு உதவி கிடைக்குமாயின், வழங்கும் நிறுவனம் மற்றும் வழங்கப்படும் தொகை ஆகியவை வெவ்வேறாகவும்; அத்துடன்

(v) அரசு ஒதுக்கியுள்ள பணத்தொகை

யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state the human and physical resources development projects implemented under the Ministry of Education at present?

(b) Will he inform this House of -

(i) the prime objective;

(ii) the year of commencement and the proposed year of completion;

(iii) the total amount estimated;

(iv) the institution that grants money and the amount of money granted separately, if foreign aid is received; and

(v) the amount of money allocated by the Government;

(vi) in relation to each of the aforesaid projects ?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) මේ වන විට පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

1. දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP)

2. ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව යටතේ ක්‍රියාත්මක ළමා මිතුරු පාසල් ආකෘතිය ප්‍රාථමික පාසල් සඳහා හඳුන්වා දීම.

3. වෙනත් ව්‍යාපෘතියක් මඟින් සංවර්ධනය කරනු නොලබන උතුරු නැඟෙනහිර පළාත්වල පාසල්වල කොරියානු ආධාර ප්‍රදාන මත නව ඉදිකිරීම් හා පාසල් ගොඩනැඟිලි අලුත්වැඩියා කටයුතු ක්‍රියාත්මක කිරීම.

4. මාර්ගෝපදේශ හා උපදේශන ඒකකය මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති 02.

GIZ ව්‍යාපෘතිය සමඟ ක්‍රියාත්මක කෙරෙන, ගැටලුමය තත්ත්වයන් වැඩි ප්‍රදේශවලින් තෝරා ගත් පාසල් 200ක් තුළ මනෝ සමාජයීය ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන.

කැනේඩියානු රතුකුරුස සමාජයත් සමඟ ක්‍රියා කරනු ලබන අපි සුරකෙමු ළමා ආරක්ෂණ වැඩසටහන

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව යටතේ ක්‍රියාත්මක පරිගණක පුහුණු වැඩසටහන්.

6. ද්විභාෂා අධ්‍යාපන ශාඛාව යටතේ ක්‍රියාත්මක ගුරු මධ්‍යස්ථාන හරහා ද්විභාෂා නොවන විෂයය

ගුරුවරුන් ද්විභාෂා ගුරුවරුන් ලෙස පුහුණු කිරීම.

7. මානව සම්පත් සංවර්ධන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන නිලධාරින් හා විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්.

8. ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව යටතේ ක්‍රියාත්මක වන මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි ප්‍රාථමික පාසල් ජාලයක් සඳහා ද්විතීයික පාසලක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන.

(ආ) (i) (ii) (iii) (iv) හා (v) කොටස් සඳහා පිළිතුරු ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
**Annexes tabled:*

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP) | | | | | |
| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
| දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP) | ද්විතියික පාසල් ඉලක්ක කොට රැකියා වෙළඳපොළ සඳහා උචිත දක්ෂතාවලින් හෙබි උගත් තරුණ පරපුරක් සඳහා ගුණාත්මක බව්න්, අදාළ බව්න් හා සමානාත්මතාවයෙන් යුතු උසස් ඉගෙනුම් ඵල කරා ළඟාකර වීමේ අවස්ථා සහතික කිරීම. | ආරම්භ කළ වර්ෂය 2008 මාර්තු 07 නිම කිරීමට යෝජිත වර්ෂය 2014 ජූනි 30 | රුපියල් මිලියන 11,267 | ආසියානු සංවර්ධන බැංකුව (ADB) හා රාජ්‍ය අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව ලබාදෙන මුදල රුපියල් මිලියන 8,584 | රුපියල් මිලියන 2,683 |
| 2. ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව මඟින් කරනු ලබන ව්‍යාපෘති | | | | | |
| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
| ළමා මිතුරු පාසල් ආකෘතිය ප්‍රාථමික පාසල් සඳහා හඳුන්වා දීම | ළමා මිතුරු පාසල් ප්‍රවේශය තුළින් ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම | 2005 සිට ඉදිරියට | - | යුනිසෙෆ් ආයතනය මඟින් 2012 වර්ෂය සඳහා රු.675,000 වෙන් කර ඇත | - |
| 3. කොරියානු ව්‍යාපෘති සම්බන්ධීකරණ අංශය මඟින් කරනු ලබන ව්‍යාපෘති | | | | | |
| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
| කොරියානු ආධාර ප්‍රදානයන් මත උතුරු නැඟෙනහිර පළාත්වල නව ඉදිකිරීම් හා පාසල් ගොඩනැඟිලි අළුත්වැඩියාවන් හා යටිතල පහසුකම් ලබාදීම | වෙනත් ව්‍යාපෘතියක් මඟින් සංවර්ධනය කරනු නොලබන උතුරු හා නැගෙනහිර පළාත්වල අධ්‍යාපනික හා යටිතල පහසුකම් ඇති කරමින් යහපත් ඉගෙනුම් තත්ත්වයක් ඇති කරලීම සඳහා අදාළ ආධාර ප්‍රදානයන් ලබා දීම (උතුරු වසන්තය හා නැගෙනහිර නවෝදය පදනම් කරගනිමින්) | ආරම්භ කළ වර්ෂය 2011 නිම කිරීමට යෝජිත වර්ෂය 2014 | රුපියල් මිලියන 700 | කොරියානු ජනරජය | රුපියල් මිලියන 40 |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

**4. විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන සාම ශාඛාව මගින් කරනු ලබන ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| GIZ ව්‍යාපෘතිය සමග ක්‍රියාත්මක කෙරෙන ගැටළුමය තත්ත්වයන් වැඩි ප්‍රදේශ වලින් තෝරාගත් පාසල් 200 ක් තුළ මනෝසමාජීය ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන | උතුර, නැගෙනහිර, සබරගමුව, ඌව හා මධ්‍යම පළාත්වල තෝරාගත් පාසල් 200ක් තුළ මනෝ සමාජීය ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් සිසුන්ට සුවදායක පාසල් පරිසරයක් නිර්මාණය කිරීමයි. මෙම පාසල්වලින් උතුරු නැගෙනහිර පාසල්වල පාසල් තුළ යුද ගැටුම්වලින් ප්‍රශ්න ඇති වූ සමාජවල පිහිටි පාසල් වූ අතර අනෙකුත් පළාත්වලින් වතුකරය ආශ්‍රිත පාසල් තෝරා ගෙන ඇත. | ආරම්භ කළ වර්ෂය 2009<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2012 | රුපියල් මිලියන 5.4 | සම්පූර්ණ මුදලම GIZ ආයතනය මගින් දරනු ලැබේ.<br>රුපියල් මිලියන 5.4 | නැත |
| කැනේඩියානු රතුකුරුස සමාජයත් සමග ක්‍රියාත්මක කරනු ලබන අපි සුරැකෙමු ළමා ආරක්ෂණ වැඩසටහන | අපි සුරැකෙමු ළමා ආරක්ෂණ ව්‍යාපෘතිය - පාසල්වල ප්‍රාථමික පන්තිවල සිසුන් ඉලක්ක කර ගනිමින් ළමා අපචාර හා අපයෝජන ක්‍රියාවන්ගෙන් ඔවුන් මුදා ගැනීම පිණිස සරල ක්‍රියාකාරකම් ආධාරයෙන් ඔවුන්ට අවබෝධයන් ලබාදෙන වැඩසටහනකි. මෙයට ගුරු පුහුණු හා දෙමාපිය දැනුවත් කිරීම් ඇතුළත්ය. ශ්‍රී ලංකාවේ සෑම පළාතකම තෝරාගත් පාසල්වලින් මුලින් ක්‍රියාත්මක කර සාමාන්‍ය පාසල් වැඩසටහනක් ලෙස ඉදිරියට ක්‍රියාත්මක කිරීමට යෝජිතයි.<br>අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව එකතුව වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. | ආරම්භ කළ වර්ෂය 2008<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2013 | කැනේඩියානු ඩොලර් 800, 000 | කැනේඩියානු රතුකුරුස ආයතනය මගින් සියළු වියදම් දරයි.<br>කැනේඩියානු ඩොලර් 800, 000 | නැත |

**5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් කරනු ලබන ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ප්‍රවර්ධනය සඳහා දායක වන ගුරුවරුන් සහ නිලධාරීන් 20කට පමණ විරට අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සඳහා භාවිතය සම්බන්ධයෙන් ස්ථිරසාර මට්ටමින් අත්දැකීම් ලබා දීම හා එම ක්‍රමවේදයන් දේශියකරණය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදීම් ප්‍රශස්ත කිරීම. | ආරම්භ කළ වර්ෂය 2010<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2015 | | කොරියානු ජන රජයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මකවේ. පුහුණුව සඳහා යන කණ්ඩායමේ සියළු වියදම් කොරියානු රජය විසින් දරනු ලබයි. | නැත |
| දෘඪාංග හා ජාලගත විසඳුම් කණ්ඩායම් සඳහා කලාප හා පාසල් මට්ටමින් ගුරුවරු හා ගුරු උපදේශකවරුන්ගෙන් සමන්විත වන ලෙස සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම | පාසල් පරිගණක විද්‍යාගාරවල සියළුම පරිගණක හා උපාංගයන්හි ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා එමගින් තොරතුරු තාක්ෂණ විෂයයේ භාවිතය තහවුරු කිරීම. | ආරම්භ කළ වර්ෂය 2007<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2016 | රුපියල් මිලියන 11 | නැත | රුපියල් මිලියන 11 |
| විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණය සඳහා තෝරාගත් සම්පත් පුද්ගල ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණය පාසල් පද්ධතිය තුළ සිටින ගුරුවරුන් මගින්ම සිදු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම | ආරම්භ කළ වර්ෂය 2008<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2016 | රුපියල් මිලියන 26.95 | නැත | රුපියල් මිලියන 8 |
| ජාතික පාසල් සඳහා පරිගණක විද්‍යාගාර ලබාදීම | ජාතික පාසල් සඳහා ශිෂ්‍ය පරිගණක අනුපාතය අනුව 75 ට 1 මට්ටමේ පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම. | ආරම්භ කළ වර්ෂය 1999 යාවත්කාලීන කිරීම් සිදුකරමින් වැඩසටහන ක්‍රියාත්මක වේ. | රුපියල් මිලියන 127.2 | නැත | රුපියල් මිලියන 107.2 |

6. ද්වි භාෂා අධ්‍යාපන ශාඛාව මගින් කරනු ලබන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| ගුරු මධ්‍යස්ථාන හරහා ද්විභාෂා නොවන විෂය ගුරුවරුන් ද්විභාෂා ගුරුවරුන් ලෙස පුහුණු කිරීම | හයවන ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන යටතේ තෝරාගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා පුහුණු ගුරුවරුන් නොමැති වීමේ ගැටළුවට පිළියමක් වශයෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් උගන්වනු ලබන අදාළ විෂයය ගුරුවරුන්හට අවශ්‍ය ගුරු නිපුණතා සංවර්ධනය කිරීම. | ආරම්භ කළ වර්ෂය 2009<br>නිම කිරීමට යෝජිත වර්ෂය 2011 | රුපියල් මිලියන 24.6 | ලෝක බැංකුව<br>රුපියල් මිලියන 11.72 | |

7. මානව සම්පත් සංවර්ධන ශාඛාව මගින් කරනු ලබන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය | 2012 | රු. 246,500 | - | රු. 246,500 |
| ද්විතියික පාසල් 1000 විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ වැඩසටහනට අදාළව මූලික කාර්යයන් සිදු කිරීම. | දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය | 2012-2016 | ලෝක බැංකු ආධාර | - | - |
| අමාත්‍යාංශ නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීණතාවය ලබාදීම සඳහා රාජ්‍ය භාෂා පුහුණු කිරීමේ වැඩසටහන | දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබාදීම | 2011-2012 | රු. 47,200 | - | රු. 47,200 |

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| අධ්‍යාපන කලාප හා කොට්ඨාසවල කළමනාකරණ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් (තෝරාගත් කලාප 23 ක) | දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය | 2012 සැප්තැම්බර් - ඔක්තෝබර් | ලෝක බැංකු ආධාර | - | |
| අධ්‍යාපන කලාප හා කොට්ඨාසවලට අයත් පාසල්වල විදුහල්පතිවරු සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් (තෝරාගත් කලාප 23 ක) | දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය | 2012 සැප්තැම්බර් - ඔක්තෝබර් | ලෝක බැංකු ආධාර | - | මිලියන 1 |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවයට බඳවාගනු ලබන නව නිළධාරීන්ගේ දිශාභිමුඛ පාඨමාලා සඳහා මූලික කාර්යයන් සිදු කිරීම. | දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය | 2012.09.18 දින ක්‍රියාත්මක වීමට නියමිතය | ලෝක බැංකු ආධාර | - | මිලියන 3 |
| දේශීය හා විදේශීය පාඨමාලා / පුහුණු වැඩසටහන් සඳහා නිළධාරීන් යොමු කිරීම. (දේශීය - 94, විදේශීය - 18) | වෘත්තීය සංවර්ධනය | 2012 | | - | රු. 400,000 |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

8. ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව මඟින් කරනු ලබන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුඛ්‍ය අරමුණ | ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය | ඇස්තමේන්තු ගත මුළු මුදල | විදේශීය ආධාර ලබාදෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය | රජය වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි ප්‍රාථමික පාසල් ජාලයක් සඳහා ද්විතීයික පාසලක් සංවර්ධනය කිරීමේ වැඩසටහන | • නිදහස් අධ්‍යාපනය හා අනිවාර්ය අධ්‍යාපනය තහවුරු වන පරිදි සියළු දරුවනට සම හා උසස් මට්ටමේ අධ්‍යාපන අවස්ථා සැපයීම හා ප්‍රශස්ථ මට්ටමේ සම්පත් උපයෝජනය<br>• අවම වශයෙන් ප්‍රාථමික පාසල් 3-5ක් පෝෂිත පාසල් ලෙස ගැනෙන පරිදි විද්‍යාත්මක පාසල් සිතියම්කරණ අභ්‍යාසයක් හරහා පවත්නා පාසල් අතුරෙන් ද්විතියීක පාසල් 1,000ක් තෝරාගෙන සංවර්ධනය කිරීම.<br>• තෝරාගත් පාසල්වලට අවශ්‍ය මානව, භෞතික, යටිතල හා මූල්‍යමය සම්පත් සැපයීම හරහා ආකර්ෂණීය හා ප්‍රායෝගික පාසල් ජාලයක් ස්ථාපිත කිරීම.<br>• මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස පෝෂිත ප්‍රාථමික පාසල් ජාලය වැඩිදියුණු කිරීම.<br>• නාගරික පාසල්වලට ඇති අනවශ්‍ය හා කෘතීම තරඟකාරිත්වය අවම කිරීම.<br>• ප්‍රජානන කුසලතා හා අනෙකුත් ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය හරහා සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීම.<br>• මෙම පාසල් හරහා අවම වශයෙන් භාෂා තුනක් හෝ අධ්‍යයනය කිරීමට අවශ්‍ය පරිසරයක් ඇති කිරීම.<br>• සමාජ ඒකාග්‍රතාව හා සාරධර්ම අධ්‍යාපනය මෙම පාසල් හරහා ශක්තිමත් කිරීම.<br>• තොරතුරු තාක්ෂණය, විදේශ භාෂා බලගැන්වීම, සම්පත් උත්පාදනය, දැනුම් හුවමාරුව, ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් ආදී කාර්යයන්හි රාජ්‍ය පෞද්ගලික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම.<br>• සෑම ශිෂ්‍යයෙකු සඳහා ම පෞද්ගලික අවධානය යොමුවන පරිදි හා සමසාධාරණත්වය තහවුරු වන පරිදි අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• මෘදු කුසලතා ඔප් නැංවෙන හා වැඩිදියුණු වන සුවිශේෂී වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (මේ සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන, මුදල් හා ක්‍රම සම්පාදන, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශවල මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකයින්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට අපේක්ෂිතය)<br>• සියලුම විෂයයන් / විෂය ධාරාවන් ඉගෙනීම සඳහා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.<br>• දෙමාපියන් හා පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.<br>• පාසල, තීරණ ගැනීමේ බලය හා අධිකාරිත්වය සහිත ඒකකයක් ලෙස ස්ථාපිත කිරීමට අවශ්‍ය මූල්‍ය හා කළමනාකරණ බලතල පාසල වෙත මුදා හැරීම.<br>• පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීම හරහා වර්තමානයේ පැතිර ඇති දූෂණ, අකටයුතුකම් තුරන්කොට පාසල් කළමනාකරණය හා පරිපාලනය වඩාත් පාරදෘෂ්‍යභාවයකින් හා වගකීම් සහිත ව පවත්වා ගෙන යාම. | ආරම්භ කළ වර්ෂය - 2012<br>නිම කිරීමට යෝජිත වර්ෂය -2016 | ද්විතීයික පාසල් සංවර්ධන වැඩසටහන සඳහා (2012-2016) රු.මිලි. 41,000<br><br>ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන සඳහා (2012-2016) රු.මිලි. 7,300 | විදේශ ආධාර ලෙස මෙම වැඩසටහනට ආයෝජනය කිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණය සම්බන්ධයෙන් ලෝක බැංකුව(WB), ආසියානු සංවර්ධන බැංකුව(ADB), ඕස්ට්‍රේලියානු ආධාර වැඩසටහන(AusAID) සහ යුනිසෙෆ් යන ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී. | 2012 අයවැය ඇස්තමේන්තු හරහා රු.මි. 200<br>2012 අයවැය යෝජනා හරහා රු.මි. 2,500<br>මුළු එකතුව රු.මි. 2,700 |

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහනවා, සෑම පාසලකටම පාසල් උපදේශන සේවා ඒකකයක් ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබෙනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, දැනට පාසල්වල උපදේශනය සඳහා සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක වනවා. නමුත් මම පිළිගන්නවා, එය ප්‍රමාණවත් නැහැ කියලා. කෙසේ නමුත් උපදේශනය සඳහා අවශ්‍ය පිරිස නොමැතිකම නිසා තමයි ඒ කටයුත්ත වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, උපදේශන සේවාව සඳහා ගුරුවරයෙක් නොවිය යුතුයි කියන උපදේශන මතය තිබෙනවා. එය ඉතා භාරදූර ක්‍රියාවක්; වග කීමක් පැවරිය හැකි ක්‍රියාවක්. සිසු දරු දැරියන්ගේ ප්‍රශ්න පිළිබඳව ඉතාම ළෙන්ගතුව සාකච්ඡා කරමින් ඒවාට පිළිතුරු සැපයෙන වැඩසටහනක් එය. ගරු කථානායකතුමනි, එය ඉතාම සූක්ෂ්මව සහ ක්‍රමවත්ව කළ යුතුයි කියන අදහස අප දරන නිසා ඉතා හෙමින් එය ක්‍රියාත්මක කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. පාසල් උපදේශන සේවාවන් සඳහා සෘජුවම මනෝ විද්‍යා උපාධිධාරීන් බඳවා ගැනීමට හැකියාවක් තිබේද කියලා මම අහනවා. මොකද, ගරු කථානායකතුමනි, මේ උපදේශන සේවාවන් දැනට සිදු කරන්නේ වෙන විෂයයන් භාරව සිටින ගුරුවරුයි. ඉතින්, ඒක එච්චර සාර්ථක වන්නේ නැහැ. මනෝ විද්‍යා ගුරුවරුන් බඳවා ගෙන ඒ සම්බන්ධව පාසල්වලට යොදවන්න පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා තමුන්නාන්සේලා කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, පෙර කී පරිදි උපදේශන සේවාවට ගුරුවරුන් යොදා ගැනීම සුදුසු නොවන බව උපදේශන සේවාවන් පිළිබඳ විශේෂඥයන්ගේ මතයයි. කෙසේ නමුත් සමාජ සේවා අමාත්‍යාංශය මඟින් උපදේශන සේවාවට පුහුණු කළ අය අපි හඳුනා ගෙන තිබෙනවා, ගුරුවරයෙක් මේ සඳහා යෙදෙව්වොත් ඒ සියලු කරුණු කාරණා විදුහල්පතිවරයාට හෙළිදරව් කරනවා. ඒ නිසා ඒවායේ රහස්‍යභාවය රැකීමට බාහිර පුද්ගලයෙක් යෙදිය යුතු වෙනවා. නමුත් බාහිර පුද්ගලයා පාසලට අනුගත කරන්නේ කෙසේද කියන කාරණය පිළිබඳව අපි දැඩි විමර්ශනයක යෙදී සිටිනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මගේ ප්‍රශ්නය අවබෝධ කර ගත්තේ නැහැ. පාසල්වල වෙනත් විෂයයන් භාරව සිටින ගුරුවරුන් මඟින් දැනට මේ උපදේශන සේවාවන් ක්‍රියාත්මක කරනවාය කියන එක ගැනයි මම ඇහුවේ. එතුමන්ලාට මේ පිළිබඳව මනෝ විද්‍යානුකූල හැඟීමක් හෝ දැක්මක් නැහැ. දෙමව්පියන් අහිමි වීම, ළමා අපචාර, මේවා පිළිබඳව ළමයින් දැනුමත් නොවීම ආදී ප්‍රශ්න ගණනාවක් පාසල්වල තිබෙනවා. ඒ නිසයි අපි කියන්නේ, මනෝ විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් මේ සඳහා බඳවා ගෙන විශේෂයෙන්ම දුෂ්කර පාසල්වල මේ උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය කියා. තමුන්නාන්සේලා ඒ සඳහා ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියන එකයි මම අහන්නේ. එහෙම නැතිව මේ සඳහා පිටින් බඳවා ගන්න එකක් ගැන නොවෙයි මම අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමාට පැහැදිලිව මම කිව්වා, උපදේශන සේවාවට ගුරුවරුන් සුදුසු නැතැයි කියා. ඒක තමයි පළමු වන කාරණාව.

දෙවන කාරණාව තමයි, ඉස්සර කාලයේ පාසල්වල සිටියේ සීමාසහිත ළමයින් ප්‍රමාණයක් විතරයි කියන එක. එතකොට ළමයාගේ දෙමව්පියන් පෞද්ගලිකව විදුහල්පතිවරයා හරි, ගුරුවරයා හරි හඳුනනවා. හැබැයි ඒ කාලයේ විදුහල්වල උපදේශන සේවාවකුත් ක්‍රියාත්මක වුණා. නමුත් අද සමාජයේ තිබෙන මේ වෙනසත් එක්ක උපදේශන සේවාවන් පාසල්වලට පමණක් නොවෙයි, යුද්ධයෙන් පස්සේ මුළු මහත් සමාජයටම අවශ්‍යයි. විපක්ෂයටත් උපදේශන සේවාවක් අවශ්‍යයි. තමුන්නාන්සේලාගේ නායකයින්ටත් උපදේශන සේවාවක් අවශ්‍යයි. ඒ නිසා මේ උපදේශන සේවා අතිශයින් වැදගත්. එය ක්‍රමානුකූල විය යුතුයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර ප්‍රශ්නයට සීමා කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අදාළ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නය කියලා එතුමාට කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

## බදුල්ල පළාත් මහ රෝහල : ප්‍රමිතියෙන් තොර ගොඩනැඟිල්ල

### பதுளை மாகாண வைத்தியசாலை: தர நியமமற்ற கட்டிடம்

### BADULLA PROVINCIAL HOSPITAL : SUBSTANDARD BUILDING

1876/'11

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බදුල්ල පළාත් මහ රෝහලේ සායන අංක 72 සහ 73 පවත්වාගෙන යනු ලබන දෙමහල් ගොඩනැඟිල්ලේ අත්තිවාරම ගිලා බැසීම නිසා එම ගොඩනැඟිල්ලට හානි සිදු වෙමින් පවතින බවත්;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) මෙම ගොඩනැඟිල්ල ප්‍රමිතියෙන් තොරව ඉදි කර ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැඟිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයින් හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම ඉදි කිරීම ලබා දුන් කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදුල්ල පළාත් මහ රෝහල ඉදි කිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර අදාළ කාර්මික නිලධාරී වාර්තාව ලබා ගෙන තිබේද;

(iii) එම රෝහලේ ගොඩනැඟිලි ඉදි කිරීමට අදාළව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாகாண வைத்தியசாலையில் 72 மற்றும் 73ஆம் இலக்க பிணி ஆய்வுப் பணிகள் நடைபெறும் இருமாடிக்கட்டிடத்தின் அத்திவாரம் புதைந்துவருவதன் காரணமாக இக்கட்டிடம் சேதமடைந்து வருகின்றதென்பதையும்;

(ii) இக்கட்டிடம் உரிய நியமமின்றி கட்டப்பட்டுள்ளதாக பிரதேச மக்கள் குறை கூறுகின்றனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இக்கட்டிட நிர்மாணத்துக்கான ஒப்பந்தத்தை வழங்குகின்றபோது கேள்விப்பத்திரம் கோரப்பட்டதா;

(ii) அவ்வாறாயின், கேள்விப் பத்திரங்களை முன்வைத்த நபர்கள் அல்லது நிறுவனங்களின் பெயர்கள் யாவை;

(iii) இந்த நிர்மாண வேலை வழங்கப்பட்ட ஒப்பந்தகாரரின் பெயர் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பதுளை மாகாண வைத்தியசாலையை நிர்மாணிப்பதற்கு செலவிடப்பட்ட மொத்தப் பணத்தொகை யாது;

(ii) நிர்மாண ஒப்பந்தகாரருக்கு பணம் செலுத்துவதற்கு முன்னர் தொழில்நுட்ப உத்தியோகத்தரின் அறிக்கை பெறப்பட்டதா;

(iii) இவ்வைத்தியசாலைக் கட்டிட நிர்மாணம் தொடர்பாக முறைசார்ந்த விசாரணையொன்றை நடத்த நடவடிக்கை மேற்கொள்வாரா

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the two-storeyed building of the Provincial Hospital at Badulla where clinics No. 72 and 73 are held, is getting damaged as a result of the caving in of the foundation of that building; and

(ii) the people of the area level allegations that the building has not been constructed in compliance with the required standards?

(b) Will he inform this House -

(i) whether tenders were called for the awarding of the contract for the construction of this building;

(ii) if so, the names of the persons or institutions that offered bids; and

(iii) the name of the person who was awarded the contract?

(c) Will he also inform this House -

(i) of the total amount of money spent on the construction of the Provincial Hospital at Badulla;

(ii) whether the Technical Officer's report has been obtained prior to making payments to the contractor; and

(iii) whether measures will be taken to hold a proper investigation regarding the construction of that hospital building ?

(d) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) සහ (ii) මෙම ගොඩනැඟිල්ල නියමිත ප්‍රමිතියකට ඉදි කර ඇති අතර එහි අත්තිවාරම ගිලා බැසීමකට ලක් වී නොමැත.

දැනට බදුල්ල රෝහලේ අංක 72 සහ 73 සායන පවත්වාගෙන යන ගොඩනැඟිල්ලේ ඌව පළාත් සභාව යටතේ පාලන ලිංගාශ්‍රිත රෝග සායනය සහ බිම් මහලේ මහ රෝහලට අයත් ශල්‍ය සායන පවත්වාගෙන යනවා. මේ ගොඩනැඟිල්ල දැන් ප්‍රයෝජනයට ගන්නවා.

(ආ) (i) ඔව්.

(ii) එම ටෙන්ඩර් කැඳවීම් දිගු කාලයකට ඉහතදී එනම් 1998 - 1999 වකවානුව තුළදී සිදු කර ඇති බැවින් අදාළ වාර්තා මේ වන විට නොමැත.

(iii) බිම් මහල - නෝඩ් ඉංජිනියරිං කොන්සොටිය, හම්බන්තොට.

පළමු මහල - යමුනා කන්ස්ට්‍රක්ෂන්, බදුල්ල.

(ඇ) (i) බිම් මහල - රුපියල් 3,234,838.88

පළමු මහල - රුපියල් 2,750,000.00

(ii) ඔව්.

(iii) ගොඩනැඟිල්ල යහපත් තත්ත්වයේ තිබෙන බැවින් එවැනි පරීක්ෂණයක් අවශ්‍ය නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මා මෙම ප්‍රශ්නයේ සඳහන් කර තිබෙන වාට්ටු දෙක අයත් එම ගොඩනැඟිල්ලේ අත්තිවාරමත් ඒ වාගේම වටේට දමා තිබෙන pavement එකෙත් ගිලා බැසීමක් නැහැ කියලා ඔබතුමා සඳහන් කරනවා. මා ඔබතුමාට මේ ඡායා රූප එවන්නම්. කරුණාකර, මේ ගැන පරීක්ෂණයක් කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහනවා. උත්තරය දෙන්නේ නිලධාරින් නේ. මා මේ තොරතුරු දුන්නොත් ඔබතුමාට මේ ගැන හොයලා බලන්න පුළුවන්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඒක ගැන සොයා බලන්න ඔබතුමාටත් පුළුවන්. මොකද, නිලධාරින් දෙන උත්තරයෙන් පමණක් මා සෑහීමකට පත් වුණේ නැහැ. මම ඔබතුමාට රෝහල් අධිකාරිගේ දුරකථන අංකය දෙන්නම්. මේක ගැන මා ඇහුවා. අවුරුදු ගණනකට කලින් සුළු ඉරි තැලීමක් සිදු වෙලා තිබෙනවා. මේ රෝහලේ අධ්‍යක්ෂ රත්නපුරයේ හිටපු අධ්‍යක්ෂවරයෙක්. මම එතුමාගෙන් ඇහුවාම ඒ කාලයේ පොඩි ඉරි තැලීමක් වෙලා ඒක සම්පූර්ණයෙන් හදලා තිබෙනවාය කිව්වා. මේකේ කියලා තිබෙනවා, "රෝහලේ මෙම ගොඩනැඟිල්ලේ ඉහළ මහල ගොඩ නැඟීමෙන් පසු කල් ගතවීමේදී බිම් මහලේ බිත්ති සුළු ඉරි තැලීමකට ලක් වී ඇති අතර, ඒවා රෝහලේ සුළු නඩත්තු යටතේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරු මඟින් අලුත්වැඩියා කරන ලදී. කෙසේ නමුත් මෙම ගොඩනැඟිල්ලේ කිසිදු ගරා වැටීමක් දක්නට නොමැති අතර, එහි අත්තිවාරම ගිලා බැසීමකට ලක් වී නොමැත. එහෙත් යහපත් තත්ත්වයේ තිබෙන බැවින් සායන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ" යන්න. මම මේක වෛද්‍ය අධිකාරීතුමාගෙනුත් ඇහුවා. ඔබතුමාටත් ඕනෑ නම් ඒ වෛද්‍ය අධිකාරීතුමාගේ දුරකථන අංකය දෙන්නම්. අපි ලිපිගොනු අනුවම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මම ඇහුවා මේකේ සායන පවත්වන්න බැරි තත්ත්වයක් තිබෙනවාද කියලා. එහෙම කිසිම ගිලා බැසීමක් නැහැ. ඒ වෛද්‍ය අධිකාරීතුමා තමයි මේ රෝහලේ කටයුතු කරන්නේ. ඊට එහා දෙයක් නැහැ නේද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

දුරකථන අංකයත් දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මම හිතන්නේ, ඔබතුමාට ලණුවක් දීලා තිබෙනවාය කියායි. මේක දකුණේ ප්‍රශ්නයක් වුණා නම් හරි. ඔබතුමා බදුල්ලේ ප්‍රශ්නයකට අත ගහන්න ගිහිල්ලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

එතුමා මුල් උත්තරේදී කියපු නැති කාරණයක් අතුරු ප්‍රශ්නයේදී කිව්වා, බිත්තිවල යම් ඉරි තැලීමක් වෙලා තිබෙනවාය කියලා. අපි දන්නවා, පොඩි ඉරි තැලීමකින් පටන් අරගෙන තමයි ලොකු තත්ත්වයකට පත් වෙන්නේ කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

විපක්ෂයත් හැම දාම එහෙමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තවත් අහන්න දෙයක් තිබෙනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ, ඔබතුමා මට ඒ අංක ටික දෙනවා වාගේම-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මෙතුමා ප්‍රශ්නය අහන කල් පොඩ්ඩක් ඉන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අහගෙන ඉන්නය කියා කියන්න බැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ,-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වාගේ තමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔහොම ඉන්න කෝ පොඩ්ඩක්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම අහන්නේ, ඔබතුමා ඔය දුරකථන අංක දෙනවා වාගේම මා මේ දෙන ඡායා රූප සහ තොරතුරු ටික අරගෙන ඔබතුමාට පරීක්ෂණයක් කරන්න පුළුවන්ද කියලායි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඡායා රූප දුන්නොත් බලන්නම්. එහෙම කිසි දෙයක් නැහැ. රෝගීන්ට හොඳ ප්‍රතිකාර කෙරෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ඡායා රූප ටික දෙන්න. හොඳයි. දෙන්නාගේම උනන්දුව ගැන ස්තුතියි.

ප්‍රශ්න අංක 14 - 2134/'11- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා. ලංකාවේ ප්‍රධානතම අපනයන කර්මාන්තය පිළිබඳව ඔබ වැදගත් ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ. ඒ නිසා එයට වැදගත් ලෙස උත්තරයක් දෙන්න ඕනෑ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අය වැයත් එක්කම පිළිතුර ලැබෙයි.

ප්‍රශ්න අංක 15 - 2188/'11 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උත්තර ලැබෙන්නේ නැති ප්‍රශ්නවලට අය වැයේදී පිළිතුරු ලැබෙනවාද, ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා, අය වැය වෙන කල් ඉන්න ඕනෑ නැහැ කියලා හිතාගෙන.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ගරු මන්ත්‍රීතුමනි, නැවතත් ඔබේ වාරය.

## ලංකා විදුලිබල මණ්ඩලය : පාරිභෝගිකයන්
## இலங்கை மின்சார சபை : நுகர்வோர்
CEYLON ELECTRICITY BOARD : CONSUMERS

1133/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවා සපයනු ලබන සමස්ත විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයෙන් සේවය ලබා ගන්නා පාරිභෝගිකයන් අතරින් ගෘහස්ථ, රජයේ ආයතන, කාර්මික ආයතන, ආගමික ආයතන සහ වෙනත් යන කාණ්ඩවලට අයත්වන පරිභෝගික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පරිභෝගික කාණ්ඩයේ විදුලි පරිභෝජනය සමස්ත නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා වූ පසුගිය වර්ෂ තුනක කාලය තුළ ඉහත (අ)(ii) හි සඳහන් පාරිභෝගික කාණ්ඩවලින් අයකරන ලද විදුලිය සඳහා වූ ගාස්තු ප්‍රමාණයන් කවරේද;

(ii) ඉහත සඳහන් කාල සීමාව තුළ ගාස්තු ප්‍රමාණයන්හි වෙනස්කම් ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 ජනවාරි මස සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මසකට ලැබූ පාඩුව කොපමණද;

(ii) ඉහත සඳහන් විදුලි පාරිභෝගික කාණ්ඩ එකිනෙක මගින් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ පාඩුවට දායක වී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස හා තථ්‍ය වටිනාකම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையிடமிருந்து மின்சாரத்தினைப் பெறும் நுகர்வோர்களின் மொத்த எண்ணிக்கையினையும்;

(ii) வீட்டுப் பாவனை, அரசாங்க நிறுவனங்கள், கைத்தொழில் நிறுவனங்கள், மத நிறுவனங்கள் மற்றும் ஏனையோர் எனும் வகைகளின் கீழுள்ள இ.மி. சபையின் நுகர்வோர்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(iii) மொத்த உற்பத்தியின் நூற்றுவீதமாக ஒவ்வொரு நுகர்வோரினதும் மின்சார நுகர்வினையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இற்றை வரையிலான கடந்த மூன்று வருடங்களில், (அ) (ii) வகையில் அடங்கும் நுகர்வோர்களிடமிருந்து அறவிடப்பட்ட கட்டணத்தினையும்;

(ii) மேற்குறிப்பிட்ட காலப்பகுதியில் ஏற்பட்ட கட்டண மாற்றங்களை ஒரு நூற்றுவீதமாகவும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2011 சனவரியிலிருந்து இற்றைவரை இ.மி.சபைக்கு ஏற்பட்ட மாதாந்த நட்டத்தினையும்;

(ii) இ.மி.சபைக்கு ஏற்பட்ட நட்டத்திற்கு மேற்குறிப்பிட்ட ஒவ்வொரு நுகர்வோர் வகையும் கொண்டிருந்த பங்களிப்பினை நூற்றுவீதமாகவும் உண்மையான பெறுமதியிலும் வெவ்வேறாகவும்

அவர் இச் சபைக்கு அறியத் தருவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state -

(i) the total number of electricity consumers served by the Ceylon Electricity Board;

(ii) the number of consumers of the CEB coming under the categories separately as domestic, Government institutions, industrial institutions, religious institutions and others; and

(iii) the consumption of electricity by each user category as a percentage of the total production ?

(b) Will he also state -

(i) the rates charged for the electricity from the user categories in (a)(ii) above for the last three years to date; and

(ii) the changes of rates during the aforesaid period as a percentage?

(c) Will he inform this House -

(i) the loss incurred by the CEB per month from January 2011 to date; and

(ii) the contribution by each of the aforesaid user category of electricity to the loss in the CEB in percentages and actual values separately?

(d) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉන්නවා නේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඔබතුමා පළමු වටයේදී ප්‍රශ්න අහන වේලාවේදී හිටියේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක ඔබතුමාට බලපාන්නේ නැහැ. මම පාර්ලිමේන්තුවේ ඉන්නවා. නිකම් උද්ධච්චකම පෙන්වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉවසීමෙන් කටයුතු කළොත් ඒවා හරි. සාමාන්‍යයෙන් දෙවන වටය යන කොට සභාගත කිරීම තමයි මේ පාර්ලිමේන්තුවේ තිබුණු සම්ප්‍රදාය. ඇමතිතුමා කැමැති නම් ඒකට පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
උද්ධච්චකම තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේටයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමා කැමැති නම් පිළිතුර දෙන්න පුළුවන්.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මම එම පිළිතුර සභාගත කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මෙතැන ඉන්න නිසා පිළිතුරු දෙන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම එකක් නැහැ. දෙවන වටයේදී සහාගත කිරීම තමයි සිදු කෙරෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔහොම ඉන්න, ඔහොම ඉන්න. කියන කල් ඉන්නේ නැහැ නේ. අපි පසු ගිය කාලයේ තීරණයක් ගත්තා, දෙවන වටයේ මන්ත්‍රීතුමා පැමිණියොත් පිළිතුරු දීම සුදුසුයි කියලා. මම හිතන්නේ, පිළිතුරු දුන්නාට වරදක් නැහැය කියලායි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, එතුමා මුලින් පැමිණියේ නැහැ. නැත්නම් අපේ පිළිතුර සූදානම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලින් තිබුණු සම්ප්‍රදාය අනුව ඒක හරි. නමුත් -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඔබතුමාගේ ඉල්ලීම අනුව අපි එහෙම කරන්නම්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඇමතිතුමා කොච්චර නිහතමානීද? බලන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තූතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය මගින් විදුලිය සැපයෙන මුළු පාරිභෝගිකයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| වර්ෂය | ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ප්‍රදේශවල සිටින පාරිභෝගිකයින් සංඛ්‍යාව | ලංකා විදුලි පෞද්ගලික සමාගම සේවා සපයන ප්‍රදේශය තුළ පාරිභෝගිකයින් සංඛ්‍යාව | සමස්ත පාරිභෝජනය |
|---|---|---|---|
| 2008 | 4,088,900 | 439,520 | 4,528,420 |
| 2009 | 4,280,168 | 449,825 | 4,729,993 |
| 2010 | 4,480,423 | 458,137 | 4,938,560 |
| 2011 | 4,717,448 | 471,571 | 5,189,019 |

(ii) කාණ්ඩය අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| | ලංකා විදුලිබල මණ්ඩලය සේවා සපයන ප්‍රදේශය තුළ | | | | ලංකා විදුලි පෞද්ගලික සමාගම සේවා සපයන ප්‍රදේශය තුළ | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පාරිභෝගික කාණ්ඩය | 2008 | 2009 | 2010 | 2011 | 2008 | 2009 | 2010 | 2011 |
| ගෘහස්ත | 3,608,347 | 3,781,674 | 3,958,829 | 4,165,738 | 378,303 | 387,091 | 394,164 | 404,032 |
| පොදුකාර්ය General Purpose | 415,867 | 430,341 | 449,270 | 475,380 | 55,070 | 56,849 | 58,410 | 62,113 |
| කර්මාන්ත Industries | 40,030 | 42,234 | 45,059 | 47,529 | 3,924 | 3,623 | 3,270 | 3,112 |
| ආගමික | 24,150 | 25,419 | 26,763 | 28,320 | 2,173 | 2,222 | 2,257 | 2,274 |
| වෙනත් (හෝටල්, වීදි ආලෝකකරණය වැනි) | 506 | 500 | 502 | 481 | 50 | 40 | 36 | 40 |
| එකතුව | 4,088,900 | 4,280,168 | 4,480,423 | 4,717,448 | 439,520 | 449,825 | 458,137 | 471,571 |

(iii) මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස එක් එක් පාරිභෝගික කාණ්ඩයේ විදුලි පරිභෝජනය පහත දැක්වේ

| පාරිභෝගික කාණ්ඩය | පරිභෝජනය දළ උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලංකා විදුලිබල මණ්ඩලය | | | | ලංකා විදුලි පෞද්ගලික සමාගම | | | |
| | 2008 | 2009 | 2010 | 2011 | 2008 | 2009 | 2010 | 2011 |
| ගෘහස්ත | 27.8457 | 29.1743 | 29.2888 | 29.3112 | 4.7470 | 4.8472 | 4.6948 | 4.4240 |
| පොදුකාර්ය | 15.8469 | 16.5655 | 16.3711 | 16.7158 | 2.7876 | 2.9852 | 3.0054 | 3.0795 |
| කර්මාන්ත | 27.0478 | 25.4807 | 26.7874 | 27.1600 | 2.3634 | 2.1554 | 2.1747 | 1.9951 |
| ආගමික | 0.4242 | 0.4453 | 0.4480 | 0.4424 | 0.0707 | 0.0708 | 0.0653 | 0.0694 |
| වෙනත් (හෝටල්, වීදි ආලෝකකරණය වැනි) | 2.4341 | 2.4185 | 2.3987 | 2.3248 | 0.6565 | 0.6173 | 0.5507 | 0.4944 |
| **මුළු (පාරිභෝජනය)** | **73.5986** | **74.0842** | **75.2940** | **75.9542** | **10.6252** | **10.6760** | **10.4909** | **10.0625** |
| විදුලි හානිය | 14.9884 | 14.5821 | 13.4964 | 13.0552 | 0.7878 | 0.6578 | 0.7187 | 0.9282 |
| මුළු එකතුව | 88.5870 | 88.6663 | 88.7904 | 89.0094 | 11.4130 | 11.3337 | 11.2096 | 10.9906 |

(ආ) (i) පාරිභෝගික කාණ්ඩවලින් විදුලිබලය සඳහා අය කරන ලද ගාස්තු ප්‍රමාණයන් අමුණා ඇති පහත ලේඛනවල දැක්වේ.

1. අයක්‍රම සටහන - 2008 මාර්තු 15 දිනට පෙර (ඇමුණුම 1)
2. අයක්‍රම සටහන - 2008 මාර්තු 15 දින සිට 2008 නොවැම්බර් මස 01 දක්වා (ඇමුණුම 2)
3. අයක්‍රම සටහන - 2008 නොවැම්බර් මස 01 දිනට පසු (ඇමුණුම 3)
4. අයක්‍රම සටහන - 2011 ජනවාරි 1 සිට මේ දක්වා (ඇමුණුම 4)
5. 2012 පෙබරවාරි මස 16 සිට බල පැවැත්වෙන ඉන්ධන ගැලපුම් ගාස්තුව (ඇමුණුම 5)

(ii) 2009 සහ 2010 වර්ෂවල අයක්‍රමයේ වෙනසක් සිදු නොවීය. 2011 වර්ෂයේ ඇති කළ අයක්‍රම වෙනස්කම් මගින් අයක්‍රම ව්‍යුහයේ වෙනසක් ඇති විය, එනම් අයක්‍රම කොටස්වල වෙනස්කම් ඇති වීම සහ සමහර කාණ්ඩ සඳහා භාවිත කාලය මත පදනම්වූ අයක්‍රමයක් හඳුන්වා දීමය. එබැවින් ප්‍රතිශතමය වැඩි වීමේ අර්ථාන්විත සංසන්දනයක් සිදු කිරීමට නොහැකිය.

2012 පෙබරවාරි මස විදුලිබලය මත ඉන්ධන ගැලපුම් ගාස්තු හඳුන්වා දීම හේතුවෙන් 2011 සිට 2012 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව ඇති වූ ගාස්තු ප්‍රමාණයන්ගේ වෙනස්කම් පහත පරිදි වේ.

| ගෘහස්ථ පාරිභෝගිකයින් | ඉන්ධන ගැලපුම් ගාස්තුව, % |
|---|---|
| 0-30 (ඒකක/මාස) | 25 |
| 31-60 (ඒකක/මාස) | 35 |
| 60ට වැඩි (ඒකක/මාස) | 40 |

| කර්මාන්ත සහ අනෙකුත් පාරිභෝගිකයින් | ඉන්ධන ගැලපුම් ගාස්තුව, % |
|---|---|
| කර්මාන්ත | 15 |
| හෝටල් | 15 |
| පොදු කාර්ය | 25 |
| රජයේ විශ්ව විද්‍යාල සහ රජයේ වෘත්තීය පුහුණු ආයතන | 25 |

පහතින් දක්වා ඇති කාණ්ඩ සහ පාරිභෝගිකයින් ඉන්ධන ගැලපුම් ගාස්තුවලින් නිදහස් කර තිබේ

- ආගමික කාණ්ඩය
- වීදි ආලෝකකරණය
- රජයේ රෝහල්
- රජයේ පාසල්

(ඇ) (i) 2011 ජනවාරි සිට 2012 ජූනි දක්වා ලංකා විදුලිබල මණ්ඩලයට මසකට දැරීමට සිදු වූ පාඩුව ඇමුණුම -6 හි දක්වා තිබේ. * ඇමුණුම සභාගත කරමි.

(ii) ඉහතින් දක්වන ලද එක් එක් කාණ්ඩය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව වෙත දක්වන ලද දායකත්වය ප්‍රතිශතයක් ලෙස සහ තථ්‍ය අගයයන් පහත දක්වා තිබේ.

| 2011 වර්ෂය | රුපි/කිවොපැ | | | | | |
|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය විකුණුම් මිල | සාමාන්‍ය පිරිවැය | ඒකකයක ලාභය/(පාඩුව) | අලෙවි කළ ඒකක ගණන (මිලියන්) | මුළු ලාභය/(පාඩුව) | % |
| ගෘහස්ත | 9.92 | 19.82 | (9.90) | 3,379 | (33,451) | -174% |
| කර්මාන්ත කටයුතු | 12.77 | 12.40 | 0.36 | 3,131 | 1,138 | 6% |
| පොදු කාර්ය | 21.63 | 14.37 | 7.26 | 1,927 | 13,998 | 73% |
| හෝටල් | 14.81 | 11.08 | 3.73 | 159 | 595 | 3% |
| ලෙකෝ | 11.73 | 11.08 | 0.64 | 1,267 | 815.01 | 4% |
| වීදි ආලෝකකරණය | - | 16.36 | (16.36) | 109 | (1,776) | -9% |
| ආගමික කටයුතු | 6.96 | 18.33 | (11.37) | 51 | (585) | -3% |
| **සාමාන්‍ය** | **13.25** | **15.17** | **(1.92)** | **10,023** | **(19,266)** | **-100%** |

| 2012 වර්ෂය (ජූනි මාසය දක්වා) | රුපි/කිවොපැ | | | | | |
|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය විකුණුම් මිල | සාමාන්‍ය පිරිවැය | ඒකකයක ලාභය/(පාඩුව) | අලෙවි කළ ඒකක ගණන (මිලියන්) | මුළු ලාභය/(පාඩුව) | % |
| 0-30 | 3.49 | 34.10 | (30.61) | 680 | (20,810) | -67% |
| 31-60 | 6.27 | 30.35 | (24.07) | 495 | (11,910) | -39% |
| 61-90 | 11.69 | 28.42 | (16.73) | 287 | (4,804) | -16% |
| 91-120 | 31.66 | 25.57 | 6.10 | 129 | 786 | 3% |
| 121-180 | 37.49 | 25.54 | 11.95 | 95 | 1,132 | 4% |
| 181> | 51.98 | 24.48 | 27.50 | 83 | 2,295 | 7% |
| | | | | | | |
| ගෘහස්ත | 11.76 | 27.53 | (15.77) | 1,769 | (27,886) | -90% |
| ආගමික | 6.89 | 25.75 | (18.86) | 27 | (509) | -2% |
| පොදු කාර්ය | 24.93 | 19.83 | 5.10 | 1,018 | 5,198 | 17% |
| රජයේ | | | | | | |
| කාර්මික | 13.82 | 17.22 | (3.40) | 1,618 | (5,505) | -18% |
| හෝටල් | 16.24 | 15.39 | 0.85 | 79 | 67 | 0% |
| වීදි ආලෝකකරණ | - | 22.55 | (22.55) | 54 | (1,219) | -4% |
| ලෙකෝ | 13.74 | 15.39 | (1.65) | 652 | (1,074) | -3% |
| **සාමාන්‍ය** | **15.14** | **21.07** | **(5.93)** | **5,218** | **(30,929)** | -100% |

(ඈ) පැන නොනගී.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

****සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:*
*Annexes tabled:*

**Annex : 01**

## CEYLON ELECTRICITY BOARD

*Tariff rates effective from 1st February 2007*

**Domestic**

| | Unit Rate | Fixed Charge |
|---|---|---|
| Block 1 - First 30 units | Rs. 3.00 per unit | Rs. 60.00 |
| Block 2 - 31 - 60 units | Rs. 4.70 per unit | Rs. 90.00 |
| Block 3 - 61- 90units | Rs. 7.50 per unit | Rs. 120.00 |
| Block 4 - 91 - 180 units | Rs. 14.00 per unit | Rs. 180.00 |
| Block 5 - Above 180 units | Rs. 19.80 per unit | Rs. 240.00 |

**Religious Purpose**

| | | Fixed Charge |
|---|---|---|
| Block 1 - First 30 units | Rs. 2.50 per unit | Rs. 60.00 |
| Block 2 - 31 - 90 units | Rs. 3.70 per unit | Rs. 90.00 |
| Block 3 - 91 - 180 units | Rs. 6.50 per unit | Rs. 180.00 |
| Block 4 - Above 180 units | Rs. 10.20 per unit | Rs. 240.00 |

| | General Purpose | Industrial | Industrial (Time of Day) | Hotel (GP) | Hotel (Industrial) | Hotel (I) (Time of Day) |
|---|---|---|---|---|---|---|
| **Supply at 400/230V** | | | | | | |
| **Contract Demand < 42kVA** | | | | | | |
| Unit Charge (Rs/unit) | 11.90 | 8.50 | 16.00 (peak)<br>7.90 (off peak) | 11.90 | | |
| Fixed Charge (Rs/month) | | | | | | |
| upto 10 kVA | 240.00 | 240.00 | 240.00 | 240.00 | | |
| above 10 kVA | 500.00 | 500.00 | 500.00 | 500.00 | | |
| **Supply at 400/230V** | | | | | | |
| **Contract Demand >=42kVA** | | | | | | |
| Unit Charge (Rs/unit) | 11.80 | 8.10 | 22.00 (peak)<br>7.50 (off peak) | 11.80 | 8.10 | 22.00 (peak)<br>7.50 (off peak) |
| Demand Charge (Rs/kVA) | 480.00 | 400.00 | 380.00 | 480.00 | 400.00 | 380.00 |
| Fixed Charge (Rs/month) | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 |
| **Supply at 11/33/132 kV** | | | | | | |
| Unit Charge (Rs/unit) | 11.70 | 8.00 | 20.00 (peak)<br>7.10 (off peak) | | 8.00 | 20.00 (peak)<br>7.10 (off peak) |
| Demand Charge (Rs/kVA) | 460.00 | 380.00 | 360.00 | | 380.00 | 360.00 |
| Fixed Charge (Rs/month) | 3000.00 | 3000.00 | 3000.00 | | 3000.00 | 3000.00 |

**Bulk Supplies to LECO**

| | Unit charge Rs/unit | Demand Charge Rs/kVA |
|---|---|---|
| **L1 - Supply at 400/230V** | 10.80 | 240.00 |
| **L2 - Supply at 11kV & above** | 7.50 | 220.00 |

**Street Lighting** Rs. 10.00 per unit

*Peak period - from 6.30 p.m to 9.30 p.m each day*
*Off peak period - from 9.30 p.m to 6.30 p.m the following day.*

**Fuel Adjustment Charge - 20%**

A Fuel adjustment Charge of 20% will be charged on all units consumed by all electricity consumers except for Domestic & Religious Purpose consumers who consume less than 90 units per month and all Industrial Consumers.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

**Annex : 02**

**CEYLON ELECTRICITY BOARD**

*Tariff rates effective from 15th March 2008*

| Tariff category | | Unit charge (Rs/kWh) | Fixed charge (Rs/month) | Demand charge (Rs/kVA) |
|---|---|---|---|---|
| **Domestic Purpose** | | | | |
| For those who consume - | | | | |
| upto 30 units per month | | 3.00 | 60.00 | |
| in excess of 30 and up to 60 units per month | | 4.00 | 90.00 | |
| in excess of 60 and up to 90 units per month | | 5.50 | 90.00 | |
| in excess of 90 and up to 120 units per month | | 10.00 | 90.00 | |
| in excess of 120 and up to 180 units per month | | 11.00 | 90.00 | |
| in excess of 180 and up to 240units per month | | 15.00 | 90.00 | |
| in excess of 240 and up to 360 units per month | | 18.00 | 90.00 | |
| in excess of 360 and up to 600 units per month | | 21.00 | 90.00 | |
| above 600 units | | 25.00 | 3000.00 | |
| **Religious Purpose** | | | | |
| For those who consume - | | | | |
| upto 30 units per month | | 2.50 | 60.00 | |
| in excess of 30 and up to 60 units per month | | 3.00 | 90.00 | |
| in excess of 60 and up to 90 units per month | | 4.50 | 90.00 | |
| in excess of 90 and up to 120 units per month | | 9.00 | 90.00 | |
| in excess of 120 and up to 180 units per month | | 10.00 | 90.00 | |
| in excess of 180 and up to 240 units per month | | 14.00 | 90.00 | |
| in excess of 240 and up to 360 units per month | | 15.00 | 90.00 | |
| in excess of 360 and up to 600 units per month | | 20.00 | 90.00 | |
| above 600 units | | 22.00 | 3000.00 | |
| **LECO** | | | | |
| L-1 | | 12.00 | | 675.00 |
| L-2 | | 8.50 | | 650.00 |
| **General Purpose** | | | | |
| GP1 | | 15.00 | 240.00 | |
| GP2 | | 13.80 | 3000.00 | 750.00 |
| GP3 | | 13.60 | 3000.00 | 675.00 |
| **Industrial Purpose** | | | | |
| I-1 | | 10.00 | 240.00 | |
| I-2 | | 8.10 | 3000.00 | 675.00 |
| I-3 | | 8.00 | 3000.00 | 650.00 |
| I-2(TD) | peak | 22.00 | 3000.00 | 650.00 |
| | off peak | 7.50 | | |
| I-3(TD) | peak | 20.00 | 3000.00 | 650.00 |
| | off peak | 7.10 | | |
| **Hotel Prurpose** | | | | |
| H-1(GP) | | 15.00 | 240.00 | |
| H-2(GP) | | 13.80 | 3000.00 | 750.00 |
| H-2 (I) | | 8.10 | 3000.00 | 675.00 |
| H-3 (I) | | 8.00 | 3000.00 | 650.00 |
| H-2(I-TD) | peak | 22.00 | 3000.00 | 650.00 |
| | off peak | 7.50 | | |
| H-3(I-TD) | peak | 20.00 | 3000.00 | 650.00 |
| | off peak | 7.10 | | |
| **Standby Tariff** | | | | |
| I-2(ST) | | 8.10 | 3000.00 | 675.00 |
| I-3(ST) | | 8.00 | 3000.00 | 650.00 |
| **Street Lights** | | 19.00 | | |
| **3 part Time of Day tariff** | | | | |
| **Industrial/ Hotel Purpose** | | | | |
| I-2(TD3) | peak (1830hrs - 22.30 hrs) | 23.00 | 3000.00 | 650.00 |
| | day (04.30hrs -18.30hrs) | 7.30 | | |
| | off peak (rest of the time) | 5.30 | | |
| I-3(TD3) | peak(18.30hrs- 22.30hrs) | 21.00 | 3000.00 | 650.00 |
| | day (04.30hrs -18.30hrs) | 6.90 | | |
| | off peak (rest of the time) | 5.00 | | |

Fuel Adjustment Charge - 30%

A Fuel adjustment Charge of 30% is charged on all units consumed by all consumers except for Domestic & RP consumers consuming less than 90 units per month

**Annex : 03**

## C.E.B. TARIFF - EFFECTIVE FROM 01-11-2008

| DOMESTIC - | | Unit Rate | Fixed Charge |
|---|---|---|---|
| Block 1 - | First 30 units | @ Rs 3.00 per unit | Rs. 60.00 |
| Block 2 - | 31 - 60 units | @ Rs 4.70 per unit | Rs. 90.00 |
| Block 3 - | 61 - 90 units | @ Rs 7.50 per unit | Rs. 120.00 |
| Block 4 - | 91 - 180 units | @ Rs 16.00 per unit | Rs. 180.00 |
| Block 5 - | 181 - 600 units | @ Rs 25.00 per unit | Rs. 240.00 |
| Block 6 - | Above 600 units | @ Rs 30.00 per unit | Rs. 240.00 |

A discount of Rs. 30/= will be given for the consumers usuing electricity less than 90 units per 30 day billing period with effect from 10/11/2008.

| RELIGIOUS & CHARITABLE INSTITUTIONS:- | | | |
|---|---|---|---|
| Block 1 - | First 30 units | @ Rs 2.50 per unit | Rs. 60.00 |
| Block 2 - | 31 - 90 units | @ Rs 3.70 per unit | Rs. 90.00 |
| Block 3 - | 91 - 120 units | @ Rs 9.00 per unit | Rs. 180.00 |
| Block 4 - | 121 - 180 units | @ Rs 10.00 per unit | Rs. 180.00 |
| Block 5 - | Above 180 units | @ Rs 12.50 per unit | Rs. 240.00 |

A discount of Rs. 30/= will be given for the consumers usuing electricity less than 90 units per 30 day billing period with effect from 10/11/2008.

| OTHER CATEGORIES | General Purpose | Industrial | Industrial / Hotel Industrial (Time of Day - Two Part) | Industrial / Hotel Industrial (Time of Day - Three Part) | Hotel (GP) | Hotel (Industrial) |
|---|---|---|---|---|---|---|
| **Rate - 1**<br>**Supply at 400/230V**<br>**Contract demand**<br>**< or = 42 kVA** | | | | | | |
| Unit Charge (Rs/unit) | 15.00<br>+ | 10.50<br>+ | | | 15.00<br>+ | |
| Fixed Charge(Rs./Month) | 240.00 | 240.00 | | | 240.00 | |
| **Rate - 2**<br>**Supply at 400/230V**<br>**Contract demand**<br>**above 42 kVA** | | | | | | |
| Unit Charge (Rs/unit) | 13.80<br>+ | 9.30<br>+ | 8.40 (9.30 pm to 6.30 pm) + 24.60 (6.30 pm to 9.30 pm) + | 7.30 (4.30 am to 6.30 pm) + 23.00 (6.30 pm to 10.30 pm) + 5.30 (10.30 pm to 4.30 am) + | 13.80<br>+ | 9.30<br>+ |
| Demand Charge (Rs/kVA) | 750.00<br>+ | 675.00<br>+ | 650.00<br>+ | 650.00<br>+ | 750.00<br>+ | 675.00<br>+ |
| Fixed Charge(Rs./Month) | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 |
| **Rate - 3**<br>**Supply at 11 kV & above** | | | | | | |
| Unit Charge (Rs/unit) | 13.60<br>+ | 9.10<br>+ | 8.00 (9.30 pm to 6.30 pm) + 23.00 (6.30 pm to 9.30 pm) + | 6.90 (4.30 am to 6.30 pm) + 21.00 (6.30 pm to 10.30 pm) + 5.00 (10.30 pm to 4.30 am) + | | 9.10<br>+ |
| Demand Charge (Rs/kVA) | 675.00<br>+ | 650.00<br>+ | 650.00<br>+ | 650.00<br>+ | | 650.00<br>+ |
| Fixed Charge(Rs./Month) | 3000.00 | 3000.00 | 3000.00 | 3000.00 | | 3000.00 |

| Bulk Supplies to LECO | Unit Charge Rs/unit | | Demand Charge Rs/kVA |
|---|---|---|---|
| **L1 - Supply at 400/230 V** | 12.00 | + | 675.00 |
| **L2 - Supply at 11kV & above** | 8.50 | + | 650.00 |

FAC collected by LECO shall be transferred to CEB.

**Street Lighting** @ Rs 19.00 per unit

F.A.C. - 30% on unit charges, for the Domestic (those who consume above 90 units), General Purpose, Hotel Tariff - General Purpose and Street Lighting.
15% on unit charges, for the Industrial category and Hotel Tariff - Industrial category. (effective from 10/11/2008 to 31/12/2008)
Exempted the Industrial category and Hotel Tariff - Industrial category from FAC of 15% for the period 01/01/2009 to 09/11/2009)

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

**Annex : 04**

## Table 32: Approved Tariffs for Sales to end-use Customers for the Period 1st January 2011 to date

| Customer Category and consumption per month | Energy Charge (LKR/kWh) | Fixed Charge (LKR/ month) | Maximum Demand Charge per month (LKR/kVA) |
|---|---|---|---|
| **Domestic (D-1)** | | | |
| 0-30 | 3.00 | 30 | - |
| 31-60 | 4.70 | 60 | - |
| 61-90 | 7.50 | 90 | - |
| 91-120 | 21.00 | 315 | - |
| 121-180 | 24.00 | 315 | - |
| >180 | 36.00 | 315 | - |
| **Religious (R-1)** | | | |
| 0-30 | 1.90 | 30 | - |
| 31-90 | 2.80 | 60 | - |
| 91-120 | 6.75 | 180 | - |
| 121-180 | 7.50 | 180 | - |
| >180 | 9.40 | 240 | - |
| Street lighting | 15.60 | - | - |

| Customer Category and the time interval, if applicable | Energy Charge (LKR/kWh) | Fixed Charge (LKR/ month) | Maximum Demand Charge per month (LKR/kVA) |
|---|---|---|---|
| **Industry (I)** | | | |
| I-1 | 10.50 | 240 | - |
| I-2 | | | |
| Day | 10.45 | | |
| Peak | 13.60 | 3,000 | 850 |
| Off-peak | 7.35 | | |
| I-3 | | | |
| Day | 10.25 | | |
| Peak | 13.40 | 3,000 | 750 |
| Off-peak | 7.15 | | |
| **Hotel (H)** | | | |
| H-1 | 19.50 | 240 | - |
| H-2 | | | |
| Day | 13.00 | | |
| Peak | 16.90 | 3,000 | 850 |
| Off-peak | 9.10 | | |
| H-3 | | | |
| Day | 12.60 | | |
| Peak | 16.40 | 3,000 | 750 |
| Off-peak | 8.85 | | |
| **General Purpose (G)** | | | |
| GP-1 | 19.50 | 240 | - |
| GP-2 | 19.40 | 3,000 | 850 |
| GP-3 | 19.10 | 3,000 | 750 |

**Annex : 05**

# PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

# NOTICE TO PUBLIC

## Imposition of Fuel Adjustment Charge on Electricity

In terms of Section 30 of the Sri Lanka Electricity Act, No. 20 of 2009, the consumers of electricity and the general public are hereby informed that, a Fuel Adjustment Charge (FAC) is imposed on the energy charge of monthly electricity bill of consumers falling under the Tariff categories listed below. This charge is imposed with a view to compensate for the additional costs incurred by Ceylon Electricity Board as the Electricity Transmission Licensee, as a result of fuel price revision on February 11, 2012. The Fuel Adjustment Charge will be imposed with effect from February 16, 2012 and will be effective until further notice.

| Domestic Consumers | Fuel Adjustment Charge, % |
|---|---|
| 0-30 (units/month) | 25 |
| 31-60 (units/month) | 35 |
| above 60 (units/month) | 40 |

| Industrial and Other Consumers | Fuel Adjustment Charge, % |
|---|---|
| Industrial | 15 |
| Hotel | 15 |
| General Purpose | 25 |
| Government Universities and Government Vocational Training Institutions | 25 |

The following categories and consumers are exempted from the Fuel Adjustment Charge

- Religious Category
- Street Lighting
- Government Hospitals
- Government Schools

*Note: Fuel Adjustment Charge is applied only on monthly energy charge. It is not applied on monthly fixed charge and monthly maximum demand charge.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා අහලා තිබෙන්නේ 2011 ජනවාරි මස සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මසකට ලැබූ පාඩුව කොපමණද කියලායි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
2012 ජුනි මාසය දක්වා දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
2011 වර්ෂයේ පාඩුව කොපමණද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
2011 ජනවාරි මාසයේ සිට 2012 ජුනි මාසය දක්වා ලාභය හෝ අලාභය ඔබතුමාට දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්තිමට 2012 ජුනි මාසයේ අලාභය කියන්න පුළුවන්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මා කියන්නම්. මා ඔබතුමාට දෙන්නම්, එක් එක් කාණ්ඩය මඟින් විදුලිබල මණ්ඩලය -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සමස්තයක් වශයෙන් අලාභය කොපමණද කියන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒකක 30 දක්වා රුපියල් බිලියන 20.8යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
2011 වර්ෂයේ අලාභය කියන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
2011 වර්ෂයේ සමස්ත පාඩුව රුපියල් බිලියන 19.2යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතකොට 2012 වසරේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
2012 වසරේ පාඩුව රුපියල් බිලියන 30.9යි. විදුලි පාරිභෝගික කාණ්ඩ එකිනෙක මඟින් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ පාඩුවට දායක වී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස අහලා තිබෙනවා. ඒ පිළිතුරත් දීර්ඝව තිබෙනවා. අවසාන කොටසට පිළිතුර "පැන නොනඟී".

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. ඔබතුමා මෙතැනදී දැනුවත් කළා, මේ මාස 6ට අලාභය රුපියල් බිලියන 30යි කියලා. ඒ කියන්නේ රුපියල් කෝටි 3,000යි කියලා. නමුත් ඔබතුමා රූපවාහිනී වැඩසටහනකදී බොහොම සවිස්තරව ප්‍රකාශයක් කළා. ඒකෙදී බොහොම අවංකව උත්තර දීලා තිබ්බා, එක මාසයක විතරක් අලාභය රුපියල් කෝටි 3,500ක් විතර වෙනවා කියලා. සමහර විට මම වැරදි වෙන්න පුළුවන්. නමුත් අද වන විට මම දන්නා විධියට -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඉතින්, මෙහෙමනේ ගරු මන්ත්‍රීතුමා. රුපියල් කෝටි 3,500 කියන්නේ බිලියන තුනහමාරනේ. බිලියන තුනහමාර 6න් වැඩි කළාම කීයද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොඩ්ඩක් ඉන්නකෝ. මම ප්‍රශ්නය ඇහුවේ නැහැනේ. මම දන්නා විධියට අද වන තුරු අලාභය රුපියල් කෝටි 18,200යි. සැප්තැම්බර් මාසය වන විට ඒ විධිය නම්, අවුරුද්ද අග වන විට අඩු ගණනේ ඒක රුපියල් කෝටි 21,000ක් විතර වෙයි. ඒ කියන්නේ රටේ සමස්ත ආරක්ෂක වියදමම එක ආයතනයක අලාභයක් වෙලා තිබෙනවා. කරුණාකර ඔබතුමාට කියන්න පුළුවන්ද, මේ වාගේ අලාභයක් තිබෙනවා නම් කොහොමද ඒක නිවැරදි කරන්නේ, කොහොමද ජනතාවට ප්‍රශ්නයක් ඇති නොවන විධියට ඒක කළමනාකරණය කරන්නේ කියලා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, අපට තිබෙන්නේ ක්‍රමික සැලැස්මක්. ඇත්තටම 2012 වසරේදී අපි සැලසුම් කරපු ආකාරයට 2015 වසර වන විට ලංකා විදුලිබල මණ්ඩලය පාරිභෝගිකයාටත් අවුලක් නොවන ආකාරයට මූල්‍යමය වශයෙන් පාඩු හෝ ලාභ නොලබන ආකාරයට නිෂ්ක්‍රීය තත්ත්වයකට පත් කර ගන්නවා. ඒකට අසාමාන්‍ය තත්ත්වයක් ඇති වුණා. මොකද, අපි කලින් සැලසුම් කළා, මේ වසරේ සාමාන්‍යයෙන් අවශ්‍ය විදුලිය ප්‍රමාණයෙන් සියයට 35ක් පමණ ජල විදුලියෙන් නිපදවන්න පුළුවන් වෙයි, ඉතිරි ටික අපි තාප විදුලියෙන් සපයනවාය කියලා. ඒ තත්ත්වය මත සහ ඉන්ධන ගාස්තු වැඩි නොවේය කියන වාතාවරණය තුළ අපට මේ වසරේ අය ක්‍රමය වෙනස් කරන්න දුන්නේ නැහැ. ඒ අනුව රුපියල් බිලියන 15ක පමණ අලාභයක් අපි බලාපොරොත්තු වුණා. ඒක ලංකා විදුලිබල මණ්ඩලයට මූල්‍යමය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද, ලංකා විදුලිබල මණ්ඩලයේ ක්ෂය වීමේ ප්‍රමාණය අවුරුද්දකට බිලියන 17යි. එම නිසා ඒ depreciation එක ඇතුළේ මේ තත්ත්වය තිබෙන නිසා මූල්‍යමය වශයෙන් cash flow එකට ඒක ප්‍රශ්නයක් නොවෙයි කියන පදනමින් තමයි අපි ගියේ.

පෙබරවාරි 16 වන දා ඉන්ධනවල ඇති වෙච්ච වෙනස නිසා විදුලිබල මණ්ඩලයට දරන්නට සිදු වෙච්ච අතිරේක බර නිසා තමයි මේ ප්‍රමාණය වෙනස් වෙලා තිබෙන්නේ. ඒ වාගේම අප සියයට 65ක් තාප විදුලියෙන් කරන්නට බලාපොරොත්තු වුණාට තාප විදුලිය සියයට 85 දක්වා ඉහළට ගියා. ඒක අසාමාන්‍ය තත්ත්වයක්. ඒක මේ නියඟය නිසා ඇති වෙච්ච අසාමාන්‍ය තත්ත්වයක්. එසේ නැතිව මේ කළමනාකාරිත්වයේ ප්‍රශ්නයක් නොවෙයි. දැන් මේ තත්ත්වය හමුවේ අප ඒ බර කෙළින්ම ජනතාවට දමන්නේ නැතිව අප සැලැස්මක් හදා තිබෙනවා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් අපේ අමාත්‍යාංශයත් ලංකා බැංකුවත් මහජන බැංකුවත් එකතු කර ගෙන 2015 වන විට අනුක්‍රමයෙන් මේ තත්ත්වය අඩු කර ගන්න. මොකද, අපට ගල් අඟුරු බලාගාරයේ දෙවන පියවර එනවා. ඊළඟ අවුරුද්දේ තුන්වන පියවර එනවා. ඒ අනුව අපට මේ අධික ඉන්ධනවලින් දුවන බලාගාර වෙනුවට ලාභදායි බලාගාර ආවාම ඒ තත්ත්වය 2015 වර්ෂය වෙන විට සමනය වෙයි කියා අප හිතනවා. එක පාරට මේ ආපු ප්‍රවණතාව ආපසු හරවන්නට බැහැ. ක්‍රමයෙන් මේක කර ගන්නට තමයි අප බලාපොරොත්තු වන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා පිළිගත්තා, මේ වන විට කෝටි 18,200ක අලාභයක් තිබෙනවාය කියා?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඔව්. දැන් කිව්වේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වක්‍රශීලීව කිව්වේ. ඍජුව භාර ගත්තේ නැහැ. මොකද, මම ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයේදී -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඉතින් මම කිව්වා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම අගය කරනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය වන්නේ මේකයි. 2010 ජූනි මාසයේ 19 වනදා අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහ සරත් අමුණුගම අමාත්‍යතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ගිවිසුමක් අත්සන් කළා. මේ කාරණයට බලපාන නිසා එහි 4වන පිටුවේ 8වන පරිච්ඡේදය මම කියවන්නම්.

"Improving the performance and efficiency of loss-making state enterprises will help free resources for infrastructure investment and lending to the private sector. Newly reconstituted management in key public enterprises is expected to improve the performance of these enterprises. A separate Ministry of State Resources and Enterprise Development has been established to concentrate on under-performing state assets and addressing the issues in loss-making enterprises."

[*Interruption.*] - Hon. Speaker, the Hon. Minister may intervene if he wants to, but I do not want others with subservient attitudes to join the Hon. Minister in trying to create a problem in this Parliament. - [*Interruption.*] මම මගේ ප්‍රශ්නයයි අහන්නේ.

It further states,I quote:

"Electricity prices are comparatively high ….."

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. ඔය පැහැදිලි කිරීම්වලට එතරම් ඉඩ දෙන්නට බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔබතුමන්ලාව දැනුවත් කර තිබෙනවා, මෙය අලාභයට අරගෙන යන්න බැහැ; පෞද්ගලීකරණයට යොමු කරන්න; නැත්නම් මිල වැඩි කරන්න කියා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
නැහැ. නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ දෙකෙන් එකක් වෙන්නේ නැත්නම් සල්ලි දෙන්නේ නැහැ කියනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
2010 ඕක අත්සන් කළාය කියා මිල වැඩි කළේ නැහැනේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉන්නකෝ මම විස්තර කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර කරන්නට බැහැ ගරු මන්ත්‍රීතුමා කෙළින්ම ප්‍රශ්නය අහන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
එතුමා කතාවක් පවත්වන්නේ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවදා ද මේ අලාභය අඩු කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අන්න එහෙම අහන්න. [බාධා කිරීම්]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා කලබල නැතිව ඉවසීමෙන් ඉන්නකෝ. නායකත්වයට යන අය බොහොම ඉවසීමෙන් කථා කරන්න එපා යැ. මේක අහගන්නකෝ.

ගරු කථානායකතුමනි, මේ බලශක්ති ක්ෂේත්‍රය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමන්ලා ප්‍රශ්න අහන ආකාරයත්, පිළිතුරු දෙන ආකාරයත් රටම බලා ගෙන ඉන්නවා. ඒ නිසා කාටත් පිළිගත හැකි වන විධියට ප්‍රශ්න අහන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මේ බලශක්ති ක්ෂේත්‍රයේ විජ්ජා පෙන්වන්න, මැජික් කරන්න අමාරුයි. ඒකට හේතුව මේකයි. බලශක්තිය දුවන්නේ තෙල්, ගල් අඟුරු, ගෑස් මත. මේවා අපේ රටේ නිෂ්පාදනය වන දේවල් නොවෙයි. මේවා අප පිටින් ගේන්නේ. අපේ විදුලිබල ශක්තියෙන් සියයට 85ක් නිෂ්පාදනය කරන්නේ මේවායින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්දියාවටත් දෙනවා කිව්වා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
කවුද කිව්වේ? කිව්වේ ජේ.ආර්. ජයවර්ධන. ඒක මතක තියා ගන්න. ඒ, 1985 දී. [බාධා කිරීමක්] අසත්‍ය කියන්න එපා. අපි නම් කිව්වේ නැහැ. ඒ තමුන්නාන්සේලාගේ ජේ.ආර්. ජයවර්ධන කිව්වේ. අප නොවෙයි කිව්වේ. [බාධා කිරීම්] ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. ජේ.ආර්. ජයවර්ධන කිව්වේ. ඔබතුමා ඉතිහාසය ගැන දන්නේ නැහැ. නායකත්වයට පොර කන කොට එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය ගැන දැන ගෙන ඉන්න. [බාධා කිරීම්] හරි, හරි. පොඩ්ඩක් ඉන්න.

ගරු කථානායකතුමනි, මේ බලශක්ති ප්‍රභේද නැති වෙන ඒවා. මේ බලශක්ති ප්‍රභේද -තෙල්,ගල් අඟුරු, ගෑස්- තව අවුරුදු 30කින් ඉවරයි. ඒ නිසා කාටවත් මේකේ මිල උච්චාවචනය පාලනය කරන්න බැහැ. ඒ නිසා මේ බර ජනතාවට දමනවාද, එහෙම නැත්නම් මේක රජය දරා ගන්නවාද කියන ප්‍රතිපත්තිය ආවාට පස්සේ අපටත් පුළුවන් අය ක්‍රමය වෙනස් කරලා, ගණන වැඩි කරලා ලංකා විදුලිබල මණ්ඩලය ලාභ ලබන තත්ත්වයට පත් කරන්න; වාණිජ පදනමින් ගෙන යන්න. ඒක අමාරු වැඩක් නොවෙයි. එහෙම තමයි ගෙනිච්චේ. එක්සත් ජාතික පක්ෂය කරන්න ගියේ එහෙමයි. ඔවුන් කළේ එහෙමයි. ඒ වාණිජ පදනමින් අප මේක ගෙන යන්නේ නැහැ. ඒ මොකද? රටේ කර්මාන්තවලට, පාසල්වලට, අනික් ස්ථානවලට සහනශීලී පියවරක් අනුගමනය කරන්න ඕනෑ නිසා. ඒ නිසා අප වෙන උපක්‍රමයක් අනුගමනය කර තිබෙනවා. ඒ මොකක්ද? අපේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

විදුලිබල අර්බුදයක් ආපු හැම වෙලාවේම පෞද්ගලික අංශයට කථා කරලා වැඩි මිලට විදුලිය මිලදී අරගෙන ඒ හරහා මූල්‍ය අර්බුදයක් හදපු එක තමයි මීට කලින් කළේ. ඒ වෙනුවට නිෂ්පාදන වියදම හැකි තාක් දුරට අඩු කරන්න අපි දැන් උත්සාහ කර තිබෙනවා. මොකද, ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම්වලින් සියයට 80ක්ම නිෂ්පාදන වියදම. එතකොට ඒක අඩු කර ගන්න නම් ලාභදායී නිෂ්පාදන ක්‍රමවලට යන්න ඕනෑ. අන්න ඒ සඳහා තමයි අප ක්‍රමක්‍රමයෙන් බලන්නේ ගල් අඟුරු, ඒ වාගේම ද්‍රව වායු හඳුන්වා දීම මඟින් මේ අධික මිල සහිත ඩීසල් බලාගාර භාවිතය හැකි තාක් දුරට අවම කර ගන්න. ඉතින් මේ වර්ෂාවේ ප්‍රශ්නය නිසා, පසු ගිය කන්න තුනක් එක දිගට වැසි -මෝසම් වැසි තුනක් අඛණ්ඩවම- නොලැබීම නිසා සුවිශේෂී අසාමාන්‍ය තත්ත්වයක් ඇති වුණා. සියයට 85ක්, 90ක්ම තෙල්වලින් විදුලිය නිපදවන්න සිද්ධ වුණා. ඒ බර රජය දරා ගත්තා මිසක් මහජනයාට භාර දුන්නේ නැහැ.

ගොවියාට නියං සායට සහනාධාර දෙනවා නේ. හැබැයි නියඟය ඇති වුණා කියලා ලංකා විදුලිබල මණ්ඩලයට කවුරුවත් සහනාධාර දීලා නැහැ. ඒ වාගේම විදුලිබල මණ්ඩලය අප

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

කොහොම හරි අරගෙන ගිහින් තිබෙනවා. විසි හතර පැයේම විදුලියත් බොහොම අමාරුවෙන් අප සපයා ගෙන යනවා. ඒ අතරේ අප ජනතාවගෙන් ඉල්ලීමක් කළා විදුලිය ඉතිරි කරන්න කියලා. ජනතාව එයට හොඳ ප්‍රතිචාරයක් දක්වලා තිබෙනවා. අපේ පාරිභෝගිකයින් පනස් ලක්ෂයෙන් විසි ලක්ෂයක් අපත් එක්ක එකතු වෙලා විදුලිය ඉතිරි කරලා තිබෙනවා. විදුලිය ඉතිරි නොකළා නම් මේ පාඩුව මීටත් වඩා වැඩි වෙන්න තිබුණා.

මාස තුනක් ඇතුළත රුපියල් බිලියන 4.3ක් ඩීසල්වලින් ඉතිරි කර දීලා තිබෙනවා. අපි ඒ වාගේ වෙහෙස මහන්සි වෙලා ක්‍රමක්‍රමයෙන් දෙපැත්තෙන්ම ඉතිරි කරගෙන යනවා ගරු කථානායකතුමනි. ජනන වියදම් අඩු කරනවා. ඒ වාගේම විදුලිය ඉතිරි කිරීමේ ක්‍රමවේදවලට යනවා. 2015 දක්වා සියයට 10කින් පමණ විදුලිය ඉතිරි කිරීමකට යන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ විධියට ගිහිල්ලා 2015 වෙන කොට මෙය සම මට්ටමකට ගෙනෙන්නයි අප බලාපොරොත්තු වන්නේ. එහෙම නොකර අපටත් තිබුණා 2002-2004 වාගේ මිල සූත්‍රයක් දෙන්න. මිල සූත්‍රයක් දීලා ලෝක වෙළෙඳ පොළේ මිල උච්චාවචනයන් කෙළින්ම මහ ජනයාට භාර දෙන්න තිබුණා. අපි එහෙම කළේ නැහැ. මේ රජය එහෙම කළේ නැහැ. අපි පියවරෙන් පියවර ගිහින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා මතක් කරන්න ඕනෑ 1977-1994 කාලයේ සියයට සියයක් නොමිලේ ලැබෙන ජලයෙන් විදුලිය නිපදවලාත් දහතුන් ගුණයකින් විදුලිය බිල ඉහළ ගිය බව. ඒ විධියට අපි ක්‍රියා කරලා නැහැ. අද විදුලිය නිපදවන්න ජලයෙන් විතරක් බැහැ. ජලයෙන් විදුලිය නිපදවන ප්‍රමාණය සියයට 20, සියයට 15 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වෙනුවට තෙල්වලිනුයි විදුලිය නිපදවන්නේ. ඒක පාලනය කරන්න අනිවාර්යයෙන්ම කාටවත් බැහැ. මොකද, ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක ලෝක මට්ටමේ තිබෙන ප්‍රශ්නයක්. කොටින්ම කිව්වොත් ඒක මේ ශිෂ්ටාචාරයේම තිබෙන ප්‍රශ්නයක්. මේ අධික තෙල් මිලට, ගල් අඟුරු මිලට, ඒ වාගේම ගෑස් මිලට මුහුණ දෙන්නේ කොහොමද කියන එක අද ලෝකය පුරාම තිබෙන ප්‍රශ්නයක්. ඒක දේශපාලන සටන් පාඨවලින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් යම් විධිමත් සැලැස්මකට අනුව, කෙටි කාලීනව, මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව අප ක්‍රියා කරන බව කියන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර ප්‍රමාණවත්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. කිසිසේත් ඒක පිළිගන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් තවත් ටිකක් කියන්න දෙන්නද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ ගරු කථානායකතුමනි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය කෙටියෙන් අහන්න. කෙටියෙන් පිළිතුර දෙන්න. එතකොට හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, මා කෙටියෙන් අහන්නම් ගරු කථානායකතුමනි.

තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා ඒ බර රජය දරා ගන්නවා කියලා. මොන අසත්‍යයක්ද? මෙහි එකම කොටස්කරුවා ජනතාව. ජනතාවට රුපියල් කෝටි 18,200ක බරක් දීලා ඊට පස්සේ කියනවා රජය දරාගන්නවා කියලා. අන්තිමට මේකට පව් ගෙවන්න වෙලා තිබෙන්නේ ජනතාවට නේ. මා මේ අවස්ථාවේදී කියන්නේ මේකයි. ඡන්දය දුන්නු ඡන්දදායකයන්ට මහින්ද චින්තනය තුට්ටු දෙකකට වටින්නේ නැති ප්‍රකාශයක් බවට පත් වෙලායි තිබෙන්නේ. මෙවර පළාත් සභා ඡන්දය කාලයේ අල මිල අඩු කළා. දැන් රුපියල් 20කින් වැඩි කළා. ටින් මාළු මිල අඩු කළා. ඔන්න ආයෙත් වැඩි කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පළාත් සභා ඡන්දයේදී මොකද වුණේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තෙල් මිල අඩු කරනවා කිව්ව ඔබතුමන්ලා තෙල් මිල අඩු කළේ නැහැ. කරුණාකර මට කියන්න කවදාද-[බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
බය වෙන්න එපා. හවසට "සිරස" දාවි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් ඇති.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මේ බර අපි ජනතාවට දාලා නැහැ. අපේ පළමුවැනි පරමාර්ථය මේ රටේ ඉන්න 51,00,000ක් වූ පාරිභෝගිකයන්ට කෙසේ හෝ විසිහතර පැයේම විදුලිය දීමයි. තවත් ලක්ෂ තුනක පමණ ජනතාවක් විදුලිය නැතිව ඉන්නවා.

දෙවැනි පරමාර්ථය, ඒ අයට විදුලිය ලබා දීමයි. අතිගරු ජනාධිපතිතුමා ඒ ධුරය භාර ගන්නා අවස්ථාවේ අපට හිටියේ විදුලි පාරිභෝගිකයන් 43,00,000යි. දැන් අපට විදුලිය පාරිභෝගිකයෝ 52,00,000ක් ඉන්නවා. පසු ගිය අවුරුදු දෙකේ විතරක් අපි 5,00,000ක් වූ ජනතාවට අලුතින් විදුලිය දීලා තිබෙනවා. විදුලිය දීලා භූමි තෙල්වලින් ඒ අය මුදා ගෙන තිබෙනවා. භූමි තෙල්වලට

රුපියල් 500ක්, 600ක් මාසයකට වැය කරපු අය ඒකක 30ට අඩුවෙන් පාවිච්චි කරනවා නම් අද විදුලිය බිල හැටියට ගෙවන්නේ රුපියල් 150යි. ඒ ලක්ෂ තුනක් වූ පිරිසේ ජීවන බර අඩු කරලා තිබෙනවා. භූමි තෙල්වල තිබුණු යැපීම්භාවය අඩු කරලා තිබෙනවා. භූමි තෙල් සහනාධාරය අවශ්‍ය නැති තැනට අපි සමාජය පත් කරලා තිබෙනවා. ඒක මේ කවුරුත් පිළිගන්නවා. සෑම තැනකටම අපි විදුලි බලය ගෙන ගිහින් තිබෙනවා. ඒක තමයි මහින්ද චින්තනය.

විදුලිය කොළඹට විතරක් නොවෙයි, කොළඹ 7ට විතරක් නොවෙයි අද සෑම ගමකටම ගිහිල්ලා තිබෙනවා. ඔබතුමා දන්නවා හම්බන්තොට, ඒ වාගේම මාතර, ගාල්ල වාගේ දිස්ත්‍රික්කවල සෑම ගමක්ම අපි විදුලියෙන් ආවරණය කරලා තිබෙන බව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට පින් සිද්ධ වෙන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ජේ.ආර්. ජයවර්ධනට පින් සිද්ධ වෙන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] හැබැයි අපි -[බාධා කිරීම්] ඉන්න, කලබල වෙන්න එපා. [බාධා කිරීම්] ඔව්, ජේ.ආර්. ජයවර්ධනට පින් සිද්ධ වෙන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, පින යන තැනට යයි. දැන් අතුරු ප්‍රශ්න ඇති. ඊළඟට ප්‍රශ්න අංක 6.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, එතුමා දේශපාලන වශයෙන් මේගොල්ලෝ වාගේ අවලංගු කට්ටිය නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වැදගත් වැඩක් කළා. ඒක තමයි වාරිමාර්ග ක්ෂේත්‍රයට පමණක් යොදා ගත්ත මහවැලි ව්‍යාපාරය විදුලි බලයට යොමු කළ එක. එතුමා වැදගත් මෙහෙයක් කළා. ඒක අපි පිළිගන්නවා. ඒකේ කිසිම පැකිළීමක් නැහැ. හැබැයි මේ වාගේ පක්ෂග්‍රාහී කථා තමයි ඉවසන්න බැරි. මේ වාගේ අන්තවාදී, පක්ෂග්‍රාහී කථා තමයි ඉවසන්න බැරි. හැබැයි ඊට පස්සේ -[බාධා කිරීම්]

## පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලය : පවරා ගත් ඉඩම්
## பிட்டிபன மகிந்த ராஜபக்ஷ வித்தியாலயம்: காணிச் சுவீகரிப்பு
## PITIPANA MAHINDA RAJAPAKSA COLLEGE: LAND TAKEN OVER

2288/'12

6. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sunil Handunnetti)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) හෝමාගම, පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කළ බලයලත් නිලධාරියා කවුරුන්ද;

(iii) එම ඉඩමේ මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ප්‍රථම පදිංචිකරුවන් සිටියේද;

(iv) 1/7 බී, පිටිපන උතුර, හෝමාගම ලිපිනයෙහි වර්ෂ 35ක සිට පදිංචිව සිටින එම්. ඒ. අනුර මහතාගේ ඉඩමද ඉහත කටයුත්ත සඳහා පවරා ගෙන තිබේද;

(v) එම ඉඩම් පවරා ගැනීමේදී පදිංචිකරුවන්ට ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවරා ගෙන ඇති ඉහත ඉඩමේ පදිංචිකරුවන්ගේ විදුලිය මේ වන විට විසන්ධි කර ඇති බවත්;

(ii) ඔවුන් විසින් පාවිච්චි කරමින් සිටි ළිඳ වසා දමා ඇති බවත්;

(iii) එම ඉඩම් පවරා ගැනීමෙන් පසුව මතුව ඇති ඉහත තත්ත්වයන් නිසා එහි පදිංචිව සිටි පුද්ගලයන්ගේ ජීවත්වීමේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹோமாகம பிட்டிபன மகிந்த ராஜபக்ஷ வித்தியாலயத்தை நிர்மாணிப்பதற்காக காணிகள் சுவீகரிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி காணிகளை சுவீகரித்த அதிகாரம் வாய்ந்த உத்தியோகத்தர் யார் என்பதையும்;

(iii) மேற்படி காணியில் மகிந்த ராஜபக்ஷ வித்தியாலயம் நிர்மாணிக்கப்படுவதற்கு முன்னர் குடியிருப்பாளர்கள் இருந்தனரா என்பதையும்;

(iv) 1/7 பீ, பிட்டிபன வடக்கு, ஹோமாகம முகவரியில் 35 வருடங்களாக குடியிருக்கின்ற திரு.எம்.ஏ. அநுரவின் காணியும் மேற்படி நடவடிக்கைக்காக சுவீகரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) மேற்படி காணிகள் சுவீகரிக்கப்பட்ட போது குடியிருப்பாளர்களுக்கு வழங்கப்பட்ட சலுகைகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) சுவீகரிக்கப்பட்டுள்ள மேற்படி காணியில் குடியிருப்பவர்களது மின்சாரம் தற்போது துண்டிக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) இவர்கள் பயன்படுத்திய கிணறு மூடப்பட்டுள்ளதென்பதையும்;

(iii) மேற்படி காணிகள் சுவீகரிக்கப்பட்டதன் பின்னர் எழுந்துள்ள மேற்படி நிலைமைகளின் காரணமாக அங்கு குடியிருந்த ஆட்களின் வாழ்வதற்கான அடிப்படை உரிமை மீறப்பட்டுள்ளதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he state -

(i) the date on which the land was taken over to build Mahinda Rajapaksa College at Pitipana, Homagama;

(ii) the person in authority who took over the land;

(iii) whether there were any residents in the aforesaid land before the Mahinda Rajapaksa College was built;

(iv) whether the land of Mr. M.A. Anura, who has been residing at 1/7 B, Pitipana South, Homagama for 35 years, too has been taken over for the aforesaid purpose; and

(v) the relief granted to the residents when the aforesaid land was taken over ?

(b) Will he admit that -

(i) electricity supply provided to the residents of the aforesaid land which was taken over, has been disconnected by now;

(ii) the well which was used by them has been closed down; and

(iii) the fundamental rights to life of the residents of the aforesaid land have been violated as a result of the above-mentioned condition which arose after the aforesaid land was taken over ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීම සඳහාම විශේෂයෙන් ඉඩම් පවරා ගැනීමක් සිදු කර නැත. නමුත් 2007.07.26 දින ඉඩම් අත්කර ගැනීමේ පනතේ නියම කර ඇති ආකාරයට 2වන වගන්තිය ප්‍රදර්ශනය කර හෝමාගම නගර සංවර්ධනය සඳහා මාහේනවත්ත ඉඩම් අත් පත් කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

(ii) හෝමාගම ප්‍රාදේශීය ලේකම් (ඉඩම් ඇමතිතුමා විසින් ගැසට් පත්‍රයක් මඟින් අත් පත් නිලධාරි වශයෙන් පත් කර ඇත.)

(iii) ඔව්. අනවසර පදිංචිකරුවන් 02ක් පමණ සිටින බව වාර්තා වී ඇත.

(iv) එම්.ඒ. අනුර මහතා දැනට පදිංචිව සිටින ඉඩම් කොටසද ඇතුළත්ව පාසල් භූමිය සඳහා පවරා ගැනීමට නියමිතය. පදිංචි කාලය නිශ්චිතව නොදනී.

(v) ඉඩම් අමාත්‍යාංශයෙන් එවැනි සහනයක් ලබා දෙන ලෙස මෙතෙක් අත් පත් නිලධාරියාට දන්වා නැත. තවමත් ඉඩමේ පදිංචිව සිටී.

(ආ) (i) හා (ii) ඉහත පරිදි විදුලිය විසන්ධි කිරීමක් හෝ ළිඳ වසා දැමීමක් අත් පත් නිලධාරියා විසින් සිදු කර නොමැත.

(iii) නොදනී

(ඇ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව : නියෝග
### இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு: கட்டளைகள்
### HUMAN RIGHTS COMMISSION OF SRI LANKA : ORDERS

2785/'12

8. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියෝග රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන විසින් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ ගැටලුවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 17/2005 මඟින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණ කවරේද;

(ii) මේ වන විට එම අරමුණ ඉටු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2005.10.05 දින සිට මේ දක්වා ආරවුල් විභාග කිරීමෙන් පසු ලබාදී ඇති නියෝග සංඛ්‍යාව කොපමණද;

(ii) එම නියෝග අතරින් අදාළ රජයේ ආයතන සහ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කර ඇති නියෝග සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මඟින් දෙන ලද නියෝග ප්‍රකාරව කටයුතු සිදුවන්නේ ද යන්න පිළිබඳව පසු විපරමක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் வழங்கப்படும் கட்டளைகள் அரச திணைக்களங்கள் மற்றும் நிறுவனங்களினால் அமுல்படுத்தப்படாமை தொடர்பில் பிரச்சினைகள் நிலவுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் கட்டளைகளை அமுல்படுத்துதல் தொடர்பில் வெளியிடப்பட்டுள்ள அரசாங்க நிருவாக சுற்றறிக்கை 17/2005 இன் மூலம் நிறைவேற்றிக்கொள்ள எதிர்பார்க்கும் நோக் கங்கள் யாவை என்பதையும்;

(ii) தற்போது மேற்படி நோக்கங்கள் நிறைவேற்றப்படுள்ளனவா என்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(இ) (i) இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் 2005.10.05 ஆம் திகதி தொடக்கம் இற்றைவரையில் பிணக்குகள் விசாரிக்கப்பட்டதன் பின்னர் வழங்கப்பட்டுள்ள கட்டளைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி கட்டளைகளில் குறித்த அரச நிறுவனங்கள் மற்றும் உத்தியோகத்தர்களினால் அமுலாக்கப்பட்டுள்ள கட்டளைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் வழங்கப்பட்ட கட்டளைகளின் பிரகாரம் நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றதா என்பது பற்றிய பின்னாய்வுகள் மேற்கொள்ளபட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that there is a problem with regard to the non-implementation of the orders given to the Government departments and institutions by the Sri Lanka Human Rights Commission?

(b) Will he state -

(i) the aim that is expected to be achieved by the Public Administration Circular 17/2005 that has been issued pertaining to the implementation of the orders of the Sri Lanka Human Rights Commission; and

(ii) whether that aim has been achieved by now ?

(c) Will he inform this House -

(i) the number of orders given by the Sri Lanka Human Rights Commission upon investigating disputes from 05.10.2005 up to date;

(ii) out of those orders, the number of orders that have been implemented by the relevant government institutions and officials; and

(iii) whether follow-up action has been taken to ensure that the orders given by the Sri Lanka Human Rights Commission are implemented accordingly ?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පරීක්ෂණ හා විමර්ශන කිරීමෙන් අනතුරුව නිකුත් කරනු ලබන්නේ නියෝගයන් නොව නිර්දේශයන් ය. කොමිෂන් සභාවේ අරමුණ වන්නේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය ආයතන කළ යුතු කරුණක් බව තහවුරු කිරීම හා එහි වැදගත්කම පෙන්නුම් කිරීමයි.

(ii) ඔව්, යම්තාක් දුරට ඉටු වී තිබේ.

(ඇ) (i) ලබා දී ඇති නිර්දේශ පරිගණක දත්ත වාර්තා අනුව පහත පරිදි වේ.

| වර්ෂය | ලබා දී ඇති නිර්දේශ සංඛ්‍යාව |
|---|---|
| 2005 | 639 |
| 2006 | 886 |
| 2007 | 393 |
| 2008 | 339 |
| 2009 | 298 |
| 2010 | 74 |
| 2011 | 147 |

(ii) පරීක්ෂණ හා විමර්ශන කිරීමෙන් නිකුත් කරනු ලබන්නේ නිර්දේශ වේ. නිර්දේශවලින් ක්‍රියාත්මක කළ ප්‍රමාණය ස්ථිරව ප්‍රකාශ කිරීම අපහසු ය.

(iii) ඔව්, නිර්දේශ සම්බන්ධයෙන් කොමිෂන් සභාව මඟින් පසු විපරම් කරනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Mr. Speaker, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, අද අසා තිබෙන සමහර ප්‍රශ්න මීට මාස හයකට හතකට ඉස්සෙල්ලා තමයි අහලා තිබෙන්නේ. අපේ ස්ථාවර නියෝග අනුව නම්, සම්ප්‍රදාය අනුව නම්, අහන ප්‍රශ්නවලට ඒ වෙලාවේම පිළිතුරු දෙන්න ඕනෑ. අපේ ස්ථාවර නියෝග 27හි විශේෂයෙන්ම ප්‍රශ්න ගැනයි සඳහන් කරලා තිබෙන්නේ. ඒකේ කියන්නේ, ප්‍රශ්නයකට වාචික පිළිතුරක් ඉල්ලුවාම එවෙලේම පිළිතුරු දෙන්න ඕනෑ කියලායි. එතැන කල් ඉල්ලීමක් ගැන සඳහන් වෙන්නේ නැහැ.

Standing Order No. 27 states, I quote:

"…the reply will be then given by the Prime Minister or the Minister to whom the question is addressed."

I do not think we ever contemplated that a Question was going to take this long.

එය සිංහල භාෂාවෙන් තිබෙන්නේ මෙහෙමයි :

".... එවිට ප්‍රශ්න කරනු ලැබූ අග්‍රාමාත්‍යවරයා හෝ ඇමතිවරයා විසින් ඊට පිළිතුරු දෙනු ඇත."

I looked into it. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ නම් ප්‍රශ්නයක් ඇහුවාම එවෙලේම පිළිතුරු දෙනවා. නැත්නම් ආණ්ඩුව කියනවා පිළිතුරු දෙන්නේ නැහැ කියලා.

ඉතින් මෙතැනදී අපි ඒ සම්ප්‍රදාය පිළිගන්නවා. යම් කිසි කාල සීමාවක් තුළ දී පිළිතුරු දෙන්න ඕනෑ. සමහර ප්‍රශ්න ගැන ඇමතිවරු විශේෂයෙන්ම කියලා තිබෙනවා "මේ ප්‍රශ්න දිග වැඩියි, ලිඛිත පිළිතුරු දෙන්න ඕනෑ" කියලා. මම හිතන හැටියට ඒ ප්‍රශ්නය මතු කරන්න ඕනෑ ප්‍රශ්නය දුන්නාමයි. පළමුවැනි වතාවේම කියන්න ඕනෑ මේ ප්‍රශ්නය දිග වැඩියි, ඒ නිසා අපට මාස තුනක හතරක කාලයක් ඕනෑ, නැත්නම් අපි මේක ලිඛිත පිළිතුරක් හැටියට දෙනවා කියලා. අන්තිම අවස්ථාවේ එහෙම කියන එක වැරදියි. අන්න ඒ කාරණා දෙක ගැනයි කියන්නේ. නැත්නම් අපට ප්‍රශ්න ගණනාවකට පිළිතුරු ලැබෙන්නේ ප්‍රමාද වෙලා.

අනෙක් කාරණය මෙයයි. *Sub judice* රීතිය ගැනත් ඔබතුමා නැවත මේ ගරු සභාවට කරුණු පැහැදිලි කරන්න ඕනෑ. *Sub judice* rule කියන්නේ විශේෂයෙන්ම අධිකරණයේ නඩුවක් තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා නොකරන එකයි. ඒ ගැන අපි කිහිප වතාවක් කථා කළා. අන්තිමට රිචඩ් ද සොයිසා සම්බන්ධ විවාදයේ දී එවකට හිටපු කථානායක එම්.එච්. මොහමඩ් මැතිතුමා තීරණයක් දුන්නා, ඒක බලපාන්නේ අපරාධ නඩුවලට විතරයි කියලා. මොකද, අපරාධ නඩුවක චූදිතයකුට, නඩුවට කිසි විටෙක හානියක් වෙන්න හොඳ නැහැ. There should be no prejudice caused to the case of the accused because everyone is innocent until proven guilty. ඒක සිවිල් නඩුවලට බලපාන්නේ නැහැ. එතැනදී එතුමා කිව්වා 'බී' වාර්තාවලටත් ඒක බලපාන්නේ නැහැයි කියලා.

අද ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා අහපු 4වැනි ප්‍රශ්නයට අනුව, මම දන්නා හැටියට නම් කොටස් වෙළෙඳ පොළ පිළිබඳව අපරාධ නඩුවක් නැහැ. තිලක් කරුණාරත්න මැතිතුමා අපරාධ නඩුවක් දමන්න හැදුවාම එතුමාට සභාපතිකමෙන් යන්න සිදු වුණා. ඒ නිසා ඔබතුමා ඒ ගැන කියලා අපරාධ නඩුවක් තිබෙනවා නම්, ඒ නඩුව මොකක්ද කියලා නඩු නොම්මරය කියන්න. නැත්නම් පිළිතුරු දෙන්න. අකැමැති නම් පිළිතුරු නොදී ඉන්න. විශේෂයෙන්ම මේ කාරණා දෙක ගැන ඔබතුමාට මතක් කරන්න මම කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා අහපු කාරණාව ගැන අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. එතුමා ස්ථාවර නියෝග 26 සහ 27 ගැන කිව්වා. එහි යම් කිසි සංශෝධනයක් වී තිබෙන බව ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට අමතක වී තිබෙනවා. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කියන්නේ ප්‍රශ්නයක් න්‍යාය පුස්තකයට ඇතුළත් වී මන්ත්‍රීවරයා අසන අවස්ථාවේ දී ඇමතිවරයා උත්තර දිය යුතුය කියලායි. ඔබතුමා මෙච්චර කාලයක් පාර්ලිමේන්තුවේ හිටියා; මාත් හිටියා. දෙවැනි, තුන්වැනි අවස්ථා කරා යන්න අපි එකඟ වෙලා තිබෙනවා. එහෙම නම් ඒකත් ස්ථාවර නියෝගවලට පටහැනියි. If you take the position that it should be answered, then it is okay. We must be clear on what you are trying to raise. We will facilitate giving answer to a Question but sometimes, we need time.

ගරු කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය ගෙන එන්නට කැමැතියි, ස්ථාවර නියෝග අංක 29ට. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, ඒ වාගේම මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස් පළ කරන්න. Standing Order No. 29 (2) states, I quote:

"(2) A question must not be made the pretext for a debate."

Are we following that? Are you agreeable to follow that? These are questions over Parliamentary practice and procedure, on which we have extended and given enough room to adjust and the Chair decides on these matters. Just because you have asked a Question and the Government has asked for time, it does not imply that the Government is not ready to answer. We have given enough reasons because we have to collect information. Therefore, you should not rush and say that we are trying to avoid a Question. We have always obliged and answered every Question that you all have asked. When some Answers are already given as printed mattter, which are placed either in the Library or on the table of the MP, the Questions is asked and we still reply.

I would like to canvass, Hon. Speaker, that you appoint a Committee to go into these matters. New procedures must be evolved. We cannot be following these old practices, on which you can rest today with 225 MPs and a limited number of Sitting Days. This is one problem we are having. If all the backbenchers ask Questions, how can we list them? How can we search for information? So, Hon. Leader of the Opposition, I would like you to rethink of the issue that you canvassed on Standing Order No. 27, which we have already amended, with the consent of the House, to give time.

Secondly, as per Standing Order No. 29 (2), no debate is possible. You have agreed and I have agreed on that, but the House continues to have debates. So, Sir, we should reconsider all these matters if the issue is raised.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි. ගරු විපක්ෂ නායකතුමාත්, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත්-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Hon. Speaker, I do not think there is a serious disagreement between the Chief Government Whip and myself. I did not say that the Answer should be given immediately. I said that there must be a time limit. Okay, if you want time, you can ask for time once or twice. We do not mind that. But, as some Hon. Members pointed out, the time taken to answers some of the Questions has gone up to one year.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Over one year.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Yes, over one year. That is not possible and it is not good.

Secondly, with regard to the practice where some Ministers say, "We require a long time as this involves details", I think such issues can be taken up by the Minister at the very first time the Question is asked. He can say, "We will table it as a written answer". You can decide that at that stage. What I am saying is, do not wait till the last minute or after six months to say, "It requires a long answer." As far as what is considered an answer and what is considered a debate is concerned, the Chair has to finally decide. This is because in Sri Lanka, the nature of a Question is quite different from that of England, where it is a general Question that is asked. But, we are very specific; we even ask about someone's pension.

I certainly have no problem sitting down with the Hon. Member and talking of the time required. Another matter is, when Sittings were at 10 o'clock in the morning, everyone said, "We must sit in the afternoon because then we can finish our lunch and come back". Now, we sit in the afternoon, but it is the same number and the same Members. The few of us who were present in the morning then are the same Members who are now present in the afternoon. මාත් එකඟ වෙනවා. මේ ගැන හිතලා කටයුතු කරන්න ඕනෑ.

මම හතරවෙනි කාරණය හැටියට කිව්වේ විශේෂයෙන්ම stock exchange එකේ තිබෙන කාරණයක්. කොහොම වුණත් මම හිතන හැටියට මේක හොඳ අදහසක්. අපි වාඩි වෙලා සාකච්ඡා කරලා බලමු කොහොමද මේ ප්‍රශ්න විසඳා ගන්නේ කියලා. ඇත්ත වශයෙන්ම මම හිතන විධියට ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් න්‍යාය පුස්තකයේ තිබෙනවා. There are a whole lot of Questions in the Order Book. How do we cut through those?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කියන කාරණය වාගේම, ඔබතුමා සහ අපි සැලකිල්ලට ගත්තා ශෝක යෝජනා පිළිබඳ කාරණය. අපේ න්‍යාය පත්‍රයේ ශෝක යෝජනා පණහක්, හැටක් තිබුණා. නමුත් අපි දෙපාර්ශ්වයම එකඟ වෙලා ඔබතුමා පක්ෂ නායක කමිටුවේදී තීරණයක් දුන්නා ඒ කාලය සීමා කරලා කටයුතු කරන්න. ඒ අනුව අද පවතින ශෝක යෝජනා සංඛ්‍යාව දෙකකට පමණ අඩු කරලා තිබෙනවා. කාලය ගැන තිබෙන අර්බුදයට හරියාකාරව අවධානයට යොමු කරනවා නම්, සාකච්ඡා මඟින් අපට මේ ප්‍රශ්න හුඟක් විසඳා ගන්න පුළුවන්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, may I draw your attention to the fact that there is a Committee sitting on revision of the Standing Orders, of which I am also a Member. There have been certain suggestions made. I think the Committee originally sat under the Chairmanship of the Hon. Gitanjana Gunawardena.

Now, that apart, this Parliament is duty-bound to go by the Standing Orders that are before us. Sir, you have to only give a ruling by interpreting the Standing Orders that are in force at the moment.

With all due respect, the Hon. Leader of the Opposition misquoted Standing Order No. 27. It does not compel, as he says, any Minister to answer questions forthwith. The Minister has all the right to ask for a date, because perhaps he had to collect so many information, sometimes running into hundreds of pages. Therefore, it is not a new procedure. Even during the time of the UNP Government, of which I was a Member, the Prime Minister and other Ministers asked for longer time to answer Oral Questions. Sometimes, they never answered any question at all. That was the procedure that they followed which they thought was right at that time. You have to go by the Standing Orders that we are following. Standing Order No. 28 (1) states, I quote:

> "Provided that not more than three supplementary questions shall be asked on any answer : "

How many hundreds of questions are they asking in the morning? It is not three as stipulated in the Standing Orders. Then, there is another matter. As the Hon. Chief Government Whip pointed out, Standing Order No. 29 (2) states, I quote:

> "A question must not be made the pretext for a debate."

Now, today what happened? When a Question was asked from the Minister of Power and Energy by the Hon.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

Ravi Karunanayake, it went beyond the description of even a debate. Sir, that shall not be allowed. We have to strictly follow the Standing Orders. I am going to raise a point of Order everyday because they are asking more than three Supplementary Questions. Sir, you are very liberal; you are very generous and therefore, you are allowing it. But, it cannot be allowed. - [*Interruption.*] Wait, I am speaking; I am on my feet. We will strictly follow the Standing Orders and if there are any changes to be made, any deviations, then the Committee can sit, discuss and finalize the report and present it before Parliament. Until then, we cannot deviate from even one word of the Standing Orders, which is before us. Once again, I tell you that under Standing Order No. 27, the Minister has all the power to ask for time. It can be one month or it can be even one year. There is no time limit. Sir, after all, we follow this procedure. According to the Standing Orders, you cannot read papers; you cannot read your speech. But, we are deviating from that and doing it. Therefore, Sir, we will agree upon the revision of that Standing Order and then when it comes before the House, we can get the whole thing re-assessed. The British Parliament is quite different although we are following the Westminster system. These Standing Orders are quite different. Our Standing Orders are unique because they are relevant only to the Sri Lanka Parliament. We do not quote from other Parliaments to substantiate our arguments.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, the Hon. Member who spoke prior to me on a Standing Order, said that I had asked a Question from the Minister of Power and Energy and that it went on for long. Just because it is beyond his comprehension, it does not mean that I have got to ask questions that are in his mental framework. I ask questions on behalf of the people that we represent, we are not like him who has got to sing hosannas for dinner to survive in Parliament. That is the difference between the two.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අනවශ්‍ය දේවල් නොකියා අදාළ දේවල් පමණක් කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, there is another matter that I would like to bring to your notice.

ගරු කථානායකතුමනි, Securities and Exchange Commission එකේ දරුණු ප්‍රශ්නයක් තිබෙනවාය කියලා 2012 අගෝස්තු මාසයේ 21 වැනිදා මා ඔබතුමාව දැනුවත් කළා. ඒ අවස්ථාවේදී මම කිව්වා ඒ වෙනුවෙන් යෝජනාවක් ගෙනෙනවා කියලා. 2012 අගෝස්තු මාසයේ 21වැනිදා හැන්සාඩ් වාර්තාවේ 1061 තීරුවේ තිබෙනවා, ඒ යෝජනාව ගෙනෙන්න කියලා ඔබතුමා කියපු එක. ස්ථාවර නියෝග 23(1) යටතේ මම ඒ යෝජනාව ඉදිරිපත් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් නොවෙයි. ඒක හරි විධියට, නියම විධියට notice දීලා ඉදිරිපත් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Notice දීමක් මෙතැන නැහැ ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 23(1) යටතේ යෝජනාව ඉදිරිපත් කරන්න විතරයි තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳට ඒ වගන්තිය කියවලා බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට ඒක කිව්වා නම් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කියන්න දෙයක් නැහැ. මෙතැනට එන්න ඕනෑ ඒවා දැන ගෙන.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ යෝජනාව ගරු කථානායකතුමා ඉල්ලුවා; මම දෙනවා. එය හැන්සාඩ්ගත කරන්න. ඒ ඇති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ලිඛිතව හරි විධියට දෙන්න. ඒක ඒ තරම් අමාරුවක් නොවෙයි නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් දෙන එකේ වරදක් නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතකොට සම්ප්‍රදායයන් වෙනස් වෙනවා නේ. ඒ නිසා notice දෙන්න ලිඛිතව හරි විධියට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"Notice of questions or motions shall be given in writing, signed by the member giving the notice and addressed to the Secretary-General. Such notices may be handed to the Secretary -General at any time when Parliament is sitting or may be sent to or left at the Office of the Secretary-General at any time."

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලිඛිතව පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ලිඛිතව තමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලිඛිතව දුන්නොත් හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, it can be given in writing. So, that is why I am making this point. In Parliament, I am giving it. If you want, I can read it out or otherwise I will give -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නියම විධියට ලිඛිතව දෙන්න. ඊට පස්සේ අදාළ කටයුතු කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලිඛිතව මෙතැන තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලිඛිතව භාර දෙන්න. ඊට පස්සේ ඒක ආපසු Order Book එකට යන්න ඕනෑ. ඒ විධියට කටයුතු කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම දෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(3)ත් පොඞ්ඩක් කියවලා බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Stock Exchange එකේ හිටපු තිලක් කරුණාරත්න මහතා කිව්වා, "manipulated by a mafia" කියලා; ඒ mafia එක නිසා තමයි ඉල්ලා අස් වුණේ කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔන්න ඕක තේ වැරැද්ද. කියන්න හදන්නේ එකක්. කියන්නේ වෙනත් එකක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුව වාගේ තමයි, ගරු කථානායකතුමනි. ආණ්ඩුවත් මිල අඩු කරනවා කියනවා. නමුත් වැඩි කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ යෝජනාව හරි විධියට දෙන්න. එතකොට අවශ්‍ය කටයුතු කරලා වෙලාවක් දෙන්නම්.

විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා නැඟුවේ බොහොම වැදගත් ප්‍රශ්නයක්. අපේ ස්ථාවර නියෝග සංශෝධනය කරන්න දැන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව අවුරුද්දකටත් වැඩිය ගිහිල්ලා. අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාත් මෙතැන ඉන්නවා. අපි ඉල්ලීමක් කරනවා, පුළුවන් ඉක්මනින් ඒ සංශෝධන ටික හදලා මේ සභාවට ගෙනැල්ලා සම්මත කර ගනිමු කියලා. ඒ සම්බන්ධ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මේවා අවුරුදු ගණනාවක් පරණ ස්ථාවර නියෝග. ඒක නිසා ඒ ගැන අවධානය යොමු කරලා අපි කාගේත් යහපත වෙනුවෙන් ඉක්මනට මේ සංශෝධන ගෙනැල්ලා ස්ථාවර නියෝග ටික පිළියෙල කර ගනිමු කියලා මා ඉල්ලීමක් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න යටතේ ස්ථාවර නියෝග 26, 27, 28, 29 පිළිබඳව විරුද්ධ පාර්ශවයේ නායකතුමා ඉදිරිපත් කරපු කරුණුත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කරපු කරුණුත්, අනෙකුත් මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු කරුණුත් සැලකිල්ලට ගත යුතුයි. අපි අහන ප්‍රශ්නත්, ඒවාට ලැබෙන උත්තර මොනවාද කියලාත් රටේ ජනතාව බලා ගෙන ඉන්නවා. මේ කටයුත්ත ඉතා වග කීමකින් කෙරෙන්න ඕනෑ නිසා මම හිතන හැටියට මේක අපි පක්ෂ නායකවරුන්ගේ කමිටුවේදී හෝ සාකච්ඡා කරලා මේ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. ප්‍රශ්නවලට ඉක්මනින් පිළිතුරු දෙන්නත්, ඒ වාගේම අහන ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර ගන්නේ නැතුව අහන්නත් කටයුතු කළොත් මම හිතන හැටියට අහන ප්‍රශ්න සංඛ්‍යාව වැඩි කර ගෙන අනෙක් මන්ත්‍රීවරුන්ටත් සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්. හොඳයි, මේ කරුණ අවධානයට යොමු කරන්න.

මී ළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු එම්.එස්. තව්ෆික් මහතා, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பரீரா முஸ்லிம் மகளிர் அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) சட்டமூலம்
### BAREERAH MUSLIM LADIES ARABIC COLLEGE (INCORPORATION) BILL

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the Bareerah Muslim Ladies Arabic College."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 7 දක්වා අනුමත කිරීම, ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා.

## විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත : නියමය
## விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
## SPECIAL COMMODITY LEVY ACT : ORDER

[අ. භා. 2.14]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2)වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 මැයි 11 දිනැති අංක 1757/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, දේශීය වෙළඳ පොළ තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම පාලනය කිරීම සඳහා මෙරටට ආනයනය කරන ලද හඳුනා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ මත අය කෙරෙන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කරමින් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නිකුත් කරන ලද, මා පසුව සඳහන් කරන ගැසට් නිවේදන මේ ගරු පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ භාණ්ඩ වර්ග 32ක් සඳහා ගැසට් නිවේදන හතරක් මඟින් නිකුත් කරන ලද නියෝග යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක විය. එම ගැසට් නිවේදනයන්ගේ වලංගු කාලය කලින් කල අවසන් වන බැවින් පරිපාලනමය වශයෙන් පහසුවක් ඇති කිරීමට එකී ගැසට් නිවේදන එක් ගැසට් පත්‍රයක ඇතුළත් කිරීමට මෙම ගැසට් නිවේදන මඟින් පියවර ගෙන ඇත.

එයට අමතරව ශ්‍රී ලංකාව විසින් එකඟ වී ඇති ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට බලපෑමක් නොවන පරිදි කුඩා දොඩම් සඳහා ක්‍රියාත්මක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීමටත්, ඒ සඳහා සාමාන්‍ය බදු අය කිරීමටත්, දේශීය කර්මාන්තය ආරක්ෂා කිරීමේ අරමුණින් ලොකු ලූනු, බටානා පරිප්පු, මුං ඇට, කුරක්කන් සඳහා ආදේශකයක් වූ මිල සහ දේශීය පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා ආනයනික පාම් ඔයිල් මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉහළ නැංවීමටත් මෙම ගැසට් නිවේදනය මඟින් කටයුතු කර ඇත.

ඊළඟට, රට තුළ ඇති වී තිබෙන අයහපත් කාල ගුණ තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවක් මතු විය හැකි බැවින් ඊට විසඳුමක් ලෙස සහ පාරිභෝගික ජනතාවට සරිලන කඩිනම් සහනයක් ලෙස ආනයනික මාළු, හාල් මැස්සන්, කරවල, අර්තාපල්, බොම්බයි ලූනු සහ ටින් මාළු සඳහා අය කරන බදු අනුප්‍රමාණ පරිදි ගැසට් කර ඇත.

ඊළඟට, අන්තර් ජාතික වෙළෙඳ පොළේ ආනයනික සීනිවල මිල ගණන් පහළ යාමත්, දේශීය සීනි නිෂ්පාදකයන් දිරි ගැන්වීම සඳහාත්, සීනි සඳහා පැවති බදු අනුප්‍රමාණය වූ කිලෝග්‍රෑමයට රුපියල් 10ක් වූ බද්ද රුපියල් 20 දක්වා සංශෝධනය කිරීම 2012.06.19 දිනැති ගැසට් නිවේදනය මඟින් සිදු කර ඇත. එය මසක පමණ කාලයකට වලංගු කරන ලද අතර 2012.07.19 දිනෙන් අවසන් වූ බැවින් තවත් ඉදිරි මාස තුනක් සඳහා එය දීර්ඝ කිරීම ගැසට් නිවේදනය මඟින් සිදු කරන ලදී.

ඊළඟට, දේශීය සීනි කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයක් වන ඊතයිල් මද්‍යසාරය දේශීය මත්පැන් නිෂ්පාදනයට යොදා ගැනීම තුළින් දේශීය සීනි කර්මාන්තයට ආරක්ෂණයක් සහතික කිරීම සඳහා ආනයනික ඊතයිල් මද්‍යසාරය සඳහා වූ තීරු බදු සංශෝධනය ගැසට් නිවේදනය මඟින් සිදු කරන ලදී. ඒ පරිමාව අනුව සැර ප්‍රමාණයෙන් සියයට 80ක හෝ ඊට වැඩි මද්‍යසාර ප්‍රමාණයකින් යුත්, ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මද්‍යසාරය සඳහා ක්‍රියාත්මක වූ ලීටරයකට රුපියල් 125ක ආනයන තීරු බද්ද, රුපියල් 200 දක්වා ඉහළ නැංවීම සිදු කරන ලදී. මෙම තීරු බදු සංශෝධනය යොදා සකස් කරන ලද අංක 2/2012 ආදායම් සංරක්ෂණ ආඥාව ඇතුළත් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

ගරු කථානායකතුමනි, මෝටර් වාහන පනත යටතේ වන නියෝගත් මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කරන්න කැමැතියි. මේ කරුණුවලට පසුබිම් වී තිබෙන අපේ කල්පනාවන් පිළිබඳවත් ඒ විධියට අපි තීරණ ගන්නේ ඇයි කියන එක ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. රජයක් හැටියට දේශීය නිෂ්පාදනය සහ දේශීය නිෂ්පාදකයා රැක ගැනීම මූල ස්ථානයෙන් අපි සලකනවා. දේශීය නිෂ්පාදනය සහ පරිභෝජනය කියන ඒ අංශ දෙකම යම් කිසි විධියක සමතුලිත තත්ත්වයකට ගෙනෙන්න අපි කැමැතියි. නමුත් මේක විටින් විට වෙනස් වෙන ස්වභාවයක් තිබෙනවා. නිදසුනක් වශයෙන් අල වාගේ දේවල් එක කන්නයකදී විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. නමුත් කන්නය නොවන කාලයේ රටට අවශ්‍ය නිෂ්පාදනය අපට දෙන්න බැහැ. එක පැත්තකින් දේශීය නිෂ්පාදකයා රැක ගන්න ආනයන යම් කිසි විධියකින් සීමා කරන්න අපට සිද්ධ වෙනවා. ඊළඟට, නිෂ්පාදනය වැඩි වන අවස්ථාවලදීත් දේශීය නිෂ්පාදකයා රැක ගනිමින් පාරිභෝජකයාටත් සාධාරණ මිලක් ලැබෙන විධියට ඒ බදු අපට එක එක විධියට සකස් කරන්න සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ තත්ත්වය ඉතාම සංකීර්ණ කාරණයක් වෙලා තිබෙනවා. එක පැත්තකින් දේශ ගුණික හේතූන් මීට බලපානවා. අපේ හිතවත් ගරු විදුලිබල ඇමතිතුමාත් මීට ඉස්සෙල්ලා ඒ සම්බන්ධව කථා කළා. දේශ ගුණික හේතූන් නිසා බලාපොරොත්තු නොවුණු විධියට අපේ ඒ සැලසුම් වෙනස් කරන්න සිද්ධ වෙනවා. බොහෝ දුරට කාලගුණික හේතූන් නිසා අපේ ගොවිතැනේත්, දේශීය නිෂ්පාදනයේත් සැලසුම් වෙනස් කරන්න සිද්ධ වෙනවා. ඉතින් එවැනි අවස්ථාවලදී අපේ බදු ප්‍රතිපත්තිය, මේ රටට ඒ භාණ්ඩ ගෙනෙන ප්‍රතිපත්තිය අපට අවස්ථානුකූලව සකස් කරන්න වෙනවා. නමුත් මම ඉතාම පැහැදිලිව කියනවා, අපේ මූලික ඉලක්කය වන්නේ දේශීය නිෂ්පාදකයා රැක ගැනීම කියන එක. නමුත් ඒ අතරම, පාරිභෝජකයාටත් ඒ අවශ්‍ය සහනය ලබා දෙන්න ඕනෑ.

අපි මේ කථා කරන්නේ සාමාන්‍ය ජනතාවට ඉතාමත්ම වැදගත් වන භාණ්ඩ පිළිබඳව. එක පැත්තකින් මේ රටේ නිෂ්පාදනයට -වී නිෂ්පාදනයට, එළවලු නිෂ්පාදනයට, සීනි නිෂ්පාදනයට- අවශ්‍ය බදු රාමුවකුයි අපි සකස් කරන්නේ. අනෙක් අතට ලෝක වෙළෙඳ පොළේ මිල උච්චාවචනය අනුව පාරිභෝජකයාටත් අපි සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ නිසා මේ කාරණය අපි නිරන්තරයෙන්ම සොයා බලන දෙයක්.

ඊළඟට, දෙවැනි කාරණාව කෙරෙහි මම අවධානය යොමු කරන්න කැමැතියි. මේ කරුණු සරලව වාද විවාද කරන්න පුළුවන් කරුණු නොවෙයි. මේවාට රජය තීරණය ගන්නේ විශාල පර්යේෂණයක් කරලායි; විශාල කරුණු හැදෑරීමක් කරලායි. මේ රටට ගෙනෙන භාණ්ඩ සම්බන්ධයෙන් ගත්තොත් අල වෙන්න පුළුවන්; දොඩම් වෙන්න පුළුවන්; වෙනත් එළවලු වර්ගයක් වෙන්න පුළුවන්; මේ වෙන කොට අපට බලන්න වෙනවා අපේ රටේ අවශ්‍යතාව කුමක්ද, අපි අත්සන් කරලා තිබෙන වෙළෙඳ ගිවිසුම් මොනවාද, ඒ රටවල මිල මුදල් උච්චාවචනය වෙන්නේ කෙසේද කියන කරුණු කාරණා ගැන. ඒ වාගේ සාධක විශාල ප්‍රමාණයක් සොයා බලා තමයි අපට ඒ තීන්දුව ගන්න වෙන්නේ. ඒ නිසා මේකෙදී, හාල් මැස්සන් මිල වැඩි වුණාය, නැත්නම් කරවල මිල අඩු වුණාය, එහෙම නැත්නම් අල මිල වැඩි වුණාය කියන ඒ සරල, ජනප්‍රිය විවාදයට විතරක් අපට යන්න බැහැ. බොහොම වග කීමෙන් මේ කරුණු ගැන හොයා බලන්න ඕනෑ.

අපි ගන්න වෙළෙඳ භාණ්ඩ ගැන ඉදිරි විපරමක් කරලා ඒවා ගැන සොයා බලන්න කියලා අපේ තානාපති කාර්යාලවලට අපි දන්වලා තිබෙනවා. ඒ හින්දා මම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරන්න කැමැතියි. මේ විවාදය මේ වේලාවට මිල වැඩි කළා, මේ වේලාවට මිල අඩු කළා කියලා නිකම්ම මතු පිටින් කෙරෙන සරල විවාදයක් නොවෙයි. අපි මේ තීන්දු තීරණ ගන්නේ හොඳට කල්පනා කරලායි. එක පැත්තකින් පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් අපට සොයා බලන්න වෙනවා. ජනගහනය වැඩි වෙනවා. ඒ ජනගහනයේ කෑම පිළිබඳ, පරිභෝජනය පිළිබඳ තිබෙන ඒ රටාවන් වෙනස් වෙනවා.

අද බලන්න, එක එක භාණ්ඩ පිළිබඳව කොච්චර වෙළෙඳ ප්‍රචාරයන් කෙරෙනවාද කියලා. අපේ ජනගහනය වැඩි වෙනවාත් එක්කම භාණ්ඩවලට ඉල්ලීම වැඩි වෙනවා. උදාහරණයක් වශයෙන් පිටි කිරි ගන්න; බෙත් හේත් ගන්න. ඒවාට ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ ඉල්ලීම වැඩියි. මොකද ජනගහනය වැඩි වෙන නිසා. ඒ හින්දා ඒවාට අපට මුදල් සොයා ගන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ඊට උචිත බදු ක්‍රමයක් අපට සකස් කරන්න සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, එක පැත්තකින් අපි බලන්න ඕනෑ, දේශීය ගොවියා රැක ගැනීමට හා දේශීය නිෂ්පාදකයා රැක ගැනීමට. ඒ වාගේම පාරිභෝගිකයාටත් අහිතක්, අවාඩක් නොවන විධියට අපි මෙම අංශ දෙකම සමබරතාවෙන් ගෙන යන්න තමයි හදන්නේ. විශේෂයෙන්ම ඒ පිළිබඳව දැනුම තිබෙන්නේ රජයේ අංශයටයි. ඒ සෑම සාධකයක්ම සලකා බලා තමයි අපි මේ තීන්දු ගන්නේ. ඒ නිසා මේ අත්‍යවශ්‍ය රෙගුලාසි සම්මත කර ගැනීමට තමුන්නාන්සේලාගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ. භා. 2.24]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, කාලය ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතියි. මගේ කථාව කරන්න කලින් ගරු ඇමතිතුමා කියපු කථාවේ අඩංගු යම් යම් දේවල් පිළිබඳව මූලික පිළිතුරක් දෙන්න බලාපොරොත්තු වෙනවා. එතුමා කියනවා, ආණ්ඩුව මේ බදු වෙනස් කිරීමේ මූලික ඉලක්කය දේශීය නිෂ්පාදකයා රැක ගැනීම සඳහාය කියලා. ඊට පස්සේ එතුමා කියනවා, පාරිභෝගිකයා රැක ගන්නත් ඒ වැඩ කටයුත්තෙන් හැකි වෙනවා කියලා. ඒත් එක්කම කියනවා, පරිප්පුවල ගණන වැඩියි, බටුවල ගණන අඩුයි, මේක ලෙහෙසියෙන් එක පාරට කථා කරන්න පුළුවන් දෙයක් නොවෙයි, මේක ගැඹුරෙන් හිතා බලා දත්ත එක්ක සංසන්දනය කරලා කරන්න ඕනෑ කථාවක් කියලා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න සූදානම් වෙන්නේ ආණ්ඩුවේ මූලික ඉලක්කය දේශීය නිෂ්පාදකයා රැක ගැනීම නොවෙයි, ඡන්ද දායකයා රැවැට්ටීම කියන එකයි. කාට හරි කියන්න පුළුවන්, මේ මන්ත්‍රීවරයා නිකම් ආවාට ගියාට බොරුවට මේ කථාව කියනවා, කිසිම විධියකින් මේක ඔප්පු කරන්න බැරුව ඇති කියලා. ගරු කථානායකතුමනි, මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ මත බදු පනවපු දවසේ ඉඳලා හැම වෙනස් කිරීමක්ම පිළිබඳව දත්තයන් මා ළඟ තිබෙනවා. එතැනදී බලන්න පුළුවන් හරි ලස්සණ කාරණයක් තමයි, ඡන්දයක් කිට්ටුවන කොට මේ වෙළෙඳ භාණ්ඩවල බද්ද අඩු වෙන එක.

ගරු කථානායකතුමනි, අපි උදාහරණයක් හැටියට ගනිමු මයිසූර් පරිප්පු. මයිසූර් පරිප්පු සඳහා බද්ද තිබුණේ රුපියල් විස්සටයි. ඊට පස්සේ හදිසියේම 2009 නොවැම්බර් මාසයේ ඒක රුපියල් දෙකට අඩු වෙනවා. ගරු කථානායකතුමනි, ඊට පස්සේ ඡන්ද ටික ඉවර වුණාම 2010 මැද ඒක නැවතත් රුපියල් පහළොවටත්, ඊට පස්සේ රුපියල් විසි දෙකටත් වැඩි වෙනවා. එතකොට එතැන වුණේ ඡන්දයක් තිබ්බව එක විතරයි. ගරු කථානායකතුමනි, මිරිස්වල බද්දත් එහෙමයි. රුපියල් හතළිහේ ඉඳලා රුපියල් විස්සට අඩු වෙනවා. ඊට පස්සේ ආපසු රුපියල් විසිපහට වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, මා ළඟ ඒ පිළිබඳ විස්තර තිබෙනවා. සීනි, මයිසූර් පරිප්පු වැනි දේවලට ගහපු බද්ද ඡන්ද කාලයත් එක්ක අඩු වෙනවා. ඊයේ-පෙරේදා ඡන්දයක් තිබුණා නේ, ගරු කථානායකතුමනි. ඊයේ-පෙරේදා ඡන්දයට කලින් ආණ්ඩුව කිව්වා, සැමන් ටින් එකේ මිල අඩු කරනවා කියලා.

සැමන් ටින් එකකට ගහන බද්ද රුපියල් අසූ පහේ ඉඳලා රුපියල් පණහට අඩු කළා, මාස තුනක කාලයක් සඳහා. ඒ කියන්නේ ජූලි 17 සිට ඔක්තෝබර් 17 වන තෙක් අඩු කළා. මැතිවරණය ඉවර වුණා. ඊයේ සිට නැවතත් සැමන් ටින් එකක බද්ද වැඩි කළා. අද මෙතැනට ඇවිල්ලා ඇමතිවරයා කියනවා, සැමන් ටින් එකක බද්ද අඩු කළා කියලා. සැමන් ටින් එකක බද්ද අඩු කරලා තිබෙන්නේ ජූලි මාසයේ 17 වන දා. නමුත් ඊයේ රෑ සැමන් ටින් එකක බද්ද නැවතත් වැඩි කළා. එහෙම නම් මේ සභාවට මෙතුමා ඇවිල්ලා කියන්නේ ඇත්ත වශයෙන්ම සත්‍ය නොවෙයි නේ ගරු කථානායකතුමනි. මෙතුමාට සදාචාර අයිතියක් තිබෙනවා කියන්න-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! There is a point of Order being raised by the Hon. (Dr.) Sarath Amunugama.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔබතුමා මේක පැහැදිලි කර ගන්න ඕනෑ. අද දින අපි මේ සභාවේදී අනුමැතිය ලබා ගන්නේ කලින් gazette notification එකක පළ කරන ලැබූ නියමයන් හා නියෝගවලටයි. එම නියමයන් හා නියෝග සම්මත කර ගැනීමයි අද සිදු කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්, දන්නවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

දැන් තමුන්නාන්සේ කථා කරන කාරණය gazette notification එකක පළ කරලා වෙනම සාකච්ඡාවට ගනිමු.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මෙතැන සිදු කරන්නේ ප්‍රගති සමාලෝචනයක් නොවෙයි. ඒකේ කිසිම point of Order එකක් නැහැ ගරු කථානායකතුමනි. හරි, මම ගරු ඇමතිතුමා කියන එක පිළිගන්නවා. මේක ගැසට් පත්‍රයක පළ කරපු එකක්. ඒක සම්මත කර ගන්න තමයි කථා කරන්නේ. නමුත් ඔබතුමාට සදාචාර අයිතියක් තිබෙනවා, "මෙහෙම වුණාට ඊයේ රෑ අපි නැවතත් සැමන් ටින් එකක මිල වැඩි කළා" යි කියලා ඔබතුමාගේ කථාවේදී කියන්න. ඒක කියන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ. ඒක මම කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එහෙම නම් එතැන කරන්නේ අර මම කියපු එක තමයි. ඡන්ද දායකයා රැවටීම තමයි ගරු කථානායකතුමනි, මූලික ඉලක්කය. ඊට වඩා ඒ ගැන කථා කරන්න දෙයක් නැහැ ගරු කථානායකතුමනි.

පසු ගිය ඉරිදා "The Sunday Times" පත්තරයේ ප්‍රධාන ශීර්ෂ පාඨය මම මේ අවස්ථාවේදී උපුටා දක්වන්න කැමැතියි:

"Treasury stalls Customs probe on alcohol 'firms' "

එම ශීර්ෂ පාඨයේ සඳහන්ව තිබෙන්නේ ලංකාවට මධ්‍යසාර ගෙන්වන ආයතන වගයක් ගැන. එම පුවත් පත් වාර්තාව මම **සභාගත*** කරන්න කැමැතියි. ඒකට හේතුව තමයි ගරු ඇමතිතුමා

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කිව්වා, ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීම සම්බන්ධයෙන් තීරු බදු සංශෝධනයක් කරලා තිබෙනවා; ලීටරය රුපියල් 125 සිට රුපියල් 200ට වැඩි කර තිබෙනවා කියලා. දැන් මේ පත්තරයේ සඳහන්ව තිබෙන්නේ ගරු කථානායකතුමනි, මේ ඊතයිල් මද්‍යසාර ආනයනයෙන් මහ විශාල හොරකමක් වුණා කියලායි. මේ ලිපියේ කියලා තිබෙනවා, රජයේ ආදායමට රුපියල් කෝටි 100ක පාඩුවක් සිදු වුණා කියලා. මේ ඊතයිල් මද්‍යසාර ආනයනයේදී සිදු වූ වංචාව නිසා රජයට අය විය යුතු බදු රුපියල් කෝටි 100ක් රජයට එකතු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, දැන් බලන්න, මෙතැන තිබෙන පරස්පරය. ආණ්ඩුවේ දේශපාලනඥයකුට සම්බන්ධ ක්‍රියාවලියක් නිසා මේ ගැන කරන සොයා බැලීම් නවත්වන්න කිව්වායි කියලා සුරාබදු දෙපාර්තමේන්තුවේ මේ පුද්ගලයා කියනවා. බලන්න, එතුමා කෙළින්ම කියලා තිබෙනවා. ආණ්ඩුවේ දේශපාලනඥයකුට සම්බන්ධ දූෂණයක් නිසා රුපියල් කෝටි 100ක් පාඩු වුණත් ඒ පිළිබඳව විමර්ශනය කරන්න එපා කියලා. ඒක නිකම් අර මාලක සිල්වාගේ වැඩය වාගේ තමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවුද, කියන්නේ?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේක කියන්නේ ගරු කථානායකතුමනි, Senior Customs Officer.

I quote:

"Speaking on grounds of anonymity since Customs investigators are not expected to talk to the media, he said the companies were linked to a powerful politician."

බලන්න, දූෂණය කරලා, රුපියල් කෝටි සියයක් දේශපාලනඥයෙක් වංචා කරන කොට ඒක නවත්වලා -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. - සාමාන්‍ය ජනතාවගේ සැමන් ටින් එකේ බද්ද වැඩි කරනවා. මේ දෙකම කරන්නේ මේ සතියේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා මේ පුවත් පත් වාර්තාවක් පමණයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම නම් ගරු කථානායකතුමනි, මූලික ඉලක්කය මොකක්ද කියන එක පෙනෙනවා නේ. රුපියල් කෝටි සීයක වංචාව වෙන්න ඉඩ දෙනවා. ඒ සම්බන්ධයෙන් කරන විමර්ශන නවත්වන්න කියලා කියනවා. අනෙක් අතට සැමන් ටින් එකේ බද්ද වැඩි කරනවා. මොකක්ද මේ? මේකද, ආශ්චර්යය? මේකද, ඔබතුමන්ලා ජනතාවට දෙන්නේ? මේකද, ජනතාවට පොරොන්දු වුණේ? මම හිතන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මෙතැන වුණු සාකච්ඡාත් එක්ක යම් කිසි දෙයක් මම මේ සම්බන්ධයෙන් කථා කරන්න කැමැතියි. මොකද, රටේ ආදායම් ගැන තමයි අද මේ ගරු සභාවේ කථා වුණේ. "ප්‍රශ්නවලට උත්තර දෙන්න අමාරුයි" කියලා රජයේ ඇමතිවරයෙක් කියන කොට, "ඇයි අමාරු" කියන එක එතුමා කිව්වාට වඩා හොඳින් මම පැහැදිලි කරලා දෙන්නම්.

මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන්. සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැත්තේ මේ දවස්වල කොළඹ කොටස් වෙළෙඳ පොළේ සහ මූල්‍ය වෙළෙඳ පොළේ සිද්ධ වන නොයෙකුත් හැලහැප්පීම් නිසායි. අපි කවුරුත් දන්නවා, අවුරුද්දක කාල පරිච්ඡේදයක් ඇතුළත ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරුන් දෙදෙනකු ඉවත් වෙලා තිබෙනවාය කියලා. අවසානයට ඉවත් වුණු පුද්ගලයා ප්‍රසිද්ධියේම කෙළින්ම කියා තිබෙනවා, මාෆියාවක් තිබෙනවා, දේශපාලන බලපෑම් නිසා ඔහුට ඉවත් වෙන්න සිද්ධ වුණාය කියලා. දැන් බලන්න. ඔබතුමාට මා එක උදාහරණයක් අරගෙන පෙන්වන්න කැමැතියි. මොකක්ද ඒ උදාහරණය?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මා එක උදාහරණයක් අරගෙන පෙන්වන්න කැමැතියි, සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් මා අහන ප්‍රශ්නවලට මේ ආණ්ඩුව පිළිතුරු දෙන්නේ නැත්තේ ඇයි කියලා. ඒ උදාහරණය පෙන්වන්නේ ඊයේ පෙරේදා නිකුත් වුණු දත්තයනුත් සමඟයි. දැන් මා ළඟ තිබෙනවා, අගෝස්තු මාසයේ ඉදිරිපත් කරපු වාර්තාව. අගෝස්තු මාසයේ ඉදිරිපත් කරපු වාර්තාවේ තිබෙනවා, සේවක අර්ථ සාධක අරමුදල ද ෆිනෑන්ස් ආයතනයෙන් සියයට 8.43ක කොටස් ලබා ගෙන තිබෙනවාය කියලා. සේවක අර්ථ සාධක අරමුදල ද ෆිනෑන්ස් ආයතනයේ කොටස් දිගින් දිගටම ලබා ගන්නවා. හොඳයි, දැන් ඒක පැත්තකින් තබමු.

දැන් අපි බලමු, ද ෆිනෑන්ස් ආයතනයත් එක්ක තිබුණු කලබැගෑනිය මොකක්ද කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Hon. Member, could you please give me one minute?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Yes.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
When the Hon. Leader of the Opposition raised this question about the stock exchange - apart from the Questions asked in Parliament, he made a statement as the

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

Leader of the Opposition - I gave a very comprehensive reply. That is now tabled in the Library. Have you taken a look at that?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Of course, I have. Thank you very much and I appreciate what you have done. But, I am also a Member of Parliament. I too have a right to ask questions and I have asked a Question on the EPF almost one year ago, which is getting delayed and delayed. Now, for the fifth consecutive time, it has been delayed. What I am trying to say is that the reason behind not answering these Questions is not that the Government does not have the answers; the Government very much has the answers. But, it does not want to let the country know what it is up to and this is one example that I am giving:

The Employees Provident Fund owns 8.4 per cent of The Finance Company. The Finance Company is a company that was in the news in the recent past due to a transaction between that company and the National Savings Bank. This is important and I am going to say this. In a statement issued on the 2nd of May, the Chairman of The Finance Company, a gentleman by the name of Mr. Preethi Jayawardena, who is also in one of the Consultative Committees of the Central Bank says, "When I was appointed as Chairman of the company and the new Director Board took over, upon intervention of the Central Bank, The Finance Company was in great financial difficulty. From Rs. 1.7 billion loss-making venture, the company has witnessed a significant turnaround, making Rs. 15 million profit during the last three quarters". This is important and you keep this in mind. Then, he further says, "This company is the largest and most sought-after financial institution in the country. Today, the monthly intake in deposits of the company has exceeded Rs. 1 billion, which mirrors investor and public confidence in the company".

This is also important, Sir. Soon thereafter, the Department of Supervision of Non-Bank Financial Institutions of the Central Bank issued a statement on the 27th of May, 2012. I will **table*** the whole document and would like to read some parts of it to be included in Hansard.

The document states, I quote:

"Clarification issued by the Department of Supervision of Non-Bank Financial Institutions regarding certain politician's statements about The Finance Co. PLC"

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

We do not know who the politician is but accusing an Opposition politician. It further states:

"The Department of Supervision of Non-Bank Financial Institutions (DSNBI) of the Central Bank of Sri Lanka continuously supervises and monitors all licensed finance companies and specialized leasing companies licensed by the Monetary Board."

It further states:

"..........The Finance Co. PLC is today among the top five finance companies in the country in terms of its asset base, and is fulfilling its obligations satisfactorily in accordance with the restructuring plan and the conditions imposed by the Central Bank of Sri Lanka."

It states that it is satisfactorily fulfilling the obligations laid down by the Central Bank of Sri Lanka. Then, it further goes on to state, I quote:

"In these circumstances the public is hereby informed that The Finance Co. PLC is a stable finance company and therefore, not to be misled by statements about the company's progress and functions, as made by certain politically motivated persons."

Now, this is the position. This was issued on the 27th of May 2012, which is after the date that the Central Bank knew the exact position of the finances of The Finance Company as at the end of 31st March, 2012. Now, somebody can argue how is that possible because these accounts have to be audited and so forth and the Central Bank may not know the real position of The Finance Company until much later. But, I would like to read from the Annual Report for 2011-2012 of The Finance Company, released on the 15th of August. On page 24 of the Report it states, I quote:

"The Central Bank also conducts its audits to ensure that the Company complies with the regulations laid down by the Central Bank of Sri Lanka. In addition, a reporting system is in place, which requires the Company to submit detailed reports concerning key areas of operations on a weekly/monthly/quarterly/annually to the Non-banking Supervision unit of Central Bank."

This means, on a weekly basis the Central Bank is aware of the internal happenings of The Finance Company. Therefore, when the Department of Supervision of Non-Bank Financial Institutions of the Central Bank released that document on the 27th of May 2012, it certainly knew whether The Finance Company was actually fulfilling the obligations in a satisfactory manner or not.

Now, Sir, this is what I want to show you. The opinion of the auditors of The Finance Company is given at page 45 of the Report. It states that the Company's accumulated losses incurred during the year was Rs. 9.8 billion and the net assets show a negative balance of Rs. 3.8 billion and so on. What is important is not that. What is important is this. That is, the auditors say that these matters raise doubt in the Company's ability to continue as a going concern. මේ විගණනකරුවන් කියනවා, මේ ආයතනයේ පැවැත්ම පිළිබඳව ඔවුන්ට සැක සහිතයි කියා. So, this is a company that elicits deposits from the public. අප

මීට කලින් දැක තිබෙනවා, සක්විති වැනි අයළඟ, Golden Key වැනි ආයතනවල මිනිස්සු මුදල් තැන්පත් කරලා ඊට පස්සේ ඒ මුදල් ඔක්කොම නැති වෙලා තිබෙන බව. අපට අයිතියක් තිබෙනවා, ඇත්ත වශයෙන්ම මේ ආයතනවල වෙන්නේ මොකක්ද කියන එක ජනතාවට පෙන්වා දෙන්න. මේ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

> "The Company has been unable to comply with the directions issued by the Central Bank of Sri Lanka under the Finance Business Act, No. 42 of 2011…"

ඉතින් මොකක් ද මේ කියන්නේ? එක තැනක auditor කියනවා, Central Bank එකෙන් දාපු regulations මේගොල්ලෝ පිළිපදින්නේ නැහැ කියා. Central Bank එකෙන් නිවේදනයක් නිකුත් කර කියනවා, මේ ඔක්කොම පිළිපදිනවාය කියා. ලොකු පරස්පරයක් තිබෙනවා. එහෙම වෙද්දි අර්ථ සාධක අරමුදලේ මුදල් -ජනතාවගේ මුදල්- මේ කොටස් මිලට ගන්න පාවිච්චි කරනවා. රුපියල් තිහේ කොටස රුපියල් පනහට ගත්ත කථාවට නැවතත් මම යන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මම කියන්නේ මේවා කාගේවත් පෞද්ගලික මුදල් නොවන බවයි. මේවා මේ රටේ වැඩ කරන ජනතාවගේ මුදල්. මේකේ තවත් හොඳ කථාවක් තිබෙනවා. මේ වාර්තාවේ 80වන පිටුවේ සම්පූර්ණ section එකක් වෙන් කර තිබෙනවා. Note No. 49 එකේ මෙසේ සඳහන් වෙනවා:

> "The Company has been unable to comply with following directions issued by the Central Bank of Sri Lanka …"

"Following Directions" කියා Direction No. 1 of 2003, Direction No. 2 of 2006, Direction No. 1 of 2009 ආදී වශයෙන් directions විශාල ගණනක් තිබෙනවා..

Sir, I will read out to you Direction No. 3 of 2009. I quote:

> "During the restructuring period a beneficiary finance company shall, recover at least 50% dues from the related parties, which has not been complied with by the Company."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ ගොඩක් කරුණු කාරණා මෙතැන පැහැදිලි කර තිබෙනවා. එතකොට ප්‍රශ්නය වන්නේ මෙහෙම ආයතනයක, එහි පැවැත්ම ගැන සැක සහිතයි කියා විගණනය කරන පුද්ගලයින් කියන ආයතනයක කොටස්, අර්ථ සාධක අරමුදලේ මුදල් පාවිච්චි කර ගන්නේ ඇයි කියන එකයි. ඒ ප්‍රශ්නය තමයි අප අවුරුද්දක් තිස්සේ අහන්නේ. ඒ ප්‍රශ්නයට තමයි ආණ්ඩුව අවුරුද්දක් තිස්සේ උත්තර දෙන්නේ නැත්තේ. අපට සාධාරණ අයිතික් තිබෙනවා, ජනතාවගේ මුදල් සුරක්ෂා කිරීම සඳහා ඒ ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්] ඒ ප්‍රශ්නය අහන්න අපට අයිතියක් තිබෙනවා. ඒ ප්‍රශ්නය අහන්නේ හර්ෂ ද සිල්වා වෙනුවෙන් නොවෙයි. මගේ ශත පහක්වත් කොටස් වෙළඳ පොළේ නැහැ. මම ප්‍රශ්නය අහන්නේ අර්ථ සාධක අරමුදලේ මිලියන ගණනක් ඉතිරි කළ අයගේ ඉදිරි කාලය සඳහා ජීවත් වන්න තිබෙන සල්ලි කාබාසිනියා කරන වැඩ පිළිවෙළ ගැනයි. So, that is what is going on. [බාධා කිරීමක්] හරි. මම කියන්නද? මම කියන්නම්. සියයට අටක් හෝ නවයක් විතර - [බාධා කිරීමක්] සියයට අටක් හෝ නවයක් කියන්නේ, රුපියල් බිලියන 80ක් -රුපියල් කෝටි 8000ක්-. ඔබතුමා කියන්නේ රුපියල් කෝටි අට දාහක් කියන්නේ පොඩි ගණනක් කියලාද? රුපියල් කෝටි අට දාහක් කියන එක ඔබතුමාට පොඩි වුණාට ඉතා විශාල මුදල් ප්‍රමාණයක්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, please wind up now.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay, Sir.

So, that is what I wanted to point out. The reason the Government Ministers are not answering Questions has nothing to do with their having to look for the Answers. The answers are already there. The only reason why they are not giving the Answers is because they know that they have done something wrong. That is why they are scared to give the answers to the public.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you very much.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
That is totally wrong. I have given the full answer to the Hon. Leader of the Opposition. That answer was tabled and placed in the Library. Please consult that and then -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is not what we are asking for. Why do you not read my Question?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Rohana Dissanayake.

[අ. භා. 2.46]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් (අංක 1), (අංක 2), (අංක 3) සහ (අංක 4), ඒ වාගේම (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනත යටතේ යෝජනාව සහ (203වැනි අධිකාරය වන) මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1) සහ (අංක 2) සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ වෙලාවේ ඒ සම්බන්ධව මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මෙහිදී ගරු සරත් අමුණුගම ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා මේ පිළිබඳව මේ ගරු සභාව ඉදිරියේ කරුණු මැනවින් තබන්නට කටයුතු කළා. මෙහිදී ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ -[බාධා කිරීමක්] මා ඒ ගැනත් පසුව කියනවා මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් කියන්න ඕනෑ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සැමන් ටින් එකක් ගැන කථා කළ බව. සැමන් ටින් එකක මිල ගැන කථා

[ගරු රෝහණ දිසානායක මහතා]

කරන කොට අපි කියන්න ඕනෑ, එදා ආනයනික භාණ්ඩ සඳහා රුපියල් 85ක් වුණු බද්ද රුපියල් 50ක් දක්වා අඩු කළ බව. අද එම බද්ද නැවත රුපියල් 25කින් වැඩි වෙලා තිබෙනවා. එතකොට බද්ද රුපියල් 75යි. එදාට වඩා තවත් රුපියල් 10ක් අඩුවෙන් තමයි -[බාධා කිරීමක්] ඒත් රජය; අදත් රජය. රුපියල් 10ක් අඩුවෙන් ඒ බද්ද පවත්වා ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයට අවංක වුවමනාවක් තිබෙනවා. අනික් එක, සැමන් ටින් එකකට එදාට වඩා රුපියල් 10ක් අඩුවෙන් මේ බද්ද පනවන කොට අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අනික් පැත්තෙන් මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ බොම්බයි ලූනු ගොවියා රැක ගන්න, නුවරඑළියේ අල ගොවියා රැක ගන්න අද රජය යම් කිසි බද්දක් පනවා -[බාධා කිරීමක්] ඒක තමයි.

කාලීනව ඒ ගොවීන් රැක ගැනීමේ වගකීම රජයකට තිබෙනවා. රජයකට මේවා අමතක කරලා, පරිසරය අමතක කරලා, භූගෝලීය තත්ත්වයන් අමතක කරලා, ලෝකය අමතක කරලා කටයුතු කරන්න බැහැ. මොකද අද ලෝකයම එකම ආර්ථික කලාපයක් බවට පත් වෙලා තිබෙනවා. අද රටත් එකම ආර්ථික කලාපයක්. ඒ වාගේම ලෝකයත් එහෙමයි. එකම ආර්ථික කලාපයක් තුළයි අපි ජීවත් වන්නේ. විශ්ව ගම්මානයක් - global village -. ඒ විශ්ව ගම්මානය තුළ යම් යම් රටවල් එක්ක ගනුදෙනු කරන කොට, මා හිතන හැටියට අපේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩවල ප්‍රමාණයත් - quantity එකත් - ඒ වාගේම ආනයන හා අපනයන අතර තිබෙන මිල ශේෂයත් යම් ආකාරයකින් සමබරතාවයකින් පවත්වා ගෙන යෑමට රජයට විශාල වග කීමක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අන්න ඒ නිසා තමයි එදා සැමන් ටින් එක රුපියල් දහයකින් අඩු කරන කොට අනික් පැත්තෙන් හාල් මැස්සන් අර්තාපල්, කරවල, මාළු වැනි ආනයනය කරන සියලු දේවල්වල මිලත් යම් ආකාරයකින් අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අන්තිම වරට අඩු කළේ කවදාද?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
2012.07.13වැනි දා. [බාධා කිරීමක්]

දැන් මැතිවරණයක් නැහැ නේ. මැතිවරණවලදී ලබා දිය යුතු පිළිතුර ඉතාම පැහැදිලිව හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නියෝජනය කරන පක්ෂයටත්, අනුර දිසානායක මන්ත්‍රීතුමා නියෝජනය කරන පක්ෂයටත් ජනතාව ලබා දීලා තිබෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. ගැටලුවක් නැහැ. අපි ඊයේ නැඟෙනහිර පළාතේ මහ ඇමතිතුමාත් පත් කළා. ස්ථාවර රජයක් පවතින නිසා, ඔබතුමන්ලා ජනතාව ඉදිරියට ගිහිල්ලා ආකර්ෂණීය වචන කථා කළාට ජනතාව ඒවා විශ්වාස කළේ නැහැ. රජය ගෙන යන වැඩ පිළිවෙළ, මහින්ද චින්තන ඉදිරි දැක්ම, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය සහ එතුමා කෙරෙහි විශ්වාසය තියලා ජනතාව මැතිවරණයේදී හොඳ පිළිතුරක් දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඒ නිසා ඒ ගැන මම මේ විවාදයේදී ඔබතුමාත් එක්ක පැටලෙන්න උත්සාහ කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ වගකීම ඉෂ්ට කිරීමේදී රජය නිරන්තරයෙන් උත්සාහ කරනවා, ගොවියා ආරක්ෂා කර ගන්න, නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්න, ඒ වාගේම මේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගන්න, මේ රටේ ව්‍යාපාරිකයා ආරක්ෂා කර ගන්න. ඒ සඳහා රජය පැහැදිලි වැඩ පිළිවෙළක ඉන්නවා. සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා වාගේ පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම අපේ රජයේ වග කීමක්. මේ රටට ගෙනෙන දේවල් පරිභෝජනය කරන ජනතාව ආරක්ෂා කර ගැනීම අපේ වග කීමක්. ඒ නිසා මේ මොහොතේදී මම මීට වඩා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ අද ඉදිරිපත් කර ඇති මේ නියෝග ගැන කථා කරන කොට, මෙන්න මේ කාරණයත් ඉතා වැදගත්. අද අපේ රට බොහොම වේගයෙන් සංවර්ධනය වෙනවා. මේ රටේ උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලට ගියත්, උතුරු මැදට ගියත්, සබරගමුවට ගියත්, දකුණට ගියත් පෙනෙනවා ඒ පළාත්වල මහා මාර්ග පද්ධතිය ඉතාම ශීඝ්‍රයෙන් සංවර්ධනය කරන බව. ඒ වාගේම ගම්වල තිබෙන අතුරු මාර්ග පද්ධතිය ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙනවා. ඒ මාර්ග සංවර්ධනය වෙනවා පමණක් නොවෙයි, ඒ මාර්ග පද්ධතියේ දියුණුව නිසා අද නගර දෙකක් අතර ගමන් කිරීමට යන කාලය අපට ඉතුරු වෙලා තිබෙනවා. ඒ කාලයේ පැය හතක්, අටක් ගිය ගමනක් මේ රජය යටතේ සිදු වන මාර්ග පද්ධතියේ සංවර්ධනය නිසා අද පැය එකහමාරකින් දෙකකින් යන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. හැබැයි ඒ සංවර්ධන කටයුතු තවම අවසන් වෙලා නැහැ. ඒ සංවර්ධනය ඉතාම වේගයෙන් ක්‍රියාත්මක වෙනවා. එය තවත් ඉදිරියට ගෙන යමින්, විශේෂයෙන්ම ගමින් ගම යා කරමින්, නගර යා කරමින් කිලෝමීටර් දහස් ගණනක මාර්ග සංවර්ධනය කරන්න අප රජය කටයුතු කරලා තිබෙනවා. ඒ පළාත්වලට ගියොත් මේ සංවර්ධන කටයුතු සිදු වන ආකාරය ඔබතුමන්ලාට දකින්න පුළුවන්.

අද විවිධ යාන වාහන ගේනවා; ඒ වාගේම යන්ත්‍රෝපකරණත් ගේනවා. මේ මෝටර් වාහන පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන එක නියෝගයක් තමයි ඝන සෙන්ටිමීටර 350ට වැඩි මෝටර් සයිකලයක- යතුරුපැදියක- එන්ජිමේ ඝන සෙන්ටිමීටර 450 දක්වා වැඩි කරන්න කියන එක. අද අධිවේගී මාර්ගයේ යනකොට වාහනයකට යන්න පුළුවන් යම් කිසි වේගයක් තිබෙනවා. එදා 50, 60ක වේගයකින් ගිය වාහන අද 100ක, 120ක වේගයකින් යනවා. ඒකත් සීමාසහිත වේගයක්. හැබැයි යම් දුරක් යෑම සඳහා එදා ගත වුණු කාලයයි, අද ගත වෙන කාලයයි ගණනය කරලා බැලුවාම අපට පෙනෙනවා අද බොහොම වැඩි කාලයක් ඉතිරි වෙන බව. එදා තිබුණු අබලි වාහන තමයි ඒ මාර්ගවල ගෙනිච්චේ. නමුත් අද අපට පුළුවන් වෙලා තිබෙනවා ජනගහනය ලක්ෂ දෙසීයක් පමණ වෙසෙන මේ රටේ ඒ ජනගහනයෙන් හතළිස්හත්ලක්ෂ පනස්දහසක විතර පිරිසක් - හරියටම හතරෙන් එකක් - වාහනයක් පාවිච්චි කරන තත්ත්වයට ගේන්න. ඒවා මෝටර් සයිකල් වෙන්න පුළුවන්, කාර් වෙන්න පුළුවන්, ලොරි රථ වෙන්න පුළුවන්, බස් රථ වෙන්න පුළුවන්. නැත්නම් වෙනත් වාහන වෙන්න පුළුවන්. මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ මේ රට ස්ථාවර තත්ත්වයට පත් වෙන ආකාරයෙන් ඒ කටයුතු කරන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා.

අද අප නොයෙක් රථ වාහන වර්ග ආනයනය කරනවා. ඒවා බැකෝ යන්ත්‍ර වෙන්න පුළුවන්, මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර වෙන්න පුළුවන්, ටිපර් රථ වෙන්න පුළුවන්. මේ රටේ සිදු වන සංවර්ධනයත් එක්ක විශාල වශයෙන් අපට ඒ යාන වාහන අවශ්‍ය වෙනවා. මේ රටේ දේශීය නිෂ්පාදකයා, කර්මාන්තකරුවා ඒ වාහන වෙනත් ආකාරයට සකස් කරමින් අද නව නිපැයුම් කරන්න කටයුතු කරනවා. ඒ නව නිපැයුම boom truck එකක් වෙන්න පුළුවන්, නැත්නම් ටිපර් එකක් වෙන්න පුළුවන්. ලොරියක් ටිපර් රථයක් බවට පත් කරපු ආකාරය අප මේ රටේ දැකලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ගෙනාපු ලොරියක් boom truck එකක් බවට පත් කරලා ලයිට් කණු ඔසවන්න, ටෙලිෆෝන් කණු ඔසවන්න, මහා ගොඩනැඟිලි ඉදි කිරීමේදී භාණ්ඩ ඔසවන්න යොදා ගන්නවා. ඒ නිසා අප ඒ කටයුතුවලදීත් මේ රටේ දේශීය කර්මාන්තකරුවා රැක ගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. එදා ආපු බස් එකට වඩා අද එන බස් එකේ ප්‍රමාණය වෙනස් වෙලා තිබෙනවා. එදා ආපු ජීප් රථයට වඩා අද එන ජීප් රථයේ දිග පළල වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවාට අදාළ පැරැණි නීති අප රටට ගැළපෙන ආකාරයට සකස් කරමින්, නව නීති සකස් කරමින් ඉදිරියට පවත්වාගෙන යෑම වැදගත්. දේශීය ව්‍යාපාරිකයා ඒ වාහනවලට අලුත් යන්ත්‍රෝපකරණ සවි කරලා ඒවා පාරේ අරගෙන යන කොට සමහර වෙලාවට පොලීසියෙන් අල්ලනවා; ඒවා නීත්‍යනුකූල නොවන වාහන හැටියට සලකනවා. ඒ නිසා ඒවා නීත්‍යනුකූල කරන්න ඕනෑ. දැන් මේ රටේ කෙරෙන සංවර්ධනයත් එක්ක එවැනි යන්ත්‍රෝපකරණ, රථ අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා ඒ වාහන නීත්‍යනුකූල කරලා මේ රටේ ව්‍යාපාරිකයාත් ආරක්ෂා කරගනිමින්, කර්මාන්තකරුවාත් ආරක්ෂා කරගනිමින් මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා. ඒ අභියෝගය භාර ගන්න මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අද කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඊයේ-පෙරේදා පත්තරයක දැකපු කාරණයක් ගැන මේ වෙලාවේදී කියන්න ඕනෑ. අපි ලංගමයට අලුතින් බස් රථ ගෙනෙන්න යනවා. අපේ ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා බස් රථ 3,000ක් ගෙනෙන්න කථා කරන කොට පෞද්ගලික අංශය, පෞද්ගලික බස් රථ සංගම් කියලා තිබෙනවා, ඒ බස් රථ ගෙනාවොත් ඒ අය strike කරනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ ලක්ෂ 200ක් පමණ ජනතාව ඉන්නවා. ඒ වාගේම අවුරුද්දකට ලක්ෂ ගණනක් සංචාරකයෝ මේ රටට ඇදී එනවා. පෞද්ගලික බස් රථ සංගම් කියනවා අද ඒ අයට බස් රථ 22,500ක් තිබෙනවා කියලා. නමුත් ලංගම බස් රථ තිබෙන්නේ 5,200යි, ඒ අතරිනුත් 2,500කට වඩා අවුරුදු 15කට වැඩියෙන් පැරැණියි. මහන්සි වන ජනතාවට, ගාල්ලේ ඉඳලා, නුවර ඉඳලා එදිනෙදා කොළඹට පැමිණෙන ජනතාවට හොඳ විධියට යන්න, පහසුවෙන් යන්න, හොඳ බස් රථයක් රජයෙන් දෙන්න යන කොට ජනතාව ඒකට කැමැති වෙනවා. නමුත් ව්‍යාපාරිකයෝ අතළොස්සක් ඒකට අකමැත්ත ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, චීනයෙන් හෝ ඇමෙරිකාවෙන් හෝ ජපානයෙන් හෝ ගෙනැල්ලා මේ රටේ ඉන්න ජනතාවට හොඳ බස් එකක ගමන් කරන්න හැකි තත්ත්වයක් ඇති කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා. පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය කියන දෙකම රැක ගැනීම අපේ රජයේ වග කීමක්. පෞද්ගලික අංශයේ බස් 20,000ක් තිබෙනවා කිව්වත් ඒ බස් 20,000 අතරත් තිබෙනවා, යන්න බැරි, ලොරි වාගේ බස් රථ. ඒවා මහා මාර්ගයට යොදවන්න විධියක් නැහැ. සමහර ඒවායෙන් වායු දූෂණය - air pollution - සිදු වෙනවා; ශබ්ද දූෂණය - sound pollution - සිදු වෙනවා. ඒ තත්ත්වය වෙනස් කරලා පෞද්ගලික අංශයෙන් හෝ වේවා රාජ්‍ය අංශයෙන් හෝ වේවා හොඳ බස් රථ මහා මාර්ගයට ලබා දීලා මේ රටේ මහ ජනතාව නියමිත වෙලාවට ඔවුන්ගේ ගමනාන්තය දක්වා රැගෙන යෑමේ වගකීම අපට තිබෙනවා. මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න යන කොට අද අතළොස්සක පිරිසක් පිස්සු කෙළින තත්ත්වයකට පත් වෙලා ඉන්නවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ, පෞද්ගලික බස් සංගම්වල අය වෙන්න පුළුවන්. ඒ අය ඒ අයගේ මඩිය තර කර ගන්න හදනවා.

පෞද්ගලික අංශයේ සමහර අය බස් රථ රාත්‍රියේ ධාවනයේ යොදවන්නේ නැහැ. සවස හයෙන් පස්සේ වැඩ කරන්නේ නැහැ. උදේ හයෙන් පස්සේ, දවල් කාලයේ හිරු එළියෙන් තමයි ඒ බස් වැඩ කරන්නේ. ඒ වාගේ හිරු එළියෙන් වැඩ කරන බස් තිබෙනවා. ඒ නිසා ගමේ ඉඳලා කොළඹට ගිය මහියා ආපහු හවසට අනුරාධපුරයේ ඉඳලා රාජාංගණයට එක්කරගෙන යන්න ඕනෑ ශ්‍රී ලංගම බස් රථයෙන්, එක මහියකු හිටියත්. ඒ නිසා අපි උත්සාහ කරනවා,- [බාධා කිරීමක්] රෑට නැහැ නේ solar power. ඒකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. හිරු එළිය දවල්ට විතර නේ වැටෙන්නේ. තමුන්නාන්සේලාට solar power එකත් නැහැ. ඒකයි හේතුව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප කියන්නේ මේකයි. අද මේවාට විරුද්ධ වෙන අය කල්පනා කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ අය කියනවා අද 60:40 කාල සටහන් ක්‍රමය ඇති කරන්න කියලා. 60:40 කාල සටහන් ක්‍රමය ඇති කරන්න නම් මොකක්ද සිද්ධ වෙන්න ඕනෑ කියලා ඒ අයට කියන්න ඕනෑ. ගණිතය පිළිබඳව යම්කිසි අවබෝධයක් ඒ අයට තිබෙනවා නම් දැන ගන්න ඕනෑ, 60:40 කාල සටහන් ක්‍රමය ඇති කළාම ඒ අයගේ බස් 22,000ක් යන කොට අපේ බස් 13,000ක් යන්න ඕනෑ බව. ඒක ඒ අයට වැටහෙන්න ඕනෑ. පෞද්ගලික අංශයේ බස් රථ තුනක් ධාවනයේ යොදවන කොට රාජ්‍ය අංශයේ බස් දෙකක් යොදවන්න ඕනෑ. ඒ නිසා ඒ අය නඟන ඒ තර්ක නිකම් පුහු තර්ක. ඒවා ඒ සංගමයේ සභාපතිකම රැක ගන්න, එහෙම නැත්නම් තමන්ගේ මඩිය තර කර ගන්න කරන තර්ක. එම නිසා රජයට වග කීමක් තිබෙනවා කවුරු මොන ආකාරයෙන් කටයුතු කළත් මේ රටේ මහ ජනතාවගේ යහපත සැලැස්වීමට. එය රජයේ වග කීමක්. ප්‍රවාහන අමාත්‍යාංශය සහ රජය ඒ වගකීම ඉෂ්ට කරන්න සූදානම්. ඒ නිසා අපට එක් එක්කෙනාගේ කථා වැඩක් නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා පත්තරයක මම දැක්කා, මේ රටේ සියයට 60ක් මානසික රෝගීන් ඉන්නවා කියලා එක දොස්තර මහත්තයෙක් කියලා තිබෙනවා. තව කෙනෙක් කියනවා සියයට 25ක් ඉන්නවා කියලා. තවත් කෙනෙක් කියනවා සියයට 10ක් ඉන්නවා කියලා. අපි ඒවා පිළිගන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
සියයට 10ක් ඉන්නවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා, අපි ඒක පිළිගන්නේ නැහැ. හැබැයි අපි එකක් පිළිගන්නවා. මේ වාගේ පිස්සෝ දෙදෙනෙක්, තුන් දෙනෙක් නම් ඉන්නවා. [බාධා කිරීම්] මේ වාගේ පිස්සෝ දෙදෙනෙක්, තුන් දෙනෙක් මේ රටේ ඉන්නවා කියන එක නම් අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා. අද කුමන්ත්‍රණකාරී ලෙස මේවා කරලා, කකුලෙන් පස්සට ඇදලා අප ගෙන යන සංවර්ධනය නවත්වන්න බැහැ කියලා. එය Z-score ගැටලුව වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වෙන වෙන දේවල් වෙන්න පුළුවන්. මොකක් හෝ ආකර්ෂණීය වචන, ආකර්ෂණීය දේවල් අරගෙන තමයි අද රටේ ජනතාවට මේ රටේ විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ කථා කරන්නේ. හැබැයි දැන් ඒවා ඉවරයි. ආකර්ෂණීය වචනවලට රැවටුණු කාලය ඉවරයි. ජනතාව ඒවා ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ජනතාව යථාර්ථයත් එක්කයි යන්නේ. යථාර්ථයත් එක්ක යන ගමනේදී මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න- [බාධා කිරීම්] ඔව්, අපි කෙටි කාලයකින් ඒ දේවල් කරනවා. අපි කිව්ව දේවල් කරනවා. මහින්ද චින්තනය ඉදිරි දැක්ම තුළ මේ රට ස්වයංපෝෂිත කරන්න ඒ වැඩ පිළිවෙළ කරනවා. තමුන්නාන්සේලාට බලය තිබෙන

[ගරු රෝහණ දිසානායක මහතා]

කොට ඒක කරන්න බැරි වුණා. අද තමුන්නාන්සේලා ඒ ගැන කථා කරනවා. හැබැයි බලය තිබෙන කොට තමුන්නාන්සේලාට කරන්න බැරි වුණා. ඒක කරන්න බැරි වුණු පිරිසක්- [බාධා කිරීම්] අද කියනවා, බලය තිබ්බා නම් මෙහෙම කරනවා කියලා. ඒ නිසා අපිට කනගාටුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා, යථාර්ථය තේරුම් අරගෙන අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න, මේ රටේ ජනතාවට සහන සලසන්න අපි ඔක්කෝම එකතු වෙමු කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. Next speaker is the Hon. Vijitha Herath.

[අ. භා. 3.01]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උපන්ගෙයි කොරයට තෙල් බෙහෙත් පත්තු බැන්දාට වැඩක් නැහැ. ඒ කොරය අරින්න බැහැ නේ. ඒක තමයි අපේ ගරු රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා පෙන්නුම් කළේ. ඒක ඉතා පැහැදිලියි.

දැන් මේ ආණ්ඩුව වෙනුවෙන් ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා දිගින් දිගටම තර්ක කරමින් ඉදිරිපත් කළා, මේ බදු පැනවීම තුළ අපේක්ෂා කරන මූලික ඉලක්කය. එතුමා කිව්වේ, දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තමයි මේ බදු පනවන්නේ කියලා. දේශීය නිෂ්පාදනය වැඩි කරන්න බදු පැනෙවුවාට පමණක් බැහැ. ඒක අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඉතා පැහැදිලිව පිළිගන්නවා ඇති. දේශීය නිෂ්පාදනය වැඩි කරන්න නම් අනිවාර්යයෙන්ම ඒ සඳහා වෙච්ච කෙටි කාලීන, දිගු කාලීන සැලසුම් ක්‍රියාත්මක කිරීම්, නිෂ්පාදනය වැඩි කිරීම් අවශ්‍යයි. හීනෙන් හය වෙලා නැගිට්ටා වාගේ එක පාරටම බදු වැඩි කළාට දේශීය නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැ. ඔබතුමාම පිළිගන්නවා ඇති ඊයේ අලවලට බදු ගැහුවාට දේශීය නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැ කියලා. ඊයේ ඡන්දය ඉවර වෙච්ච ගමන් එක පාරටම ඔබතුමන්ලා සැමන් ටින් එකේ බද්ද ආපහු වැඩි කළා. රුපියල් 25කින් බදු වැඩි කළා. ඡන්දය කිට්ටු වෙලා, ඡන්දය ආසන්නයේදී බදු අඩු කළා. මේකෙන් කොහොමද අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරන්නේ? ඒක සැලසුම් සහගත, දූරදර්ශී දැක්මක් ඇතුව සිද්ධ වන දෙයක්ද? ඔබතුමාම ඒක නැහැයි කියලා දකිනවා ඇති. ඔබතුමාම ඒක ඡන්ද ගුණ්ඩුවක්, නිකම් දීපු සීනි බෝල්යක්, ටොපියක් කියන එක පිළිගන්නවා ඇති.

අපි මහා ලොකුවට වචනවලින් කථා කරනවා දේශීය නිෂ්පාදනය වැඩි කරන්න. අලවලට බදු ගැහුවේ ඊයේ. දැන් අල ගලවලා ඉවරයි. අලවලට බදු ගහන්න තිබුණේ මීට මාසයකට කලින්; අල ගොවියෝ තමන් වගා කරපු අල ටික විකුණා ගන්න බැරිව පසු ගිය මාසය, මාස එකහමාර තිස්සේ පාරවල්වල උද්ඝෝෂණය කරන කොට. එතකොට ඒ ගොවියාට සාධාරණ මිලක් ලැබුණේ නැහැ. දැන් අශ්වයා පැනලා ඉවරයි. දැන් ඉස්තාලය වහනවා. මෙහෙම පුළුවන්ද ආශ්චර්යය ගෙනෙන්න ගරු ඇමතිතුමනි? ඒක තමයි ඔබතුමන්ලාගේ තිබෙන අදූරදර්ශී දැක්මේ තත්ත්වය. ඇත්තටම ගත්තොත් අලවලට බදු ගහන්න තිබුණේ අල ගලවන්න කලින්; ගොවියා අල ටික විකුණා ගන්න වෙළෙඳ පොළට දමන්න කලින්. නමුත් දැන් අලවලට බදු ගහලා ඒකට උත්තර හොයන්න බැහැ. ඇත්තටම මෙතැන තිබෙන්නේ ඔය ඔබතුමන්ලා මතු කරන සාධාරණ හේතු නොවෙයි. දේශීය නිෂ්පාදනය වැඩි කිරීම ඉලක්ක කර ගෙන නොවෙයි. ඉතා පැහැදිලිව ඔබතුමන්ලාගේම ආර්ථික සංඛ්‍යා ලේඛන, දත්ත අනුව ඔප්පු වෙනවා මේ බදු පැනවීමේ ප්‍රතිපත්තිය තුළ අපේ රටේ දේශීය නිෂ්පාදනය වැඩි වුණෙත් නැහැ, අපේ රටේ වගා කරන්න පුළුවන්, වගා කරන ඒ මූලික ද්‍රව්‍ය ආනයනය කිරීම අඩු වෙලත් නැහැ කියන එක. ආනයනය කිරීම වැඩි වෙලා තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ආනයනය අඩු වෙලා නැහැ නේ. මට ඔප්පු කරලා පෙන්වන්න ඔය බදු ප්‍රතිපත්තිය නිසා ආනයනය අඩු වෙලා තිබෙනවා නම්. මට පෙන්වන්න කුරක්කන් ගෙන්වපු එක අඩු වෙලා තිබෙනවාද කියලා. කුරක්කන් සාටකය පැළඳගෙන ඉඳීම තුළම ඔප්පු කරලා පෙන්වන්න එපැයිනේ අඩුම ගණනේ කුරකන්වලට ගහපු බදුවලින් අපි ආනයනය කරපු කුරක්කන් ප්‍රමාණය අඩු කරලා තිබෙනවා කියලා. නමුත් මේ සංඛ්‍යා ලේඛන තුළ ඉතා පැහැදිලිව ඔප්පු කරලා තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත. ඔබතුමන්ලාගේම "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2012" අනුව 2011 ජනවාරි -අප්‍රේල් බදු ආදායම රුපියල් මිලියන 2,49,790යි. ඊට සාපේක්ෂව 2012, ඒ කියන්නේ මේ වර්ෂයේ ජනවාරි - අප්‍රේල් බදු ආදායම රුපියල් මිලියන 2,76,488යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමු මාස හතර තුළ රුපියල් මිලියන 26,698කින් බදු ආදායම වැඩි වෙලා තිබෙනවා. ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්ද තුළ රජයේ බදු ආදායම රුපියල් මිලියන 26,698කින් වැඩි වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේම මේ වාර්තාවට අනුව බදු ආදායම වැඩි වෙන කොට රජයේ බදු නොවන ආදායම අඩු වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ රුපියල් මිලියන 35,123ක් වෙච්ච බදු නොවන ආදායම, මේ අවුරුද්දේ රුපියල් මිලියන 29,089ට අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 6,034කින් බදු නොවන ආදායම අඩු වෙලා තිබෙනවා කියන එකයි. එතකොට ඔබතුමන්ලා වැඩි කරලා තිබෙන්නේ බදු ආදායමයි. ඒ බදු ආදායම වැඩි කිරීමේ දී ආනයන බදු වැඩි කරලා බදු ආදායම වැඩි කරලා නැහැ. ඉතා පැහැදිලිව ඔබතුමන්ලා වැඩි කරලා තිබෙන්නේ එකතු කළ අගය මත බදු, නිෂ්පාදන බදු, සුරා බදු, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු, ජාතිය ගොඩනැඟීමේ බදු සහ අනෙකුත් බදුයි.

2011 වර්ෂය සඳහා ආනයන බද්ද ගත්තොත් ඔබතුමන්ලා උපයලා තිබෙන ආදායම රුපියල් මිලියන 30,098යි. ඒ ගිය අවුරුද්දේ. මේ අවුරුද්දේ - 2012 - රුපියල් මිලියන 30,151යි. මේ කාලය තුළ වර්ධනය සියයට දශම 2යි. ඉදිරි මාස කිහිපය තුළ තව පුංචි ගණනකින් වෙනස් වෙන්න පුළුවන්. අනෙකුත් බදු ආදායම් තමයි, ඇත්තටම ශීඝ්‍ර ලෙස වැඩි වෙලා තිබෙන්නේ. මේ සංඛ්‍යා ලේඛනවලට අනුව ඉතා පැහැදිලිවම 2011 ජනවාරි - මැයි කාලය තුළ බදු ආදායම සියයට 11.9කින් වැඩි වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ පළමුවන මාස පහයි, මේ අවුරුද්දේ පළමුවන මාස පහයි සංසන්දනය කළාම බදු ආදායම සියයට 11.9කින් වැඩි වෙලා තිබෙනවා. බදු නොවන ආදායම සියයට 13.4කින් අඩු වෙලා තිබෙනවා. ඇත්තටම ගත්තොත් ඒ වැඩි කර තිබෙන්නේ

ආදායම් බදු නොවෙයි. ආදායම් බදුවලින් රජයේ ආදායම වැඩි කර ගන්න ප්‍රමාණයට වඩා, ඔබතුමන්ලා වැඩි කරලා තිබෙන්නේ නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩ නැඟීමේ බදු, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු කියන ඒවායි. ඒවායින් තමයි ඔබතුමන්ලාගේ බදු ආදායම වැඩි කරලා තිබෙන්නේ. ඒ නිසා බදු ආදායම වැඩි කරලා දේශීය කෘෂි කර්මාන්තය නඟාසිටුවන්නට, ඒ සඳහා වෙච්ච නිෂ්පාදනවල වැඩි වීමක් කරලා නැහැ. ඒ සඳහා වෙච්ච සංඛ්‍යා ලේඛන ඔබතුමන්ලාගේම ආර්ථික පොත්වල, මහ බැංකු වාර්තාවල තිබෙනවා. ඒ වාර්තාවලට අනුව 2012 වසරේ ජනවාරි - ජුනි කාලය තුළ අල කිලෝ 63,01,339ක් අපි ආනයනය කර තිබෙනවා. ඒ වාගේම රතු ලූනු, මිරිස්, මිරිස් කුඩු, සුදු ලූනු, කව්පි, ග්‍රීන් පීස්, කුරක්කන්, රට කජු, ටින් මාළු, උම්බලකඩ, ඉඟුරු සහ කහ -මේ ඔක්කොම- අපි ආනයනය කරනවා. ඒවායේ අඩු වීමක් නැහැ. බදු ප්‍රතිපත්තිය තුළ ආනයනය කරන ප්‍රමාණය අඩු වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවුරුද්දේ මුල් මාස හය ඇතුළත -ජනවාරි ජුනි- කිරි ආහාර කිලෝග්‍රෑම් 4,48,98,691ක් ආනයනය කරලා තිබෙනවා. මෙහේ කිරි හලනවා. අඹේවෙල නිෂ්පාදනාගාරයේ කිරි බවුසර් ගණන් වළවල්වලට හලනවා. හැටන් තලවකැලේ පැත්තේ දොවන කිරි ටික විකුණා ගන්න බැරිව කිරි බවුසර් ගණන් මහ පාරේ හලනවා. ඒ කිරි ගොවීන් තමන් නිෂ්පාදනය කරපු කිරි ටික විකුණා ගන්න බැරිව අද අලුත් රබන් පදයකුත් ගහනවා, "කිරි දොවපිය - මහ හලපිය, කිරි දොවපිය - මහ හලපිය, කිරි දොවපිය - මහ හලපිය" කියලා. දොවා ගන්න කිරි ටික විකුණා ගන්න බැහැ. හැබැයි අපි කිරි නිෂ්පාදන ආහාර කිලෝග්‍රෑම් 4, 48,00,000ක් ආනයනය කරනවා. මේකයි තත්ත්වය. කෝ, ඔබතුමන්ලාගේ බදු ප්‍රතිපත්තිය තුළ ඒවා අඩු කළාද? ඔබතුමන්ලා කියන විධියට අඩු කරලා පෙන්වන්න එපායැ.

ඊළඟට, සීනිවල තත්ත්වය කොහොමද? මේ අවුරුද්දේ පළමුවැනි මාස හය ඇතුළත විතරක් සීනි කිලෝග්‍රෑම් 28,87,29,043ක් අපි ආනයනය කරලා තිබෙනවා. සීනිවලට ඔබතුමන්ලා මොකක්ද කළේ? ලෝක වෙළෙඳ පොළේ සීනි මිල රුපියල් 10කින් අඩු වුණා. ඔබතුමන්ලා ඒ සහනය මේ රටේ පාරිභෝගිකයාට දුන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ රුපියල් 10 මේ රටේ ජනතාව මත පටවලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව ලාභ ලැබුවා මිසක් ජනතාවට ඒ සහනය දුන්නේ නැහැ. නමුත් අද දේශීය නිෂ්පාදනය වැඩි කරන්න කථා කරනවා. එහෙම නම් සීනි නිෂ්පාදනාගාර වැඩි වෙලා අපි ආනයනය කරන සීනි ප්‍රමාණය අඩු වෙන්න ඕනෑ. දේශීය නිෂ්පාදනය වැඩි කරන්න නම් අපේ සීනි නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. නමුත් එහෙම දෙයක් වෙලා නැහැ. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ පැවැත්ම සඳහා, ඔබතුමන්ලාගේ නාස්තිකාර වියදම් පියවා ගැනීම සඳහා ජනතාව මත බදු පැටෙව්වා බොරු සූත්තරයක් ආදේශ කරලා. "දේශීය නිෂ්පාදනය නඟා සිටුවීම" කියන ලස්සණ සටන් පාඨයට මුවා වෙලා ඔබතුමන්ලාගේ ආදායම වැඩි කර ගන්නවා. ඒක හරියට අකුරැස්සේ ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ මැතිවරණ තේමා පාඨය වාගේ. අවුරුදු 14ක් වයසැති දැරිය දූෂණය කළ අකුරැස්සේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ මැතිවරණ තේමා පාඨය වුණේ, "සීමා මායිම් නැති මනුස්සකම." හරි ලස්සණ තේමා පාඨයක්. ඒකට මුවා වෙලා තමයි අර කිරි සප්පයාව දූෂණය කළේ. ඔබතුමන්ලා අද "දේශීය නිෂ්පාදනය වැඩි කිරීම" කියන තේමාවට මුවා වෙලා ජනතාව මත බදු පටවලා ඒ ලබා ගන්නා ආදායම තමුන්නාන්සේලාගේ පැවැත්මට, බඩ ගෝස්තරයට වියදම් කරනවා මිසක රටේ ජනතාවට සහන දෙන්නේ නැහැ. ඒක තමයි මේ දත්තවලින් ඔප්පු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට නිෂ්පාදනය කරන්න පුළුවන් අත්‍යවශ්‍ය දේවල් අපි නිෂ්පාදනය කරලා නැහැ. ඔබතුමන්ලා කියනවා නම් දේශීය නිෂ්පාදනය වැඩි කරන්න තමයි බදු ගහන්නේ කියලා, පෙට්‍රල් ලීටරයකට රුපියල් 42ක් බදු ගහන්නේ ඇයි? පෙට්‍රල් ලීටරයට රුපියල් 42ක් බදු ගහන්නේ දේශීය නිෂ්පාදනය වැඩි කරන්නද? ඔබතුමන්ලා ඒකෙන් විතරක් වාර්ෂික බදු ආදායම සොයනවා, රුපියල් මිලියන 38,000ක්. ඩීසල් මත ගහන බද්දෙන් ඔබතුමන්ලා වාර්ෂිකව රුපියල් මිලියන 12,000ක ආදායමක් සොයනවා. ඒ කියන්නේ පෙට්‍රල් සහ ඩීසල් සඳහා -තෙල් සඳහා- ගහන බදුවලින් රුපියල් මිලියන 50,000ක ආදායමක් සොයනවා, මේ ආණ්ඩුව. ඒ, ජනතාවගේ තෙල් නිෂ්පාදනය වැඩි කරන්නද? රටේ පෙට්‍රල්, ඩීසල් නිෂ්පාදනය වැඩි කරන්නද මේ තරම් බද්දක් ගහන්නේ? ඇයි පෙට්‍රල් ලීටරයකට රුපියල් 42ක් බදු ගහන්නේ? ඒකෙන් දේශීය නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්ද? බැහැ නේ. මේවා නිකම් ගොන් තර්ක විතරයි; නිකම් පුස් තර්ක විතරයි. හරි පැහැදිලියි ඔබතුමන්ලා මේ බදු ගහන්නේ ඔබතුමන්ලාගේ නාස්තිකාර වියදම් පියවා ගන්න කියලා.

2012 ජුනි මාසයේ -මාස දෙක තුනකට කලින්- ටින් මාළු කිලෝග්‍රෑම් එකකට බද්ද රුපියල් 85ක්ව තිබුණා. කරවල රුපියල් 100යි. මොකක්ද කළේ? මැතිවරණ කාලයේදී ටින් මාළුවල බද්ද රුපියල් 50ට බැස්සුවා. ඡන්දය කිට්ටු වන විට රුපියල් 50ට බැස්සුවා. එහෙම කරලා බඩු මිල අඩු කරනවා කියලා මහා සන්දර්ශනයක් පෙන්නුවා. ඡන්දය ඉවර වුණ ගමන් ආපහු රුපියල් 25ක් බදු ගැහුවා. කරවල කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 100ක් තිබුණ බද්ද ඡන්දය කාලයේ රුපියල් 70 දක්වා අඩු කළා. හෙට අනිද්දා වන විට ඒක ආපසු වැඩි කරයි. මේක දූර දැක්මක් අනුව රටේ දේශීය නිෂ්පාදනය නඟා සිටුවීම සඳහා කරන බදු ප්‍රතිපත්තියක් නොවෙයි. මේවා හුදෙක් තමුන්නාන්සේලාගේ නාස්තිකාර ආණ්ඩුවේ වියදම් පියවා ගන්න බොරු සූත්තර දාලා කරන සෙප්පඩ විජ්ජාවන් විතරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අද මේ බදු ප්‍රතිපත්තිය තුළ රටේ නිෂ්පාදනය වැඩි වෙලා නැහැ. රටේ ආර්ථිකයේ ශීඝ්‍ර වර්ධනයක් වෙන්න, නිෂ්පාදනයේ වර්ධනයක් වෙන්න මේක කිසිසේත් ඉවහල් වෙලා නැහැ. ඒ නිසා මේ බොරු වචනවලට මුවා වෙලා කරන ප්‍රෝඩාව නතර කරන්න කියලා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මේ බදු ප්‍රතිපත්තිය ඇතුළේ බොහෝ දේවල් දේශපාලන මැදිහත්වීම මත සිද්ධ වෙනවා කියන එක දැන් ඉතා පැහැදිලිව ඔප්පු වුණා. ඒක අද මූල්‍ය ක්ෂේත්‍රයේ සෑම අංශයකම සිදු වෙමින් තිබෙනවා. පසු ගිය දවස්වල කොටස් වෙළෙඳ පොළට සිදු වුණේ ඒක. අදත් කොටස් වෙළෙඳ පොළෙහි ක්‍රියාත්මක වන මාෆියාව තුළ තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි දේශපාලන මැදිහත්වීම.

ඒ විතරක් නොවෙයි, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ කොටස් වෙළෙඳ පොළේ මුදල් ගනුදෙනුව තුළ ඇති වුණ අක්‍රමිකතාව පිළිබඳව අපි ඉතා පැහැදිලිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ඒක, හුදෙක් පුද්ගලයෙක් ඉලක්ක කරලා නොවෙයි කළේ; මේ රටේ යහ පාලනය ඇති කිරීම සහ මේ රටේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ පවතින්න ඕනෑ විනිවිද භාවය ආරක්ෂා කිරීම සඳහා කළ දෙයක්. ඒ පැමිණිල්ල විභාග වෙනවා; විභාග වෙන එක හොඳයි. පැමිණිල්ල විභාග කරලා ඒ පිළිබඳව නිසි පිළියම් ගන්න එක හොඳයි. හැබැයි අද මොකක්ද එතැන සිද්ධ වෙන්නේ? පසු ගිය කාලය තුළ අපිට ඉතා පැහැදිලිව නිරීක්ෂණය වුණා, ඒ විමර්ශන කටයුතු සිදු වන්නේ පටු දේශපාලන අරමුණක් ඉලක්ක කර ගෙන කියලා.

[ගරු විජිත හේරත් මහතා]

පසු ගිය කාලයේ "දිවි නැගුම" පනත් කෙටුම්පත වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් කිහිපයක් ඉදිරිපත් කළා. මේක ලෝක පුදුමයක් කියන්නේ හිටපු ගමන්, ඒ "දිවි නැගුම" පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වෙන දවසේම අර සභාපතිවරයාව ප්‍රශ්න කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කැඳවනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ නඩුව අහන කොට එදාම හරියට මේ සභාපතිවරයා පිළිබඳ පරීක්ෂණය පැය හතරහමාරක්, පහක් තිස්සේ ක්‍රියාත්මක වෙනවා. ඒ, "දිවි නැගුම" පනත් කෙටුම්පත පිළිබඳ දෙවෙනි විභාගය ශ්‍රේෂ්ඨාධිකරණයේ ගත්ත දවසේ. පැහැදිලිවම, සභාපතිවරයාව ඒ විධියට ප්‍රශ්න කරනවා. ඊයේ "දිවි නැගුම" පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබුණ තීන්දුව පාර්ලිමේන්තුවට ගේන මොහොතේත් හරියටම සභාපතිවරයාව ඒ කොමිෂන් සභාවට ගෙනත් පැය හතරහමාරක්, පහක් ප්‍රශ්න කළා.

කොටස් වෙළෙඳ පොළේ ඇති වෙච්ච මූල්‍ය වංචාවන් පිළිබඳව, ඒ අක්‍රමිකතාවන් පිළිබඳව සොයා බලන්න ඕනෑ. ඒක පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක පාවිච්චි කරලා මේ මොකක්ද කරන්න හදන්නේ? අධිකරණ තීන්දුවලට යම් දේශපාලන බලපෑමක් කරන්න නේද හදන්නේ? ඒක කාටද තේරෙන්නේ නැත්තේ? ඒක මේ රටේ ඕනෑ කෙනකුට තේරෙනවා. කෙනකුට නිකම්ම කියන්න පුළුවන් "නැහැ, ඒක එහෙම නෙමෙයි, ඒක ස්වභාවිකව හරියටම ඒ දවසේ ඇවිල්ලා තිබෙනවා, පනත මෙදා ඇවිල්ලා තිබෙනවා" කියලා. නැහැ, මේ තමයි නීතියේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීම, දේශපාලන මැදිහත් වීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඉතා අවධාරණය කරනවා, අල්ලස් කොමිෂන් සභාවට මේ පැමිණිල්ල කළේ පුද්ගලයෙක්ව ඉලක්ක කරලා, පුද්ගලයෙක්ව යම් ප්‍රශ්නකාරී තැනකට දාලා දේශපාලන blackmail කිරීමක් සඳහා නොවෙයි කියලා. අද ඒක blackmail කිරීමක් බවට පත් වෙලා තිබෙනවා. ඒක තමයි අද අධිකරණ සේවා කොමිෂන් සභාවට සිද්ධ වෙලා තිබෙන්නේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ මේ ස්වාධීනත්වයට ඇඟිලි ගහනවා, දේශපාලන බලපෑම් කරනවා කියලා ජනතාවගේ දැනුවත් වීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කරන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට බලපෑම් කරලා දේශපාලන මැදිහත් වීම් තුළින් ආණ්ඩුවට ඕනෑ කරන තීන්දු තීරණ ගන්න යනවා නම් ඒක බරපතළ අපරාධයක්. ඒ නිසා ඒක වහාම නතර කරන්න. මූල්‍ය ක්ෂේත්‍රයේ සිද්ධ වන ඒ අක්‍රමිකතා නතර කරන්න. ඒ සඳහා අධිකරණයේ ස්වාධීනත්වය කෙලෙසලා එම බලපෑම් හරහා යම් උත්සාහයක් කරනවා නම් එය වහාම නතර කරන්න කියන බලපෑම කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.17]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා වැදගත් බදු යෝජනා කීපයක් ගෙන එන අවස්ථාවේ මටත් කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ඉල්ලීම මත, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම මත රජය කෘෂි කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සහ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ යෙදෙන ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා පසු ගිය කාල වකවානුවේ විවිධ අවස්ථාවල බදු පැනවීම් රාශියක් සිද්ධ කළා. එසේ සිද්ධ කළේ මේ රටේ අල ගොවියා, ලූනු ගෙවියා ඒ වාගේම එම ක්ෂේත්‍රයේ ඉන්න සියලුම ගොවීන් ආරක්ෂා කර ගැනීමේ බලාපොරොත්තුව ඇතිව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා මේ වකවානුව ලොකු ලූනු අස්වැන්න නෙළමින් ඉන්න අවස්ථාව බව. ඒ ගොවීන්ට තමන්ගේ නිෂ්පාදන සාධාරණ මුදලකට විකුණා ගැනීම සඳහා අවස්ථාවක් සලසා දිය යුතුව තිබෙනවා. ඒ නිසා තමයි බදු පැනවීම මඟින් මිල මට්ටම ස්ථාවර කර ගැනීමට රජය කටයුතු කරන්නේ. ඒක ගොවියා ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමක්. ඒ වාගේම මේ මොහොත වන විට අර්තාපල් අස්වැන්නත් නෙළමින් ඉන්නවා. ඒ නිසා ආනයනික අර්තාපල්වලට බදු පනවලා එම ගොවියා ආරක්ෂා කරන්නත් රජය කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වයේ සමහර ගරු මන්ත්‍රීවරු ඒක වැරැදි විධියට විග්‍රහ කෙරුවා. මම කියන්න සතුටුයි, මේ බදු පැනවීම නිසා තමයි අපේ රටේ නිෂ්පාදනය වැඩි වුණේ කියා. එසේ ගොවියා ආරක්ෂා කිරීමෙන් ගොවියා තුළ ලොකු විශ්වාසයක් ඇති වෙනවා. අස්වැන්න නෙළන සෑම කාලයේම ආනයනයන් සඳහා රජය බදු පැනවීමක් කරලා ඒ ගොල්ලන්ව ආරක්ෂා කරනවා කියලා ඒ අය තුළ දැන් ලොකු විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ නිසා තමයි ඒ ගොල්ලන් එම වගාවන් කිරීම සඳහා ඉදිරිපත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ මම කියන්න සතුටුයි අපේ රටට වර්ෂයකට ලොකු ලූනු මෙට්‍රික් ටොන් 250,000ක් අවශ්‍ය වන බව. වර්ෂයකට මෙට්‍රික් ටොන් 60,000ක විතර ප්‍රමාණයක් තමයි මෙච්චර කාලයක් අපි නිෂ්පාදනය කළේ. මේ වර්ෂයේ මේ මොහොත වන විට ලොකු ලූනු මෙට්‍රික් ටොන් 95,000ක අස්වැන්නක් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වගේමයි අල වගාවත්. සෑම වර්ෂයකම අර්තාපල් මෙට්‍රික් ටොන් 240,000ක්, 250,000ක් අතර ප්‍රමාණයක් අපට අවශ්‍ය වෙනවා. කවදාවත් අපට අලවලින් ස්වයංපෝෂිත වෙන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. එහෙම නම් මුළු උඩරට කඳුකරයම සුද්ද කරලා අපට අල වවන්න සිද්ධ වෙනවා. ඒක කරන්න බැහැ. නමුත්, මේ වර්ෂයේ මේ මොහොත වන විට අපි අර්තාපල් මෙට්‍රික් ටොන් ලක්ෂයක අස්වැන්නක් බලාපොරොත්තු වෙනවා. මුළු අවශ්‍යතාවෙන් සියයට 45ක විතර ප්‍රමාණයක් මේ වර්ෂයේදී අපි බලාපොරොත්තු වෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනෙක් එළවලු හදන ගමන් තමයි මේවා කරන්නේ. විජිත හේරත් මන්ත්‍රීතුමා ඇහුවා, "මොකුත් අඩු කරලා තිබෙනවාද?" කියලා. මොනවාද අඩු කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනගහනය වැඩි වීම අඩු වන තෙක් අඩු කරන්න පුළුවන් වෙන්නේ නැහැ. ජනගහනය වැඩි වීම අඩු කර ගන්න පුළුවන් වුණොත් රටේ අවශ්‍යතාවනුත් අඩු කර ගන්න පුළුවන්. හැබැයි සමහර දේවල් අඩු කරන්න පුළුවන් තැන්වල අපි අඩු කරලා තිබෙනවා. බීජ ගෙන්වීම අපි අඩු කර තිබෙනවා. මම ඔබතුමාට වග කීමෙන් යුක්තව කියනවා, මේ වර්ෂයේ මැයි මාසයේ 31 වෙනිදා දක්වා කාල සීමාව තුළ අපි ලංකාවට ආනයනය කරලා තිබෙන්නේ අර්තාපල් බීජ මෙට්‍රික් ටොන් 1,000ක් පමණයි කියලා. ඊට කලින් වර්ෂය බැලුවොත් මේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 6,000ක් වෙලා තිබෙනවා. නමුත් මේ වතාවේ අපේ රජය මඟින් ගෙන ගිය බීජ සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ අප දැන් ස්වයංව බීජ නිෂ්පාදනය කර ගැනීම සඳහා ගොවියාට අවශ්‍ය කරන තාක්ෂණය හා ඒ දැනුම බෙදා දීලා මේ වැඩ පිළිවෙළ ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක වේ ගෙන යනවා. ඒ නිසා මේ වර්ෂයේ බීජ ආනයනය කිරීම අඩු වී තිබෙනවා. මේ වර්ෂයේ අපේ ගොවිපොළවලත් බීජ නිෂ්පාදනය කළා. ඒ වාගේම පෞද්ගලික ගොවීනුත් තමන්ගේ බීජ නිෂ්පාදනය කර ගැනීමට පෙලඹුණා. ඉදිරි කාල සීමාව තුළ අඩුම ගණනේ තවත් ගොවීන් 500ක් මේ වැඩේට සහභාගි කරවා

ගන්න අපි බලාපොරොත්තු වනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක ගොවියෙක් බීජ අල මෙට්‍රික් ටොන් දහය ගණනේ නිෂ්පාදනය කළත් අපට ඇති, ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න. අපි දේශීයව නිෂ්පාදනය කරන බීජවල අස්වැන්න වැඩියි. පිට රටින් ගෙන්වන බීජවලින් අපි ලබන අස්වැන්න එකට අටක් නම්, දේශීයව නිෂ්පාදනය කර ගන්නා අපේ මව් අල බීජවලින් අඩුම ගණනේ අපට එකට විස්සක් ලබා ගන්න පුළුවන්. එකට විසිදෙක ලබා ගත් ගොවීනුත් ඉන්නවා. මේක තමයි මේකේ සත්‍ය කතන්දරය. මේ තත්ත්වය තමයි අපි ආරක්ෂා කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේමයි ලොකු ලූනු බීජ. මෙච්චර කාලයක් අපි ලොකු ලූනු බීජ ගෙන්නුවේ ඉන්දියාවෙන්. මේ මොහොත වන කොට අපි පිට රටින් ලොකු ලූනු බීජ ගෙන්වීම සම්පූර්ණයෙන් තහනම් කරලා තිබෙනවා. දැන් අපට ලොකු ලූනු බීජ ගෙන්වන්න ඕනෑ නැහැ. දැන් අපි වුවමනා තරම් බීජ නිෂ්පාදනය කර ගන්නවා විතරක් නොවෙයි, අපේ රටේ ගොවීන් ඒ දේශීය බීජ භාවිත කරන්නත් කැමැතියි. ඒගොල්ලනුත් නිෂ්පාදනය කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒවායේ අස්වැන්නත් වැඩියි. අපි නිෂ්පාදනය කර ගන්නා බීජවල අස්වැන්න එකට දහඅටක්, විස්සක් විතර ප්‍රමාණයක් ලැබෙනවා. පිට රටින් -ඉන්දියාවෙන්- ගෙන්වන බීජවලින් අපි මෙච්චර කාලයක් ලැබුවේ එකට දහයයි, දොළහයි වාගේ ප්‍රමාණයක්. අපි විශ්වාස කරනවා, මේ මට්ටම තවත් වැඩි කර ගන්න පුළුවන් කියලා. මේ මොහොත වන කොට දේශීයව නිෂ්පාදනය කරපු ලොකු ලූනු බීජ කිලෝග්‍රෑම් 2,000ක් විතර අපි දැන් ගබඩා කර ගෙන තිබෙනවා, ඊළඟ කන්නයට පාවිච්චි කරන්න. මේ බදු ප්‍රතිපත්තිය යටතේ ඒ මඟිනුත් අපි බදු අඩු කරලා තිබෙනවා. ගොවීන් මේ සඳහා යොමු කරන්න නම්, ඒගොල්ලන්ගේ නිෂ්පාදන වෙළඳ පොළට එන වෙලාවට ඒගොල්ලන්ගේ භාණ්ඩ සාධාරණ මිලකට විකුණා ගන්න පුළුවන් කියලා ඔවුන්ට සහතිකයක් තිබෙන්න ඕනෑ. මේ වර්ෂයේ මේ සහතිකය දුන්නා විතරක් නොවෙයි, මේ වර්ෂයේදී දේශීය ලූනු මිලදී ගන්නත් සතොස ඉදිරිපත් වුණා. ඒක ලොකු හයියක් වුණා. සතොසෙන් ලොකු ලූනු මිලදී ගන්න ඉදිරිපත් වුණු නිසා වෙළෙන්දන්ට වුවමනා හැටියට මේ තත්ත්වය පාලනය කර ගන්න බැරි වුණා. ඒ නිසා සමහර වෙළෙන්දෝ සංවිධානය වෙලා මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න, මේ වැඩ පිළිවෙළ ආක්‍රමණය කරන්න යම් කිසි දෙයක් ක්‍රියාත්මක කරයි. අපේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා මැදිහත් වෙලා ඒකත් දැන් නිරාකරණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ ගැටලු -ප්‍රශ්න - අපට නැතිවා නොවෙයි. අතරමැදියා මැදිහත් වෙලා මේ වැඩ පිළිවෙළේ යම් යම් තැන්වලදී කඩාකප්පල් කිරීම් කරනවා. අපි අතරමැදියා සම්පූර්ණයෙන් නැති කරන්න උත්සාහ කරන්නේත් නැහැ. අතරමැදියාත් ඉන්න ඕනෑ. නමුත් අතරමැදියාට මේ වෙළඳ පොළ පාලනය කරන්න දෙන්න බැහැ. අතරමැදියාට මේ වෙළඳ පොළ සම්පූර්ණයෙන් ආක්‍රමණය කරන්න ඉඩ දෙන්න බැහැ. ඒක තමයි මේ බදු ප්‍රතිපත්තියෙන් අපි බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ විජිත හේරත් මැතිතුමා ඇහුවා, "ආනයන නවත්වලා තිබෙනවාද?" කියලා. ආනයන නවත්වලා තිබෙන තව නිෂ්පාදනයක් මම කියන්නම්. ඒ තමයි බඩ ඉරිඟු. 2005 වර්ෂය වන කොට අපි බඩ ඉරිඟු අවශ්‍යතාවෙන් සියයට 85ක් ආනයනය කෙරුවා. පරිවාස ආණ්ඩු කාලයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා භාර අරගෙන සිටියා. සිංගප්පූරුවෙන් තමයි ඒ කාලයේ බඩ ඉරිඟු ඇට ගෙනාවේ. අද අපි සියයට සියයක් නිෂ්පාදනය කරනවා විතරක් නොවෙයි, මේ මොහොත වන කොට අපේ නිෂ්පාදනය සියයට 110ත්, 115ත් අතර ප්‍රමාණයක තිබෙනවා. මේ විධියට මේ නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් වුණේ රජයෙන් ලැබුණු ආරක්ෂාව සහ රජයෙන් ලැබුණු ආවරණය නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ ගොවීන්ට අවශ්‍ය කරන මූලික පහසුකම් සියල්ලම අපි ලබා දුන්නා. ඒ නිසා තමයි අද මේ තත්ත්වයට අපි ආවේ. ඒ නිසා එතුමන්ලා කියන තර්ක අපට පිළිගන්න බැහැ. එතුමන්ලා කියන්නේ කෙටි කාලීනව ඒගොල්ලන්ට වුවමනා විධියට මේ ආර්ථිකය හසුරවන්න ඉඩ දෙන්න කියලා. එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. මේක අපේ රටේ අපට වුවමනා හැටියට, අපේ ඉලක්කයන් දිනා ගැනීම සඳහා, අපේ ගොවීන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා රජය ගන්නා පියවරවල් බව කියන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි තවත් විවිධ පියවර ගන්නවා. මේක දීර්ඝ කාලීන සැලසුමක ප්‍රතිඵලයක්; අද ගත්ත සැලසුමක ප්‍රතිඵලයක් නොවෙයි. මේ මොහොත වන කොට අපේ ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉදිරි අනාගත සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහාත්, බීජ ගොවි පොළවල් සඳහාත් තවත් අවුරුදු පහක වැඩ පිළිවෙළකට -2015 දක්වා යන වැඩ පිළිවෙළකට- වුවමනා කරන සියලුම මුදල් දීලා තිබෙනවා. බීජ නිෂ්පාදනය කරනවා කියන්නේ දවසකින් දෙකකින් කරන්න පුළුවන් ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. පර්යේෂණ කටයුතු අවසාන වෙලා හොඳ බීජයක් නිෂ්පාදනය කර ගන්න දීර්ඝ කාලීනව අවුරුදු තුනක්-හතරක් සමහර වෙලාවට අවුරුදු පහක්-හයක් යනවා. ඒ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළකට වුවමනා කරන වියදම සම්පූර්ණයෙන් රජය මේ වන කොට ලබා දීලා තිබෙනවා. මේක තමයි සැලැස්ම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ බීජවලින් කරන නිෂ්පාදන සඳහා ගොවියාට සහතික මිලක් සහ සාධාරණ මිලක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන පරිසරය සකස් කිරීමත් රජයේ වග කීමක්. ඒ වගකීම මේ රජය ඉටු කරලා තිබෙනවා. විවිධ අවස්ථාවල මේ භාණ්ඩවල මිල උච්චාවචනයන්ට ලක් වන්නේ බදු මඟින් වෙළෙඳ පොළ හසුරුවන නිසායි. එසේ වෙළෙඳ පොළ හසුරුවන කොට සමහර වෙලාවට යම් යම් අවස්ථාවල අපේ පාරිභෝගිකයාට අඩු පාඩු සිදු වෙන්න පුළුවන්. නමුත් ගොවියා රැක ගැනීමේ බලාපොරොත්තුවෙන් තමයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක්. ගොවියා නිෂ්පාදනය කරන ද්‍රව්‍යවල ප්‍රමාණය ගැන අපේ භාණ්ඩාගාරය, අපේ ජනාධිපතිතුමා හැම තිස්සේම හොයනවා. කොච්චර බිමක් වගා කරලා තිබෙනවාද, කොච්චර නිෂ්පාදනයක් බලාපොරොත්තු වනවාද, ඒ කොයි කාලයේද කියා සොයා බලනවා. ඒ කියන කාල සීමාව කිට්ටු වන කොට එතුමා මේක සොයලා බලලා මේකට බද්දක් ගහනවා. ඒ අනුව තමයි විවිධ අවස්ථාවල්වල මේ බදු පැනවීම් අපි කරලා තිබෙන්නේ. කෘෂිකර්ම අමාත්‍යාංශය වශයෙන් අපට ලොකු වග කීමක් තිබෙනවා. වෙලාවට අපි මේ බද්ද ගහන්න රජයට උපදෙස් දෙන්න ඕනෑ, "මෙන්න මේ වෙලාවට මේක කරන්න" කියලා. ඒ අනුව තමයි මේ වැඩේ කර ගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේක රටේ ආර්ථිකය, රටේ අනාගතය වෙනුවෙන් ගන්න ඉතාමත් වැදගත් ක්‍රියා මාර්ගයක් හැටියටයි මා දකින්නේ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු අපෙන් අහනවා, "මොනවාද මේ වැඩි වුණේ?" කියලා. 2005 ඉඳලා 2009ට දක්වා තමයි මගේ ළඟ සංඛ්‍යා ලේඛන තිබෙන්නේ. 2010, 2011 වර්ෂ දෙකේ සංඛ්‍යා ලේඛන තවමත් එන්න තිබෙනවා.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

දැන් බඩ ඉරිඟුවල සියයට 210ක වැඩි වීමක් පෙන්වනවා. මුංඇටවල සියයට තුනක වැඩි වීමක් පෙන්වනවා. කව්පිවල සියයට විසිඑකක වැඩි වීමක් තිබෙනවා. අපි බඩ ඉරිඟු ටොන් දහදාහක් පිට රටත් යැව්වා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2009 වර්ෂය අවසානයේ තල නිෂ්පාදනයේ වැඩි වීම සියයට 38ක්, උඳු නිෂ්පාදනය වැඩි වීම සියයට 2ක්. ඊට පස්සේ මීටත් වඩා වැඩි වුණා. රට කජුවල වැඩි වීම සියයට 45යි. ලොකු ලූනුවල වැඩි වීම සියයට 47යි. මේවා තමයි 2005 ඉඳලා 2009 දක්වා තිබෙන සංඛ්‍යා ලේඛන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමුන්නාන්සේ දන්නවා, පසු ගිය වර්ෂ දෙකේ මහ කන්නය තුළින් අපට සියලුම අංශවලින් හොඳ අස්වැන්නක් ලැබුණාය කියන එක. කාලයකින් අපට ඉතාමත්ම සාර්ථක අස්වැන්නක් ලැබූ අවස්ථාවක් තමයි පසු ගිය මහ කන්නය. ඒ කන්නයේ තොරතුරු තවම ආවේ නැහැ. මේ සැරේ යල කන්නයේදී අපට නියඟය නිසා යම් කිසි ගැටලු -ප්‍රශ්න- කිහිපයක් මතු වුණා. සියයට 20ක විතර අස්වැන්න ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා. අස්වැන්න අඩු වුණත් මේ වර්ෂය තුළ මහ කන්නයේ ලැබූ සාර්ථක අස්වැන්න නිසා ඒකේ කිසිම ගැටලුවක් අපට මතු වෙන්නේ නැහැ. එවන් සාර්ථක වැඩ පිළිවෙළකට යන්නේ ගොවියාට විශ්වාසයකින් යුක්තව ඉදිරියට යන්න පුළුවන් විධියේ පරිසරයක් සකස් කරලා දුන්නු නිසායි. ඒක තමයි අපෙන් කෙරෙන්න ඕනෑ. ඒක තමයි රජයේ වග කීම.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ හීනෙන් බය වෙලා වාගේ බදු දැම්මා නොවෙයි; නැඟිටලා කලබල වෙලා මේ බදු දැම්මා නොවෙයි. කාලයක් තිස්සේ සැලසුමක් කර ගෙන මෙන්න මේ කාලයට මෙන්න මේ විධියේ බදු ප්‍රමාණයක් පනවනවාය කියන බලාපොරොත්තුවෙන් ගිහිල්ලා තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. පසු ගිය කාලයේ නියඟය පිළිබඳව ගැටලුව අපට මතු නොවුණා නම් මේ වන කොට මේ ගමන ඉතාම සාර්ථකව යනවා. හැබැයි අනිකුත් භෝග කෙරෙහි නියඟය අපට වෙස් වළා ගත් ආශීර්වාදයක් වුණා. මේ වර්ෂයේ නියඟය නිසා බොහෝ ගොවියෝ කුඹුරු ගොවිතැන්වලට ගියේ නැතිව කව්පි වගා කළා, මුං වගා කළා, වෙනත් භෝග වගා කළා. මම සන්තෝෂයෙන් කියනවා, මේ මොහොත වන කොට මුංඇටවලින් අපි ස්වයංපෝෂිත මට්ටමකට ඇවිල්ලා තිබෙනවාය කියලා. මේ වර්ෂයේ යල කන්නයේ අස්වැන්නත් එක්ක බැලුවාම මුංඇටවලින් අපි ස්වයංපෝෂිත මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම කව්පිත් ඒ හා කිට්ටුවට ඇවිල්ලා තිබෙනවා. සෝයා බෝංචි ඒ කිට්ටුවට ඇවිල්ලා තිබෙනවා. ඒ ගොවියෝ ජලය හිඟකම නිසා මේ විධියේ භෝග වගා කිරීම සඳහා පෙළඹුණා. එහෙම පෙළඹීලා අද සාර්ථක ගමනක් යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හැම ගමනකදීම අපට ලැබෙන ශක්තිය තමයි නියමිත වෙලාවට රජය බදු පනවලා ගොවියාට ස්ථාවර මිලක් ලබා දීම සඳහා ගන්නා ක්‍රියා මාර්ගය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම හැම ක්ෂේත්‍රයකටම, හැම ගමකටම, හැම ගෙදරකටම ගිහිල්ලා අපි දිවි නැගුම වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මේවා තමයි මේ ගොල්ලන්ට උහුලන්න බැරි වෙලා තිබෙන්නේ. මේක තමයි ඒ ගොල්ලන්ට පසු ගිය මැතිවරණයේදී ලැබුණු ප්‍රතිඵලය. ඉතින් ඒ මැතිවරණ ප්‍රතිඵලය ගැන දැන් ඒ ගොල්ලන් කියනවා, රජයේ මුල් බැස ගත් අසාර්ථකත්වයේ ප්‍රතිඵලයක්ය කියලා. මම ඒ ගොල්ලන්ට කියනවා, ඒ ගොල්ලන් දැන් පරාජයේ මුල් බැසගෙන ඉන්නවාය කියා. කවදාවත් ඒ ගොල්ලන්ට පරාජයෙන් ගැලවෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා ඒ ගොල්ලන් වියරුවෙන් කෑ ගැහුවත් කවදාවත් මේ වැඩ පිළිවෙළ නවත්වන්න බැහැ. අපේ ජනාධිපතිතුමාත් මේ වැඩ පිළිවෙළත් සාර්ථකව ඉදිරියට යන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.31]

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ඇමෙරිකාවේ හිටපු ජනාධිපතිවරයකු වූ වින්ස්ටන් චර්චිල් මහතා කියපු දෙයක් කියන්න කැමැතියි. එය මෙසේයි. "යම් ජාතියක් සෞභාග්‍යය අරමුණු කර ගෙන ජාතිය ඇතුළටම බදු පැනවීමෙන් ක්‍රියා කිරීමට වෙර දැරීම හරියට බාල්දියකට බැස ගත් මිනිසෙක් බාල්දි කොක්කෙන් අල්ලා ගෙන තමාම ඔසවා ගැනීමට වෙර දැරීම හා සමානයි."

ඒ අනුව බලනකොට මේ ආණ්ඩුවත් එවැනිම ක්‍රියාදාමයක යෙදිලා ඉන්න අවස්ථාවක තමයි අපි මේ කථා කරන්නේ. ගරු කෘෂිකර්ම ඇමතිතුමා කෘෂිකාර්මික පැත්ත ගැන කථා කළා. නමුත් බදු ප්‍රතිපත්තිය ගැන එතුමා කථා කළේ නැහැ. වින්ස්ටන් චර්චිල් ජනාධිපතිතුමා හිටියා නම් අද එතුමාගේ කටට සීනි දමන්න වටිනවා. මොකද, එදා එතුමාගේ කියමන අදට හරියටම ගැළපෙන නිසායි. මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ ගැන හිතලාම ඒ දවස්වල එතුමා ඒක කිව්වාද දන්නෙත් නැහැ.

අද දිගට හරහට බදු පනවමින් සාමාන්‍ය ජනතාවගෙන් බදු අය කරන වැඩ පිළිවෙළ දරුණු විධියට ගෙනි යනවා. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ පනත ගෙනාවේ අය වැය යෝජනාවක් අනුව, ජාත්‍යන්තරයේ මිල ගණන් වැඩි වෙනකොට තෝරා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩවල ආනයන බදු අඩු කර පාරිභෝගිකයන්ට සහනයක් ලබා දෙන්නයි. නමුත් පසු ගිය අවුරුදු දෙක-තුන ඇතුළත බදු අඩු වුණේත් නැහැ; පාරිභෝගික මිල අඩු වුණේත් නැහැ; අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු වුණේත් නැහැ. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට එක්තරා තීන්දුවක් ගත්තා, තීරු බද්ද, අය බද්ද සහ සෙස් බද්ද අයින් කරනවාය කියා. එහෙම අයින් කරලා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම, මිල පාලනය කිරීම සඳහා ගෙනාපු වැඩ පිළිවෙළ අනුව ඒ සහනය පාරිභෝගිකයාට යන්නේ නැහැ. කෘෂිකාර්මික පැත්තෙන් නිෂ්පාදකයා ගැන කතා කරන අතරතුර පාරිභෝගිකයා ගැන කථා කිරීමත් රජයේ වග කීමක් වෙනවා. නමුත් අපි එවැනි දෙයක් දකින්නේ නැහැ.

විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ විටින් විට පනවනු ලබන බදු ක්‍රියාවලිය දිහා බලනකොට අපට පෙනී යන්නේ ආණ්ඩුව ඒ පනතින් ඉතා සූක්ෂ්ම අන්දමින් රජයේ බදු ආදායම වැඩි කර ගැනීමේ සූදුවක යෙදෙන බවයි. ඒක තමයි ආණ්ඩුවේ අරමුණ වෙලා තිබෙන්නේ. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ -එක්දාස් අටසිය ගණන්වල- අධිරාජ්‍යවාදීන් එක එක විධියට බදු පනවා තිබෙනවා. ඒ දවස්වල ඔරු බද්ද, මරාල බද්ද, තුවක්කු බද්ද, බලු බද්ද ආදී වශයෙන් විවිධ බදු පනවනකොට අධිරාජ්‍යවාදී පාලකයන්ට විරුද්ධව ජනතාව ප්‍රසිද්ධ ජන කවි හදා කියා තිබෙනවා. මම ඒ ජන කවියකින් එක කොටසක් දැන් කියන්න කැමැතියි. මොකද, ඒ ජන කවිය අදටත් අදාළ වෙන නිසායි.

"ගමේ ගෙදරකට සෙනේ ඇතුව සිටි බලු කුක්කට මොන
බදුද අනේ තනේ තියෙන කිරි ටිකටත් බද්දක් ගෙවන්න
වේවිද ඉදිරි දිනේ"

ඒ විධියට බලනකොට එදා කියපු ඒ ජන කවිය අදටත් ගැළපෙනවා. එදා වින්ස්ටන් චර්චිල් ජනාධිපතිතුමා කියපු දෙයත් අදට ගැළපෙනවාය කියා මම හිතනවා. මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ අනුව අපට පෙනෙන්නේ අද මේ ආණ්ඩුව පුංචි

මිනිස්සු පාවිච්චි කරන කිරි පිටි, පාන් පිටි, පරිප්පු, හාල්මැස්සන් සහ සීනි ආදී අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල වැඩි කිරීමේ ව්‍යායාමයක් කරගෙන යන බවයි. මම මේ සභාව ඇතුළට එනකොට මට අහන්න ලැබුණා, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක්. මාත් දැක්කා "The Sunday Times" පුවත් පතේ පළ වී තිබූ ප්‍රවෘත්තියක්. පසු ගිය ඉරිදා "The Sunday Times" පුවත් පතේ පළ කර තිබෙන්නේ මොකක්ද? "Treasury stalls Customs probe on alcohol 'firms' ". මේකෙන් මොකක්ද කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? පිට රටින් වසර එකහමාරක් තුළ මද්‍යසාර ලීටර් දෙලක්ෂ හැටදහසක් මේ රටට ආනයනය කර තිබෙනවා. ඒවා නිෂ්පාදන හේතු මත ගෙනාපු දේවල්ය කියලා වැරදි තොරතුරු දීලා තිබෙනවා. මෙය රේගු දෙපාර්තමේන්තුවෙන් හොයා ගෙන බලන කොට රටට රුපියල් බිලියනයක පාඩුවක් - කෝටි සියයක වාගේ පාඩුවක්- සිද්ධ වෙලා තිබෙන බව පෙනී ගියා. ඒ අවස්ථාවේදී ඒකට ක්‍රියා මාර්ග ගන්න බලන කොට රජයෙන් මැදිහත් වෙලා කෙළින්ම ඒ පරීක්ෂණය නතර කරන්නය කියලා බලපෑම් කර තිබෙනවා. දැන් බලන්න, රටට කොච්චර පාඩුද කියලා. එක පැත්තකින් පාරිභෝගිකයා පාවිච්චි කරන පරිප්පු ටිකටයි, අල ටිකටයි, කිරි පිටි පැකට් එකටයි හිතන්නේ නැතිව පුදුම විධියට බදු අය කරනවා. නමුත් ශතයක්වත් බදු ගෙවන්නේ නැතිව, මත්පැන්වලට භාවිත කරන්න ලංකාවට ගෙනැල්ලා තිබෙන මද්‍යසාර ලීටර් දෙලක්ෂ හැටදහසක් සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන කොට, මේකට මැදිහත් වෙන්න එපා, මේක පරීක්ෂා කරන්න එපාය කියලා රජය රේගු දෙපාර්තමේන්තුවට කියනවා. ඉතින් බලන්න මේ ආණ්ඩුව ක්‍රියා කරන ආකාරය. පැහැදිලිව මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේකෙන් රටට වෙලා තිබෙන පාඩුව රුපියල් කෝටි සියයක වාගේ ප්‍රමාණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012.07.19 දිනැති අංක 1767/23 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙන්, ආනයනය කරනු ලබන මද්‍යසාර සඳහා ඒවායේ අඩංගු සැර ප්‍රමාණය මත ලීටරයකට රුපියල් දෙසියයක තීරු බද්දක් පනවා තිබෙනවා. පාර්ලිමේන්තුවට පනත් ඉදිරිපත් කරනවා; නීති ගෙනෙනවා. නමුත් තෝරා ගත්ත පිරිසකට, තෝරා ගත්ත ජාවාරම්කරුවන් පිරිසකට කිසිම බද්දකින් තොරව තමන්ට ඕනෑ තරම් මද්‍යසාර ගෙනෙන්න පුළුවන්. ඒ අයට බදු අය නොකර, නීති කඩලා ඕනෑ දෙයක් කරන්න පුළුවන් licence එක ආණ්ඩුවෙන් ලබා දෙනවා. ඉතින් මොකක්ද මේ ආණ්ඩුවේ අරමුණ? ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා දැන් ගරු සභාවට ආවා. මා හිතන හැටියට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් මේ කරුණ ඉදිරිපත් කළා. දැන් රටේ ආදායම්වල හිඟය - revenue deficit එක- බැලුවොත් 2012 වසරේ පළමුවැනි මාස 05 තුළ රුපියල් බිලියන 139යි. මාස 05කට revenue deficit එක රුපියල් බිලියන 139යි! ඉතින් මේ විධියට තෝරා ගත්ත ජාවාරම්කරුවන්ට බදු රහිතව, නීතිරීති කිසිම දෙයක් නැතිව තමන්ගේ ව්‍යාපාරය කරගෙන යන්න ඉඩ දීලා තිබෙනවා. ඒ හේතු නිසා තමයි රටේ ආදායමයි වියදමයි අතර මේ වාගේ පරතරයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආදායම සහ වියදම අතර පරතරයක් ඇති වන කොට ඊළඟට ආණ්ඩුව මොකක්ද කරන්නේ? අර පුංචි මිනිහා පාවිච්චි කරන කිරි පිටි, සීනි, පාන් පිටි වැනි සියලුම අත්‍යවශ්‍ය භාණ්ඩවලට බද්ද වැඩි කරනවා. තමන්ගේ බදු ආදායම් වැඩි කර ගන්න එතැනින් වැඩි කරගෙන යනවා. මේක තමයි ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ. ඉතින් මහජන සහනාධාරත් ඒත් එක්කම අඩු කරනවා. ඒකෙන් පහර වදින්නේ පුංචි මිනිහාට. අර තෝරා ගත්ත පන්තියකට ඕනෑ ඕනෑ විධියට හොර ජාවාරම් කරන්න ඉඩ දීලා, නීති කඩ කරන්න ඉඩ දීලා ඊළඟට ආණ්ඩුව කරන්නේ පුංචි මිනිහාට දෙන ඒ බදු සහනය, සහනාධාර නැති කරන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011ත් එක්ක සංසන්දනය කරලා බලන කොට ළදරු කිරි පිටි සහනාධාර වෙනුවෙන් ගිය වසරේ පළමුවැනි මාස 05ට රුපියල් මිලියන 41ක් වෙන් කර තිබෙනවා. මේ අවුරුද්දේ පළමු මාස 5ට දෙන සහනාධාරය රුපියල් මිලියන 28ට අඩු වෙලා තිබෙනවා. රුපියල් මිලියන 13ක අඩු වීමක් තිබෙනවා. ගිය අවුරුද්දේ මුල් මාස 05ට පෝෂණ මල්ලට රුපියල් මිලියන 103ක් වෙන් කරලා තිබුණා. මේ අවුරුද්ද වන කොට ඒක රුපියල් මිලියන 87ට අඩු වෙලා තිබෙනවා. මේ විධියට සහනාධාර කප්පාදු කරගෙන යනවා වියදම් අඩු කරන්න. නමුත් අඩු කරන්නේ පුංචි මිනිහාට දෙන සහනාධාරවලිනුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ආදායම් වැඩි කරන කොට පුංචි මිනිහා පරිභෝජනය කරන ආහාරවලට තමයි බදු වැඩි කරන්නේත්. ඒ නිසා අපි රජයට කරන චෝදනාව මොකක්ද? ආණ්ඩුව ආරක්ෂා කරන්නේ එක්තරා තෝරා ගත්ත පන්තියක් විතරයි. ඒ තෝරා ගත්ත පන්තිය පෝෂණය කරන්න ඕනෑ නිසා නීතිරීති කිසිවක් නැතිව මේ රටේ ඕනෑම දෙයක් කරන්න ඒ අයට licence එක දීලා තිබෙනවා.

මීට කලින් මේ ආණ්ඩුව මොකක්ද කළේ? ගිය වසරේ මෝටර් රථ සඳහා ආනයන බදු ප්‍රතිපත්තියක් ගෙනාවා. 2009 දී මොකක්ද කළේ? එක පාරටම සුඛෝපභෝගී වාහනවල බදු අඩු කළා. ඊට පස්සේ මොන්ටෙරෝ, පෙජෙරෝ වාගේ වාහන ලංකාවට ගේන්න පටන් ගත්තා. ගිය අවුරුද්ද වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් දීපු උපදෙස් මත වාහනවල බදු ආපහු වැඩි කරන්න කිව්වා. සුඛෝපභෝගී වාහනවල බදු වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි කළේ ත්‍රි රෝද සහ මෝටර් සයිකල්වල බදු. ආණ්ඩුව ආපහු ආදායම උපයන්න පටන් ගත්තේ පුංචි මිනිහා පාවිච්චි කරන වාහන සඳහා වැඩි කරපු බදුවලින්. සුඛෝපභෝගී වාහන සඳහා වැඩි කරපු බදු ප්‍රතිශතය ඇත්ත වශයෙන්ම අඩුයි. මේ වැඩ පිළිවෙළ අනුව බලන කොට ආණ්ඩුව වැඩ කරන්නේ එක කොටසකට, එක පන්තියකට කියන එක ඉතාම පැහැදිලියි.

රටක බදු ප්‍රතිපත්තිය සහ එම බදු ප්‍රතිපත්තියේ ක්‍රමවේදය තුළ පළමුවැනි කාර්ය භාරය වෙන්නේ රජයේ වියදම් සපුරා ගැනීමට ආදායම් සොයා ගැනීමයි. ආදායම් සොයා ගැනීමට නම් ආණ්ඩුවකට නිවැරදි බදු ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ ඉලක්කයෙන් අද මේ ආණ්ඩුව fail. ඒ ඉලක්ක අද අසාර්ථක වෙලා තිබෙනවා. ඒ කාර්ය භාරය ආණ්ඩුවට ඉටු කරන්න බැරි වෙලා තිබෙනවා. නිදසුනක් හැටියට 2012 වසර ගත්තොත්, අදායමයි වියදමයි අතර පරතරය පළමුවැනි මාස පහට රුපියල් බිලියන 139යි. එතකොට මෙහෙම යද්දී අපේ වෙළෙඳ හිඟය, අය වැය හිඟය මේ හැම දෙයකම මූල්‍ය ප්‍රශ්නයක් ඇති වෙනවා.

රටේ බදු ප්‍රතිපත්තියේ ප්‍රධාන කාර්ය භාරයක් තමයි රටේ ආදායම් විෂමතාව අඩු කිරීම සහ ඒ බදු ප්‍රතිපත්තිය නියම විධියට සකස් කිරීම. බදු ප්‍රතිපත්තිය හරහා රටේ ධනය සහ ආදායම ප්‍රතිව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළක් - redistribution of wealth - හරියට තිබෙන්න ඕනෑ. ඒක හරියට ඉලක්ක වෙන්න හරි බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත් අද මොකක්ද වෙන්නේ? ආණ්ඩුව ඊට වඩා ඒකෙන් අසාර්ථක වෙලා තිබෙනවා. අද කනගාටුයි ඒ ගැන කියන්න. ඇත්තටම බදු ප්‍රතිපත්තිය සකස් වෙන්න ඕනෑ ඇති අයගෙන් නැති අයට යන්නයි. නමුත් මේ රටේ මොකක්ද වෙලා තිබෙන්නේ?

මහින්ද චින්තනයෙන් පස්සේ ඒක reverse වෙලා තිබෙන්නේ. නැති අයගෙන් ඇති අයට යම් මුදලක් යනවා මිසක් ඇති අයගෙන් නැති අයට යන්නේ නැහැ. ඒක ඉතාම පැහැදිලියි. අද ඒක සහතික

[ගරු කබීර් හාෂීම් මහතා]

කරන්න පුළුවන් වන්නේ මේ කාරණය නිසායි. අද ශ්‍රී ලංකාවේ සමස්ත ආදායමෙන් සියයට 52ක් හිමි වන්නේ ඉහළ ධනවතුන් සියයට 20කට වන අතර, පහළ ආදායම ලබන දුප්පත්ම සියයට 20කට හිමි වන්නේ රටේ මුළු ආදායමෙන් සියයට 4.5යි. එතකොට මේකෙන් මොකක්ද පෙනෙන්නේ? මහින්ද චින්තන බදු ප්‍රතිපත්තිය, ආදායම් අතර පරතරය සහ අර තෝරා ගත්ත පන්තිය සඳහා තිබෙන විශේෂය මේකෙන් සහතික වෙනවා. අද රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම අතර විශාල පරතරයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ ඇති වී තිබෙන විශාල පරතරය තවත් වැඩි වී ගෙන යන තත්ත්වයක් තිබෙනවා. ඒකේ භයානක දේ තමයි බදු ආදායම සහ රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට දවසින් දවස අඩු වී ගෙන යන එක.

මට මතකයි, යූඑන්පී ආණ්ඩුව කාලයේ අද රජයේ ඉන්න මේ අය අපට චෝදනා කළා, "බදු විරාමයක් දුන්නා, බදු වැඩියෙන් අය කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑය" කියලා. 1999 දී මේ රටේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 21යි. එදා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 21ක බදු ආදායමක් තිබුණා. 2007 වන කොට ඒක සියයට 14ට අඩු වුණා. 2009වන කොට ඒක සියයට 12.8ට අඩු වුණා. 2011වන කොට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට බදු ආදායම සියයට 12.4යි. මේ අපේ කලාපීය රටවල් දිහා බලන කොට සිංගප්පූරුවේ දළ දේශීය නිෂ්පාදනයෙන් බදු අය කිරීමේ ප්‍රතිශතය සියයට 27යි. මැලේසියාවේ සියයට 23යි. ඒ ආදායමෙන් තමයි ඒ රටවල රාජ්‍ය වියදම්වලට අවශ්‍ය මුදල් උපයන්නේ. නමුත් ඇයි ලංකාවේ මේ ආදායම අඩු වී ගෙන යන්නේ? ඒකට හේතු වන ප්‍රධානම දේ තමයි, "මහින්ද චින්තන ආණ්ඩුව" යටතේ ලංකාවේ විශාල කළු කඩ ආර්ථිකයක් තිබෙන එක. Black economy එකක් තිබෙනවා. ඒ කළු කඩ ආර්ථිකය තුළ කළු සල්ලි උපයන, ජාවාරම් කරන, බදු දැලට ඇතුළත් නොවෙන, ඕනෑම හොර ජාවාරමක් කරන්න පුළුවන් පිරිසකට ආණ්ඩුවේ රැකවරණය දෙනවා. ඒ අයගෙන් අය කරන්න ඕනෑ ඒ බදු ප්‍රමාණය අය කරන්නේ නැහැ. විශේෂයෙන් කියන්න ඕනෑ. ඒක කොහොමද වන්නේ?

මද්‍යසාර මේ රටට ආනයනය කරලා ඒවාට බදු නොගෙවපු ආයතනවලින්, ඒ කොම්පැනිවලින් ඒ බදු අය නොකරන්න රජයෙනුත් රැකවරණය දෙන කොට ඒකෙන් පෙනෙන්නේ මේ තිබෙන කළු ආර්ථිකයට නැත්නම් කළු කඩ ආර්ථිකයට රැකවරණය දෙන්නේත් රජය කියන එකයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඒක පුවත් පතක පළ වූ සාමාන්‍ය පුවතක් පමණයි. තමුන්නාන්සේලාට මම නිල වශයෙන් කියනවා, ඊයේ භාණ්ඩාගාරයේ ලේකම්තුමා ජ්‍යෙෂ්ඨ නිලධාරින් ගෙනැල්ලා ඒ හැම එකක් ගැනම පරීක්ෂා කරලා අවශ්‍ය දඩුවම් දෙන්න කියලා නියෝගයක් දුන්නු බව. ඒ නිසා පුවත් පතක පළ වුණු දෙයක් පුන පුනා කියන්න එපා. අනික තමුන්නාන්සේගෙන් මා අහන්න කැමැතියි දැන් තමුන්නාන්සේලා "යළි පුබුදුමු ශ්‍රී ලංකා" වැඩසටහන අමතක කරලාද? ඒක ඔබතුමන්ලාගේ පක්ෂය නිල වශයෙන් ප්‍රතික්ෂේප කරලාද තිබෙන්නේ?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමනි, මම කියන්නම්.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ප්‍රතික්ෂේප කරලාද?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මගේ කථාවේදී මම කියන්නම්. ගරු ඇමතිතුමනි, මම සතුටු වෙනවා මේ වාගේ සිද්ධියක් වුණාය කියන එක ඔබතුමා පිළිගත්ත එක ගැන. ඒක පිළිගත්තා, ඒකට ආණ්ඩුව ක්‍රියා මාර්ග ගන්නවා කියලා දැන් ඇමතිතුමාම කියනවා. නමුත් මේ අය වැරැද්දක් කරලා රුපියල් කෝටි සියයක පාඩුවක් සිද්ධ වෙලා තිබෙන බව පත්තරෙන් ප්‍රකාශ වන තුරු තමුන්නාන්සේලා දන්නේ නැහැ. මේක අල්ලා ගත්ත එක සිද්ධියක් විතරයි. තව මේ වාගේ සිද්ධි සියයක් තිබෙන්න පුළුවන්. පත්තරයකින් හෙළි කරන තුරු භාණ්ඩාගාරයෙන් මේ ගැන කිසිම පරීක්ෂාවක් නොකරපු එක පුදුමයක්, ඇත්ත වශයෙන්ම. ඒ නිසා මාධ්‍යය තුළින් අද මේ ඇත්ත තත්ත්වය කථා කරන එක ඉතා ලොකු ශක්තියක්. අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "යළි පුබුදමු ශ්‍රී ලංකා" කියන ප්‍රතිපත්තිය ගැන ගරු සරත් අමුණුගම ඇමතිතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා නිසා මා ඒකට උත්තර දෙන්න ඕනෑ. අපේ එවැනි ප්‍රතිපත්තියක් තිබුණා. ඒක හරි හෝ වැරදි හෝ අපි ඒ ප්‍රතිපත්තිය අනුගමනය කළා. නමුත් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනාපු ප්‍රතිපත්තිය අද කාලයත් එක්ක අපි අනුගමනය කරන්නේ නැහැ. අපි කාලයෙන් කාලයට අපේ ප්‍රතිපත්ති වෙනස් කරනවා. නමුත් තමුන්නාන්සේලාට තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා කියන්න බැහැ. තමුන්නාන්සේලා නියෝ ලිබරල් ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කරන්නේ.නමුත් තමුන්නාන්සේලා කථා කරන්නේ දේශීය ප්‍රතිපත්තියක් ගැන. ඒක තමයි අපට පුදුම දේ. තමුන්නාන්සේලා මේ අසත්‍ය කියන එක තමයි ප්‍රශ්නය. ඇත්ත කථා කරන්න ඕනෑ.

යූඑන්පීය විවෘත ආර්ථිකය ගෙනාවාම අපි ඒක ගැන කිව්වා. තමුන්නාන්සේලා පෞද්ගලීකරණය කරන්නේ නැහැයි කියලා, මේ රටේ තිබෙන ඉඩම් ටික හොරෙන් විකුණනවා. ඒක වැරදියි. ඒ නිසා ප්‍රතිපත්ති නැතිව තමුන්නාන්සේලාට කථා කරන්න බැහැ. ඉතින් තමුන්නාන්සේලාගේ නිරුවත්භාවය අපට හොඳටම පෙනෙනවා. අද කළු කඩ ආර්ථිකයක් තිබෙන නිසා තමයි මේ රටේ රාජ්‍ය ආදායම නැති වීගෙන යන්නේ. රටට ඒ ආදායම අහිමි වෙනවා. මේක ලොකු පාඩුවක්. මේ ආදායම් නැති ප්‍රශ්නය නිසා ආණ්ඩුව මොකක්ද කරන්නේ? ඒ ආදායම් ප්‍රතිශතය වැඩි කර ගන්නට දුප්පත් අයගෙන් බදු අය කරන වැඩ පිළිවෙළක් ගෙන යනවා.

හොරෙන් මද්‍යසාර -මත් ද්‍රව්‍ය- ගෙනෙන අය, මැණික් රත්තරන් හොර ජාවාරම් කරන අය, රජයේ ව්‍යාපෘතිවලින් කෝටි ගණනක් කොමිස් ගන්නා අය, රටට තඹ ශතයකින්වත් දායක නොවී බදු නොගෙවා සුර සැප විඳින අය සම්බන්ධයෙන් ආණ්ඩුව හරියාකාරව නීතිය ක්‍රියාත්මක කරනවා නම් මේ රටේ බදු ආදායම වැඩි කර ගන්න පුළුවන් කියලා මා හිතනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බදු ප්‍රතිපත්තියක මූලික කාර්ය භාරය වන්නේ ආදායම් ප්‍රතිව්‍යාප්ති කිරීමයි - redistribution of wealth. ඒක හරියට නොකරන හේතුව නිසා තමයි අද ආදායම් පරතරය වැඩි වීගෙන යන්නේ. ඒ නිසා ඒ සඳහා පියවර ගැනීම ඉතා වැදගත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ආණ්ඩුව අද ගෙන යන බදු ප්‍රතිපත්තිය ගැන නැවත හිතලා කටයුතු කළ යුතුයි. අද එකතු කරන ආදායම් බදු ප්‍රතිශතය ඇත්ත වශයෙන්ම අඩු

වීගෙන යනවා. ඒ අතරතුර වක්‍ර බදු අය කිරීමේදී වැට් බද්ද, සෙස් බද්ද, ජාතිය ගොඩ නැඟීමේ බද්ද ආදී බදුවලින් වැඩි ප්‍රතිශතයක් අය කිරීම දකින්න ලැබෙන්නේ කුමක් නිසාද? අර පුංචි මිනිසුන්ගෙන් වක්‍රව බදු අය කරන වැඩ පිළිවෙළක් ආණ්ඩුව ගෙන යන නිසායි. ඒ තුළින් මේ රටේ ආදායම් පරතරය වැඩි වෙනවා මිසක්, ආදායම් පරතරයේ විෂමතාව අඩු වන්නේ නැහැ. ඒ නිසා මහින්ද චින්තනයට පටහැනියි මේ ගෙන යන වැඩ පිළිවෙළ. ඉතින් අපි ආණ්ඩුවේ අවධානයට යොමු කරන්නේ, මේ බදු ප්‍රතිපත්තිය හරියට සකස් කරලා, බදු දැලට හසු නොවෙන, කළු කඩ ජාවාරම්කරුවන්, හොර ජාවාරම්කරුවන් සියලු දෙනාම බදු දැලට හසු කර ගන්න කියලායි. එහෙම කරන්න ආණ්ඩුවට වගකීමක් තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Athauda Seneviratne. Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා.

[අ. භා. 3.51]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුව ආර්ථික සංවර්ධනයේ පැති කිහිපයක් ගැන කල්පනා කර තිබෙනවා. එකක් තමයි, අපේ අපනයනයන් පුළුවන් තරම් වැඩි කරන එක. සෑම අංශයකින්ම -කාර්මික පැත්තෙන්, කෘෂිකාර්මික පැත්තෙන්, මැණික්, ඛනිජ වැලි ආදියෙන්- අපේ අපනයනයන් වැඩි කර ගෙන ඒ මඟින් අපේ ආදායම වැඩි කර ගන්නවා. ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව නිවැරදි දැක්මක් ඇතිව රටක ආදායම වැඩි කර ගන්න ගත යුතු ක්‍රියා මාර්ගය හැටියට ඒ සඳහා ප්‍රමුඛත්වය දීලා කටයුතු කරනවා.

අනික් පැත්තෙන් අපේ ආනයනයන් -විදේශවලින් මේ රටට භාණ්ඩ ගෙන්වන එක- පුළුවන් තරම් අඩු කරන්න ඕනෑ. විශේෂයෙන් අපේ රටේ නිෂ්පාදනය කරන්න බැරි, ප්‍රමාණවත් තාක්ෂණ දියුණුවක් නැති නිසා නිෂ්පාදනය කරන්න බැරි භාණ්ඩ පිට රටින් ගෙන්වන්න ඕනෑ. නමුත් අපට නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ හැකි තරම් අපේ රට තුළම නිෂ්පාදනය කර ගැනීම සඳහා අපි සියලු උත්සාහයන් කරනවා.

ඒ විතරක් නොවෙයි. පසු ගිය අපේ ආණ්ඩු කාලයේ මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කළා. අපේ රටට අවශ්‍ය කරන කිරි ප්‍රමාණයෙන් සියයට 50ක් මේ රටේ නිෂ්පාදනය කිරීමට කටයුතු කෙරිලා තිබුණා. නමුත් විවෘත ආර්ථිකයත් එක්ක ඒ සියල්ල විනාශ වෙලා ගිහින් එම ප්‍රමාණය සියයට 15කට පමණ බැස්සා. දැන් අපි ඒ තත්ත්වය පුළුවන් තරම් වෙනස් කර ගෙන යනවා. ඉක්මනින් එහි ප්‍රතිඵල ලබන්න අපි උත්සාහ කරනවා. ඒ කර්මාන්තයට ප්‍රමුඛත්වය දීලා ඒ කටයුතු කර ගෙන යනවා. කිරි ආනයනයෙන් පිට රටට ගලා යන අතිවිශාල ධනස්කන්ධය නියමිත කාල සීමාවක් තුළ මේ රට තුළ ඉතිරි කර ගන්න අපි බලාපොරොත්තු වනවා. කිරි නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමෙන් පිට රටට ඇදී යන ආදායම වළක්වා ගැනීමට හැකි වනවා වාගේම ග්‍රාමීය මට්ටමින් අතිවිශාල පිරිසකට රක්ෂාවන් ලබා දීමටත් පුළුවන්කම ලැබෙනවා. ඒ අනුව අපි පසු ගිය කාලයේ පිට රටින් කිරි හරක්, එළදෙනුන් ගෙන්වූවා. ඉදිරියට තවත් කිරි හරක් ගෙන්වීමට කටයුතු කර ගෙන යනවා. කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීම අපේ අරමුණ වෙලා තිබෙනවා. එයත් වැදගත් කාර්යයක් හැටියට කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සීනි නිෂ්පාදනය බොහෝ දුරට සාර්ථකව කර ගෙන ගියා. එය විශාල ආදායම් මාර්ගයක්. පිට රටින් සීනි ගෙන්වීම වළක්වා ගන්න නම් අපේ රටේ සීනි නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒ සඳහා සීනි නිෂ්පාදනයට අවශ්‍ය කරන උක් වගාව දියුණු කරන්න අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. එතකොට උක් ගොවීන්ට රක්ෂාවන් ලබා දෙන්න පුළුවන්. ඒ ගොවීන්ගේ ආදායම වැඩි කරන්න පුළුවන්. සීනි ආනයනය සඳහා පිට රටට යන මුදල අඩු කර ගෙන, ඒ මුදල් මේ රටේ උක් ගොවීන්ට ලබා දෙන්න කටයුතු කිරීම අපේ ආණ්ඩුවේ ප්‍රමුඛ වැඩ පිළිවෙළක් බව කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. පසු ගිය කාලයේ රබර් මිල අඩු වීම නිසා අපේ රටේ රබර් නිෂ්පාදනය අඩු වුණා. රබර් ගස් කපා දමා වෙනත් වගාවන් කළා. දැන් රබර් මිල වැඩි වීම නිසා රබර් වගාව සඳහා උනන්දුව වැඩි වෙලා තිබෙනවා. පසු ගිය කාලවල වියළි කලාපයේ රබර් වැව්වේ නැහැ. දැන් වියළි කලාපයටත් රබර් වගාව ව්‍යාප්ත කිරීමට අපි උත්සාහ කරනවා. යාපනය, කිලිනොච්චිය වැනි ප්‍රදේශවලත් රබර් වගාව ආරම්භ කරන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා.

ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කවල රබර් වගාව දියුණු කරන්නට අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. ඒ මඟින් වැඩි ආදායමක් ලබා ගන්නට අප ඒවා පිට රට යැවීමටත් කටයුතු කරනවා. රබර් කිරි නිෂ්පාදනයෙන් සියයට 75ක් මේ රටේ නිමි භාණ්ඩවලට යොදවනවා. අපේ රටේ අමු ද්‍රව්‍ය නිමි භාණ්ඩ වශයෙන් පිට රට යැවීමත් ආදායම් වැඩි කර ගැනීමේ එක්තරා ක්‍රමවේදයක්. තවත් සියයට 25ක් අප පිට රට යවනවා. ඒ සියයට 25ත් අප මේ රටේ නිමි භාණ්ඩ වශයෙන් පිට රට යැවීමට අදහස් කර තිබෙනවා. අමු ද්‍රව්‍ය යැවීම වෙනුවට භාණ්ඩ නිෂ්පාදනය කර -නිමි භාණ්ඩ- පිටරට යැවීම තුළින් වැඩි ආදායම් ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා. තේ පිට රට යැවීම වෙනුවට පැකට් කර නිමි භාණ්ඩ හැටියට පිට රට යැවීම තුළින් ආදායම වැඩි කර ගැනීමටත් කල්පනා කර තිබෙනවා. දැන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. මේ ආකාරයෙන් ආදායම වැඩි කර ගැනීමේ අවධානය මේ රජයේ අරමුණ හා බලාපොරොත්තුව හැටියට තිබෙනවා.

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

පසු ගිය කාලයේ මුං ඇට පිට රටින් ගෙන්වූවා; කුරහන් පිට රටින් ගෙන්වූවා. තවත් එවැනි ද්‍රව්‍ය පිට රටින් ගෙන්වූවා. ලූනුත් ගෙන්වූවා. බී ලූනුත් ගෙන්වූවා. ඒවා මේ රටේ වගා කරන්නට ප්‍රමුඛත්වය දී කෘෂි කර්මාන්තයෙන් මේ රටේ වගා කළ හැකි දේවල් තෝරා ගෙන කෘෂි කර්මාන්තය දියුණු කරන්නට කටයුතු කර ගෙන යනවා. මේ අනුව ගොවීන්ට ආදායමක් ලැබෙනවා; රක්ෂා ලැබෙනවා; පිට රට යන මුදල් ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා. මේ ආකාරයට අපේ රටේ ආර්ථිකය දියුණු කර ගෙන ජනතාවට වැඩි සැප පහසුවක් ලබා දෙන්නට බලාපොරොත්තුවෙන් කටයුතු කර ගෙන යන ආණ්ඩුවක් මේ ආණ්ඩුව. ඒ කියන්නේ අපනයනය වැඩි කර, ආනයනය අඩු කිරීමේ බලාපොරොත්තුවෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ ප්‍රතිපත්තිය තමයි මොන ආණ්ඩුව ආවත් ක්‍රියාත්මක කර ගෙන යන්නේ. පසු ගිය කාලයේ ඒ තත්ත්වය හුඟක්ම නැති වුණා. යූඑන්පී ආණ්ඩුවේ පෞද්ගලීකරණය නිසා ඒ තත්ත්වය ඇති වුණා. වේයන්ගොඩ, පූගොඩ, තුල්හිරිය වැනි ආයතන තිබුණා. අපේ රෙදි කර්මාන්තශාලා තිබුණා. පෞද්ගලිකරණය නිසා ඒවා ඔක්කොම වැහිලා ගියා. ඒ වාගේම හිඟුරාන, කන්තලේ සීනි කර්මාන්තශාලා වැහිලා ගියා. අපේ රටේ ආර්ථිකය නිෂ්පාදනය පැත්තෙන් ආපසු යෑමක් සිද්ධ වුණා, එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය නිසා. එම නිසා ලොකු හානියක් සිද්ධ වුණා. අපේ ආණ්ඩුව හැකිතාක් දුරට මේ කටයුතු සාර්ථක කර ගන්නට උත්සාහ කර ගෙන යනවා. ඒවාගේම පසු ගිය කාලයේ තිබුණු- වැහිලා යන කර්මාන්තශාලා කිහිපයක් නැවත සංවර්ධනය කර, අලුත්වැඩියා කර, නැවත අලුත් මැෂින් සවි කර ඒ ප්‍රතිසංස්කරණ කටයුතු කර ගෙන යනවා. මුදල් පිට රට යාම වළක්වන්නට, නිමි භාණ්ඩ පිට රට යවා ආදායමක් ලබා ගන්නට ඒ වැඩ පිළිවෙළ ඇති කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. අපේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තමයි නිවැරදි දැක්ම, නිවැරදි වැඩ පිළිවෙළ වන්නේ. දේශීය භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරන්නට ඕනෑය කියන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමුන්නාන්සේලා කවුරුත් දන්නවා, ප්‍රේමදාස මහත්මයාගේ යුගයේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පාලන කාලයේ පොහොර සහනාධාර සම්පූර්ණයෙන් අයින් කළ බව. පොහොර සහනාධාරය දුන්නේ නැහැ, කැපුවා. අපේ ජනාධිපතිතුමා -මේ ආණ්ඩුව- පොහොර සහනාධාරය ලබා දුන්නා. පොහොර වෙන වැඩකට පාවිච්චි කරන්නට බැහැ. ඒක පාවිච්චි කරන්නට තිබෙන්නේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා පොළොවටයි. ඒ වැඩ පිළිවෙළ නිසා අපේ ජනාධිපතිතුමා වී ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දුන්නා. රුපියල් සියයක පොහොර ගන්නවා නම් රුපියල් අනූහයක් ආණ්ඩුවෙන් දරනවා. රුපියල් හතරයි ගොවියා ගෙවන්නට ඕනෑ. ඒක ගොවියාට විශාල සහනාධාරයක්. සියයට 96ක් ආණ්ඩුවෙන් දුන්නා. එම නිසා අපේ වී ගොවිතැන දියුණුවට පත් වුණා. වී ගොවීන්ගේ උනන්දුව වැඩි වුණා. එම නිසා අපට වී වලින් ස්වයංපෝෂිතභාවයක් ලබා ගන්නට පුළුවන් වුණා. වෙළඳ පොළේ හාල් මිල වැඩි වුණේ නැහැ.

වැඩි වන වී නිෂ්පාදනය නිසාම, වැඩි වන සහල් නිෂ්පාදනය නිසාම වෙළෙඳ පොළ පාලනය වුණා; සහල් මිල පාලනය වුණා. ඒ මඟින් නිවැරදි පිළිවෙළට ඉල්ලීමත් සැපයීමත් දෙක සකස් වෙනවා නම් බඩු මිල වැඩි වීමක් සිද්ධ වෙන්නේ නැහැ. හිඟයක් තිබෙනවා නම් තමයි යම් හෙයකින් බඩු මිල පාලනය කරන්න වෙන්නේ; බඩු මිලේ වැඩි වීමක් වෙන්නේ. එක පැත්තකින් ඒ හිඟය නැතිව අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය ලබා දීලා, ඉල්ලීමට ගැලපෙන විධියට ඒක සකස් කර ගන්න පුළුවන් නම් මිල වැඩි වීම පාලනය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තේවලට, රබර්වලට, පොල්වලට, කුරුඳුවලට, ගම්මිරිස්වලට සහ එළවලුවලට ආදී සියලුම දේවල්වලට අපි පොහොර සහනාධාරය ව්‍යාප්ත කරලා තිබෙනවා. ඒ මඟින් අපේ අස්වැන්න වැඩි කර ගන්න පුළුවන් වුණා. ඒ කියන්නේ මේ පොළොවෙන් ගන්න පුළුවන් උපරිම ප්‍රතිලාභය තමයි අස්වැන්න වැඩි කර ගැනීම. අස්වැන්න වැඩි කර ගැනීමට පොහොර සහනාධාරය අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ පිළිවෙළට අපේ ආණ්ඩුව, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව ගොවීන්ට ඒ පොහොර සහනාධාරය ලබා දීමෙන් තේ, රබර්, පොල් සහ වී ආදී වැවිලි කර්මාන්තයන් පැත්තෙන් විශාල දියුණුවක් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒක ඉතාම වැදගත් සාධකයක් හැටියට අපට කල්පනා කරන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු කබීර් හාෂීම් මන්ත්‍රීතුමා කිව්වා, මේක ලොකු පන්තියට සහන සලසන ආණ්ඩුවක් කියලා. එක්සත් ජාතික පක්ෂය තමයි ඉතිහාසයේ ධනපති පන්තියේ ප්‍රධාන භාරකාරයා; උරුමක්කාරයා. තමුන්නාන්සේලාගේ කට්ටිය මෙහාට ආපු නිසාද දන්නේ නැහැ එහෙම කියන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ කියන්නේ, ඔබතුමා ඒක පිළිගන්නවා නේද?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ නිසාද දන්නේ නැහැ එහෙම කියන්නේ. කොහොම වුණත්, අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ වැඩ කරන ජනතාවත් එක්ක සිටීමයි. වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරලා තමයි කටයුතු කරන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් වෘත්තීය සමිතිවලට සැලකුවේ නැහැ. වෘත්තීය සමිති කඩාකප්පල් කරලා, වෙඩි තියලා, ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ ලක්ෂයක විතර පිරිසක් සේවයෙන් දොට්ට දාලා තමයි කටයුතු කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, 1980 වැඩ වර්ජනය කරපු අය තවම පාරේ ඉන්නවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
1980 වැඩ වර්ජනයෙන් අසාධාරණයට ලක් වූ සියලු දෙනාටම සලකලා තිබෙනවා. [බාධා කිරීම්] නමුත් ඒක ව්‍යාපාරයක් කර ගෙන කිය කියා යන එක්තරා කණ්ඩායමක් ඉන්නවා. අරක ලබා දෙන්නම්, මේක ලබා දෙන්නම් කියලා එහෙම වැඩ පිළිවෙළක් කරන කට්ටියක් ඉන්නවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම කම්කරු ඇමතිවරයා හැටියට සියලු දෙනා කැඳවලා ඒ අයට දෙන්න පුළුවන් ආධාර, උදව් ලබා දුන්නා. නමුත් සමහර අය ඉදිරිපත් නොවුණේ මොකක් හින්දාද කියලා අපි දන්නේ නැහැ. නමුත් ඒ සියලු දෙනාටම අපි සහයෝගය දුන්නා; උදව්පදව් කෙරුවා. ඒ කියන්නේ ධනේෂ්වර පන්තියේ රැකවලා වශයෙන් ඉන්න එක්සත් ජාතික පක්ෂය දැන් කථා කරනවා, දුප්පතා ගැන, පොඩි මිනිහා ගැන, බඩු මිල වැඩි වීම ගැන. බඳු පැනවීමෙන් පහර වදින්නේ අහවලාට, අහවලාට කියලා කල්පනා කරනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔබතුමා කරන්නේත් ඒකනේ.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
නැහැ, මම කරන්නේ ඒක නොවෙයි. මම ඒකට විරුද්ධව කථා කරනවා. මම කරන්නේ ඒක නොවෙයි. මම දවසක් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගෙන් ඇහුවා, "ඔබතුමා වෘත්තීය සමිති ආරම්භ කළේ ඇයි?" කියලා. එතුමා වෘත්තීය සමිති ආරම්භ කළේ 1960 ගණන්වල. එතකල් වෘත්තීය සමිති මර්දනය කෙරුවා. ඊට පස්සේත් කරපු අවස්ථාවන් තිබෙනවා. නමුත් වෘත්තීය සමිති ආරම්භ කරන්න පටන් ගත්තේ 1960 ගණන්වල.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒක තමයි කාලයක් යන කොට වෙනස් වෙනවා. [බාධා කිරීමක්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඔව්, ඔව්. මේකෙන් මම කියන්න හදන්නේ එතුමන්ලා ගමන් කෙරුවේ මොන පාරේද කියලායි. ඒ වෘත්තීය සමිති හදන, වැඩ කරන ජනතාව යන පාරේ නොවෙයි ගමන් කළේ. ධනේශ්වර පාරේ තමයි ගමන් කරලා තිබුණේ. [බාධා කිරීම්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
වමට signal දාලා දකුණට හරවනවා. [බාධා කිරීම්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ අනුව මේ වැඩ පිළිවෙළ ඇති කර ගෙන ගියා. ඒක තමයි එතුමා කිව්වේ.

ඊළඟට මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි- [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Please permit the Hon. Minister to speak.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඊයේ-පෙරේදා ජනතාවට අප ලබා දීපු තවත් සහනයක් ගැන තමුන්නාන්සේලා දන්නවා ඇති. ඒක තමයි අවුරුදු 70ට වැඩි සියලු දෙනාටම මාසයකට රුපියල් 1,000 ගණනේ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගොවි විශ්‍රාම වැටුප නැහැ.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒක ඒ පාලනයේ වැරැද්දක්. ඒවා සකස් කරලා දෙනවා. [බාධා කිරීමක්] පාලනයේ වැරැද්දක් කියලා මම කියන්නේ, එය පාලනය කරපු සභාපතිවරයකුගේ වැරදි ක්‍රියා කලාපයක්. ඒවා නිසි පරිදි සකස් කරලා ඒ මුදල් ගෙවන්න ආණ්ඩුව දැන් අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 70ට වැඩි සියලු දෙනාටම රුපියල් 1,000 බැගින් දීමේ වැඩ පිළිවෙළක් අප හැදුවා. ඒක දැන් ගෙවනවා. ඒ විතරක් නොවෙයි, අසරණ අයට දීපු රුපියල් 350ක පින් පඩිය රුපියල් 1,000 දක්වා වැඩි කළා. රුපියල් 600, 750 බැගින් තිබුණු සමෘද්ධි ආධාර රුපියල් 1,000ක් කළා. ඒ වාගේම රුපියල් 900ට තිබුණු සමෘද්ධි ආධාර රුපියල් 1,200 දක්වා වැඩි කෙරුවා. මේ වැඩ කටයුතු කරමින් දුප්පත් මිනිහා නඟා සිටුවීමට අප රජය කටයුතු කර තිබෙනවා. තමුන්නාන්සේලාගෙන් එය සිදු වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා මේ කාලය තුළ අප සුබසාධනයට වැඩි අවධානයක් යොමු කළ බව. තමුන්නාන්සේලා රාජ්‍ය සේවයේ ලක්ෂ 9ක් වූ සේවකයන් ලක්ෂ 6කට අඩු කරන්න තමුන්නාන්සේලාගේ "යළි පුබුදමු ශ්‍රී ලංකා" නමැති ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් සැලසුම් කර තිබුණා. රාජ්‍ය සේවයේ සේවකයන් අඩු කරන්නයි එමඟින් සැලසුම් කර තිබුණේ. අප ඒක ලක්ෂ 15ක් විතර දක්වා වැඩි කරලා පසු ගිය කාලය තුළ රාජ්‍ය සේවයට උපාධිධාරීන් 30,000ක් නැවතත් බඳවා ගෙන තිබෙනවා. ඒක ධනය බෙදී යෑමේ ක්‍රමයක්. උපාධිධාරීන්ට රැකියා දෙනවා කියන්නේ ඔවුන්ට රජයෙන් පඩි ගෙවන එක. ධනය බෙදී යෑමේ ක්‍රමවේදයක් විධියට තමයි අප එය සකස් කර තිබෙන්නේ. ජනතාව අතර ධනය බෙදී යෑමේ ක්‍රමයක් විධියට තමයි ඒ වැඩ පිළිවෙළ ඇති කරලා තිබෙන්නේ. අපේ බලාපොරොත්තුව පොදු ජනතාවට වැඩි වැඩියෙන් සහන සැලසීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අධ්‍යාපනයත් සුබසාධන කාර්යයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමියනි, ඔබතුමිය විනෝදය විඳිනවා වාගෙයි. [බාධා කිරීමක්] අද මොකද විශේෂත්වයක්?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ද්විතීයික පාසල් 1,000ක් වැඩිදියුණු කරලා අධ්‍යාපනය උසස් මට්ටමට ගෙන එන්න අවශ්‍ය කටයුතු දැන් කරගෙන යනවා. ඒකත් සුබසාධන කාර්යයක්.

ඊළඟට ප්‍රාථමික පාසල් 5,000ක්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have to conclude your speech.- [*Interruption.*] Please allow the Hon. Minister to conclude his speech.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ප්‍රාථමික පාසල් 5,000ක් දියුණු කරලා secondary schools වලට ශිෂ්‍යයන් යවන්නත් දැන් කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා තමයි අපේ රජය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩ පිළිවෙළවල්. තමුන්නාන්සේලා ලංකාවේ මේ දියුණුව ගැන නොයෙක් විවේචන කරනවා. නමුත් ලෝක බැංකුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්, ඒ වාගේම ජාත්‍යන්තර අර්ථ ශාස්ත්‍රඥයනුත් ලංකාවේ සංවර්ධනය ගැන උදම් අනනවා;අපට ආධාර දෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අයට මේක තේරෙන්නේ නැහැ. [බාධා කිරීම්]

තමුන්නාන්සේලාට තේරෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! I have to call upon the next speaker now.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

එක්සත් ජාතික පක්ෂයේ අයට මේවා නොවෙයි තමන්ගේ දේශපාලන ගමන යන්න ඕනෑ දිශාවවත් තේරෙන්නේ නැහැ. ඒ තේරෙන්නේ නැතිකම නිසා තමයි මේ විධියට දිගටම දිගටම පැරදි පැරදි ඇවිත් මේ සැරේත් පැරදෙන තැනට වැටුණේ. දිනා ගන්න බැරි තත්ත්වයට වැටිලා තිබෙන්නේ ඒ නිසායි. මේ රටේ සාමය, සමෘද්ධිය ඇති කරමින් අප මේ ගෙන යන වැඩ පිළිවෙළ නිසා ජනතාව ආණ්ඩුවත් එක්කයි ඉන්නේ. ඒක නිසා තමුන්නාන්සේලා රනිල් වික්‍රමසිංහ මහත්මයා පැන්නුවත්, එතුමාව පන්නලා සජිත් ප්‍රේමදාස මහත්මයා ගත්තත් ඔය යන ගමන ගිහිල්ලා ප්‍රතිඵලයක් ගන්න බැහැ.

ජනතා විමුක්ති පෙරමුණත් ඒ වාගේමයි. ජනතා විමුක්ති පෙරමුණ තිබුණු තැනින් බිමට වැටිලා තිබෙනවා. මේ ආණ්ඩුව යන ගමන ඊර්ෂ්‍යාවෙන් විවේචනය කරලා, ක්‍රෝධයෙන් විවේචනය කරලා ප්‍රතිඵලයක් ලබන්න පුළුවන්කමක් නැහැ. අද තමුන්නාන්සේලා කාටත් පිළිගන්න සිද්ධ වන කාරණයක් තිබෙනවා. අද මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7ක් කියා අපි කියමු. සියයට 8ට තිබුණු ආර්ථික වර්ධන වේගය මේ අවුරුද්දේ සියයට 7යි කියමු කෝ. නමුත් යුරෝපයේ රටවල වර්ධන වේගය සියයට 2ට බහින කොට සියයට 1ට බහින කොට, මේ රටේ වෙලා තිබෙන ආර්ථික වර්ධන වේගයේ සුළු වෙනස් වීම ගැන අපේ ආර්ථික ගමන ගැන තමුන්නාන්සේලාට කථා කරන්න, විවේචනය කරන්න යුතුකමක් නැහැ; අයිතියක් නැහැ. ක්‍රෝධය, පළිගැනීම නිසා තමයි මේ විවේචන ඉදිරිපත් කරන්නේ කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට වෛද්‍යාචාර්ය ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ. භා. 4.12]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු වැඩි කිරීම පිළිබඳව අද පැවැත්වෙන මේ විවාදයේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් යමක් ප්‍රකාශ කරන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ බදු වැඩි කිරීම සම්පූර්ණයෙන්ම ඉලක්ක කර ගෙන තිබෙන්නේ මේ රටේ සාමාන්‍ය පන්තියේ අහිංසක මිනිසුන්ගේ ජන ජීවිතයට තවත් බරපතළ පහරක් එල්ල කරන්නයි කියන එක මා පළමුවෙන් මතක් කරන්න ඕනෑ. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට; පොඩි මිනිහාගේ කිරි පිටි ටිකට, පාන් පිටි ටිකට, පරිප්පු ටිකට, කරවල ටිකට, හාල්මැස්සන් ටිකට බදු ගහලා තමන්ගේ දූෂණය, භීෂණය, වංචාව, රැවටිල්ල, ජනතාව නොමඟ යැවීම වසා ගන්න අද මේ ආණ්ඩුව උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ වැඩ කරන අහිංසක ජනතාවගේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් ඔවුන්ගේ අඹු දරුවන් වෙනුවෙන් ඔවුන් විසින් ඉතිරි කර ගත්තු සේවක අර්ථ සාධක අරමුදල කොල්ල කන මේ ආණ්ඩුව මේ වන විට අහිංසක ගොවීන් තමන්ගේ සැඳෑ සමය වෙනුවෙන් ඉතිරි කර ගත් ගොවි විශ්‍රාම වැටුපත් කොල්ල කාලා ඉවරයි. අද අහිංසක ගොවීන්ට ගොවි විශ්‍රාම වැටුපත් නැහැ. එපමණක් නොවෙයි.

අද කෘෂිකර්ම ඇමතිවරයා මෙතැන හිටියා නම් මා වැඩියෙන්ම සතුටු වෙනවා. අද පොහොර සහනාධාරය ගැන කථා කරනවා. අද ගොවියාට පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 15ත් 70ත් අතර පසු වන අහිංසක ගොවි ජනතාවගෙන් සියයට 15ක් නිදන්ගත වකුගඩු රෝගවලට භාජනය වෙලා ඉවරයි. උතුරු මැද පළාතේ පමණක් නිදන්ගත වකුගඩු රෝගීන් 20,000කට වඩා වැඩි ප්‍රමාණයක් සිටින බව වාර්තාගත වෙලා තිබෙනවා. මොකක්ද මේ නිදන්ගත වකුගඩු රෝගය කියලා කියන්නේ? ලෝකයේ කොහේවත් ස්ථිර ප්‍රතිකාරයක් තවමත් හරිහැටි සොයා ගෙන නැති, වකුගඩු බද්ද කිරීම හැරුණු කොට කිසිම ප්‍රතිකාරයක් සොයා ගෙන නැති අතිභයානක රෝගයක් තමයි නිදන්ගත වකුගඩු රෝගය. රෝගී වූ ගොවියා පමණක් නොවෙයි, ඒ අහිංසක මනුස්සයාගේ අඹු දරුවන් ඇතුළු මුළු පවුලම, මුළු පරම්පරාවම රෝගීන් බවට පත් කරන, මහ පාරේ හිඟමන් යදින තත්ත්වයට පත් කරන මහා දරුණු රෝගයක් තමයි මේ නිදන්ගත වකුගඩු රෝගය. මේ රෝගය පිළිබඳව අපේ රටේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවල; රජරට විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය කියන විශ්වවිද්‍යාවල වෛද්‍ය පීඨවල මහාචාර්යවරු, කථිකාචාර්යවරු, වෛද්‍ය විශාරදයෝ පර්යේෂණ පැවැත්තුවා. ඊට අමතරව, මේ රෝගයේ තිබෙන බරපතළකම ගැන දැඩි අවධානය යොමු කළ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිදන්ගත රෝග පාලනය කිරීම සහ වළක්වා ගැනීම පිළිබඳ ඒකකයේ ප්‍රධානියා හැටියට අද කටයුතු කරන ශ්‍රී ලාංකික විශේෂඥ වෛද්‍යවරියක වන, එදා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරිය ලෙස කටයුතු කළ මහාචාර්ය ශාන්ති මෙන්ඩිස් මහත්මිය විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් සමඟ ලංකාවට කීප වතාවක්ම ඇවිල්ලා මේ රෝගයට අනුමාන කළ හැකි හේතු සොයන්නට ගවේෂණ, පර්යේෂණ කළා.

අවසාන වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය 2011 දී මේ ආණ්ඩුවට වාර්තා දෙකක් ඉදිරිපත් කළා. 2012 දී තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාවලින් නිර්දේශ කර තිබෙන්නේ මොකක්ද? වකුගඩුවලට විෂ ද්‍රව්‍ය ලෙස සලකන ආසනික් සහ

කැඩ්මියම් කියන රසායනික ද්‍රව්‍ය නිසා වකුගඩු රෝගය හැදෙන්න පුළුවන් කියන අනුමාන හේතුව අද රජයට නිර්දේශ කරලා තිබෙනවා. අන්න ඒ නිසා ලංකාවට පොහොර ගෙන්වීමේදී, කෘෂි රසායනික ද්‍රව්‍ය ගෙන්වීමේදී තත්ත්ව පරීක්ෂාවට - quality control - ලක් කරන්න නීති සම්පාදනය කරන්න කියලා නිර්දේශය ලැබිලා තිබෙනවා. අවාසනාවකට අද පොහොර සහනාධාරය ගැන කථා කරන මේ ආණ්ඩුව තවමත් ලංකාවට ගෙන එන කෘෂි රසායනික ද්‍රව්‍ය සහ පොහොරවල තත්ත්වය රටේ මිනිස් ජන ජීවිතයට, වකුගඩුවලට අහිතකර නොවන ආකාරයට ගෙන්වන්න හැකි ප්‍රමිතියක්, ප්‍රමිති පාලනයක් කරන්නට අවශ්‍ය කරන නීති මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. මෙන්න මේකයි තත්ත්වය.

මේ වන විට උතුරු මැද පළාතෙන් දැන් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයටත් මේ වකුගඩු රෝගය ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවක් දකින්න ලැබෙනවා. ඊළඟට නුවරඑළියට වෙන්න පුළුවන්, නුවරට වෙන්න පුළුවන්. කෘෂි රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරන, පොහොර පාවිච්චි කරන අනෙකුත් දිස්ත්‍රික්කවලට මේ තත්ත්වය උදා වන්න පුළුවන්. ඊට පස්සේ මොකක්ද වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ කෘෂි රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරලා, මේ පොහොර පාවිච්චි කරලා නිෂ්පාදනය කරන, වගා කරන එළවලු වන්නට පුළුවන්, සහල් වන්නට පුළුවන්, අනිකුත් කෘෂි භෝග වන්නට පුළුවන් මේවා අනුභව කරන අපේ රටේ සමස්ත පාරිභෝගික ජනතාවගේ වකුගඩු දෙකට දෙවියන්ගේම පිහිටයි කියන එක තමයි මට කියන්න සිද්ධ වන්නේ. අද අපේ රටේ ජනතාවට මරණ වරෙන්තුව නිකුත් කරන්න, මරණ වරෙන්තුව ලියා දෙන්න, අපේ රටේ ජනතාව රෝගීන් බවට පත් කරන්න මෙන්න මෙහෙම තමයි මේ ආණ්ඩුවේ අලුගෝසු ප්‍රතිපත්තිය අද ක්‍රියාත්මක වන්නේ කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ.

අවුරුද්දක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අහනවා සේවක අර්ථ සාධක අරමුදලට මොකද වන්නේ කියලා. මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ රොෂෙන් චානක සහෝදරයා එදා අර්ථ සාධක අරමුදල ආරක්ෂා කර දෙන්න තමාගේ ජීවිතය පූජා කළ බව. එදා ප්‍රෝඩාකාරී පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප හඳුන්වා දෙන්න උත්සාහ කරපු වෙලාවේ එයට එරෙහිව නැඟී සිට මේ රටේ පෞද්ගලික අංශයේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ විශ්‍රාම වැටුප ආරක්ෂා කර දෙන්න ඔහු ජීවිතය පූජා කළා. මේ ආණ්ඩුව රොෂෙන් චානකගේ ඝාතනය පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්නට හිටපු මහාධිකරණ විනිසුරු මහානාම තිලකරත්න මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. අද වන තුරු ඒ කමිටුවේ වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැහැ. අද වන තුරු රොෂෙන් චානක සහෝදරයාගේ පවුලේ උදවියට; අඩු තරමේ අම්මාට, තාත්තාට, ඒ සහෝදරයන්ට රොෂෙන් චානකගේ ඝාතනය පිළිබඳව හිටපු මහාධිකරණ විනිසුරු මහානාම තිලකරත්න මහත්මයාගේ ඒ වාර්තාව මොකක්ද කියලාවත් තවම දැන ගන්න අවස්ථාවක් ලැබිලා නැහැ. මෙන්න මෙහෙමයි රටේ සමස්ත වැඩ කරන ජනතාවගේ සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් තම ජීවිතය පූජා කරපු රොෂෙන් චානක සහෝදරයාගේ ජීවිතයට අද මේ ආණ්ඩුව සලකන්නේ. ඒ ජීවිතය පිළිබඳව අබමල් රේණුවකවත් තැකීමක් කරලා නැහැ. මෙන්න මේක තමයි අද තත්ත්වය.

මේ රටේ සේවක අර්ථ සාධක අරමුදලේ තැන්පතු තමුන්ගේ පෞද්ගලික දේපළක් ලෙස මේ රටේ පෞද්ගලික අංශයේ මුලා සමාගම්වල හිතුමතේ ආයෝජනය කරනවා. මේ රටේ සේවකයන්ට අයිති ඒ ධනය, ඒ සේවකයන්ගේ දහඩිය මහන්සියෙන් අනාගතය වෙනුවෙන් ඉතිරි කර ගත් සේවක අර්ථ සාධක අරමුදල අද මේ ආණ්ඩුව මේ ආකාරයට ලජ්ජා නැතිව කොල්ල කන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මෙහෙම නම් කම්කරුවන්ට සලකන්නේ, මෙහෙම නම් ගොවි ජනතාවට සලකන්නේ, මෙහෙම නම් වැඩ කරන ජනතාවට සලකන්නේ මේ අහිංසක ජනතාවට දෙවියන්ගේම පිහිටයි කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මේ බදු පනවන්න ආණ්ඩුව පළාත් සභා මැතිවරණය අවසන් වන තුරු බලාගෙන හිටියාද කියලා මම ප්‍රශ්න කරනවා. මේ වන විට අලවලට බදු ගහලා ඉවරයි. හෙට අනිද්දා වන කොට තව අත්‍යවශ්‍ය බඩුවලට බදු ගහනවා. මේ වන විට රජයේ මුද්‍රණාලයේ ගැසට් පත්‍රයක් මුද්‍රණය වනවාලු. මොනවාටද? ජල බද්දත් වැඩි කරලා. වතුර බිලත් වැඩි කරලා. මේ සියල්ලම අද සැලසුම් කරලා තිබෙන්නේ මේ මැතිවරණ ජයග්‍රහණයෙන් පස්සේයි. මැතිවරණයට කලින් සහන දෙනවාය කියලා, මැතිවරණ කාල සීමාව තුළ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරනවාය කියලා විවිධ වහසි බස් කථා කරලා ජනතාවගේ ඡන්දය කොල්ල කාලා දැන් කියනවා, ඔන්න මේ දේශීය කෘෂි ආර්ථිකය ආරක්ෂා කරන්න බදු ගහනවා කියලා. එක පැත්තකින් බදු ජාවාරම්කරුවන්ට, කුට ව්‍යාපාරිකයන්ට දේශපාලන රැකවරණය ලබා දෙන ගමන්ම මත් කුඩු ජාවාරම්කරුවන්ට, මද්‍යසාර අළෙවි කරන්නන්ට කෝටි ගණන් මුදල් වංචා කරන්නට සම්පූර්ණයෙන්ම දොර ඇර දීලා ඒ සඳහා පහසුකම් සපයලා සම්පූර්ණයෙන්ම ඒ සඳහා දේශපාලන රැකවරණය ලබා දීලා අහිංසක මනුෂ්‍යයාගේ බඩට ගහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අහිංසක මනුෂ්‍යයාගේ බඩට ගහනවා පමණක් නොවෙයි. මම තමුන්නාන්සේට පැහැදිලිව කියන්න ඕනෑ අද මේ රටේ ළමා මන්ද පෝෂණය දවසින් දවස වර්ධනය වෙනවාය කියලා. ළමා මන්ද පෝෂණය දවසින් දවස වැඩි වෙනවා. ගැබිනි මව්වරුන්ගේ මන්ද පෝෂණය දවසින් දවස වැඩි වෙනවා. අද පෝෂණ මල්ල ගැන මොන කථාද? අද පෝෂණ මල්ලට මොකද වෙලා තිබෙන්නේ? දේශීය කිරි නිෂ්පාදනය ගැන කථා කළා. අපි ඊයේ-පෙරේදා දැක්කා, දේශීය කිරි නිෂ්පාදනයට මොකද වෙලා තිබෙන්නේ කියලා. කිරි ලීටර් ලක්ෂ ගණනක් කානුවට දැම්මා. හොරෙන් ගිහිල්ලා කැලේ වළවල් කපලා අද අපේ දේශීය කිරි ටික වළලනවා. අහිංසක දරුවන්ට බොන්න දෙන්න, වැඩ කරන මිනිසුන්ට බොන්න දෙන්න තියෙන කිරි ටික අද කානු ගානේ පස්වලට යට කරනවා. මෙන්න රජයේ කාර්යක්ෂම පාලනය. මෙන්න ඇමතිවරුන්ගේ වග කීම. මේක තමයි අද සිදු වන්නේ. අද වතුකරයට ගිහිල්ලා බලන්න. අද වතුකරයේ වැඩ කරන ජනතාවගේ තිබෙන පෝෂණීය තත්ත්වය මොකක්ද කියලා ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා කියාවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අහිංසක මිනිසුන්ගේ සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳව අපි කොච්චර කථා කළත් "බීරි අලියාට වීණා ගහනවා වාගේ" තමයි ආණ්ඩුව කටයුතු කරන්නේ. අවුරුද්දක් තිස්සේ සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳව අපි මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරනවා. මේක හරියට අර "බාලගිරි දෝසය අද නොවෙයි හෙට"යි කියනවා වාගේයි. ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ. නැහැ අද නොවෙයි, තව සති දෙකකින්, තව සති දෙකකින්, තව සති දෙකකින්, තව සති දෙකකින් උත්තර දෙනවා කියලායි කියන්නේ. අනේ! රුපියල් ට්‍රිලියන එකක වත්කමක් තිබෙන මේ සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අද විනාශ කරන්න අවශ්‍ය කරන සියලුම පියවරවල් මේ ආණ්ඩුව අරගෙන ඉවරයි.

අද අපේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරලා. ඒ පිළිබඳව අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා කථා කරයි. අද නිදහස් සෞඛ්‍ය සේවය සහමුලින්ම කඩා වැටිලා. අද බාල බෙහෙත් ගෙනැල්ලා. කල් ඉකුත් වුණු බෙහෙත් ගෙනැල්ලා. රෝහල්වල බෙහෙත් නැහැ. අවශ්‍ය කරන පහසුකම් නැහැ. අද දොස්තර මහත්වරුන්ට සිද්ධ වෙලා තිබෙන්නේ රෝහල්වලට බෙහෙත් ගන්න එන මනුෂ්‍යයින්ට පෞද්ගලික ෆාමසියට ගිහිල්ලා බෙහෙත් ටික ගන්න කියලා තුණ්ඩු කෑල්ල ලියලා දෙන්නයි. අද ඒ තත්ත්වයට පත් වෙලා. රෝහල්වලට ගෙනෙන බෙහෙත්වල

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

කිසිම තත්ත්ව පාලනයක් නැහැ. බාල බෙහෙත් ගෙනෙන්නේ. මේ ආකාරයට බාල බෙහෙත් ගෙන්වපු වකවානුවක් අපේ රටේ ඉතිහාසයේ නැහැ. මා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට කොළඹ රජයේ මධ්‍යම ලේ බැංකුවේදී කල් ඉකුත් වුණු ඖෂධ, කල් ඉකුත් වුණු රුධිර පාරවිලයන කට්ටල හොරුත් එක්ක අල්ලා දුන්නා. මොකක්ද ආණ්ඩුව ඒ සඳහා ගත්ත පියවර? කල් ඉකුත් වුණු රුධිර පාරවිලයන කට්ටල පාවිච්චි කරලා මේ රටේ රෝගීන් දස දහස් ගණනකගේ ජීවිත අනතුරට පත් වුණත් ඒ පිළිබඳව ආණ්ඩුව මුනි වත රකිනවා.

ඒ අපරාධවලට මුල් වෙච්ච මිනිස්සු, ඒ අපරාධකරුවන් අද වන තුරු නීතියේ රැහැනට ගෙනැල්ලා නැහැ. පැහැදිලිවම අද මධ්‍යම පළාතේ මහ ඇමතිවරයාට අල්ලස් හා දූෂණ චෝදනා එල්ල වෙලා තිබෙනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ආණ්ඩුවේ දේශපාලනඥයින්ට අද අල්ලස් හා දූෂණ චෝදනා එල්ල වෙනවා. නමුත් මේවා පිළිබඳව නීතිය හරිහැටි ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රකාශය කරන්නට බැහැ. එය ස්ථාවර නියෝගවලට විරුද්ධයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන හෝ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන එවැනි ප්‍රකාශ කරන්නට බැහැ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මම නමක් කිව්වේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, නමක් කියන්න ඕනෑ නැහැ. The inference is there. එම කොටස expunge කරනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
නමුත් මේවා ලංකාවේ ජාතික පුවත් පත්වල පොල් ගෙඩි අකුරුවලින් පළ වෙනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙන්න මේ ආකාරයට අල්ලස් හා දූෂණ චෝදනා තිබෙනවා කියලා මාධ්‍යයේ පළ වෙනවා. මේවා වැරදි නම්, මේවා අසත්‍ය නම්, ඇඟිල්ල දික් කරන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හෝ ඒවා නිවැරදි කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය, ඒ මාධ්‍ය නිදහස තිබෙන බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි.

මෙතැනදී අවසාන වශයෙන් මම පැහැදිලිව කියන්න ඕනෑ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම කියන්න බැහැයි කියලා නැවතත් මම කියනවා. එහෙම කියන්න බැහැ. ඒ කොටස expunge කරනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ -එල්එල්ආර්සී වාර්තාවේ- නිර්දේශ ක්‍රියාත්මක කරනවාය කියලා පොදු රාජ්‍ය මණ්ඩලයේ 58වැනි සමුළුවේ සමාරම්භක උත්සවයේදී ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කළා. මේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කාල වකවානුවක් තිබෙනවාද කියන එක රජයෙන් දැන ගන්න මම බලාපොරොත්තු වෙනවා. මෙම වාර්තාවේ තිබෙන ප්‍රධානම නිර්දේශයක් තමයි, ස්වාධීන පොලිස් කොමිසම ක්‍රියාත්මක කිරීම. අද වන තුරු ස්වාධීන පොලිස් කොමිසම ක්‍රියාත්මක වීමක් ගැන ඉඟියක්වත් නැහැ. අද එය ක්‍රියාත්මක කිරීමට රජයට කිසිම බාධාවක් නැහැ. තමන්ට අවශ්‍ය කරන තුනෙන් දෙකේ බලය අද රජයට තිබෙනවා. අද ස්වාධීන මැතිවරණ කොමිසමක් නැහැ. ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් නැහැ. ස්වාධීන අධිකරණ සේවා කොමිසමක් නැහැ. කිසිම ස්වාධින කොමිසමක් නැහැ. අධිකරණ සේවා කොමිසමට දේශපාලන බලපෑම් තිබෙනවා කියලා අධිකරණ සේවා කොමිසම අද ප්‍රසිද්ධ ප්‍රකාශ කරනවා. අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අධිකරණය පිළිබඳ විශ්වාසය රටේ ජනතාවගෙන් ගිලිහෙමින් පවතින තත්ත්වයක ඉඳගෙනයි, අපි අද ජනතාවගේ දේශීය ආර්ථිකය නංවන්නට, බදු වැඩි කරන්නට මේ විවාදය කරන්නේ. මොන විවාද කළත් සත්‍යය ජය ගන්නවා. අද කරන මේ බොරුවට, රැවටිල්ලට, වංචාවට, ප්‍රෝඩාවට, නොමඟ යැවීමට වැඩි ආයුෂ නැති බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා - එතුමා නැහැ. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා - එතුමා නැහැ; ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා - එතුමා නැහැ.; ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා. -එතුමා නැහැ. ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

[අ. භා. 4.29]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ කථිකයින් දෙපළකගේම නම් ප්‍රකාශ කළත්-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තුන් දෙනෙක්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
තුන් දෙනකුගේම නම් ප්‍රකාශ කළත් මේ වැදගත් විවාදය පවත්වන අවස්ථාවේ ඒ අය සභාවේ නොසිටීම ගැන මම කනගාටු

වෙනවා. මේ අණපනත් ගෙනාවාට මේවා සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්නට, මේවා සම්බන්ධයෙන් රටේ ජනතාව දැනුවත් කරන්නට රජයේ පාර්ශ්වයට තිබෙන වුවමනාව මේකෙන්ම තේරෙනවා. ඒ අයගේ මේ නොපැමිණීමෙන්ම විපක්ෂය විධියට අපට පැහැදිලිව පෙනෙන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. කුමන බදු ගෙනාවත්, භාණ්ඩ හා සේවා මත බදු පැනෙව්වත් ඕනෑම බදු ක්‍රමයක මූලික ලක්ෂණ තිබෙන බව අපි පැහැදිලිව අවබෝධ කර ගන්න ඕනෑ. ඒ තමයි ඕනෑම බදු ක්‍රමයක් සරල වෙන්න ඕනෑ; සාධාරණ වෙන්න ඕනෑ. විශේෂයෙන්ම සාධාරණ වෙන්න ඕනෑ. පසු ගිය කාලය පුරාම මේ ආණ්ඩුවේ බදු අය කිරීමේ ක්‍රියා පිළිවෙත ගත්තාම ජනතාවට කොතරම් බදු බරක් පටවා තිබෙනවාද කියලා බලන්න. ඊයේ-පෙරේදා අර්තාපල්වලට රුපියල් 20ක බද්දක් පැනෙව්වා අපි දැක්කා. සැමන් ටින් එකටත් රුපියල් 20ක බද්දක් පැනෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න පහළම පන්තියේ ඉන්න මිනිස්සුන්ටත් ජීවත් වෙන්න කෑමට ගන්න -පරිභෝජනය කරන- භාණ්ඩයක් තමයි අර්තාපල් කියන්නේ, සැමන් කියන්නේ, පරිප්පු කියන්නේ, හාල් කියන්නේ, සීනි කියන්නේ. මේවා අත්‍යවශ්‍ය භාණ්ඩ.

බලන්න, මේ භාණ්ඩවලට බදු පනවන එක බැලූ බැල්මට නොදැනෙන දෙයක් වුණාට, පහළම පන්තියේ මිනිසුන්ට ඒක ඉතාම අමාරු, දැනෙන දෙයක්. මොකද, ඔය වතුකරයේ මිනිස්සු පාන් ගෙඩියක් අරගෙන ගිහිල්ලා අල හොද්දක් හදා ගෙන තමයි කන්නේ. ඉඳි ආප්ප ටිකක් හදා ගෙන අල හොද්දක් හදා ගෙන තමයි කන්නේ. නැත්නම් සැමන් ටින් එකක් අරගෙන හදා ගෙනයි කන්නේ. එහෙම කරන්නේ ගොඩක් කටයුතු ලෙහෙසියෙන් කර ගත යුතුව තිබෙන නිසායි. ඉතින් එවැනි තත්ත්වයක් තුළ මේ භාණ්ඩවලට මෙවැනි බදු පැනවීම, බදු ක්‍රමයක තිබිය යුතු සාධාරණ බව රැක ගැනීමේ මූලධර්මයට පටහැනියි කියලා මම මේ අවස්ථාවේදී විපක්ෂය විධියට කියන්න ඕනෑ.

දැන් බලන්න, පසු ගිය කාලය පුරාම මැතිවරණ තිබුණා. ඒ පැවැත්වූ මැතිවරණ ගැන කියන්න ඕනෑ නැහැ නේ. මැතිවරණ දිගින් දිගටම පැවැත්වූයේ සලාක ක්‍රමයට. පුළුවන් නම් ඉදිරියේදී පනත වෙනස් කරලා ප්‍රාදේශීය සභාවෙන් ප්‍රාදේශීය සභාවට මැතිවරණ තියලා ප්‍රාදේශීය සභාත් දිනා ගන්න කටයුතු කරයි. පනත වෙනස් කරන්න පුළුවන් නම් ඒකත් කරයි. පසු ගිය කාලය පුරාම පළාත් සභා මැතිවරණ වෙන වෙනම පැවැත්වූවා. ජනතාව බලා ගෙන ඉන්නවා, මැතිවරණය ප්‍රකාශයට පත් කරනවාත් එක්කම බඩු මිල අඩු වන හැටි. විවිධ බඩුවල මිල අඩු වෙනවා. එහෙම අඩු වෙලා ඒ මැතිවරණය අවසන් වනවාත් සමඟම ආපහු එක දිගටම බඩු මිල වැඩි වේ ගෙන වැඩි වේ ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේක දැන් රටාවක් වෙලා තිබෙන්නේ; මේක නිකම් කලාවක් වෙලා තිබෙන්නේ. දැන් මේක ජනතාවත් දන්නවා. ජනතාව ඇන්දවීමේ කලාව තමයි දැන් මේ ආණ්ඩුව ප්‍රගුණ කරමින් යන්නේ.

බෞද්ධයන් වශයෙන් සර්වඥ ධාතූන් වහන්සේ වැඩ පුදා ගන්න අපිත් ගියා. ඒක බොහොම හොඳ වැඩක්. හැබැයි මේ සේරම කෙරෙන්නේ මැතිවරණ කාලයේදී. වෙසක් පෝය, පොසොන් පෝය වාගේ කාලයකදී තමයි මේ වාගේ හොඳ දේවල් මේ රටට ගෙනෙන්න ඕනෑ. නමුත් මේ වාගේ දේවල් මැතිවරණ කාලයේදී වෙනවා. ඒ ගැන මාධ්‍ය සංදර්ශන දමනවා. මාධ්‍ය මාෆියාව යොදා ගෙන මනෝ විද්‍යානුකූලව ඒක කොතරම් දුරට මැතිවරණයට යොදා ගන්නවාද කියනවා නම්, බෞද්ධයන් මේ සර්වඥ ධාතූන් වහන්සේ වැඩ පුදා ගෙන ආණ්ඩුවට ඡන්දය දුන්නේ නැත්නම් බෞද්ධකමට -බුදුන් වහන්සේට- විරුද්ධ වුණා හා සමාන විධියට හඟවලා මේ සර්වඥ ධාතූන් වහන්සේ මේ මැතිවරණ ව්‍යාපාරය තුළට යොදා ගැනීමක් අපි දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා වැරැදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉදිරියේදී බස්නාහිර පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිතයි. මීගමුව, වත්තල, ජාඇල ප්‍රදේශයේ ඉන්න වැඩි දෙනෙක් කතෝලික ජනතාව. ජේසුස් වහන්සේගේ මොනවා හරි දෙයක් ලංකාවට ගෙනැල්ලා මේ ප්‍රදේශවල ඉන්න කතෝලික ජනතාවට පෙන්වලා, ඊට පස්සේ ඒ ආශ්‍රයෙන් කතෝලික ජනතාවගේ ඡන්ද ගන්න කටයුතු කරයිද කියලා අපට සැකයක් තිබෙනවා. මම හිතන හැටියට මේ තුළින් ජනතාව ඇන්දවීමේ ක්‍රියාදාමයක තමයි මේ ආණ්ඩුව යෙදෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු බෙදනවා, ඍජු බදු සහ වක්‍ර බදු කියලා කොටස් දෙකකට. ඇත්ත වශයෙන්ම වක්‍ර බදු ජනතාවට කෙළින්ම බලපානවා, භාණ්ඩ හා සේවා මත පනවන නිසා. ව්‍යාපාරික පන්තියෙන් තමයි ඍජු බදු අය කරන්නේ. නමුත් බලන්න, මේ රටේ ඍජු බදු අය කිරීමේදී අනුගමනය කරන ක්‍රියා මාර්ග දිහා. ඍජු බදු නැත්නම් ආදායම් බදු පැහැර හරින ඉහළම ව්‍යාපාරිකයෝ මේ රටේ ඉන්නවා. එක එක අල්ලස් දීලා, එක එක කොමිස් දීලා, එක එක දේශපාලන බලය පාවිච්චි කරලා බදු පැහැර හැරීම විශාල වශයෙන් සිදු වනවා කියලා මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 වර්ෂයේදී ආදායම් බදු පැහැර හැරීමෙන් රජයට අහිමි වුණු ආදායම රුපියල් බිලියන 94ක්. ඒවා අය කර ගන්න ආණ්ඩුව උත්සාහ දරන්නේ නැහැ. හැබැයි අහිංසක මිනිසුන්ට බඩේ පහර ගහන්න තමයි ආණ්ඩුව උත්සාහ කරන්නේ.

ඒ වාගේම බලන්න, රේගු දෙපාර්තමේන්තුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් දීම් වැනි අයථා ක්‍රම භාවිත කරලා, රේගුව මඟ හැරලා, මේ රටට අය විය යුතු, රජයට අය විය යුතු රුපියල් කෝටි කීයක් දවසකට ආදායම් බදු හැටියට ගෙවීම පැහැර හරිනවාද කියලා තමුන්නාන්සේ දන්නවාද? මම ඒක අලුතෙන් කියන්න ඕනෑ නැහැ. ඒක දැන් කලාවක් වෙලා තිබෙන්නේ. අද රේගු දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරින් ඔක්කොම කෝටිපතියන් වෙලා. මොකක්ද හේතුව? ඔක්කෝම අයගේ ඇස්වලට වැලි ගහලා මේ රජයට අය විය යුතු මුදල්වලින් කොටසක් අරගෙන ධනපතියන් වෙන්නේ කොහොමද කියලා ඒගොල්ලන් දන්නවා. නමුත් මේවා වහන්න, මේවා නවත්වන්න, මේවා අවම කරන්න පසු ගිය කාලයේ ආණ්ඩුව ගත්ත ක්‍රියා මාර්ග මොනවාද කියලා මා මේ අවස්ථාවේදී අහන්න ඕනෑ. ලොකුවට ආදායම් තිබෙන, ලොකුවට තෙල්වලින් ආදායම් එන, එහෙම නැත්නම් වෙනත් කාර්මික නිෂ්පාදනවලින් ලොකුවට ආදායම් එන රටක් විධියට තමයි අපේ රටේ අය හැසිරෙන්නේ; දේශපාලනඥයෝ හැසිරෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, අපේ කාන්තාවන් මැද පෙරදිග ගිහිල්ලා එක එක්කෙනාගේ බැලමෙහෙවරකම් කරලා, රෙදි හෝදලා ගෙනෙන සල්ලි තමයි අද මේ ආණ්ඩුව දුවන ප්‍රධාන ආදායම් මාර්ගය වෙලා තිබෙන්නේ.

අපට ලජ්ජයි ඒ ගැන කියන්න. ඒ වාගේ ආදායම් අර ගෙන අද අපේ බොහෝ අය හැසිරෙන්නේ හරියට මහා ධන කුවේරයෝ, එහෙම නැත්නම් රත්තරන් නිධි තිබෙන පුද්ගලයෝ වාගේයි. ඒක කනගාටුවට කාරණාවක්.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ආරම්භ කළ කර්මාන්තශාලාවල සහ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ආරම්භ කළ ඇඟලුම් කර්මාන්තශාලාවල සේවයට යන ගම්වල අහිංසක ළමයි -අවුරුදු දෙක තුනක් යන විට ඔවුන් ලේ නැතිව සුදුමැලි වෙනවා- දුක් විඳලා, මහන්සි වෙලා, හම්බ කරන සල්ලිවලින් තමයි බොහෝ අය අද මේ ඔක්කොම සෙල්ලම් දාන්නේ. ඒ නිසා මම කියනවා, මේ මිනිසුන්ගේ අමාරුකම් පිළිබඳව මේ රජය මීට වැඩිය අවධානය යොමු කරන්න ඕනෑ කියලා. මිනිසුන්ට ජීවත් වෙන්න කොතරම් අමාරුද කියන එක පිළිබඳව මේ රජය අවධානය යොමු කරන්න ඕනෑ.

මේ රටේ මන්ද පෝෂණය ගැන බලන්න. කුඩා දරුවන්ගේ මන්ද පෝෂණය සියයට 30 දක්වා වැඩි වෙලා තිබෙනවා. සියයට 30 දක්වා! මම නොවෙයි එහෙම කියන්නේ. සෞඛ්‍ය අධ්‍යක්ෂතුමිය තමයි එහෙම කියන්නේ. දැන් අපි පාරවල් හදනවා. පාරවල් හදන එක හොඳයි. පාරවල් හදන එකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් පාරේ යන්න මිනිසුන් ඉතිරි වෙලා ඉන්න ඕනෑ.

අද මිනිසුන්ට රෝහලකට යන්න බැහැ. ගිහින් වැඩක් නැහැ, බෙහෙත් නැහැ. මම ඊයේ-පෙරේදා මාත් එක්ක විශ්වවිද්‍යාලයේ හිටිය මිතුරෙකු බලන්න කොළඹ මහ රෝහලේ 41 වෙනි වාට්ටුවට ගියා. එයාට 41 වෙනි වාට්ටුවේ ඇඳක් දෙන්න විධියක් නැහැ, එතරම් රෝගීන් සංඛ්‍යාවක් ඉන්නවා. අවශ්‍ය පහසුකම් නැතිව අගු පිල්වල රෝගීන් ඉන්නවා. මම ඒ වෛද්‍යවරයෙකුගෙන් තව කොතරම් ඇඳන් ප්‍රමාණයක් අවශ්‍යද කියලා ඇහුවාම කිව්වා, අපේ ප්‍රධාන රෝහලට තිබෙන ප්‍රමාණයට වැඩිය තව ඇඳන් දාහක්වත් අවශ්‍යයි කියලා. මේවා සහ ගහන අපරාධ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා සහ ගහන අපරාධ. මේ අවශ්‍යතාවන් ඉෂ්ට කළ යුතුව තිබෙනවා. රෝගීන්ට අවශ්‍ය බෙහෙත් වර්ග නැහැ කියලා ඒ වෛද්‍යවරු අපට කියනවා. අවශ්‍ය උපකරණ බොහොමයක් නැහැ කියලා වෛද්‍යවරු කියනවා. දස දහසකට වැඩි පිරිසක් හෘදය සැත්කම් කර ගන්න බැරිව පොරොත්තු ලේඛනයේ ඉන්නවා. ඒවාට අවශ්‍ය උපකරණ නැහැ. ඒවාට අවශ්‍ය මුදල් වෙන් කිරීම් කරන්නේ නැහැ. මම මේ පාර්ලිමේන්තුවේදීම ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ඇහුවා. නමුත් ඒ පිළිබඳව කටයුතු කරන්නේ නැහැ. මිනිස්සු මැරී ගෙන මැරී ගෙන යනවා. දෙමවුපියන්ට දරුවෝ නැති වෙනවා; දරුවන්ට අම්මලා තාත්තලා නැති වෙනවා; බිරිඳට ස්වාමියා නැති වෙනවා. මේකයි යථාර්ථය. නමුත් මේ ආණ්ඩුවට ඒ කෙරෙහි අවධානය යොමු කරලා අවශ්‍ය ප්‍රමුඛතාව අනුව මුදල් වෙන් කරන්න ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිකම් විදුලිය නාස්ති කර ගෙන මේ දේවල් ගැන කථා කරනවා. ඒ නිසා මම අහනවා මේ ජනතාව ගැන අවධානය යොමු කරලා තිබෙනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ශ්‍රී ලන්කන් එයාලයින්ස් එකේ පාඩුව කීයද? රුපියල් බිලියන 19යි. පසු ගිය වසරේ පාඩුව රුපියල් බිලියන 19යි. ඒ පාඩුව ගැන සොයලා බැලුවාම මොකක්ද හේතුව? නිරපරාදේ මුදල් විනාශ කළ තත්ත්වක් තිබෙනවා. ලෝකයේ ප්‍රධාන ගුවන් සමාගම් ගෙවන වැටුපටත් වැඩිය සමහර අංශවල ඉන්න අයට වැටුප් දෙනවා. කවුරුත් මේවා ගැන අවධානය යොමු කරලා නැති බවයි අපට පෙනෙන්නේ. ඒ නිසා අපි කියනවා මේවා කෙරෙහි අවධානය යොමු කළ යුතුව තිබෙන බව. එසේ නොවුණහොත් අපි ලොකු අර්බුදයකට පත් වෙනවා. ඒ වාගේම ජනතාව වෙනුවෙන් අපේ යුතුකම ඉෂ්ට කළා වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙතැන පරිපූරක වෙන් කිරීම් තිබෙනවා ඊළඟ අය වැයට අදාළ. රුපියල් මිලියන 10ක්, එහෙම නැත්නම් කෝටියක් දමලා තිබෙනවා සෙවණගල සීනි කම්හලට. මේක අපේ දයා ගමගේ මැතිතුමා හොඳට ලාභ උපයා ගෙන පවත්වා ගෙන ගිය සීනි කම්හල. පුනරාවර්තන වියදම්වලට, ඒ ආයතනය පවත්වා ගෙන යන්න අද රජයෙන් මුදල් වෙන් කර ගන්නවා. හොඳට ලාභ උපයමින් ගිය ආයතන දේශපාලනය මත, දේශපාලන වෛරය වපුරලා ආණ්ඩුවට පවරා ගත්තාට දැන් පවත්වා ගෙන යන්න බැහැ. ඒ ආයතනවලින් ලාභ උපයන්න බැරිවා විතරක් නොවෙයි පඩි දී ගන්න විධියක් නැතිව දැන් පරිපූරක ඇස්තමේන්තු දාලා කෝටි ගණන් මුදල් වෙන් කර ගන්නවා. මේකද මේ ආණ්ඩුවේ ක්‍රියාදාමය කියලා මම අහන්න කැමැතියි.

අතාවුද සෙනෙවිරත්න මැතිතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂයට පොඩි මිනිහා ගැන කථා කරන්න අයිතියක් නැති ලු. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ධනවාදී පක්ෂයක් ලු. නමුත් මා කියනවා, පොඩි මිනිහාට වැඩියෙන්ම වැඩ කළේ එක්සත් ජාතික පක්ෂයයි කියලා. එක්සත් ජාතික පක්ෂයේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ පාලන කාලයේ ඉඳලා ජනසවිය වැඩ පිළිවෙළ ගෙනාවා. නිදහස් අධ්‍යාපනය යටතේ නොමිලයේ පොත් ටික දීලා, නොමිලයේ නිල ඇඳුම් ටික දීලා, නොමිලයේ දිවා ආහාරය දීලා, විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබන්න මහපොල ශිෂ්‍යාධාරය දීලා පොඩි මිනිහාට නොවෙයිද අපි සැලකුවේ කියලා මම අපේ අතාවුද සෙනෙවිරත්න මැතිතුමාගෙන් අහනවා. පොඩි මිනිහාට වැඩියෙන්ම සලකලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයයි.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අද සමෘද්ධි සහනාධාරය කපන තැනට ඇවිල්ලා. අද ගොවීන්ගේ විශ්‍රාම වැටුප කෝ? මේ වන විට ඒක ගෙවලා නැහැ. ගොවීන්ගේම සල්ලිවලින් ගෙවන විශ්‍රාම වැටුපවත් මේ ආණ්ඩුවට ගෙවා ගන්න පුළුවන්කමක් නැහැ. මේකද පොඩි මිනිහාට සලකන විධිය?

අද උපාධිධාරින්ට කරලා තිබෙන නිගාව මොකක්ද? දෙමවුපියන් දහසකුත් දුක් විඳලා දරුවන්ට උගන්වනවා. ඒ දරුවන් නිදහස් අධ්‍යාපනය නිසා අධ්‍යාපනය ලබලා විශ්වවිද්‍යාලවලට ගිහින්, එළියට ඇවිත් අද ඉඳගන්න පුටුවක්වත් නැතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, තවත් තැන් තැන්වලට දාලා ඉන්නවා. ඒ අයට රුපියල් 10,000යි ගෙවන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ උපාධිධාරින් අද ගම් දනව් ගානේ ඇවිද්දනවා. ග්‍රාම නිලධාරී යටතේ අත්සන් කරලා කුකුළු පැටව් බෙදන්න, බීජ පැළ බෙදන්න, බීජ ඇට බෙදන්න වාගේ වැඩවලට තමයි උපාධිධාරින් යොදවන්නේ. පුවත් පතක පළ වෙලා තිබුණා, උපාධිධාරින් හතර දෙනෙක් කම්කරු පත්වීම්වලට දමා තිබෙනවාය කියා. මේ රටේ උපාධිධාරින් පාවිච්චි කරපු හැටි තමයි ඒ. මේක අනාගතයට ඉතාම නරක ආදර්ශයක්ය කියන එක මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

අද නීතිය වල් වැදිලා. අද රටේ නීතිය හා සාමය නැහැ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනල්ලා මොකක්ද කළේ? ඒ ඔක්කොම තමන්ගේ යටතට පවරා ගෙන අද තමන්ට ඕනෑ ඕනෑ විධියට නීතිය හසුරුවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ මුළු රටම දන්නවා ඇමතිවරයෙකුගේ පුත්‍රයෙක් කරපු පහර දීමක් ගැන මොකක්ද වුණේ කියන එක. හමුදා නිලධාරියෙකුට පහර දීලා අවසානයේදී මොකක්ද වුණේ? අවසානයේදී තමන්ට පහර දුන්නේ නැහැ කියා

ඒ හමුදා නිලධාරියා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන තත්ත්වයකට බලපෑම් ඇති කරලා තිබෙනවා. හෙට, අනිද්දා වෙද්දී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීතුමා මරණයට පත් වුණේ එතුමා විසින්ම කර ගත්තු වෙඩි තියා ගැනීමක් නිසාය කියන එක පැහැදිලිව ඔප්පු වේවි. එතැනට තමයි මේ ආණ්ඩුව මේ රටේ නීතිය හා සාමය තල්ලු කරන්නේ. ඒ නිසා මම කියනවා, මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ ගැන අපට කිසිසේත්ම සෑහීමකට පත් වෙන්න බැහැ කියා. ගම්වල ජනතාව දුක් විඳිනවා, බඩු මිල වැඩි වේගෙන යනවා. මැද පෙරදිග ගිහින් දුක් විඳලා, කර්මාන්ත ශාලාවල වැඩ කරලා, විවිධ අංශවල වැඩ කරලා මේ රටට ගෙනෙන සල්ලිවලින් මේ රටේ අහිංසක ජනතාවට සහන සලස්වන්නය කියා අපි කියනවා. එහෙම නොවුණොත් මොන විධියකින් ඔය සල්ලි හම්බ කළත් ඔය හැමෝටම හොඳක් වෙන්නේ නැති බව මට විශ්වාසයි.

අද අපේ රටේ තරුණයන්ට රැකියා දීමේ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. රැකියා බිහි වීමේ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අද අපි මේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්නය කියන්නේ, පරිගණක තාක්ෂණය වැඩි කරන්නය කියන්නේ, ඉංග්‍රීසි අධ්‍යාපනය වැඩි කරන්නය කියන්නේ මේ රටේ අධ්‍යාපනය ලබන හතළිස් ලක්ෂයක දරු දැරියන් වෙනුවෙනුයි. අනාගතයේ මේ රට බාර දෙන්න, නව යුගයක් කරා මේ රට මෙහෙයවන්න සිටින මේ රටේ ජීවනාලිය බඳු දරු පරපුර වෙනුවෙන් මේ රටේ අනාගතය වෙනුවෙන් තමයි ඒ කටයුතු කරන්නය කියා අපි කියන්නේ. නමුත් මේ ආණ්ඩුව ඒවා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධයෙන් අපට කෙසේවත් සෑහීමකට පත් වෙන්න බැහැ.

අද විභාග ක්‍රමය ඉවරයි, විභාගයට කලින් ප්‍රශ්න පත්‍ර පිට වෙනවා. Z-score ප්‍රශ්නය නිසා පහු ගිය කාලයේ විශාල පිරිසක් දුක්මුසු මුහුණින් හිටියා. අපි ඒ වෙනුවෙන් සටන් කළා. අධිකරණයට පින් සිද්ධ වෙන්න සෑහෙන දුරට ඒ ප්‍රශ්නය සමනය වුණා. නමුත් ඒක සම්පූර්ණයෙන් ඉවත් කරන්න මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ. ඒ නිසා අපි මේ රජයට කියන්න ඕනෑ, මෙන්න මේ කාරණය. රජය එක එක පනත් ගෙනෙනවා. එක එක වෙළෙඳ බදු ගෙනෙනවා. එක එක දේවල් මත බදු පනවනවා. මේ විධියට බදු පනවද්දී යටම ඉන්න මිනිහාට ජීවත් වෙන්න පුළුවන් මූලික අවශ්‍යතා ටික සපුරන්න පුළුවන් වෙන විධියට ඉඩ තියා ඉහළ මට්ටමේ ඉන්න මිනිහාට ඕනෑම බද්දක් ගහන්නය කියා අපි කියනවා.

අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා කිව්වා, එක්සත් ජාතික පක්ෂය පොඩි මිනිහාට සලකන්නේ නැහැ කියා. පොඩි මිනිහා ආරක්ෂා කරන නිසා තමයි පොඩි මිනිහාගේ ජීවත් වීමේ මූලික දේවල්වලට බදු ගහන්න එපාය, ඕනෑ නම් ලොකු මිනිස්සු වෙනුවෙන් බදු ගහලා, සාධාරණය ඉෂ්ට කර දෙන්නය කියා අපි කියන්නේ. බදු ක්‍රමයක මූලිකම අංගය වූ බදු ක්‍රමය සාධාරණ විය යුතුයි කියන කාරණය කෙරෙහි අවධානය යොමු කරන්නය කියා මම විශේෂයෙන් කියනවා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අද මේ විවාදයට සහභාගි වෙමින් මේ කරුණු ටික විශේෂයෙන් කියන්න ඕනෑ. මෙතැනදී අපේ වචන කොච්චර නාස්ති කළත් ආණ්ඩුව ඒ කෙරෙහි අවධානය යොමු කරන බවක් නම් අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා අපි කියන්නේ ආණ්ඩුවේ අවධානය ඒ කෙරෙහි යොමු කරන්නය කියායි. නාස්තිය සම්බන්ධයෙන් විවිධ අදහස් උදහස් දරන මන්ත්‍රීවරු මේ ආණ්ඩුවේම ඇති. නමුත් ඒ එකක් කෙරෙහිවත් මේ ආණ්ඩුව අවධානය යොමු කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නය කියා මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිමින් නවතිනවා. බොහොම ස්තුතියි.

[4.45 p.m.]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Presiding Member, today we are speaking again about levies and custom duties imposed by the Ministry of Finance and Planning on the people of this country. Sir, taxes in the past were used to equate the poor and the rich. By taxing the rich and giving concessions to the poor, all people will have a fair opportunity to live as equals in the country. Sri Lanka being a Democratic Socialist Republic, I think, should follow this socialist policy by a party that is supposed to be left-of-centre. But, what is happening in this country? The people are being burdened with more and more taxes to increase the revenue of the Government, but not as a fiscal policy or as a means of bridging the gap between the rich and the poor.

We see taxes being imposed on the day-to-day essentials. In the past, it was an accepted practice that no taxes are imposed on food items so that people can lead their basic life which needs food as the most important sustaining requirement. But today, in fact, every other day, we see that taxes are imposed on food items. Yesterday, there was a tax increase of Rs. 20 on a kilogram of potatoes. The total tax on a kilogram of potatoes today in Sri Lanka is Rs. 50 which is unimaginable. In a country like India, you can buy a kilogram of potatoes for Rs. 10. But, you are imposing a tax increase of Rs. 20 on a kilogram of potatoes. Are potatoes a luxury item? Are they like apples? Even apples today are not considered as luxuries, but essentials. You impose taxes stating that you are going to protect the local farmer. Protecting the local farmer does not mean that you can burden the majority of the people who are consumers. The consumer also has the right to be protected as much as the farmer. So, to protect the consumer, you must provide subsidies to the farmer so that he can sell his produce at a profit while the consumer receives his goods at a fair and reasonable price. This has been totally forgotten by this Government which is only interested in raising revenue so that they can spend without any care. This Government is wasting the resources of the country by having *tamashas* to hoodwink the people and keep them always entertained. The Government is spending billions of rupees on all sorts of entertainment items, whereas the basic needs and the daily used consumer items of people are being taxed at exorbitant rates.

Sir, recently, the Government imposed higher taxes on motorcycles and small cars. In any country, it is the small cars which are taxed at the lowest rate. Also, motorcycles are today considered as a means of transport of middle-class or lower middle-class families. So, to impose such large taxes on motorcycles is unreasonable. Most of the motorcycles are imported to this country from India and most of the small cars or 50 per cent of

[ගරු ආර්. යෝගරාජන් මහතා]

the cars are imported from India because small cars are manufactured at reasonable prices in India. Some people believe that this tax was imposed on small cars and motorcycles, more as a foreign policy initiative, to hit back at India that voted in the United Nations Human Rights Council against Sri Lanka. Is it fair to impose burdens on the people of this country because your diplomacy with India has failed?

Today, an ordinary citizen who goes to India is attacked. It is because of the wrong policies followed by this Government; not that Indian people have any animosity towards the normal citizens of Sri Lanka. It is all a failure of this Government. You yourself appointed the LLRC. You got a Report. You were refusing to implement that Report. Then, the US had to bring in a Motion in the United Nations Human Rights Council to force you to implement the LLRC Report. India, which stands by the affected people in this country, has a moral duty to support a Motion that has been brought to urge the implementation of the Report that was created by this Government. So, when India does that, you hit back at India by imposing taxes on motorcycles and small cars just because you think that it is going to affect the Indian economy.

The Indian economy is the fifth largest economy in the world. It is emerging with China to take first and second places in the future. Ours is a small country whose largest supplier of imported goods is India. But, you are trying to hit back at India imposing taxes on motorcycles and small cars. This is exactly what this Government is doing without knowing what is right and what is wrong.

Recently, you increased the duty on milk food by Rs. 136 which is Rs. 61 per 400-gram packet. You increased the duty on milk food saying that you are going to protect the local milk farmer. What is happening? Are you having the means to distribute the milk produced in this country to the ordinary consumer? You do not have the capacity to do that. You are throwing milk into the drains as the Hon. (Dr.) Jayalath Jayawardana said. You are burying milk in the ground using backhoe machines because you do not know how to distribute milk. But, before finding a way of distributing this milk you are throwing it out and you are imposing taxes saying that it is to protect the milk farmer. See the economics of milk production in this country. The National Livestock Development Board and Milco - both Government-owned institutions - are buying liquid milk at Rs. 50 and selling it at Rs. 120. The value addition or the price addition to the Rs. 50 milk is Rs. 70, which is 140 per cent. What exorbitant profits are the NLDB and Milco trying to make? Is this fair? If you can sell liquid milk that you buy for Rs. 50 at Rs. 70, then nobody is going to buy powdered milk which is being sold today at Rs. 260 for a 400-gram packet, which works out to about Rs. 78 per litre when you mix it and make the liquid milk. So, if milk that is produced abroad is converted to powdered milk, packetted, sent to this country, advertised, marketed with all the commissions and still sold at Rs. 80, you all are buying local liquid milk at Rs. 50 and selling it for Rs. 120 with a value addition of Rs. 70 or profit addition of 140 per cent. Is this fair?

If you know how to manage the milk industry, then you will not be in this type of a situation. You are taking milk from the upcountry maybe to Pannala, Colombo or Kandy, converting it into powdered milk and then it is sent back to Nuwara Eliya. Then, again in Nuwara Eliya, they add water and they use this powdered milk. But still, it is cheaper than buying the liquid milk that is produced in Nuwara Eliya itself. The way to handle this issue is to have liquid milk-processing plants all over the country so that you do not have to transport it from Nuwara Eliya to Pallekele or from Nuwara Eliya to Colombo and then send it back to all the areas in the country. If you had a decentralized set up where liquid milk can be processed locally and distributed to the consumers at the local level, the milk that you buy at Rs. 50, you will be able to give the consumer at Rs. 70.

Even today, in India, a litre of milk is sold at Rs. 16 after conversion to Sri Lankan Rupees. That is because they buy at Rs. 10 and distribute at Rs. 6. But here, it is not that way.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

Hon. Member, who destroyed the local milk industry in this country?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Whoever did it, your duty today -

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

You started importing all these milk products - [*Interruption.*]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

You see, milk powder was given when we did not - [*Interruption.*]

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

Do not worry. We will continue with this. You do not worry about this.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

"Do not worry", you cannot say that because we are part of this nation. We want to preserve the milk farmer.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

What did you do? You imported milk powder from - [*Interruption*.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

No, we did not import. Even today, are you self-sufficient? Why are you throwing the milk produced in this country into the drains? You tell us that.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

You destroyed the milk industry. Why are you talking nonsense?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

We are not talking nonsense. Do not interrupt me. We want to preserve the milk farmer in this country.

That is what we are talking about. You do not know whether you are coming or going. - [*Interruption.*] So, do not talk. You are making all the mistakes. You have thrown away 800,000 litres of milk which cost you Rs. 40 million. If you had sold that at the price a litre of milk is sold to the consumer, that is at Rs. 120, you would have got nearly Rs. 120 million. But, you have thrown it into the drains. After you made the mistake, you have no right to shout here.- [*Interruption.*] Hon. Mithrapala, you are the Deputy Minister in charge of it and you are unable to do what has to be done. Why do you not decentralize - [*Interruption.*] If you have no brain to think, at least accept good advice and try to decentralize the distribution of liquid milk so that the cost of distribution will come down and the consumer will get liquid milk cheaper than powdered milk. That is the only way for you to change this and do not get angry just because we say the right thing. If you still cannot understand it, then give up your Ministry and we will get somebody else to manage it.

Then, I am going to speak about another issue - flour. This Government is trying to force people to eat rice. Again, the same reason is given. Does a citizen of this country not have the choice to eat what he likes? Do you want to burden the man who wants to eat bread or *roti* made out of flour, to eat rice? He is eating that not because he likes it. Anybody in the plantations would like to eat rice but when they go for work in the morning, the women are unable to cook rice and take it with them. For convenience, they take *roti* made out of flour. But, the President comes to Nuwara Eliya and says, “People should learn to eat rice”. It is not that we do not know to eat rice. The up-country Tamil people know very well how to eat rice. They are people who eat rice at all their big functions. They do not eat just rice. They have a five-course meal with rice. They make so many forms of food using rice. It is not that they do not know it but for the convenience of their lives, they have to eat flour. But, you impose taxes on flour to make it as expensive as possible.

Talking about sugar, recently the international prices of sugar dropped. But, you will not let the man who takes sugar, to have the benefit of it. The sweetness of the sugar price coming down cannot be enjoyed by an ordinary man in this country because you immediately imposed a tax of Rs. 10 on every kilo of sugar so that the price of sugar does not come down. Maybe it is not good for you to take sugar since most of you are maybe having diabetes and cannot eat sugar, but the ordinary man does not have that problem. He wants to have a sweet meal, a sweet drink or a sweet cup of tea.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Hon. Member, we have no diabetic problems.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Not you, Hon. Minister. Maybe you are too big and it is bad for you to take sugar. - [*Interruption.*] No, for your height you are too fat, Hon. Minister, and because of that, maybe you should not take sugar. But, 45 per cent of the ordinary people are less than 25 years. They would like to have sweets; they would like to eat more ice-cream or more cakes. Let them have that. Do not impose taxes on sugar. By doing that, what are you gaining? You are getting revenue. Your only concern is to gain revenue, which is very unfortunate.

The other issue is about the tax imposed on IDD calls. We say the economy of this country is sustained mostly by our young women and men who are working in the Middle-East. They bring enough foreign exchange to bridge the gap. Our deficit is wiped out only through the remittances these people earn for this country. Today, due to the competition between the different service providers in the mobile telephony industry, the rates for international calls have come down very rapidly. It has come down to Rs. 3 and Rs. 2. If you have a regular number, it is less than Rs. 2. But, what do you do? You impose a tax of Rs. 2 on every minute that you speak on an IDD call. In addition to this, you also have to pay 20 per cent Telecommunication Levy. Why are you taxing

[ගරු ආර්. යෝගරාජන් මහතා]

the people who bring money to this country to save your economy in this manner? What is the concession you have given to those who go to the Middle East and earn so much of foreign exchange for this country? They get a paltry duty-free allowance when they come back. Other than that, they have nothing to gain. Even though they have a duty-free allowance, they cannot buy these luxury goods with the money they bring. They bring it back to build a house or something like that. So, they do not use that duty-free allowance even to the full value. Other than that, they get nothing. At least, let them make a telephone call to their families who are far away, who sacrifice the life they would enjoy with their young children or their husbands or their grandchildren. You deprive them of all that happiness they could get by making a telephone call. Even that, you are depriving them by increasing the taxes. If the companies can provide the service at Rs. 2, you without doing anything take away another Rs. 2 to the Government and what do you do with that money? You enjoy the luxuries. The Ministers enjoy the luxuries. The Government is entertaining the people with all the costly shows that you can put up. Is this what you are trying to do?

Then, talking about the EPF, when the Hon. Athauda Seneviratne was the Minister of Labour Relations and Foreign Employment, he brought in a law. He proposed it at the NLAC to amend the EPF Act, so that any person who wishes to build a house or needs medical treatment, could withdraw one-third of the money in his EPF account, in advance. At the moment, we have a law which permits a person to borrow against the EPF balance in his account. When he borrows from a bank, he has to pay interest and also a monthly payment for the loan that he takes. If you borrow Rs. 30,000 and when you repay the loan, you are paying Rs. 78,000 including Rs. 48,000 as interest. Instead of that, the Hon. Athauda Seneviratne brought in a good law which permitted one to withdraw one-third of the amount remaining in his EPF account, in advance, if he had been a member of the EPF for 10 years. That is a very good piece of legislation. I commended that legislation when it came up in this House. But today, after 10 months, the Treasury has still not permitted the Ministry of Labour and Labour Relations to issue the circular and to issue the application forms for a person to withdraw this one-third from his own account. Why? Because the EPF is no more liquid.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I will wind up with this point. The EPF is not liquid. You have invested it in the share market. You have invested it in other investments where your cash is not liquid. If the people are allowed to withdraw one-third of the amount remaining in their account for the purpose of building a house, then the whole EPF might collapse because this Government is sustained by the EPF only. Also, you have made unethical investments in the share market to buttress the share market mafia. So, with all this, the fate of the EPF that every employee in this country contributes towards, has become suspicious. The ordinary worker is today thinking whether he will be able to withdraw his EPF or not. If he cannot be paid one-third of his balance today, when he applies for total withdrawal of his balance, will he be permitted or will the Government have difficulty in repaying? This is the question in the mind of every worker. So, if you brought in a law, implement it. Let the Treasury permit the Minister of Labour and Labour Relations to issue the necessary circulars. Allow people to withdraw their money to build their own houses. Unless you do that the confidence that the people have in the EPF will be lost and that will be disastrous for labour relations in this country.

Thank you.

[අ. භා. 5.09]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදයට එකතු වෙලා වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මට කලින් කථා කරපු ගරු යෝගරාජන් මන්ත්‍රීතුමාගේ කථාවෙනුත්, ඊට පෙර කථා කළ ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාගේ කථාවෙනුත් මට හැඟුණු දේ තමයි ජනතාවට මේ සා විශාල සහන ශුභවාදී අවස්ථාවක් නිර්මාණය කරන කොට ඒ අවශ්‍ය බදු ඉදිරිපත් කිරීමේ අරමුණ ගැන අවබෝධයක් නැතිව, බදු ගැහීම තුළින් බඩු මිල වැඩි වෙනවාය කියන මතය ඉදිරිපත් කිරීමට, ස්ථාපිත කිරීමට විරුද්ධ පාර්ශ්වය උත්සාහ කළාය කියන එක.

මේ විවාදයේදී අප පැහැදිලිව කියන්න ඕනෑ මෙම උත්සාහය, මේ ක්‍රමවේදය, මේ උපක්‍රමශීලී ක්‍රියාදාමය නිසා අද මේ රටේ භාණ්ඩ මිලෙහි යම් කිසි පාලනයක්, පරිපාලනයක් සිද්ධ වෙලා තිබෙන බව. ඉතින් එක්සත් ජාතික පක්ෂයට මේක කිසි සේත්ම අවබෝධ වෙන්නේ නැහැ. ඒක අපට පැහැදිලියි. මොකද, ඒ අයගේ ක්‍රමවේදයට ඒ ආර්ථික ප්‍රතිපත්තියට මේක ගැළපෙන්නේ නැහැ. විවෘත ආර්ථිකය තුළින් කරන්නේ තරගකාරිත්වයට යොමු කරලා තරගකාරිත්වය තුළින් කලාපයේම ශක්තිය තිබෙන, හැකියාව තිබෙන අයව ඉදිරියට ගෙන යාමයි. ඊට පසු බදු අය කර ගන්නේ ආදායම තුළිනුයි. නමුත් ප්‍රගතිශීලී රජයක් හැටියට රට තුළ නිෂ්පාදන ධාරිතාව වර්ධනය කරලා අපේ ගොවියා, අපේ නිෂ්පාදකයා ශක්තිමත් කිරීමේ ක්‍රමවේදයක් මහින්ද චින්තනයේ තිබෙන නිසා මේ සුරක්ෂිත භාවය ඇති කරලා තිබෙනවා.

බදු ක්‍රමය මගින් ආරක්ෂාවක් -සුරක්ෂිත භාවයක්- හැදීම තුළින් නිෂ්පාදන කාර්යයේ ඉන්න අයට යම් කිසි විශ්වාසයක් ඇති වෙනවා, මේ කාලයේ මෙච්චර ප්‍රමාණයක් අපි වගා කළොත් මෙවැනි ඵලදාවක් ලබා ගත්තොත් අපේ වියදම් ගියාට පසු අවම වශයෙන් සුළු ලාභයක් ලබන්න පුළුවන් කියලා. ඒ සුරක්ෂිත භාවය ගොවියාට නැති වුණොත් ඒ අය නිෂ්පාදනයෙන් ඈත්

වෙනවා. නිෂ්පාදනයෙන් ඈත් වුණාම අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ පිට රටින් ගෙනෙන ඒවායින්ම තමයි අපට යැපෙන්න වෙන්නේ. ඒ නිසා මේ ගැන ඔවුන්ට අවබෝධයක් නැති බව මට හිතා ගන්න පුළුවන්. මේ රටේ ගොවිතැනේ යෙදී සිටින අයගේ ඊළඟ පරම්පරාව ක්‍රමක්‍රමයෙන් ගොවිතැනෙන් ඈත් වෙන යුගයක මේ රජය ප්‍රගතිශීලී රජයක් හැටියට මේ සුරක්ෂිතය ලබා දෙන්නේ, පොහොර සහනාධාරය ඇතුළු ගොවීන්ට අවශ්‍ය සහන ලබා දෙන්නේ මේකේ තිබෙන වටිනාකම අත්‍යවශ්‍යතාව පිළිබඳ අවබෝධයක් තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා කියාපු එක කාරණයක් සම්බන්ධයෙන් මා අවධානය යොමු කරන්න කැමැතියි. එතුමා කිව්වා, අපි වාහනවල බදු වැඩි කළේ ඉන්දියාවට පාඩමක් උගන්වන්නය කියලා. මා බොහොම කනගාටු වෙනවා මෙවැනි මන්ත්‍රීවරයකු එවැනි ප්‍රකාශයක් කිරීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ මධ්‍යම රජයත් එක්ක අපේ තිබෙන ගනුදෙනුව, ඔවුන් එක්ක තිබෙන විශ්වාසය පළුදු වෙලා නැහැ. ඒ නිසා අපට ඉන්දියානු රජයත් එක්ක තරහා වෙන්න, ඒ රටින් ලංකාවට එන වාහනවල බදු වෙනස් කරන්න අවශ්‍යතාවක් නැහැ. ගරු යෝගරාජන් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මේ උත්තරීතර සභාව පාවිච්චි කරනවා නම් "ඉන්දියාවයි අපේ රජයයි අතර ප්‍රශ්නයක් තිබෙනවා; මානව හිමිකම් කවුන්සලයේ අන්තිම සැසි වාරයේදී අපට විරුද්ධව ඡන්දයක් ප්‍රකාශ කරපු නිසා අපි ඉන්දියාවට විරුද්ධව මේ බදු වැඩි කරනවා" කියලා කියන්න, ඒක කනගාටුවට කාරණයක්. මොකද, මෝටර් සයිකල් වේවා, පොඩි එන්ජින් ධාරිතාවක් තිබෙන වාහන වේවා ලංකාවට ආනයනය කරන්නේ ඉන්දියාවෙන් පමණක් නොවෙයි. ඉන්දියාවට දැන් චීනයත් එක්ක, කොරියාවත් එක්ක, ඒ වාගේම තායිවානයත් එක්ක තරගකාරිත්වයක් තිබෙනවා. නොයෙකුත් රටවල නිෂ්පාදන ධාරිතාවත් එක්ක, ඒ රට ඇතුළේ තිබෙන නිෂ්පාදන අවශ්‍යතාවත් එක්ක ඒ අයට තම රටේ නිෂ්පාදන ධාරිතාව පිළිබඳව පරිපාලනයක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

බහුතර ජනතාවගේ ශුභසිද්ධිය සඳහා අපේ රටේ බදු ප්‍රතිපත්ති තීන්දු කරන්නේ, ආයෝජනය සහ අපනයනය සඳහා කළ යුතු දේ තීන්දු කරන්නේ අපේ රජයයි. ජාත්‍යන්තර ප්‍රතිපත්තිත් එක්ක අපේ බදු පටලවා ගැනීම බොහොම පටු අදහසක්. අපේ යෝගරාජන් මැතිතුමා මේ බදු ප්‍රශ්නයේදී ඉන්දියාව පටලවා ගත්තු එක ගැන අපි කනගාටු වෙනවා. ඒ වාගේම කබීර් හාෂීම් මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා, මේ බදු ගැහීමෙන් දුප්පත් මිනිසුන්ගේ එදිනෙදා වේලට පහරක් වදිනවා කියලා. එදිනෙදා වේලට පහරක් වදිනවා කියන අයට අවබෝධයක් තිබෙන්න ඕනෑ, අපේ සියයට 62කට වඩා ප්‍රමාණයක් කෘෂි ආර්ථිකයත් එක්ක ජීවත් වෙන ජනතාවගේ මුදල් අත මාරු වෙන්නේ -මුදල් සංසරණය වෙන්නේ- කොහොමද කියලා. ඒ කෘෂි ආර්ථිකයත් එක්ක ජීවත් වෙන අයගේ මුදල් සංසරණය වෙන්නේ නිෂ්පාදන ධාරිතාව පදනම් කරගෙනයි. එතකොට ඒ අය කන්නේ, බොන්නේ ඒ ආදායම් මතයි. ඒ ආදායම කඩා ගෙන වැටෙන්නේ ඒ අයට සුරක්ෂිතයක් නැත්නම් පමණයි. ඒ අය සුරක්ෂිත කරන්න නම් වග කීමක් ඇති රජයක් හැටියට යම් යම් භාණ්ඩවලට කාලයෙන්, කාලයට බදු පනවන්න ඕනෑ. ඒ බදු පැනවූයේ නැත්නම් ඒ අය ඒ ක්ෂේත්‍රයෙන් ගැලවිලා යනවා.

අපි එක දෙයක් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. මේ රට ඉතාම පොඩි රටක්. මේ රටේ අක්කර භාගය, අක්කරය වාගේ පොඩි භූමිවල දහසකුත් දෙනා වගාවන් කරනවා. ඒ අයට මිනිසුන් කිහිප දෙනෙක් වගාවට යොමු කරලා, පොහොර දාලා, නොයෙකුත් කෘමි නාශක වාගේ දේවල් දාලා නිෂ්පාදන ධාරිතාව සඳහා විශාල මහන්සියක් යොදන්න වෙනවා. එතකොට අක්කරයකට අඩු භූමි ප්‍රමාණයක් වගා කරන මෙවැනි ගොවීන් ඉන්න කොට ඒ අය නිෂ්පාදනය කරන්න වැය කරන මුදල වැඩියි.

අපේ අල්ලපු රට ඉන්දියාව. අර්තාපල් ගත්තොත් ඒ අය යන්ත්‍රානුසාරයෙන් අක්කර දහස් ගණනක් වවනවා. කෝටි ගණනක් දෙනා යන්ත්‍රානුසාරයෙන් අල වැනි දේවල් නිෂ්පාදනය කළාම ඒ එක අල කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදලේ ප්‍රමාණය අඩු වෙනවා. එතකොට ඒක සංසන්දනය කරලා අපි ඉන්දියාවෙන් අල ගෙනාවොත් ලාභයි කියලා යමෙක්ට කියන්න පුළුවන්. මොකද ඒ රට තුළ තිබෙන නිෂ්පාදනය පුළුල් නිසා; ඒ අයට තිබෙන නිෂ්පාදන අවශ්‍යතාව වැඩි නිසා; ඉල්ලුම වැඩි නිසා; ඒ අය පාවිච්චි කරන ක්‍රමවේදයන් වෙනස් නිසා. එතකොට ඒ අයට නිෂ්පාදන වියදම අඩුවෙන් පවත්වාගෙන යන්න පුළුවන් වෙනවා.

කෘෂි නිෂ්පාදනය සඳහා අලුත් ක්‍රමවේද, අලුත් තාක්ෂණය භාවිත කර උපක්‍රමශීලීව අවුරුද්ද පුරාම වැඩි අස්වැන්නක් ගැනීම සඳහා යොමු විය යුතු යුගයකයි අපි ඉන්නේ. මේ රටේ පහෙන් එකක් වගා කළේ නැහැ. යුද්ධය නිසා බොහෝ ප්‍රදේශයක් අපට වගා කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් දැන් අපට සන්තෝෂ වෙන්න පුළුවන්. මොකද ඒ වගාවන් කරන ගොවියෝ අපේ රජයත් එක්ක කථා කරමින් අපට දැන් අක්කර 50ක් ඕනෑ, අක්කර 100ක් ඕනෑ, අපි දැන් මේ මාස තුනේ මේවා වගා කරනවා, අපි අතුරු බෝග වගා කරනවා කියලා කියනවා. ඒ නිසා අපි ක්‍රමක්‍රමයෙන් අපේ වගාවල තිබෙන ඒ ධාරිතාව වැඩි කර ගැනීමේ කටයුත්තේ නියැළෙනවා. ඒ නිසා අපේ ගොවියා දැන් අලුත් තාක්ෂණය ගැන හිතනවා. අලුත් ක්‍රමවේද ගැන හිතනවා. ඒ ක්‍රමවේද නිසා අවුරුද්දකට ඒ අය එක අක්කරයකින් ලබා ගත්ත ආදායම දැන් පුළුල් කර ගන්න අලුතෙන් කල්පනා කරනවා.

වග කීමක් ඇති රජයක් හැටියට රුපියල් කෝටි ගණනක් වෙන් කරලා වැව් ටික ප්‍රතිසංස්කරණය කරන්න අපි මුදල් ආයෝජනය කරගෙන යනවා. ඒ තුළින් අක්කර ලක්ෂයකට වඩා වැඩි භූමි ප්‍රමාණයකට අලුතෙන් වතුර දෙන්නත් අපි සැලසුම් කරගෙන යනවා. ඇයි මෙහෙම කරන්නේ? අපට පුළුවන් මේ අවුරුදු දෙක, තුන ඇතුළත ජනතාවගේ තෘප්තිය සඳහා තාවකාලික වැඩ කරන්න. හැබැයි වග කීමක් ඇති රජයක් හැටියට "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව දීර්ඝ කාලීනව ආයෝජනය කරන ගමන්, මධ්‍ය කාලීන ව්‍යාපෘති පවත්වාගෙන යන ගමන්, එදිනෙදා ජීවිතයේ අවශ්‍යතාවන් සඳහා මෙවැනි බදු ක්‍රමයක අපි නියැලෙනවා. ඒ නිසා මේ කෘෂිකර්මය සඳහා නියැලෙන අය ගැන අවබෝධයක් ඇති, ඒ ක්ෂේත්‍රය ගැන විශාල කැක්කුමක් ඇති දකුණු පළාතෙන් ආපු අපේ නායකයා -අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා- පෞද්ගලිකව ගොවිතැන -ගොවියාගේ ඒ කර්මාන්තය- සඳහා වෙනම ව්‍යාපෘති සැකසීම සඳහාත් හැම තිස්සේම රජයට උපදෙස් දෙනවා. මම හිතන්නේ, ඒ විශ්වාසය ජනතාව එතුමා කෙරෙහි තබා තිබෙනවාය කියායි. ජනතාවට ඒ පැහැදීම එතුමා කෙරෙහි තිබෙනවා.

මේ බදු ගහන්න එපා කියලා මෙතුමන්ලා අපව නොමඟ යවන්න හදන්නේ ඇයි? මේක කරන්න එපා, මේක නිදහස් කරන්න කියලා අපේ ජොන්ස්ටන් ඇමතිතුමාට කියන්නේ ඇයි? මේවා ආනයනය කරන - import කරන - අතරමැදියාව ශක්තිමත් කරන්නයි එහෙම කියන්නේ. තමුන්නාන්සේ හොඳටම දන්නවා, ඒක තමයි එක්සත් ජාතික පක්ෂයේ ක්‍රමය කියලා. ගරු ඇමතිතුමනි, මම බොහොම ගෞරවයෙන් කියනවා, තමුන්නාන්සේ ඇමති වුණාට පස්සේ ඔබතුමා ඒ කටයුතු ශක්තිමත්ව ඉදිරියට ගෙන යනවා කියලා. ඒ ශක්තිය අරගෙන යන්න. ඔබතුමා වට්ටවන්න තමයි මේ උත්සාහ ගන්නේ. අතරමැදියන් නැතුව ගොවියාත්, පාරිභෝගිකයාත් ආරක්ෂා වන ක්‍රමයකට ඔබතුමා මේ කටයුතු කරගෙන යනවා.

[ගරු තිලංග සුමතිපාල මහතා]

ඒකට අවශ්‍ය නායකත්වය තමුන්නාන්සේට ජනාධිපතිතුමා දෙනවා. හරියට ප්‍රතිඵල එන්න අවුරුදු හතරක්-පහක් යනවා. ඒක තමයි ඇත්ත. අවුරුදු ගණනාවක් තිස්සේ අධිකාරියක් එක්ක ගිය යම් කිසි කණ්ඩායමක් පාලනය කරපු ක්‍රමවේදය පැය විසි හතරෙන් වෙනස් කරන්න බැහැ. ඒකට විශාල පෞරුෂයක් ඕනෑ; විශාල ශක්තියක් ඕනෑ. ඒකට නොයෙකුත් දේවල් අවශ්‍ය වේවි.

අපි දැක්කා, කුඩ ප්‍රශ්නය ගැන මෙතැන යම් යම් අය කථා කළා. එයට අවශ්‍ය නායකත්වය තමුන්නාන්සේ දුන්නා. ඒ නිසා මා හිතනවා, ගොවියාගේ නිෂ්පාදන ධාරිතාව ආරක්ෂා කිරීම සඳහා කාලයෙන් කාලයට ක්‍රමවේදයක් ඇතිව පළාතේ, කලාපයේ කාලගුණය, දේශගුණය මත එක එක පළාත්වල කරන නිෂ්පාදන අනුව අවුරුද්ද පුරා නිෂ්පාදනය වන දේ අධ්‍යයනය කරලා දෛනිකව ඒ ගැන සොයා බලා, මධ්‍යම පළාතේ නිෂ්පාදන තත්ත්වය, දකුණු පළාතේ තත්ත්වය බලලා ඒ අනුව -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, your time is up. Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් ඉදිරිපත් කිරීම පිළිබඳවත්, ඒ තුළින් ගොවීන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම ගැනත් මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් ඇතුළු සියලු දෙනාට අප ස්තුතිවන්ත විය යුතුයි. මේක කාලෝචිත අවශ්‍යතාවක්. ඒ වෙනුවෙන් අනාගතයේදී මේ ක්ෂේත්‍රයට මුදල් ආයෝජනය කරලා, අලුත් ක්‍රමවේද, උපක්‍රම සහ තාක්ෂණය තුළින් අපේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගන්නා වූ උත්සාහයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.20]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ඉතාමත්ම හොඳ නියමයන් කිහිපයක් සම්බන්ධයෙන් අද දින විවාදය පැවැත්වෙනවා. විරුද්ධ පාර්ශ්වය උත්සාහ කළේ මේ මුළු විවාදය තුළම තමන්ගේ දේශපාලන මතිමතාන්තර ඉදිරිපත් කරන්නයි. ඔවුන් කථා කළේ හදවතින් නොවෙයි. හදවතේ එකක් තියා ගෙන වෙන පණිවුඩයක් තමයි මේ සභාව තුළින් මාධ්‍යය හරහා ලංකාවටයි, ලෝකයටයි දෙන්න හැදුවේ. අඩුම ගණනේ සියයට එකක් හරි හොඳක් ඔවුන් දැක්කා නම් ඒක ගැනවත් කථා කරන්න ඒ කාගේවත් දිව නැමුණේ නැහැ. සමහර මන්ත්‍රීවරු ගොවි ජනතාව නියෝජනය කරන පළාත්වල ඉඳලා ඇවිල්ලාත් ගොවි ජනතාව බේරා ගන්න බදු පැනවූවාම ඒක ගැනවත් හොඳක් කිව්වේ නැහැ. මේක පාර්ලිමේන්තුව නිසා හොඳයි. නැත්නම් ඔය අල නිෂ්පාදනය කරන පළාත්වලට එහෙම ගිහිල්ලා ඔය කථාව කළා නම් ගොවියෝ ටික එකතු වෙලා රෙදි ගලවලා ගහලා එළවයි. ඒක තමයි ඇත්ත.

දැන් අපිට තිබෙන පළමුවැනි චෝදනාව තමයි මැතිවරණ කාලයට බදු අඩු කරනවා, මැතිවරණයෙන් පස්සේ බදු වැඩි කරනවාය කියන එක. දෙවැනි චෝදනාව තමයි බදු පනවලා බදුවලින් රජයේ ඉන්න අය සුර සැප - a luxurious life - විඳිනවා කියන එක. ගරු යෝගරාජන් මැතිතුමනි, ඒක නේ ඔබතුමා කිව්වේ. ඔබතුමාත් ආණ්ඩුවල ඉඳලා තිබෙනවා. අපි හිටපු ආණ්ඩුවේ ඔබතුමාත් හිටියා. ඒ කාලයේත් බදු පැනෙව්වා. බදු පනවන්නේ නැතිව දුවන ආණ්ඩුවක් මුළු ලෝකයේම නැහැ. එහෙම රටක් තිබෙනවා නම් ඔබතුමා පෙන්වන්න. බදු නැතිව පරිපාලනය වෙන රටක් තිබෙන්නේ කොහේද කියලා කියන්න. එහෙම රටක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම ඉතාමත් වග කීමෙන් කියනවා, මේ බදු පැනවීමේදී භාණ්ඩාගාරය සහ අපේ අමාත්‍යාංශය ඉතාමත්ම පරිස්සමෙන් ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ යෑම් පහළ යෑම් දිහා පැය විසි හතර තිස්සේ සොයා බලලා ඒ උස් පහත් වීම් හරහා තමයි කටයුතු කරන්නේ කියා. මේ රටේ පාරිභෝගිකයා ආරක්ෂා කරන ගමන් දේශීය ගොවියා රකින එක තමයි අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "මහින්ද චින්තන" ප්‍රතිපත්තියේ තිබෙන්නේ.

ඒක එතුමා 2005 ඉඳලා අකුරට ඉටු කරලා තිබෙනවා. 2005 දී එතුමා කිව්වා, මේ රටේ ගොවීන්ට රුපියල් 350ට පොහොර සහනාධාරය ලබා දෙනවා කියලා. අවුරුදු 7ක් තිස්සේ අඛණ්ඩව රුපියල් 350ට පොහොර දීලා තිබෙනවා. රුපියල් 9,000ක් වියදම් කරලා පිට රටින් පොහොර ගෙන්වා, රුපියල් 350ට පොහොර සහනාධාරය දීපු යුගයක් -කාලයක්- තිබුණා. රුපියල් 7,000ට පොහොර ගෙන්වා රුපියල් 350ට දුන්නා. රුපියල් 4,000ට පොහොර ගෙන්වා රුපියල් 350ට දුන්නා. රුපියල් 3,500ට, රුපියල් 3,000ට පොහොර ගෙන්වා රුපියල් 350ට දුන්නා. එම නිසා මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් එක දිගට තමන්ගේ පොරොන්දුවක්, ප්‍රතිපත්තියක් ඉටු කරපු නායකයෙක් හැටියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නම ලංකා ඉතිහාසයේ රන් අකුරින් ලියවෙනවාය කියන එක විතරක් තමුන්නාන්සේලා මතක තබා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය මැතිවරණයේදී විපක්ෂය නොයෙක් කථාන්දර කිව්වා. රුපියල් ලක්ෂයේ සහනාධාරය දුන්නේ නැත්නම් ඡන්දය දෙන්න එපා කිව්වා. වී ගැන කථා කළා. "අද වී ගොවිතැන නැති කරන්න වී මෝල් මාෆියාවට වී මිල දී ගැනීම් භාර දීලා" රනිල් වික්‍රමසිංහ මහත්තයා එහෙම කිව්වා. ඊළඟට කිව්වා, "ධාතුන් වහන්සේ වැඳ පින් රැස් කර ගත් ජනතාව ආණ්ඩුවට ඡන්දය දී පවු රැස් කර ගන්න එපා" කියලා. ධාතුන් වහන්සේවත් විකුණන්න හැදුවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඡන්දයට ධාතුන් වහන්සේවත් පාවිච්චි කළා. ධාතුන් වහන්සේ වැඳලා බුලත් කොළයට ඡන්දය දෙන එක ගැන තවත් කථා කිව්වා. මොන තරම් බංකොලොත් වෙලාද? ඔවුන් ජාති වාදය ඇවිස්සුවා. ද්‍රවිඩ පළාත්වලට ගිහින් කිව්වා, "ද්‍රවිඩ මහ ඇමතිවරයෙක් මම තමුන්නාන්සේලාට ලබා දෙනවා"යි කියලා. මුස්ලිම් ජනතාව ඉන්න ප්‍රදේශවලට ගිහින් කිව්වා, "මුස්ලිම් මහ ඇමතිවරයෙක් ලබා දෙනවා" කියලා. සිංහල ජනතාව ඉන්න ප්‍රදේශවලට ගිහින් ගමගේ පෙන්වලා හොරෙන් කිව්වා, "සිංහල මහ ඇමතිවරයෙක් පත් කරලා දෙනවා" කියලා. මේ කථා ඔක්කොම ජනතාව ප්‍රතික්ෂේප කළා. ඊළඟට කිව්වා, "මේ නියඟය සන්ධාන ආණ්ඩුවේ ක්‍රියා කලාපය නිසා ඇති වූ දෙයක්. ධාතුන්

වහන්සේට බෝම්බ ගහන්න හදපු පුද්ගලයා මහ ඇමති කළාම ස්වභාව ධර්මය රට පුරා නියඟයක් ඇති කරලා" කියලා. ඡන්දය එනකොට බැලුවා, මොකක් ගැනද කථා කරන්නේ කියලා.

එහිදී භාණ්ඩ මිල ගැන කථා කළේ නැහැ. අද ඔය කථා කරන කිසි කෙනෙක් ඒ මැතිවරණයේදී භාණ්ඩ මිල ගැන කථා කළේ නැහැ. කථා කළේ නියඟය ගැනමයි. නියඟයම වික්කා. එතුමන්ලාට ප්‍රතිපත්තියක් නැහැ. නියඟය ගැනම කථා කළා.

රනිල් වික්‍රමසිංහ මහත්මයායි, විපක්ෂයයි ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මා හිටපු ඒ ආණ්ඩුවේ ක්‍රියා කලාපය මොකක්ද, ගොවීන්ට සැලකුවේ කොහොමද කියලා අපි දන්නවා. අද අපි සතුටු වනවා, ගොවීන් රකින, මේ රටේ ජනතාවත් එක්ක එකට ජීවත් වෙලා ජනතාවගේ දුක, දහදිය, කඳුළු ආදී හැම දෙයක්ම හඳුනන නායකයෙක් එක්ක අපට කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන එක ගැන. අපේ නායකතුමා ඍජු නායකයෙක්; ආකර්ෂණීය නායකයෙක්; මනුස්සකම, වැදගත්කම තිබෙන නායකයෙක්. මේක තමයි යථාර්ථය.

රනිල් වික්‍රමසිංහ මහත්මයා ගොවි ජනතාවට කිසි දෙයක් කළේ නැහැ. වක්කඩක් කපා ගන්න, වක්කඩක් හදා ගන්න උදලු තලයක් දුන්නේ නැහැ. හැබැයි ඡන්ද කාලයට ගිහිල්ලා ගොවීන් වෙනුවෙන් පෙනී සිටිනවා. මේ රජය ගොවීන් වෙනුවෙන් ඡන්ද කාලයට විතරක් නොවෙයි, ඡන්ද කාලය වේවා, ඡන්දය අවසන් වුණාම වේවා ගොවීන් ආරක්ෂා කරනවා.

ගරු යෝගරාජන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, අලවලට රුපියල් 50ක බදු පනවා තිබෙනවා කියලා. ඔබතුමා සතුටු වෙන්න ඕනෑ. ඔබතුමා දන්නවාද, ලංකාවේ අල නිෂ්පාදනය ටොන් කීයද කියලා. ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමා දන්නේ නැහැ, අල නිෂ්පාදනය මොන කාලයේද වෙළෙඳ පොළට එන්නේ කියලා. මේ තමයි වෙළෙඳ පොළට එන වෙලාව. ඉන්දියාවෙන්, පාකිස්තානයෙන්, චීනයෙන් එන අල එක්ක අපේ ගොවීන්ට තරග කරන්න බැරි නිසා තමයි, ආනයනය කරන අලවලට බද්දක් පනවා අද අපේ දේශීය ගොවියා රකින්නේ. ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා දකින්න ඇති, ගොවීන්ට අල විකුණා ගන්න බැරිව ඉන්නවා කියලා අද පත්‍රයක පළ වෙලා තිබුණා. අන්න ඒ ගොවීන් රැක ගන්න තමයි අපි තීන්දු අරගෙන තිබෙන්නේ.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
අල මිල දී ගන්න ක්‍රමයක් හදන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අල ගන්නවා.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Tax දමලා සාමාන්‍ය මිනිසුන් කරදරේ දමන්න එපා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අල ගන්නවා. අල ගන්නේ මේ රටේ වෙළෙන්දෝ. අපි සතොසට අල ගන්නවා. රාජ්‍ය යන්ත්‍රණයක් හැටියට තිබුණු සතොස එක්සත් ජාතික පක්ෂ රජය විවෘත ආර්ථිකය හරහා සම්පූර්ණයෙන්ම විනාශ කළා. ඒ සතොස අපි නැවත පිහිටුවා තිබෙනවා. රටේ මිල තීරකයා හැටියට අද සතොස ක්‍රියාත්මක වනවා; සමුපකාරය ක්‍රියාත්මක වනවා. එම නිසා තමයි අපට පුළුවන් වුණේ රුපියල් 55ට, රුපියල් 65ට බී ලූනු ටික ගන්න. මේවා ඔක්කොම එදා විපක්ෂය විනාශ කළා. ඒ විපක්ෂය තමයි අද ඔබතුමා නියෝජනය කරන්නේ. මාත් කාලයක් ඒ විපක්ෂය නියෝජනය කළා. තමුන්නාන්සේලාගේ ඒ වැරැදි තීන්දු තීරණ නිසා තමයි අදත් පැරදිලා පරාජයෙන් නැඟිට ගන්න බැරිව ඉන්නේ.

අද බලන්න. අල වෙළෙඳ පොළට එන වෙලාවේදී අල කිලෝවක වැඩිම මිල රුපියල් 66 සිට තිබෙනවා. සුපිරි වෙළෙඳ සල්වල අල කිලෝව රුපියල් 120ටත් විකිණෙනවා. හැබැයි අල කිලෝව රුපියල් 66ටයි යන්නේ. එම නිසා රුපියල් 30ට තිබුණු අල කිලෝව රුපියල් 20කින් වැඩි කරලා රුපියල් 50ක් කළා. රුපියල් 80ට තිබුණු අල කිලෝව රුපියල් 85ක් කළා. එතකොට ගොවීන්ට රුපියල් 65ක්, රුපියල් 70ක් දක්වා මිලක් ගන්න පුළුවන්. නිෂ්පාදනය කරන අල ඔක්කොම රජයට ගන්න බැහැ. කවුරුන් හෝ එහෙම හිතනවා නම් ඔහු වෙන ලෝකයක ඉඳලායි කථා කරන්නේ. ලංකාවේ නිෂ්පාදනය වන සියලුම වී රජයකට ගන්න බැහැ. මොන තරම් සල්ලි දුන්නත් සියයට 8යි අපට එන්නේ. අනික් ඒවා යන්නේ පෞද්ගලික වෙළෙඳුන්ට. හැබැයි අපි මිලක් තීරණය කරලා, රුපියල් 100ට ගනිද්දී මිල ස්ථාවර වනවා. එතකොට පෞද්ගලික වෙළෙඳුන්ට සිද්ධ වෙනවා, ඊට වඩා මිලක් දීලා ගන්න.

එම නිසා තමයි අද වී කිලෝ එකක මිල රුපියල් 29.50ට - රුපියල් 30ට නැඟලා තිබෙන්නේ. සම්බා කිලෝ එක රුපියල් 34ට-රුපියල් 35ට නැගලා තිබෙන්නේ. මේක තමයි රජයේ ජයග්‍රහණය. විපක්ෂයේ කවුරු හෝ හිතනවා නම් -ඔළුව නැති මිනිහෙකුට විතරයි හිතන්නට පුළුවන් වෙන්නේ- මේ සියලුම නිෂ්පාදන රජය ගන්නට ඕනෑය කියා. එහෙම කවදාවත් ගන්නට බැහැ.

බී ලූනු නිෂ්පාදනය බලන්න. බී ලූනු නිෂ්පාදනය ගැන අපේ කෘෂිකර්ම ඇමතිතුමා කියාවි. මහ දැවැන්ත යෝධ නිෂ්පාදනයක්. ඒ නිසා ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. එන කන්නය වෙද්දී ගොවියාට ගබඩා කරන්නට පුළුවන් ගබඩා ටික ගැන ඊයේ ජනාධිපතිතුමා කථා කළා. වහාම සොයා බලා ඉන්දියාවේ, පාකිස්තානයේ, චීනයේ ක්‍රමයට ගොවීන්ට ගබඩා ටික නිර්මාණය කර දෙන්නට කියා කිව්වා. පොහොර සහනාධාරය දෙද්දී ගොවියා වෙනුවෙන් බදු පනවා ගොවීන්ට ස්ථාවර මිලක් හදා දෙද්දී, නිෂ්පාදනය කරන්නට ගොවීන් උනන්දු වෙද්දී මේ ප්‍රශ්න එනවා.

අපට තිබෙන ලොකුම ප්‍රශ්නය සහල් ප්‍රශ්නයයි. වී කිලෝ මිලියන 1.2ක 1 .5ක විතර අතිරික්තයක්. අපේ සහල් කොහේවත් ගන්නේ නැහැ. අපේ සහල් අපනයනය කර නැහැ. අපේ සහල් අපනයනය කරනවා. එහෙම අපනයනය කරන්නේ ලංකාවේ ඉඳලා පිට රට ගිහින් -කැනඩාවේ, ඇමෙරිකාවේ, ඕස්ට්‍රේලියාවේ, ජර්මනියේ, එංගලන්තයේ වාගේ රටවල- ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගේ පරිභෝජනය සඳහායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවන වතාවට ටොන් ලක්ෂයක අතිරික්තය අපනයනය කරන්නට අවස්ථාව ලැබී තිබෙනවා. චීනය තමන්ගේ සහල් නිෂ්පාදනයෙන් සියයට 10ක ප්‍රමාණයක් තමයි ලෝක වෙළඳ පොළට නිකුත් කළේ. අද චීනය ලෝක වෙළඳ පොළේ විශාල සහල් වෙළඳාමක් කරනවා. අපටත් ඒ වාසනාව ලැබුණා. අපේ ගොවියා හදන සහල් පිට රට යවන්න. ලංකාවෙන් ගිහින් ජීවත් වන අයට නොවෙයි. අප්‍රිකාවේ වාගේ, ඩුබායි රට හරහා ඒ සහල් අපනයනය කරන්නට අපට අවස්ථාව ලැබී තිබෙනවා. ඒක රටේ ජයග්‍රහණයක්. මේවා ඔබතුමන්ලා සුබවාදීව දකින්නට ඕනෑ.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා, දියර කිරි ගැන; දියර කිරි විසි කරනවා, විනාශ කරනවාය කියා. දියර කිරි බවුසර් කිහිපයක් නරක් වෙලා ඒවා විනාශ කරන්නට සිදු වුණු බව අපි කවුරුත් දන්නවා. මා නවසීලන්තයට ගියාම දැන ගන්නට ලැබුණා, නවසීලන්තයේ විදුලිය නැතිව ගිහින් ටොන් ලක්ෂ ගණනක් විනාශ කළ බව. සහල් අපනයනය කරන්නට බැරි නම් මුහුදට හෝ ගිහින් දමන්න ඕනෑ. මේවා තිබ්බොත් මොකද වෙන්නේ? ඇමෙරිකාවේ බඩ ඉරිඟුවලට මොකද කරන්නේ? බඩ ඉරිඟු අතිරික්තයක් ආවාම ගිහින් මුහුදට දමනවා. ඇයි ඒ? ගොවීන්ගේ මිල ස්ථාවර කරන්නයි. මේවා තමයි ලෝකයේ වෙන්නේ. මේවා ගැන බලන්න ඕනෑ. ලෝකය දිහා බලන්න ඕනෑ. මේවා ගැන දීර්ඝව සාකච්ඡා කරන්න ඕනෑ. ළිඳක් ඇතුළේ ඉන්න ගෙම්බෝ වාගේ ඉඳගෙන තීන්දු තීරණ ගැන කවුරු හෝ කථා කරනවා නම් ඒක ලොකු වරදක්. එම නිසා විටින් විට මේ තීන්දු තීරණ ගන්නවා.

දැන්, එක්තරා මන්ත්‍රීවරයෙක් සැමන් ගැන කථා කළා, මා අහගෙන හිටියා. එතුමා අල ගැන කථා කළේ නැහැ. බී ලූනු ගැන කථා කළේ නැහැ. එතුමා කථා කළේ සැමන් ගැන. සැමන් රුපියල් විසිපහකින් මිල වැඩි කර තිබෙනවා; ඡන්දයේදී මිල අඩු කළා; ඡන්දයෙන් පස්සේ වැඩි කළාය කිව්වා. නැහැ. සැමන් මිල වැඩි කරන්න ප්‍රධාන හේතුව මෙයයි. සියලුම පොඩි මාළු වර්ගවල මිල පහළ ගිහින් තිබෙනවා. මාළු මිල පහළට ගියාම සැමන් මිල වැඩි කරනවා. මාළු මිල අඩු වුණාම සැමන් මිල වැඩි කර අපේ ධීවරයා රකින වැඩ පිළිවෙළක අපේ රජය ඉන්නේ. එක්සත් ජාතික පක්ෂයට වෙලා තිබෙන්නේ මොකක්ද? අල ගොවියා ගැන බලන්නේ නැහැ. බී ලූනු ගොවියා ගැන බලන්නේ නැහැ. ධීවරයා ගැන කථා කරන්නේ නැහැ. ධීවරයා අමතක කරලා. අල ගොවියා අමතක කරලා. වී ගොවියා අමතක කරලා. අන්තිමට ශුද්ධ පරාජයක්.

අපේ ගරු හර්ෂ මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා මගේ පැරණි මිත්‍රයෙක්. එතුමා කිව්වා, අපේ ආර්ථිකය වැටෙන්න අත ළඟය කියා. එතුමා දැන් මාස ගණනක් ඒක කියනවා. එතුමා ඡන්දයෙන් පත්වුණේත් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට පින් සිද්ධ වෙන්න ජාතික ලැයිස්තුවෙන් ඇවිත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා ලියලා දෙන කථාන්තර එතුමා පාර්ලිමේන්තුවට ඇවිත් කියවනවා. එතුමා "ටීවී ස්ටාර්"යනවා. එතුමා රූපවාහිනිය ඉස්සරහට ගිහින් කියනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ ආර්ථිකය වැටෙන්නට අත ළඟයි කියා. එතුමා අත ළඟ කියන එක දන්නේ නැහැ. හේතුව, එතුමා අත පාවිච්චි කරන්නේ වෙන දේවල්වලට. මේක තමයි ඇත්ත. කතන්දර කියන්නේ එතුමා. [බාධා කිරීම්] කතන්දර කියන්නේ. හැම දාම ඇවිත් කයිය ගහනවා. කයිය ගහලා ඡන්දය පරදිනවා.පැරදුණාම ජාත්‍යන්තරයට ගිහින් මුක්කු ගහනවා. ඒක තමයි අපේ මන්ත්‍රීතුමා කිව්වේ. ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ බදු පනවා තිබෙන්නේ ඉන්දියාවෙන් එන මෝටර් සයිකල් ටිකයි, ඉන්දියාවෙන් එන ත්‍රීවීලර් ටිකයි නතර කරන්න කියා.

අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා දක්ෂ ලෙස කථා කරලා හොඳට කිව්වා. ඔබතුමන්ලා හදන්නේ වෛරය ඇති කරන්න. ඔබතුමන්ලාගේ මේ විපක්ෂය ඇතුළේ තිබෙන්නේ, පපුව ඇතුළේ තිබෙන්නේ, පපු කැවුත්තේ තිබෙන්නේ වෛරයයි, ක්‍රෝධයයි. වෙන දෙයක් නොවෙයි. ඉන්දියාව දමලා ලංකාවට ගහන්න පුළුවන් නම් රාජපක්ෂට ගහනවා. ඇමෙරිකාව පස්සේ ගිහිල්ලා කලිසමට වැඳලා කකුල් දෙක අතගාලා රාජපක්ෂට ගහන්න පුළුවන් නම් ඒක කරනවා. තමුන්නාන්සේලාට ඊට වැඩිය දෙයක් නැහැ. හේතුව, තමුන්නාන්සේලා ජීවත් වෙන්නේ ලංකාවේ නොවෙයි, ජාත්‍යන්තරයේ. ජාත්‍යන්තරයේ ඩොලර්වලට යට වෙලා -සල්ලිවලට යට වෙලා- මුළු රටම පාවා දෙමින් ද්‍රෝහිකම් කරනවා. ඒක තමයි තමුන්නාන්සේලා ඉන්න ප්‍රතිපත්තිය. ඒ නිසා තමයි මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැත්තේ. තමුන්නාන්සේලා නියඟය ගැන කථා කෙරුවත්, මොනවා කථා කෙරුවත් තමුන්නාන්සේලා ගැන මේ රටේ ජනතාව දන්නවා. තමුන්නාන්සේලා මේ රටට ද්‍රෝහිකම් කරන මන්ත්‍රීවරු හැටියට මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා තමයි බුලත් කොළය,-

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ජාතික ලැයිස්තුවෙන් විතරයි මෙතුමන්ලාට එන්න පුළුවන්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ජාතික ලැයිස්තුවෙන් විතරයි එන්න පුළුවන්. ඡන්දය ඉල්ලුවා නම් පරාදයි. [බාධා කිරීම්] හැම ඡන්දයම බලනවා. ඡන්ද බලනවා, ඡන්ද තියනවා, ආයේ පරදිනවා. [බාධා කිරීම්] පිස්සෝ ඉන්නේ කොහේද, පිස්සෝ කථා කරන්නේ කොහේද කියන එක ජනතාව හොඳට දන්නවා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපි කියනවා, මේ ගොල්ලන් ජීවත් වෙන්නේ මනෝ ලෝකයක බව. බදු දැම්මොත් කියනවා, අහිංසක පාරිභෝගිකයාව අපහසුතාවට පත් කරන්න බදු දැම්මා කියලා. හැබැයි, ගොවියෝ ගැන කථා කරන්නේ නැහැ. ඡන්ද කාලයට ගොවියෝ ගැන කථා කරනවා. ඡන්ද කාලයේ ගොවියෝ වෙනුවෙන් පෙනී හිටින්න අනුරාධපුරයට යනවා. ඡන්ද කාලයේ ගොවියෝ වෙනුවෙන් පොළොන්නරුවට යනවා. ඒ විධියට පෙනී හිටපු නායකයෝ, ඔවුන්ගේ නියෝජිතයෝ දැන් ඒ පළාත්වල හොයා ගන්න බැහැ. ශුද්ධ පරාජයක්.

තව මාස කිහිපයකින් අනෙක් පළාත් සභා දෙක, තුනකත් අපි ඡන්දය පවත්වනවා. ඒකෙදීත් රනිල් වික්‍රමසිංහ මහත්තයා කිව්වාම හර්ෂ ද සිල්වා මහත්තයා ඇවිල්ලා කියාවි "ආර්ථිකය වැටෙන්න අත ළඟ" කියලා. එක්කෝ share market එකට ගහනවා. Share market එකේ දමන සෙල්ලම් අපි කියන්නම්. තමුන්නාන්සේයි, තමුන්නාන්සේගේ තව අධ්‍යක්ෂකවරු ටිකකුයි එකතු වෙලා මෙහාට එන ආයෝජකයන්ට කියනවා share market එකෙන් කොටස් ගන්න එපා කියලා. තමුන්නාන්සේ දමන සෙල්ලම් අපි හොඳට දන්නවා. හර්ෂ මහත්තයාව අපි හොඳට දන්නවා. තමුන්නාන්සේ දමන සෙල්ලම් ගැන අපි වෙලාවට කියන්නම්. තමුන්නාන්සේ දමන සෙල්ලම් අපි දන්නවා. මේ රටට දෝහිකම් කරමින්, ආර්ථිකය කඩා වට්ටන්න හදන තමුන්නාන්සේ ගැන අපි හොඳට දන්නවා. තමුන්නාන්සේ හිතන්නේ share market එක ගැන කථා කරපුවාම අනුරාධපුරේ ඉන්න මිනිස්සු ඡන්දය දෙයි කියලා; පොළොන්නරුවේ ඉන්න ගොවියෝ ටික ඡන්දය දෙයි කියලා. කොහේ ඉන්නවාද කියලා දන්නේ නැහැ. ඔය වාගේ පිරිසක් තමයි අද රනිල් වික්‍රමසිංහ මහත්තයා එක්ක එකතු වෙලා ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා කථා කෙරුවා. බොහොම උණුසුම් සටනක් කරනවා වගේ කථා කෙරුවේ. ආර්ථිකය ගැන, අධ්‍යාපනය ගැන කථා කළා. බැරි වෙලාවත් 2005 දී රනිල් වික්‍රමසිංහ මහත්තයා දිනුවා නම් අධ්‍යාපන ඇමති කවුද? අකිල විරාජ් කාරියවසම් මහත්තයා. එහෙනම් ලොකු ප්‍රශ්නයක් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟට, ආරක්ෂක ඇමති වෙන්න හිටියේ කවුද? සාගල රත්නායක මහත්තයා. රනිල් වික්‍රමසිංහ මහත්තයා දිනලා සාගල රත්නායක මහත්තයා ආරක්ෂක ඇමති වුණා නම් හමුදාවේ අයට දෙවියන්ගේම පිහිටයි. රනිල් වික්‍රමසිංහ මහත්තයා දිනලා අකිල මහත්තයා අධ්‍යාපන ඇමති වුණා නම්, මේ රටේ ඉන්න පිරිමි දරුවන්ට දෙවියන්ගේ පිහිටයි. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
වාඩි වෙන්න, වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
විනාඩි දෙකක් ගන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ සුමානයේ මිල ගණන් ගැන ඔබතුමා දැන් ඉදිරිපත් කරපු වාර්තාව මගේ ළඟ තිබෙනවා. ඒකේ මාළු මිල ගණන් වැඩි වීම සඳහන් වී තිබෙනවා. පරව් සියයට පහළොවකින්, මලව් සියයට දහනවයකින්, තලපත් සියයට දහනවයකින්, බලයා සියයට පහකින්, කෙලවල්ලා සියයට හයකින්, මෝරා සියයට දහයකින්. සාලයා සියයට එකොළහකින් මිල වැඩි වෙලා. ඔබතුමා මොකක්ද මේ කියන්නේ? මාළු මිල වැඩි වෙලා. ඔබතුමා කියනවා මිල අඩු වෙලාලු. මෙන්න අන්තර්ජාලයේ තිබෙනවා මිල වැඩි වෙලා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඇත්ත කථා කරනවා නම් කමක් නැහැ. ලෝකයේ තිබෙන ඔක්කොම පට්ටපල් අසත්‍යනේ කියලා තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හරිද දැන්?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම කිව්වේ පොඩි මාළු ගැන. ඔබතුමා කථා කළේ කෙලවල්ලෝ ගැන. [බාධා කිරීම්] වාඩි වෙන්න, වාඩි වෙන්න මම කියනකම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමනි, මාළුවාගේ නම කියන්නකෝ. අපි හොඳ හික්කඩුවේ කොල්ලෝ. [බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හරි, දැන් වාඩි වෙනවාද? [බාධා කිරීමක්] දැන් ඔබතුමා කොහේ කියලාද කිව්වේ?

ඔබතුමා හික්කඩුවේ කොල්ලෙක් කියලා නේ, කිව්වේ. බලාගෙන, ඔය කථාව රනිල් වික්‍රමසිංහ මහත්මයාට එහෙම ගිහින් කියන්න එපා. ඔබතුමා හික්කඩුවේ කොල්ලෙක් කියලා අප දැන ගත්තේ අද. ඒක තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔබතුමාගේ නම ජාතික ලැයිස්තුවට දමලා මේ පාර්ලිමේන්තුවට ගෙනැත් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම දැන ගෙන හිටියේ නැහැ හර්ෂ ද සිල්වා මහත්මයා මාළු කඩයක වැඩ කර තිබෙනවා කියලා. එතුමා මාළු කඩයක වැඩ කරලා මාළු විකුණලා තිබෙනවා කියලා අද තමයි අප දැන ගත්තේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වාගේ අය තව බිහි වෙන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඔබතුමා වාගේ හොඳට මොළය තිබෙන, නමුත් ඒ මොළය පාවිච්චි කරලා යූඑන්පී එක දිනවන්න බැරි ඔය වාගේ අය ඉන්න ඕනෑ. ඔබතුමන්ලා වාගේ අය ඉන්න තරමට අපි දිනනවා. එක්සත් ජාතික පක්ෂයට දෙවියන්ගේ පිහිටයි! ඔය වාගේ අය කාලයෙන් කාලයට එනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමන්ලා යූඑන්පී එකේ ඉන්න කාලයේ කරන්න ඇති නේ!

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි ඉන්න කාලයේ හොඳට කෙරුවා. යූඑන්පී එකේ ඉන්න කාලයේත් වැඩ කෙරුවා. දැන් ආණ්ඩුව පැත්තේත් හොඳට වැඩ කරනවා. මතක තියා ගන්න. [බාධා කිරීමක්] අයියෝ! මොනවා කථා කරන්නද? ඕනෑ නම් අපි දෙන්නා ගෑනු ළමයෙක් ගැන කථා වෙන්න ඇති. වෙන මොනවා කථා කරන්නද?

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන වාරයක් පාසා අපට ඡන්ද වැඩි වෙනවා. ඔබතුමා ටීවී එකට ඇවිත් කථා කරපු ගමන් ගොවි ජනතාව දන්නවා මේ වාගේ අය තමයි එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ කියලා. එහෙම හිතලා ඔවුන් බුලත් කොළයට ඡන්දය දෙනවා. ඒ නිසා ඔබතුමායි, මමයි වාද කරන්න ඕනෑ නැහැ. අප ඔබතුමාගේ හයියත් දන්නවා, අපේ හයියත් දන්නවා; එක්සත් ජාතික පක්ෂයේ හයියත් දන්නවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ හයියත් මේ රට විතරක් නොවෙයි මුළු ලෝකයම දන්නවා. තමුන්නාන්සේලා ඒක මතක තියා ගන්න. ඒ නිසා මේ රටේ ආර්ථිකය වැටෙන්න අප ඉඩ දෙන්නෙත් නැහැ, තමුන්නාන්සේලාට මේ රටේ ගොවි ජනතාව රවටන්න ඉඩ දෙන්නෙත් නැහැ. පාරිභෝගිකයා රවටන්න අප ඉඩ දෙන්නෙත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ඇත්ත වශයෙන්ම රජයක් හැටියට ඉතාම සතුටු වෙනවා, මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් නිවැරැදි තීන්දු, තීරණ ගන්න දන්නා නායකයෙක් මේ රට පාලනය කරන එක ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විතරක් නොවෙයි, පෙරේදා රාත්‍රී 12ටත් අප මේ බදු වෙනස් කෙරුවා. අප සාකච්ඡා කරලා අල ටිකට බද්ද පනවලා, සැමන් ටින් එකට බදු පනවලා - ජාති දෙකකට බදු පනවලා- තීන්දු, තීරණ ගත්තා. හැබැයි තමුන්නාන්සේලා අද මෙන්න මේ ගැන කථා කරනවාද?

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

ගැස්වලට කියලා අප එක සත පහකවත් බද්දක් අය කරන්නේ නැහැ. නැඟිටලා ඒවා ගැන කියන්න තමුන්නාන්සේලාට කොන්ද පණ තිබුණේ නැහැ. ආණ්ඩුව ගැස්වලට එක සතයකවත්, රුපියලකවත් බද්දක් ගන්නේ නැහැ. ඒවා ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැහැ. හැබැයි සාඩින් ටික ගැන කථා කරනවා. කොහොමටත් එතුමාගේ ඔළුවේ තිබෙන්නේ canned fish, sausages ගැන. එතුමා වැව් මාළු ගැන දන්නේ නැහැ; පොඩි මාළු ගැන දන්නේ නැහැ. එතුමා කථා කරන්නේ වෙන ලෝකයක ඉඳගෙන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙලාවේ අපි කියන්නේ මේකයි. මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් අප නිවැරැදි තීන්දුවක් අරගෙන තිබෙනවා. පාරිභෝගික ජනතාව වෙනුවෙන් අප නිවැරැදි තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ තීන්දුව හරහා මේ රට මෙහෙය වන්න අප නිසියාකාරව කටයුතු කරන බව ප්‍රකාශ කරමින්, මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the Acting Minister of Finance and Planning under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 1763/11 of June 19th, 2012, which was presented on 21.08.2012, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the President under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, read with Article 44(2) of the Constitution, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 1766/35 of July 13th, 2012, which was presented on 21.08.2012, can be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the President under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, read with Article 44(2) of the Constitution, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 1767/22 of July 19th, 2012, which was presented on 21.08.2012, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# රේගු ආඥාපනත : යෝජනාව
## சுங்கக் கட்டளைச் சட்டம் : தீர்மானம்
## CUSTOMS ORDINANCE : RESOLUTION

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to import duties, which was presented on 21.08.2012, be approved.

(Gazette Extraordinary No. 1767 of July 19th, 2012)
(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# මෝටර් වාහන පනත : නියෝග
## மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT : REGULATIONS

## I

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

On behalf of the Minister of Transport, I move,

"That the Regulations made by the Minister of Transport under Section 237 of the Motor Traffic Act (Chapter 203), read with Section 19 of the said Act, and published in the Gazette Extraordinary No. 1755/60 of April 27th, 2012 as amended by the Gazette Extraordinary No. 1763/19 of June 20th, 2012, which were presented on 21.08.2012, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**II**

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
On behalf of the Minister of Transport, I move,

"That the Regulations made by the Minister of Transport under Section 237 of the Motor Traffic Act (Chapter 203), read with Section 19 of the said Act, and published in the Gazette Extraordinary No. 1758/32 of May 18th, 2012, which were presented on 21.08.2012, be approved. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම. ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා.

## අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග
## பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள்
## UNPROTECTED LEVEL CROSSINGS

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රටපුරා අනාරක්ෂිත දුම්රිය ගේට්ටු ඉතා විශාල සංඛ්‍යාවක් ඇත. මේ නිසා දිනපතාම කිහිපදෙනකුම පාගේ අනතුරුවලට මුහුණදී ජීවිතක්ෂයට පත් වේ. වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ පමණක් පසුගිය මාසය තුළ 08 දෙනෙකු පමණ ජීවිතක්ෂයට පත් වී ඇත.

මේ නිසා ගරු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදලින් මේ අනාරක්ෂිත දුම්රිය ගේට්ටු සකස් කිරීමත්, ඒවා සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන් ලබා දීමට සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප දන්නවා රට පුරා මේ අනාරක්ෂිත දුම්රිය ගේට්ටු විශාල සංඛ්‍යාවක් තිබෙන බව. පසු ගිය කාලයේ අපි දැක්කා, අනාරක්ෂිත දුම්රිය ගේට්ටු නිසා අහිංසක ජනතාවගේ ජීවිත විශාල ප්‍රමාණයක් අපේ රටට අහිමි වෙලා ගියා. විශේෂයෙන්ම තමුන්නාන්සේලාට මතක ඇති එදා යාන්ගල්මෝදර සිද්ධිය. පාසල් සිසුන් 30ක් 40ක් ජීවිතක්ෂයට පත් වුණා. දකුණු පළාත ගත්තත් එහෙමයි. හැම තැනම වාගේ මේ විධියට පුද්ගලයන් ජීවිතක්ෂයට පත් වුණා. අප ඉතාම කනගාටුවට පත් වෙච්ච සිද්ධියක් ගිය ඉරිදා මගේ ආසනයේ සිද්ධ වුණා. තාත්තායි පුතායි ආපු කැබ් රථය වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ලුනුවිල බණ්ඩිරිප්පුව කියන ස්ථානයේදී පාරෙන් එහා පැත්තට යන්න ගිහිල්ලා කෝච්චියේ හැපිලා -දුම්රිය අනතුරකට භාජනය වෙලා- තිබෙනවා. ඊට සතියකට පස්සේ, එනම් අද පුතා ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. මා හිතන විධියට තාත්තාගේ ජීවිතයත් ඉතාම අවදානම් තත්ත්වයේයි තිබෙන්නේ. ඊට මාසයකට දෙකකට ඉස්සර වෙලා ඒ ස්ථානයේදීම පාසල් සිසුවකු ජීවිතක්ෂයට පත් වුණා. අමතර පන්තිවලට ගිහිල්ලා හවස එන තමන්ගේ නංගිව ගෙදර එක්කරගෙන එන්න යතුරු පැදියෙන් ගිය ඒ සිසුවා ඒ ස්ථානයේදීම ජීවිතක්ෂයට පත් වුණා. ඒ අනුව ගත්තාම අනාරක්ෂිත දුම්රිය ගේට්ටු නිසා පසු ගිය කාල සීමාව තුළ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ විතරක් මේ විධියට අනතුරු රාශියක් සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මැතිවරණ කොට්ඨාස 200ක් විතර තිබෙනවා. ඒ හුඟක් මැතිවරණ කොට්ඨාසවලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්නවා. මේ දුම්රිය ගේට්ටු දැමීම සඳහා ඉතා විශාල මුදලක් අමාත්‍යාංශයට වැය පැහැදම් වෙනවා නම් අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනා කැමැතියි තමන්ගේ විමධ්‍යගත මුදලින් හරි මුදල් දෙන්න. අපි දන්නවා දුම්රිය ගේට්ටුවක් හදන්න සාමාන්‍යයෙන් යන මුදල. සාමාන්‍යයෙන් දුම්රිය ගේට්ටුවකට රුපියල් 60,000ක්, 70,000ක් වාගේ තමයි යන්නේ. ඒ වාගේ ගේට්ටු තුනහතරක් තිබෙනවා නම්, ඒ ගේට්ටු තුනහතරට යන මුදල තමන්ගේ විමධ්‍යගත අය වැයෙන් හෝ දෙන්න අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනා කැමැතියි. අප කරන ඉල්ලීම මේකයි. අපි ඒ මුදල කොහොම හරි සොයලා දෙන්නම්. අපේ මැතිවරණ කොට්ඨාසවල තිබෙන අනාරක්ෂිත දුම්රිය ගේට්ටු සකස් කරන්න යන මුදල අපි සොයා දෙන්නම්. අපි ඉල්ලන්නේ පුළුවන් නම් අපට ඒ සඳහා සේවකයන් ලබා දෙන්න කියලායි.

ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. අපි දන්නවා අපේ රටේ සමෘද්ධියත් එක්ක විශාල සේවක පිරිසක් ඉන්නවා කියා. පසු ගිය කාලයේ විශ්‍රාම වැටුප් පවා දෙන්න යෝජනා වෙලා, ස්ථිර වෙලා ඉන්න අපේ ග්‍රාමාරක්ෂක නිලධාරින් ඉන්නවා. ඒ අය හෝ යොදවලා අනාරක්ෂිත දුම්රිය ගේට්ටු ප්‍රශ්නය විසඳා දෙන්න වැඩ කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි කරන්නේ. මේක තවදුරටත් බලාගෙන ඉන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. අනාරක්ෂිත දුම්රිය ගේට්ටු ඉතා විශාල ප්‍රමාණයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම සමහර තැන්වල දුම්රිය "සිග්නල්" නැහැ. සමහර තැන්වල සිග්නල් කණු, සිග්නල් ලයිට් වාගේ දේවල් කැඩිලා. තිබෙන දුම්රිය ගේට්ටු සමහර වෙලාවට වැඩ කරන්නේ නැහැ. විශේෂයෙන්ම ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මැතිතුමාත්, ගරු ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමාත් වැඩ භාර ගත්තාට පස්සේ අද මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ගෙනැවිත් තිබෙනවා. අපි ඒ ගැන බෙහෙවින් සතුටු වෙනවා. නමුත් එය ඉතාම ඉක්මනින්, කඩිනම්ව ක්‍රියාත්මක කරන්න කියන එකයි අපේ ඉල්ලීම වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්, පළාත් සභාවල අය -මේ සියලු දෙනාම- කැමැතියි ඕනෑ නම් තමන්ගේ විමධ්‍යගත

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

අය වැය පාවිච්චි කරලා ජනතාවගේ ජීවිත ආරක්ෂා කරගන්න ඒ ගේට්ටු හදන්න මුදල් දෙන්න, එමඟින් අමාත්‍යාංශයට යම්කිසි සහයක් ලබා දෙන්න. මා කරන ඉල්ලීම තමයි අවශ්‍ය කරන සේවක පිරිස යොදවලා ඒ කටයුත්ත කරන්න කියන එක. අපි අවුරුදු ගණනාවක් තිස්සේ මේ ගැන කථා කරනවා. අපේ රටේ ප්‍රධාන ප්‍රශ්න ගැන කථා කරද්දී සමහර වෙලාවට මේ ප්‍රශ්න මඟ හැරෙනවාදෝ කියලා හිතෙනවා. මේ ප්‍රශ්නය නිසා ජීවිත රාශියක් මේ රටට නැති වෙනවා. අද යුද්ධය අවසන් වෙලා තිබෙනවා. යුද්ධයෙන් ජීවිත රාශියක් අපේ රටට නැති වුණා. නමුත් මේ වාගේ දේවල් නිසා යුද්ධයෙන් නැති වෙච්ච ජීවිත ප්‍රමාණය වාගේ ප්‍රමාණයක් නැති වෙනවා. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් මේ ගරු සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා මේ ගැන අවධානය යොමු කරලා, ඉතාම ඉක්මනට අනාරක්ෂිත දුම්රිය ගේට්ටු ප්‍රශ්නය විසඳලා, මේ රටේ ජන ජීවිතය ආරක්ෂා කරලා දෙන්න කියලා.

**ගරු කමලා රණතුංග මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ අවස්ථාවේදී ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත යෝජනාවකුයි ගෙනාවේ. ඇත්ත වශයෙන්ම වර්තමානයේ සිදු වන අනතුරු ගැන බැලුවාම අනාරක්ෂිත දුම්රිය ගේට්ටු නිසාත් අනතුරු විශාල සංඛ්‍යාවක් දින පතාම පාහේ සිද්ධ වන බව පෙනෙනවා. ඒ බව ප්‍රවෘත්ති පත්‍රවලින් අපට නිතරම අහන්න දකින්න ලැබෙනවා. ඒ නිසා මහජන නියෝජිතයන් වශයෙන් අපට ලැබෙන විමධ්‍යගත මුදලින් හෝ ඒ අඩු පාඩුව සම්පූර්ණ කරන්නට අපි සියලු දෙනාම අපේ එකඟත්වය ප්‍රකාශ කරන්නට ඕනෑ.

රිය අනතුරු වැළැක්වීම සඳහා වර්තමාන රජය නීති මාලාවක් පනවලා තිබෙනවා. බීමත්ව රිය පදවන රියැදුරන් සඳහා නීති පනවලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒකත් මේ රජය අනතුරු සිදු වීම වැළැක්වීම සඳහා ගෙන ඇති එක් ක්‍රියා මාර්ගයක්. අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි අනාරක්ෂිත දුම්රිය ගේට්ටු නිසා සිදු වන අනතුරු මඟින් අකාලයේ වටිනා ජීවිත රාශියක් අපේ ජාතියට අහිමි වෙනවා. ඒක නිසා මෙය ඉතාම කාලෝචිත, වැදගත් යෝජනාවක් හැටියට මා දකිනවා. ඉතාම සන්තෝෂයෙන් ඒ යෝජනාව ස්ථිර කරමින්, එම යෝජනාව ඉදිරිපත් කළ අපේ සහෝදර මන්ත්‍රීතුමාට අපේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි. ස්තුතියි.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඉතාම සතුටු වනවා, ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන විමධ්‍යගත අරමුදලින් මුදල් යොදවා ගේට්ටු දමා දුම්රිය හරස් මාර්ගවලදී සිද්ධ වන අනතුරුවලින් ජනතාව ආරක්ෂා කරන්න ඉතාම වැදගත් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන්. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ගෙනෙන ලද එම යෝජනාව ගරු කමලා රණතුංග මන්ත්‍රීතුමිය ස්ථිර කරනු ලැබුවා.

විශේෂයෙන්ම එතුමා ඉතාම අවංකව සහ ඉතාම වුවමනාවෙන් ඒ යෝජනාව ගෙනාපු බව අපට පැහැදිලි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳවත් අපේ ස්තුතිය මේ වෙලාවේ පුද කරන්න ඕනෑ. එසේ පුද කරන ගමන් මම මේ කාරණය කියන්න ඕනෑ. අපේ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව වසර ගණනාවක් මේ පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් කථා කර තිබෙනවා. යාංගල්මෝදර ඇතුළු දුම්රිය අතුරු මාර්ගවලදී සිදු වන අනතුරු වළක්වන්නට විශාල වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළාට මේ අනතුරු පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම අද දවසේ වග කිව යුතු කාර්යයක් වශයෙන් අපි කල්පනා කරනවා. ඒ නිසා ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ දුම්රිය මාර්ග ප්‍රමාණය දිහා බලපුවාම, අද වන කොට තිබෙන කිලෝමීටර් 1,400ක පමණ දුම්රිය මාර්ගවල දුම්රිය හරස් ගේට්ටු 1,175ක ප්‍රමාණයක් තිබෙනවා. ඒ 1,175ට අමතරව අද තවත් දුම්රිය හරස් මාර්ග සඳහා ගේට්ටු ඉල්ලන විශාල ප්‍රමාණයකුත් ඉන්නවා. සමහර විට ගම්මානවලට අලුතින් මාර්ග හදන කොට ඇති වූ අවශ්‍යතා වන්න පුළුවන්. විශේෂයෙන්ම මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව අද මාර්ග විශාල සංඛ්‍යාවක් හැදෙනවා. ඒ නිසා ජනතාවගේ ගමනාගමන පහසුකම් සඳහා අලුතින් ගේට්ටු ඉල්ලනවා. අලුතින් ගේට්ටු ලබා දීම තුළින් මෙවැනි අනතුරුවලට අත වනන නිසා අලුතින් ගේට්ටු නොදෙන්න අපි මේ වන විට තීරණයක් අරගෙන තිබෙනවා. අපි පුළුවන් තරම් උත්සාහ කරන්නේ එම තත්ත්වය මඟ හැරලා ජනතාවට අවශ්‍ය පහසුකම් සලසන්නයි.

අද ප්‍රධාන දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 58ක්, උතුරු දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 92ක්, පුත්තලම් දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 118ක්, මුහුදුබඩ දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 225ක්, මාතර දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 9ක්, කැලණිවැලි දුම්රිය මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 27ක්, ත්‍රිකුණාමලය - මඩකලපුව මාර්ගය ගත්තොත් දුම්රිය ගේට්ටු 97ක් තිබෙනවා. ඔක්කෝම එකතුව ගත්තාම 1,175ක දුම්රිය ගේට්ටු ප්‍රමාණයක් මේ රටේ තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පසු ගිය කාලය තුළ මේ අනතුරුදායක තත්ත්වය නිසා වටිනා ජීවිත අපට නැති වෙලා තිබෙනවා. 2007 දී අනතුරු 65ක් සිද්ධ වෙලා තිබෙනවා. 2008දී අනතුරු 43ක්, 2009දී අනතුරු 66ක්, 2010දී අනතුරු 75ක්, 2011දී අනතුරු 82ක් සිදු වෙලා තිබෙනවා. අලව්ව දුම්රිය අනතුරත් එවැනි එකක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඉතාම ඉක්මනින් මේ දුම්රිය මාර්ගවලට සීනුව සහ ලයිට් එක සහිත - Bell and Light System -ගේට්ටු ලබා දෙනවා. ඒ අනුව දුම්රිය හරස් මාර්ග 230ක ප්‍රමාණයකට Bell and Light System එක සහිත ආරක්ෂිත ගේට්ටු ලබා දෙන්න අපි උත්සාහ කරනවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් වහාම ක්‍රියාත්මක කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා රුපියල් මිලියන 10,000ක මුදලක් ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් දුම්රිය ගේට්ටුවක් හදන්න රුපියල් ලක්ෂ 40ත් 50ත් අතර ප්‍රමාණයක් යනවා. මේ ගේට්ටු සැදීමේ කාර්යය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා - අද එතුමා විදේශ ගත වෙලා ඉන්නේ- අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කර තිබෙනවා. ගේට්ටු 230ක් සවි කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන පිරිවිතර evaluation committee එකට දමලා, ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරලා, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා වසරක් ඇතුළත නිම කරන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර තිබෙනවා. හැබැයි, ඒකෙන් අපට සෑහීමට පත් වෙන්න බැහැ. මොකද, ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හෙට දවසේ ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන තෙක් අපි ඒ ජීවිත ආරක්ෂා කළ යුතු වෙනවා.

ගරු කමලා රණතුංග මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මේවාට අසාධාරණ හේතුත් තිබෙනවා. සමහර විට නොසැලකිලිමත්කම නිසා මේ අනතුරු සිදු වෙනවා. මහා මාර්ගය හරහා යන දුම්රිය ගේට්ටුවල සංඥා පුවරු සවි කර තිබෙනවා. සමහර වෙලාවට දුම්රිය මාර්ගයට ඇතුළු වීමට පෙර ඒවා නොසලකා යන තත්ත්වයන් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි අනවසර ඉදිකිරීම්. දුම්රිය ගේට්ටු අසල තිබෙන අනවසර ඉදි කිරීම් වාගේ දේවලුත් මේ තත්ත්වයට බලපා තිබෙනවා. සාමාන්‍යයෙන් දුම්රිය හරස් මාර්ගයක් අසලදී මීටර් ගණනාවක් දුර දර්ශනය විය යුතුයි. වාහනවල එන අයට ගේට්ටුව දර්ශනය විය යුතුයි. අද එවැනි තත්ත්වයන් නැති වෙලා තිබෙනවා. අද නීති ක්‍රියාත්මක කරන්න ගියාම යම් යම් ආකාරයේ බාධා, ගැටලු මතු වෙනවා. අපි ඒ තත්ත්වයනුත් මැඩ ගෙන තමයි යන්න ඕනෑ. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මුදල්වලින් මේක කරන්න කියලා. මම හිතන්නේ විමධ්‍යගත අරමුදල්වලින් ඒවාට මුදල් වෙන් කරන්න කියන එකෙන් මේ පිළිබඳව එතුමාට තිබෙන වුවමනාව අපට කැපී පෙනෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් යොදා ගෙන හෝ මේ කාර්යය කරන්න කියලා යෝජනා කරමින් පක්ෂයක් වශයෙන් මන්ත්‍රීවරයකු වශයෙන් පුදුම වුවමනාවකින් එතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා මේ වන කොට කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රතිපාදන ගැටලු මත ඉතිරි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට ආරක්ෂාව සැපයීම කිසියම් කාලයක් ගත වන කරුණක් බැවින්ද, හරස් මාර්ග අනතුරු වැළැක්වීම සඳහා විකල්ප හා කඩිනම් ක්‍රියා මාර්ගයක අවශ්‍යතාවය පෙනී ගොස් ඇති බැවින්ද වංගු සහිත ස්ථානවල වඩාත් අවදානම් තත්ත්වයේ ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග ස්ථානීය පරීක්ෂාවන් සිදු කර හඳුනා ගෙන ඇති අතර එම ස්ථාන පිළිබඳව දත්තයන් පහත දක්වමි. කොළඹ සිට රඹුක්කන දක්වා 21යි, කොළඹ සිට හලාවත දක්වා 40යි, කොළඹ සිට අවිස්සාවේල දක්වා 10යි, කොළඹ සිට මාතර දක්වා 62යි.

මෙම දත්තයන් අනුව කඩිනම් විසඳුමක් ලබා දිය යුතු දුම්රිය හරස් මාර්ග 133ක සංඛ්‍යාවක් ඇත. එම හරස් මාර්ගවලට ස්ථිර ආරක්ෂාවක් සපයන තෙක් සමාජයීය ගැටලුවක් වූ අනතුරු හා ජීවිත හානි වැළැක්වීම සඳහා එම ස්ථානවලට පුද්ගලයින් යොදවා අනතුරු සංඥා ලබා දීමට කටයුතු යෙදීම යෝග්‍ය බව පෙනී යයි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතු කාර්ය මණ්ඩල යෙදවීමට හැකියාවක් නොමැති බැවින් තාවකාලික හෝ අනියම් පදනමින් සේවකයින් 400ක සංඛ්‍යාවක් ඒ ඒ ප්‍රදේශවලින් තෝරා ගැනීමක් සිදු කර, අවශ්‍යතාව අනුව තවදුරටත් දීර්ඝ කිරීමේ පදනමින් වසරක කාලයක් සඳහා බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි."

මේ විධියට එතුමා අමාත්‍ය මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමා කිව්ව විධියට ඉදිරියේදී මේ තත්ත්වය සමනය කරන්න, මේ තත්ත්වය වෙනස් කරන්න අවශ්‍යතාවයේ ඉහළම තැන ඉඳලා - top to bottom - ඒ කියන්නේ වැඩිම අවශ්‍යතාව තිබෙන අනුපිළිවෙළ අනුව ගේට්ටු 133ක් හදන්න අද වන විට තෝරා ගෙන තිබෙනවා. ඒ ගේට්ටු අපි වහාම ලබා දිය යුතුව තිබෙනවා. අද ඇමතිතුමා නොමැති නිසා මම දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා එක්ක කථා කළා. එතුමා එකඟතාව ප්‍රකාශ කළා. එතුමාට Budget එකෙන් vote එකක් වෙන් කර දෙන්න කියලා කිව්වා.

සමෘද්ධි ව්‍යාපෘතිය හරහා 400ක් පමණ බඳවා ගෙන හෝ එහෙම නැත්නම් දුම්රිය ගේට්ටු තිබෙන පළාත් පාලන ආයතනය හරහා හෝ මේ තත්ත්වය සමනය කරන්න කටයුතු කරනවා. මම ඉතා පැහැදිලිව කියනවා අපේ ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව අනුව එම කටයුත්ත ක්‍රියාත්මක කරන තෙක් ප්‍රධාන අවශ්‍යතාවන් තෝරා ගෙන එම ගේට්ටුවලට උණ බම්බු සකස් කරලා හෝ එහෙම නැත්නම් ඒ සඳහා සමෘද්ධි ව්‍යාපාරය තුළින් හෝ ගරු අමාත්‍යතුමා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා තිබෙන විධියට 400ක් බඳවා ගෙන මේ කටයුත්ත කරන්නට බලාපොරොත්තු වෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි මේ වෙලාවේ කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. දකුණු අධිවේගී දුම්රිය මාර්ගය නිසා කෝච්චියේ වේගය වැඩි වෙලා තිබෙනවා. නමුත් මේ දුම්රිය හරස් මාර්ග නිසා එහි වේගය අඩු වෙනවා. ඒ නිසා නියමිත වේගයට යන්න අපට බැරි වෙලා තිබෙනවා. ඒ අනුව අද අපට ක්‍රමවත් ගේට්ටු පද්ධතියක් අවශ්‍ය වෙලා තිබෙනවා. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. විදේශීය හෝ දේශීය ටෙන්ඩර්කරුවන් ලවා මේ තත්ත්වයට වහාම පිළියම් යොදන්නටත්, දේශීය නිෂ්පාදකයින් ලවා තවත් ගේට්ටු 30ක් වහාම සපයන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ඒ වාගේම ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ යෝජනාවටත් යම් යම් අවස්ථාවල අපි සහයෝගය ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපි මේ පිළිබඳව දැඩි අවධානයට ලක් කරමින් මේ අවදානම් තත්ත්වය ගැන ඉතාම හොඳින් තේරුම් අර ගෙන වහාම මේ තත්ත්වය වෙනස් කරන්න, එහෙම නැත්නම් මේ තත්ත්වයට උත්තරයක් ලබා දෙන්න කටයුතු කරනවා කියන එකත් මේ වෙලාවේ මතක් කරනවා.

මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපි ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේ මේ පිළිබඳව අදහස් දක්වමින් සහයෝගය ලබා දුන් ගරු කමලා රණතුංග මැතිනියටත්, අපේ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. බෙහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.02 ට, 2012 සැප්තැම්බර් 20 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.02 மணிக்கு பாராளுமன்றம், 2012 செப்ரெம்பர் 20, வியாழக்கிழமை பி. ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.02 p.m. until 1.00 p.m. on Thursday, 20th September, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සැම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.